

# දහම් ගුරු මග

## දහම් පාසල් ගුරු ධාරිතා සංවර්ධන අත්පොත

ප්‍රකාශනය : දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

Not For Sale - CMSP





# දහම් ගුරු මග

## දහම් පාසල් ගුරු ධාරිතා සංවර්ධන අත්පොත

### සංකල්පය

**දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය**
**ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා**

### සම්බන්ධීකරණය


**දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය**
6 වන මහල, "දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.

☎ 091-2234705 / 091-2233522
ෆැක්ස් 091-2223054 / 091-2234455

**Email** shanvijayalal@gmail.com
**Web** https://www.cm.sp.gov.lk


### මෙහෙයවීම හා ප්‍රකාශනය


**දකුණු පළාත් සංවර්ධන අධිකාරිය**
බාලදක්ෂ මාවත, කොටුව, ගාල්ල.

☎ 091-2234332 / 091-2247786
ෆැක්ස් 091-2247786 / 091-2242709

**Email** spda.galle@gmail.com
**Web** https://www.spda.lk


Not For Sale - CMSP

# උපදේශක මණ්ඩලය

- **පූජ්‍ය වලතර සෝහිත ස්වාමීන් වහන්සේ**

  බී.ඒ.(ගෞ), අධ්‍යාපන ඩිප්ලෝමා, ශාස්ත්‍රපති

- **පූජ්‍ය කණුමුල්දෙණියේ චන්දවිමල ස්වාමීන් වහන්සේ**

  ශාස්ත්‍රපති, දර්ශනපති

  රුහුණු විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය

- **එස්.පී. විතාන මහතා**

  විශ්‍රාමික කථිකාචාර්ය

- **කේ.වී.ඩී.එන්.එස්. කුමාර කරවිට මහතා**

  ශාස්ත්‍රවේදී ගෞරව (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

  සභාපති - දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

- **ටී.ආර්.බී. මල්ලවආරච්චි මහතා**

  ව්‍යාපාර පරිපාලනවේදී (රුහුණ විශ්ව විද්‍යාලය)

  සංඛ්‍යාන ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

  ශාස්ත්‍රපති (රුහුණ විශ්ව විද්‍යාලය)

  අධ්‍යක්ෂ ජනරාල් - දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

- **චන්ද්‍රිකා මලේපතිරණ මෙනෙවිය**

  ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

  ප්‍රාදේශීය සැලසුම් පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කැලණිය.වි.වි)

  මනෝවිද්‍යා උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා(කොළඹ වි.වි)

  සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)

- **රුවන් කෝට්ටගේ මහතා**

  (ශ්‍රී ලංකා විදුහල්පති සේවය)

  සම්බන්ධීකරණ ලේකම් (මාධ්‍ය)

  ප්‍රධාන අමාත්‍ය කාර්යාලය - දකුණු පළාත

- **මාධ්‍යවේදී මහින්ද පී. ලියනගේ මහතා**

  පෞද්ගලික සහකාර

  ප්‍රධාන අමාත්‍ය කාර්යාලය - දකුණු පළාත

Not For Sale - CMSP

# ලේඛක මණ්ඩලය

- **පූජ්‍ය වලතර සෝභිත හිමි**
  බී.ඒ.(ගෞ), අධ්‍යාපන ඩිප්ලෝමා, එම්.ඒ

- **පූජ්‍ය නාඔටුන්නේ නන්දරතන හිමි**
  ශාස්ත්‍රපති,
  ගාල්ල, කලේගාන පියතිස්ස ආදර්ශ විද්‍යාලයේ ආචාර්ය

- **පූජ්‍ය කණුමුල්දෙණියේ චන්දවිමල හිමි**
  ශාස්ත්‍රපති, දර්ශනපති,
  රුහුණු විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය

- **පූජ්‍ය බලපිටියේ සිරි සීවලී හිමි**
  ප්‍රාචීන භික්ෂු අධ්‍යාපන ආයතනයේ අංශාධිපති

- **එස්.පී විතාන මයා**
  විශ්‍රාමලත් කථිකාචාර්ය

- **ආර්.ඩබ්.එස්.කේ. විජේබණ්ඩාර මයා**
  පරිවේනාචාර්ය

- **කේ.ඩබ්.කේ. දයාවංශ මයා**
  විශ්‍රාමික රජයේ ප්‍රධාන ගණකාධිකාරී

Not For Sale - CMSP

මුද්‍රණය 2017

**දහම් පාසල් ගුරු ධාරිතා**

**සංවර්ධන අත්පොත**

ISBN - 978-955-7360-00-3

**පිටකවර සැලැස්ම**

තරිඳු ප්‍රේමානන්ද

පාලිත ජයසේකර

**පරිගණක අකුරු ඇමුණුම**

පසිඳු නාලින්ද

**ප්‍රකාශනය**

© දකුණු පළාත් සංවර්ධන අධිකාරිය,
බාලදක්ෂ මාවත, කොටුව, ගාල්ල.

**මුද්‍රණය**

එස්.ඇන්.එස්. ප්‍රින්ටර්ස්
අංක 49,
ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

Not For Sale - CMSP

## ගාල්ල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු ලේඛකාධිකාරී හිමියන්ගේ සුබපැතුම් පණිවුඩය



පොදුවේ ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය වෙනුවෙනුත් විශේෂයෙන් දකුණු පළාතේ දහම් පාසල් ගුරු භවතුන් වෙනුවෙනුත් දහම් අධ්‍යාපනය පාදක කරගත් ගුරු අත්පොතක් නිකුත් කිරීමට දහම් පාසල් අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා ඉටු කරනු ලබන ඉතා වැදගත් මෙහෙවරකි. කාලෝචිතව සිදු කරනු ලබන මෙම සත්කාර්යය වෙනුවෙන් සුබ පැතුම් එක් කරන්නට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

දකුණු පළාත් සංවර්ධන ක්‍රියාවලිය යටතේ විශේෂයෙන් දහම් අධ්‍යාපනය පිළිබඳ දිගු කලක සිට වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කර තිබෙන අතර දහම් පාසල් ගුරු ධාරිතා සංවර්ධන ගුරු අත්පොත නිකුත් කිරීමට ක්‍රියා කිරීම ඉන් සේවය ලබන සියලු දෙනාගේ ම අමන්දානන්දයට හේතු වන්නකි.

දිවයින පුරා දහම් පාසල් දහසකට ආසන්න සංඛ්‍යාවක් පවතින අතර මේ වන තෙක්ම දහම් පාසලක අධ්‍යාපනය නොලබන දරුවන් ද නැත්තේ ම නොවේ. එමෙන් ම ලක්ෂ සංඛ්‍යාත දරු පිරිසක් දහම් අධ්‍යාපනය ලැබුව ද විවිධ සමාජ විෂමතාවන්ට ගොදුරු වූ දරු දැරියන් ද සමාජ ගතව ඇත. පහත් රුචිකත්වයට නැඹුරුව සාරධර්ම කෙරෙහි සැළකිල්ලක් හෝ ගෞරවයක් නොදක්වන වැඩිහිටියෝ ද සිටිති. එබඳු පසුබිමක් යටතේ ක්‍රියාත්මක වන සමාජ පිරිසකට දහම් පණිවුඩය පිළිබඳ මනා මග පෙන්වීමක් කරන්නට ගනු ලබන උත්සාහය අතිශයින් ප්‍රශංසාර්හය.

දරුවන් හැඩගැස්වීම සඳහා මූලිකව ක්‍රියා කරන පිරිස ගුරුවරුන් ය. එම ගුරුවරුන් ගුණයෙන් හා දැනුමෙන් සන්නද්ධ කිරීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා ගුරු භවතුන් වෙනුවෙන් මාර්ගෝපදේශන සහිත ගුරු අත්පොතක් සකස් කිරීම ඉතා වැදගත් ය. දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගේ උපදෙස් මත දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපති තුමා ඇතුළු ප්‍රභූන් මෙබඳු සද් කාර්යයක්

Not For Sale - CMSP

කිරීමට උත්සුක වීම දහම් පාසල් අධ්‍යාපනය වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කරන හා ආශිර්වාද කරන සැමගේ භාග්‍යයක් ලෙස සඳහන් කරන අතර මෙයින් ජනිතවන ප්‍රතිඵල ශ්‍රී ලාංකේය ජාතික - ආගමික - සංස්කෘතික ප්‍රවර්ධනය කෙරෙහි ද අතිශයින් ම බලපායි.

එබැවින් මේ සඳහා අදහස් දක්වමින් සහාය දෙමින් ඇප කැපවී ක්‍රියාකරන දකුණු පළාත් සභාවේ සැමටත් විශේෂයෙන් දකුණු පළාත් සංවර්ධන අධිකාරියටත් බාහිර ක්‍රියාකාරී සැමටත් තෙරුවන් සරණ පතන අතර සියලු කටයුතු සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි.

**පූජ්‍ය කණුමුල්දෙනියේ චන්ද්‍රවිමල මහනාහිමි**

**ගාල්ල දිස්ත්‍රික් ශාසනාරක්‍ෂක බලමණ්ඩලයේ**

**ලේඛකාධිකාරී,**

Not For Sale - CMSP

## දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුබපැතුම් පණිවුඩය



අතීතයේ ව්‍යාප්තව, සංවර්ධිතව, පැවති බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායෙන් වත්මන වන විට ශේෂව ඇත්තේ ඉතාම සුළු ප්‍රමාණයකි. පරසතුරු ආක්‍රමණ, වියවුල් හා නොතකා හැරීම් මේ මහා සම්ප්‍රදාය බිඳ වැටීමට ප්‍රබල හේතු විය. අපට අහිමි වූ ඒ පුද්ගල සංවර්ධන, පෞරුෂ සංවර්ධන අධ්‍යාපන සම්ප්‍රදාය අද දක්වාත් රැකගත හැකිව තිබුණි නම් මීට වඩා උසස් මානව සමාජයක ජීවත්වීමේ වාසනාව අප හැමට ම හිමිවනු ඇත.

වත්මන් අධ්‍යාපන ක්‍රමය පිළිබඳ විවේචන, ගැටලු මතුවන සෑම අවස්ථාවකදී ම මසිත නිතැතින්ම එක් අදහසක් කරා යොමු වේ. බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය එවැනි විටදී එතරම් සාර්ථකව ගැටලු විසඳුවේ කෙසේද? අතීත මහා සම්ප්‍රදායක අක්මුල් සොයා යාමේ ගමන අරඹමින් තැබූ පළමු පියවර ලෙස මෙම ග්‍රන්ථය හඳුන්වාදීමට කැමැත්තෙමි.

මෙම සත්කාර්යයේ වගකීම නොපිරිහෙලා ඉටුකළ දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලයටත් තම වටිනා කාලය හා ඉතා වෙහෙසින් උපයා සපයා ගත් දැනුම මහත් සතුටින් යොදවමින් මේ පර්යේෂණ කාර්යයේ නියලුනු මහා සංඝරත්නය ප්‍රධාන විද්වතුන් සියලු දෙනාටත් හෘදයාංගමව ස්තුතිවන්ත වෙමි.

මෙම මහඟු ග්‍රන්ථය රටේ දරු පරපුර බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ඔස්සේ මෙහෙයවමින් සාමය සමාදානය සපිරි සමාජයක් බිහි කිරීමට නිස්සරණාධ්‍යාසයෙන් කැපවී සිටින දහම් ගුරු භවතුන් වෙත ගෞරව පෙර දැරිව පිරිනමන අතර, මේ ඔස්සේ ඉදිරියට යමින් අපේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳ තවත් ගැඹුරු විමර්ශනයක යෙදීමට විද්වත් ඔබ සැමට හෘදයාංගමව ආරාධනා කරමි.

**ෂාන් විජයලාල් ද සිල්වා**
**ප්‍රධාන අමාත්‍ය - දකුණු පළාත**

Not For Sale - CMSP

# දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්තුමාගේ සුබපැතුම් පණිවුඩය



යහපත් පුරවැසියෙකු සමාජයට දායාද කිරීමේ ඉහළම සාර්ථකත්වය පෙන්වූ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳ ජනතා අවධානය නැවත යොමු කරවීම කාලීන අවශ්‍යතාවයකි. එසේම දහම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි දහම් ගුරු භවතුන්ගේ වියත් බව සුවියත් කිරීම ඒ හා සමාන වටිනාකමකින් යුතු කටයුත්තකි. ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමන්ගේ සංකල්පය අනුව එළිදැක්වෙන "දහම් ගුරු මග" ග්‍රන්ථය එම අරමුණ සාක්ෂාත් කර ගත් ඉතා සාර්ථක ග්‍රන්ථයකි.

සමාජයේ විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට ඉතා අගනා ග්‍රන්ථ මාලාවක් ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි එළිදැක්වීමට අපට හැකි විය. එම ග්‍රන්ථ මාලාවේ තවත් සුවිශේෂී ග්‍රන්ථයක් ලෙස "දහම් ගුරු මග" ග්‍රන්ථය හඳුන්වා දිය හැක.

"දහම් ගුරු මග" ග්‍රන්ථය නිර්මාණය කිරීමේ දී ඒ සඳහා උපරිම සහාය ලබාදුන් වියත් පැවිදි, ගිහි ලේඛක මඩුල්ලට හා උපදේශන මඩුල්ලට විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි. එසේම ග්‍රන්ථ නිර්මාණ සංකල්පය ඉදිරිපත් කරමින් අවශ්‍ය සම්පත් මෙන්ම විමසීම් සිදුකරමින් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා මේ පිළිබඳ දැක්වූ උද්යෝගය හෘදයාංගමව සිහිපත් කිරීමත් මෙය අවස්ථාවක් කර ගනිමි.

"දහම් ගුරු මග" ග්‍රන්ථය නිර්මාණයේ දී දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන්, අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්තුමන් ප්‍රධාන සමස්ථ කාර්ය මණ්ඩලය මේ සඳහා ගත් වෙහෙස පිළිබඳව හෘදයාංගමව ස්තූතිවන්ත වන අතර, තවත් මෙබඳු හරවත් දේ සමාජයට දායාද කිරීමට ශක්තිය වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සමන් දර්ශන පාඩිකෝරාල**
**ලේකම්,**
**ප්‍රධාන අමාත්‍යාංශය,**
**දකුණු පළාත.**

Not For Sale - CMSP

# දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ සුබපැතුම් පණිවුඩය



නිස්සරණාධ්‍යාසයෙන් කැපවී කටයුතු කරන දක්ෂිණ දේශයේ දහම් ගුරු උතුමන්ගේ ප්‍රතිභාව වඩා නංවාලීම පිළිබඳ දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමන් තුළ මතුවූ සංකල්පය යථාර්ථයක් කිරීමේ භාරධූර කාර්ය දකුණු පළාත් සංවර්ධන අධිකාරිය වෙත පැවරිණි.

සාර්ථක සදාචාරවත් මානව හිතවාදී පුරවැසියන් බිහිකළ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායේ අක්මුල් සොයා යන මේ අත්‍යවශ්‍ය සමාජ මෙහෙවරෙහි සාර්ථක ප්‍රථම පියවර තබමින් දක්ෂිණ දේශයේ දහම් ගුරු උතුමන් වෙනුවෙන් "දහම් ගුරු මග" ග්‍රන්ථය නිමවීමට හැකිවීම අප ලද මහත් භාග්‍යකි.

මේ උතුම් අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා තම අමිල කාලය ශ්‍රමය බුද්ධිය මෙන්ම වෙහෙසින් උකහාගත් දැනුම් සම්භාරය නොමසුරුව වැය කරමින් වියත් පැවිදි ගිහි උපදේශක මඬුල්ලට හා ලේඛක මඬුල්ල මේ සද්කාර්ය සාර්ථක කර ගැනීම උදෙසා සිදු කළ කැපවීම බැතිබරව අගය කරමි. ගත් ඒ උතුම් වෙහෙසේ ප්‍රතිඵල ලෙස මේ සුපසන් අරමුණ යථාර්ථයක් බවට පත් පත්වීම අප ලත් මහඟු ජයග්‍රහනයකි. දහම් ගුරු උතුමන්ගේ මෙහෙවර අගයමින් හා ඔවුන්ගේ වෘත්තිමය හැකියාව වර්ධනය උදෙසා උපදේශක මඬුල්ල හා ලේඛක මඬුල්ල ඉටු කළ උතුම් මෙහෙවර පිළිබඳ පුණ්‍යානුමෝදනා පෙර දැරිව ස්තුතිවන්ත වෙමි.

ග්‍රන්ථ නිර්මාණයේ දී අදහස් ලබාදීමෙන් නොනැවතී ආදර්ශ ග්‍රන්ථ සපයා දෙමින්, නිරතුරුව ප්‍රගතිය විමසමින් හා අවශ්‍ය සම්පත් නො අඩුව ලබාදෙමින් අප මෙහෙය වූ ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමන්ගෙන් අප වෙත ලබාදුන්නේ සුවිසල් දායකත්වයකි. ප්‍රධාන අමාත්‍යතුමන්ගේ පෞද්ගලික ලේකම් ඩබ්.එච්. දයාපාල මැතිතුමන් ප්‍රධාන ප්‍රධාන අමාත්‍ය කාර්යාලීය නිලමඬුල්ලත්, ප්‍රධාන අමාත්‍යංශ්‍ය ලේකම් සමන් දර්ශන පාඩිකෝරාළ මැතිතුමන් ඇතුළු ප්‍රධාන අමාත්‍යංශයේ නිලමඬුල්ල, දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් තුමන් හා මෙම කටයුත්තේ මූලික කටයුතු ඉටු කළ සංවර්ධන අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලයටත් ලෙන්ගතු සිතින් තුති පුදමි.

බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය වෙත දරුවන් යොමු කිරීමට වෙහෙසෙන දහම් ගුරු භවතුන් සැමට මෙම "දහම් ගුරු මග" ග්‍රන්ථය මහඟු අත් පොතක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

**කේ.වී.ඩී.එන්.එස්. කුමාර**

**සභාපති- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය**

Not For Sale - CMSP

## දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුබපැතුම් පණිවුඩය



දහම් ගුරුවරයා ඉලක්ක කරගත් මෙවන් කාර්යයකට මැදිහත් වන්නට දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අවස්ථාව ලැබීම මෙම ආයතනය ලත් භාග්‍යයක් බව සඳහන් කරමි.

1995 අංක 01 ප්‍රඥප්තියෙන් මෙම අධිකාරියට පැවරී ඇති බලතල අනුව සංවර්ධන අධිකාරිය සතුව පවතින්නේ පුළුල් විෂය ක්ෂේත්‍රයකි. මේ අනුව ඒ සඳහා අරුත් ලබාදෙන ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා සෑම විටකම "සංවර්ධනය" යන්නට ලබා දෙන පුළුල් වූ අර්ථකථනය අනුව, මෙම අධිකාරිය සමාජ තලයේ විවිධ පැතිකඩයන් තුළ සංවර්ධනය සඳහා දරනු ලබන ප්‍රයත්නයන් මගින්, තිරසර සංවර්ධනයට පවතින වැට මායිම් පුළුල් කරමින් කටයුතු කරමින් සිටී. සංවර්ධනය මගින් හුදෙක් භෞතික සම්පත් ගොඩගසා මානව චින්තනය ඊට යටකර දැමිය යුතුය යන ස්ථාවරයෙන් මිදී කටයුතු කළයුතු කාලය දැන් එළඹ ඇත. ඒ අනුව මෙම සාර ග්‍රන්ථයද ඊට ඉමහත් පිටුවහලක් වනු ඇතැයි මාගේ බලාපොරොත්තුවයි.

මෙම සාර කෘතිය එළි දැක්වීමට මහත් උනන්දුවක් දැක්වූ ගරු ප්‍රධාන අමාත්‍ය තුමා ද, එම අමාත්‍යංශයේ ලේකම්තුමා ප්‍රමුඛ දිරිය දුන් සමස්ත නිළධාරි මඩුල්ල ද, එලදායී ප්‍රශස්ථ ග්‍රන්ථයක් දක්වා මෙම ග්‍රන්ථයේ අන්තර්ගතයට මග පෙන්වීම් කළ උපදේශක මණ්ඩලය හා කර්තෘ මණ්ඩලයට ද අනාගතයේ මෙම පොත පරිහරණය කරමින් දූයේ දරු පරපුරට මග පෙන්වන දහම් ගුරු උතුමන්ට ද මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

අපගේ දේශීය අධ්‍යාපන ක්‍රමයේ මුල් ගස සිඳ බිඳ දමා ඇති මුත්, එහි මූලයන් සඳහා ප්‍රාණය අදටත් විහාරස්ථානය කේන්ද්‍ර කරගත් දහම් පාසල තුළ තවමත් ලබාදෙමින් පවතී. එම සත් කාර්යට මෙම ග්‍රන්ථය ද ශක්තියක්, ධෛර්යක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**ටී.ආර්.බී. මල්ලවආරච්චි**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**දකුණු පළාත් සංවර්ධන අධිකාරිය**

Not For Sale - CMSP

# ලේඛක මණ්ඩලයෙන්...

දහම් පාසල්වල බුද්ධ ධර්මය විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක භාවයේ සමානත්වයක් නොමැති බව බොහෝවිට පිළිගැනීමකි. එයට හේතුව නිස්සරණධ්‍යාශයෙන් දහම් අධ්‍යාපනය ලබාදීම කෙරෙහි වෙහෙසෙන දහම් ගුරු භවතුන්ට විධිමත් වූ මගපෙන්වීමක් නොමැති වීම බව පෙනේ.

- බෞද්ධ ආකල්පවලින් හෙබි, බෞද්ධ සංස්කෘතිය අනාගත පරපුරට දීමේ මාහැඟි කාර්යය ඔස්සේ සුචරිතවත් සමාජයක් ස්ථාපිත කිරීමට සම්පත්දායකත්වය සපයන දහම් පාසල් ගුරුභවතාගේ සමාජ කාර්යයට උපකාරවත්වීම,
- බුද්ධ ධර්මයෙහි ඉගැන්වෙන ඉගැන්වීම් ශිෂ්‍ය ගෝචරවන ආකාරයට නිශ්චිතව හා නිවැරදිව ඉගැන්වීම මගින් දහම් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම,
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දහම් පාසල් ගුරුභවතා දැනුවත් කිරීම මගින් ශිෂ්‍ය ප්‍රජාව ධර්මානුකූලව හැඩගැස්වීම,
- දැනුම - ආකල්ප - කුසලතා සපිරි ක්‍රියාකාරී දහම් පාසල් ගුරුභවතෙකු බිහිකිරීම,
- මානව සම්පත ගුණාත්මක ඵලදායිතාවෙන් යුතු සදාචාර සම්පන්න සමාජයක කොටස් කරුවන් බවට පත්කිරීම,

අරමුණු කොට ගත් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ධුරන්ධර ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා දහම් ගුරු භවතුන්ගේ සේවා දියුණුව අපේක්ෂාවෙන් මග පෙන්වීමක් හඳුන්වා දීමට ගත් තීරණයක ප්‍රතිඵලයක් ලෙස මෙම මාර්ගෝපදේශය සකස් වී ඇත.

බුද්ධ ධර්මය විෂය විධිමත්ව දහම් පාසල්වල ඉගැන්වීම තුළින් සාරධර්ම සුපෝෂිත සමාජයක් ගොඩ නැංවීමට හැකි බව සැමගේ පිළිගැනීමයි. ඒ සඳහා දහම් පාසල් ගුරුභවතා දක්වන සහය නොමඳ ප්‍රසංශාවට ලක්වේ.

දහම් පාසල් ගුරු සේවාවෙහි යෙදෙන ඔබ, නිවැරදි නිසි අවබෝධයෙන් යුතුව දූයේ දරුවන්ගේ දහම් පිපාසාව

Not For Sale - CMSP

සන්සිඳවීමට කටයුතු කරන අතර ම, බුදු දහමේ ඉගැන්වෙන හරපද්ධතිය ජීවන රටාව ගොඩ නඟා ගනු සඳහා උපයෝගී කරගත හැකි ආකාරය වටහා දීම මගින් යහ ආකල්ප සංවර්ධනයට මග පෙන්වන්නෙකු වනු ඇතැයි අපගේ විශ්වාසය යි.

අපගේ උත්සාහය, දහම් ගුරු ඔබ සඳහා වන අතර, ඔබ - ඔබෙන් දහම් අධ්‍යාපනය ලබන දරුවන් විෂයෙහි කරනු ලබන අමිල කැප කිරීම ද අගය කරන්නෙමු.

මෙම උත්සාහය සාර්ථක කර ගැනීම සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, ප්‍රධාන සියලු කාර්‍යයන් හී නියැලුණ සැමට අපගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුදකරනු කැමැත්තෙමු.

දහම් ගුරු ඔබ වෙනුවෙන් වූ 'දහම් ගුරු මග' දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කරගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට වැදගත්වනු ඇත.

Not For Sale - CMSP



Not For Sale CMSP

# දහම් ගුරු මග

## දහම් පාසල් ගුරු ධාරිතා සංවර්ධන අත්පොත

# පෙළගැස්ම

පිටු අංක


(1) දහම් ගුරු සේවාවේ ආරම්භය හා විකාශනය............. 15

(2) බෞද්ධ අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට දහම් පාසල් අධ්‍යාපනයෙන් ඉටු කළ හැකි මෙහෙය........... 24

(3) දහම් පාසල් ගුරුවරයාගේ වගකීම හා වගවීම............. 30

(4) දහම් පාසල් ගුරුවරයාගේ කාර්යභාරය.......................... 37

(5) ඉගැන්වීමේ ඉගෙනීමේ සම්පත් .................................... 48

(6) පාඩම් සැලසුම් කිරීම........................................................ 54

(7) ඉගෙනුම් උපාය මාර්ග...................................................... 57

(8) ඉගෙනුම් ආධාරක ............................................................ 63

(9) දහම් පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ඉගැන්වීමේ උපාය මාර්ග සහ ශිෂ්‍ය සාධනය ඇගයීම........................ 66

(10) සාරධර්ම සංවර්ධනයට දහම් පාසල් ගුරුවරයාගේ මගපෙන්වීම.................................................................. 76

(11) වර්තමානයේ දහම් ගුරු අධ්‍යාපනය කෙසේ විය යුතුද?.. 81

(12) බුදුරදුන්ගේ ඉගැන්වීම් ක්‍රමවේද දහම් ගුරුවරුන්ට පෙන්වන මග................................................................. 100

(13) උපග්‍රන්ථය ........................................................................ 112

- දහම් පාසල් නිපුණතා ............................................ 113
- දහම් පාසල් ගුරු චර්යාව ...................................... 220


Not For Sale - CMSP

# 01. දහම් ගුරු සේවාවේ ආරම්භය හා විකාශනය

"ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාරතය කේන්ද්‍ර කරගෙන ආරම්භ වී සියවස් ගණනක් තිස්සේ සෙසු ලෝකය පුරා ව්‍යාප්ත වූ බව විශ්වාසය" යි යනුවෙන් විද්‍යාඥයකු වූ ඇල්බට් අයින්ස්ටයින් පවසයි. දහම් ගුරු සේවාව භාරතය කේන්ද්‍ර කරගෙන ආරම්භ වූ බවට මෙය වැදගත් සටහනකි.

සිදුහත් කුමරු ද උපතේ සිට බුද්ධත්වය දක්වා ම බමුණන්ගෙන් අධ්‍යාපනය ලැබූ බව බෝසත් සිරිතෙහි සඳහන් ය. සර්වමිත්‍ර - ආලාර කාලාම උද්දකරාම පුත්‍ර එසේ බෝසතුන් අධ්‍යාපනය ලැබූ බමුණන් වශයෙන් ප්‍රසිද්ධය. මෙයින් පැහැදිලි වන්නේ වර්තමානය තෙක් ව්‍යාප්ත වී ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයේ මුල් අවස්ථාව ඉන්දියාවෙන් ඇරඹි බවයි. විශේෂයෙන් පුද්ගලයෙකුගේ අධ්‍යාත්මය සුවපත් කර ගැනීම පිළිබඳ ඉගැන්වීම් මේ අධ්‍යාපන ක්‍රියාවලියේ පදනම විය.

### බෞද්ධ දහම් ගුරු සේවාව

බුදු දහම හා ගොඩ නැගුණු දහම් ගුරු සේවාව බෞද්ධ දහම් ගුරු සේවාවයි. බුදුන් වහන්සේ තමන් වහන්සේ විසින්ම ධර්මය අවබෝධ කරගෙන බුද්ධ යන ශ්‍රේෂ්ඨ තත්ත්වයට පත්වූහ. අනතුරුව උන්වහන්සේ එම ධර්මය බරණැස ඉසිපතනයේ මිගදායේ දී පස්වග මහණුන් උදෙසා දේශනා කරන ලද ධම්මචක්ක පවත්වන සූත්‍ර දේශනාව ලොව ප්‍රථම බෞද්ධ දහම් අධ්‍යාපනික අවස්ථාව හා දහම් ගුරු සේවාවේ ආරම්භය ලෙස දැක්විය හැකිය.

Not For Sale - CMSP

අනතුරුව සසුනේ සාමාජික පිරිස 61 නමක් දක්වා වර්ධනය වූ කල්හි බොහෝ දෙනාට හිත සුව පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස ඒ ඒ ප්‍රදේශවලට වඩිමින් ධර්මය දේශනා කරන ලෙස උපදෙස් දුන්හ. මෙලෙස මුල් අවධියේ දී අධ්‍යාපනය ලබා දීම සඳහා ස්ථිර ආයතන නොතිබිණි. සූත්‍ර දේශනාවල සඳහන් පරිදි දම්සභා මණ්ඩපය - රුක්මුල්, වන සෙනසුන්, සුසානය ආදී ස්ථාන පවා අධ්‍යාපනික ආයතන බවට පත්වී ඇත. ස්ථානය කෙසේ වෙතත් පූර්ණ අවබෝධයකින් යුතු ඥාණ ශක්තියක් උපදවා ගැනීමට ශ්‍රාවකයාට එකී ඉගැන්වීම් වලින් හැකියාව ලැබී ඇත.

ඉන්පසු සියවස් කීපයක් තුළ බෞද්ධ ඥාණ ගවේෂණයේ යම් යම් ප්‍රවණතා මත සෞත්‍රාන්තික - මාධ්‍යමික ආදී දාර්ශනික සම්ප්‍රදායන් කීපයක් බිහිවන අතර මෙම සම්ප්‍රදායන් ඇතුළු මුල් බුදුසමය හා සබැඳි විශ්ව විද්‍යාල කීපයක් භාරතය තුළ ව්‍යාප්තියට පත්විය. ඒ අනුව තක්ෂිලා - නාලන්දා - ජගද්දලා - වික්‍රමශිලා ඕදන්ත පූර - වලභී වැනි ආරාම සංස්කෘතිය ද සහිත විශ්වවිද්‍යාලවල දස දහස් ගණනින් පැවිදි - ගිහි ශිෂ්‍ය ප්‍රජාව අධ්‍යාපන මෙහෙවරෙහි යෙදී ඇත.

භාරතය කේන්ද්‍රකරගත් මෙම අධ්‍යාපන ක්‍රමය මෞර්යයී යුගය වන විට විශේෂයෙන් ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායට මුල් තැනක් හිමි වෙමින් ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ව්‍යාප්තියට පත්විය. ඒ තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල වශයෙනි.

**ලක්දිව දහම් අධ්‍යාපනයේ ආරම්භය**

ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව යම් හික්මීමේ ක්‍රමයක් පැවැතියේ වුවද එය ද භාරතීය සංක්‍රමණ මගින් සිදු වූ ඒවා

Not For Sale - CMSP

බව පැහැදිලිය. ක්‍රි.පූ. තුන්වන සියවසෙහි මිහිඳු හිමියන්ගේ වැඩම වීමත් සමඟ බුදු සසුන අප රට තුළ ස්ථාපනය විය. එයට සමගාමීව වඩාත් සංවිධිත දහම් ගුරු අධ්‍යාපන සේවයක් ක්‍රියාත්මක වන්නට විය. බෞද්ධ අධ්‍යාපනය සහ ශිල්ප ශාස්ත්‍ර හැදී වැඩී දියුණු වූයේ ආරාම මධ්‍යස්ථාන කරගෙන බවත් ආරාම සම්බන්ධ නොවූ අධ්‍යාපන අවස්ථා බෞද්ධ රටවල දක්නට නොලැබෙන බවත් ආචාර්ය රාධා කුමුද් මුඛර්ජි පවසයි. අනුරාධපුර මුල් යුගයේ දී ශ්‍රී ලංකාව තුළ ගොඩ නැගෙන සෑම ආරාමයක්ම භික්ෂූන් වහන්සේගේ ආගමික කටයුතු සඳහා පමණක් වෙන් නොවී ඒවා අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත්වීම ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. විශේෂයෙන් අනුරාධපුර මහා විහාරය දෙස් විදෙස්හි පිළිගැනීමට ලක්වූ විශ්ව විද්‍යාලයක් වූ අතර දහම් ගුරු සේවයේ ව්‍යාප්තිය එයින් මැනවින් පැහැදිලි වේ. විශේෂයෙන් වලගම්බා රජු සමයේ දී ශාසනයේ පැවැත්මට හේතු වන්නේ ප්‍රතිපත්තිය නොව පර්යාප්තිය (ධර්මය ඉගෙන ගැනීම සහ ඉගැන්වීමයි. පරියත්ති නුබෝ සාසනස්ස මූලං උදාහු පටිපත්ති) යන තීරණය ගැනීම හේතුවෙන් දහම් ගුරු සේවය වඩ වඩාත් ස්ථාවර වන්නට හේතු වූවාට සැක නැත.

මෙසේ සංවර්ධනය වෙමින් පැමිණි දහම් ගුරු සේවය අනුරාධපුර යුගයේ අවසාන භාගය වනවිට වඩාත් ක්‍රමානුකූල හා සංවිධානාත්මක වෙමින් නව ආයතනික ව්‍යුහයකට අනුගත වීම වැදගත් සන්ධිස්ථානයක් විය. මෙම නව ආයතනය වූයේ පිරිවෙනයි. ඒ අනුව ප්‍රථම පිරිවෙන වූයේ මහා විහාරය කේන්ද්‍ර කොට ඇරඹුණු කාල ප්‍රාසාද පිරිවෙනයි. අනතුරුව දීඝ සන්ද පිරිවෙන,සුන්හාත පිරිවෙන, ඵලග්ග පිරිවෙන, මරුගත පිරිවෙන, දිඝ චංකමන පිරිවෙන ආදී වශයෙන් බෞද්ධ



Not For Sale - CMSP

අධ්‍යාපන ආයතන රාශියක් බිහි වූ බව අතීත තොරතුරු සඳහන් කරයි.

වලගම්බා රජ සමය බෞද්ධ අධ්‍යාපන ක්‍රමය විධිමත් ආකාරයකට පරිවර්තනය වූ යුගය වශයෙන් සඳහන් කළ හැක්කේ ඔහුගේ මූලිකත්වයෙන් මහා විහාරය මූලික කොට ගෙන පිරිවෙන් දොළසක් ආරම්භ කළ නිසාවෙනි. ඉන් අනතුරුව රජකම් කළ වසභ රජු මෙන්ම කණිට්ඨ තිස්ස රජතුමා ද, මහා විහාරය හා අභයගිරිය ආශ්‍රිතව පිරිවෙන් රැසක් ආරම්භ කළ බව වංශකතා සඳහන් කරයි.

මෙලෙසින් මහානක (මහා විහාරය) හගිරිනක (අභය ගිරිය) දෙනානක (ජේතවනාරාමය) ඇසුරු කරගෙන වරින් වර අධ්‍යාපන ආයතන බිහිවූ බව ඓතිහාසික තොරතුරු හෙළි කරයි. විශේෂයෙන් මෙකී තුන්නිකා මූලස්ථාන කරගෙන සියවස් කීපයක් මුළුල්ලේහි අෂ්ට මූළායතන නමින් ප්‍රකට අධ්‍යාපන ආයතන අටක් යුග කීපයක් යනතුරු මහගු මෙහෙවරක් සිදු කර ඇත. ගලතුරුමුල -උතුරුමුල - විල්ගම්මුල - මහනෙත්පාමුල - දකුණුමුල - කපාරාමුල - සෙනෙවිරත් පාමුල - වහදු මුල යන මෙම අධ්‍යාපන ආයතන විශ්ව කීර්තියට පත් ශ්‍රේෂ්ඨ මෙහෙවරක් සිදු කළ ආයතන බව සුප්‍රසිද්ධ කරුණකි.

ශ්‍රී ලංකාවේ දහම් අධ්‍යාපනය මෙසේ විකාශනය වෙමින් පැමිණිය ද දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් වූ චෝල - (සොලී) සහ මාඝ වරින් වර සිදු කළ ආක්‍රමණ වලින් සිදු වූ හානිය දිගුකලක් යනතෙක්ම යථාතත්ත්වයට පත් කර ගැනීමට අපහසු විය. මීට අමතරව 1505 දී ලක්දිව ආක්‍රමණය කළ පෘතුගීසීහු ද 1602 දී පැමිණි ලන්දේසීහුද, 1796 දී පැමිණි ඉංග්‍රීසී හුද ක්‍රම ක්‍රමයෙන් බෞද්ධ අධ්‍යාපන සේවාව හා



Not For Sale - CMSP

අධ්‍යාපන ආයතන ද ඒ සඳහා කැප වූ භික්ෂූන් වහන්සේට හා ගිහි ජනතාවට ද මහත් වද හිංසා පීඩා පමුණුවමින් විනාශ ස්වභාවයට පත් කළහ. විශේෂයෙන් මොවුන්ගේ ප්‍රධාන අභිප්‍රාය වූයේ ලංකාවේ තිබෙන වටිනා ද්‍රව්‍ය ඔවුන්ගේ රට වලට රැගෙන යාමත් බුදුදහම හා සිංහල ශිෂ්ටාචාරය දුර්වල කිරීමත්, ක්‍රිස්තියානි ආගම සහ බටහිර ශිෂ්ටාචාරය පැතිරවීමත් ය. ඊට සරිලන පරිදි සිංහල බෞද්ධ සියලු බලවේග අකර්මන්‍ය කිරීමට යෙදිය හැකි සියලු උපාය මාර්ග යෙදීම ඔවුන්ගේ අභිප්‍රාය විය. 1815 මාර්තු 02 වන දින සිංහල ජාතියේත් ලංකා බුද්ධ ශාසනයේත් නිදහස බලය ඉංග්‍රීසීන්ට යටත් විය. මේ කාලයේ සිට පරිහානිය කරා ගමන් කළ සිංහල බෞද්ධ බලවේග අද වන තෙක් නිදහස ලැබූව ද, යම් යම් පරිවර්තනවලට ලක්වෙමින් පවතී. කෙසේ වුවද මෙසේ පිරිහෙමින් පැවැති දහම් අධ්‍යාපනය ඇතුළු සියලු අංග නැවත ගොඩ නගන්නට වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජයන් පෙරමුණ ගෙන ක්‍රියා කිරීම නිසා 17 වන සියවසේ මහත් ප්‍රබෝධයක් ඇතිවිය. වර්තමාන දහම් ගුරු සේවයේ වර්ධනය සඳහා මෙම පරිවර්තනය ඉමහත් පිටිවහලක් වූ බව පැහැදිලිය.

## වර්තමාන දහම් පාසල් හා දහම් ගුරු සේවය

1815 දී ඉංග්‍රීසින් ලංකාව යටත් කරගත් පසු මිෂනාරී ආගම ප්‍රචාරය කිරීමටත් බුදු දහමට හැකි සෑම අයුරකින්ම පහර ගැසීමටත් ඔවුහු පසුබට නොවූහ. මේ නිසා රට පුරා වෙහෙර විහාරස්ථානවල සිටි භික්ෂූන් වහන්සේලා මෙන්ම ජනතාව ද සිටියේ දැඩි අසහනකාරී හැඟීමෙනි. මේ තත්ත්වය පිටු දැකීම සඳහා බොහෝ භික්ෂූන් වහන්සේද සමහර ගිහි



Not For Sale - CMSP

ප්‍රභූන් ද විවිධ ක්‍රියාමාර්ග ගැනීමට උත්සුක වූහ. මෙහිදී පෙරමුණගත් හිමිනමක් වූයේ වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ය. උන්වහන්සේ තම චතුර කථිකත්වය හා ලේඛන නිපුණතාව ද යොදා ගනිමින් මිෂනාරීන්ට නිසි පරිදි පිළිතුරු සපයන්නට පසුබට නොවූහ. විශේෂයෙන් උන්වහන්සේගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වූ මහා වාද නිසා රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති විය. මහා වාද පිළිබඳ තොරතුරු ලොව පුරා ප්‍රචාරය වන්නට ද විය.

ඒ අනුව පානදුරා වාදය පිළිබඳ ඉංග්‍රීසි බසින් ලියවුණු කෘතියක් කියවා දැනුවත් වූ ඇමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා හා දානපතිනියක වූ ඇනී බිලෙසන්ට් බ්ලැවැට්ස්කි මැතිනිය ලක්දිවට පැමිණ බුදුදහම වැළඳගත් අතර, එතැන් සිට බෞද්ධ අධ්‍යාපනයේ දියුණුව සඳහා කටයුතු කළෝ ය. ලංකාවේ බෞද්ධ දරුවන්ගේ අධ්‍යාපනය ගැන අවධානය යොමු කළ ඕල්කට් තුමා ඉරුදින දහම් පාසල් මෙන්ම බෞද්ධ පාසල් ද ආරම්භ කිරීමට ක්‍රියා කළේ ය. මේ පිළිබඳව එතුමාගේ දින පොතෙහි මෙසේ සටහනක් තබා තිබේ.

"මගේ හිතට වැදගත් අදහසක් පහළ විය. බෞද්ධ ළමයින් ඔවුන්ගේ ආගම දිවයිනේ සෑම විහාරස්ථානයකදීම විශේෂ දිනවල පැය ගණනක් උගත යුතුය. ඔවුන්ගේ දෙමාපියන්ගේ ආගමෙහි මූලික කරුණු පවා ඔවුනට නොඉගැන්වූව හොත් ඔවුන් හොඳ බෞද්ධයින් වෙතැ යි කෙසේ නම් බලාපෙරොත්තු විය හැකිද?"

මේ අදහස ඇතිව ක්‍රියා කළ ඕල්කට් තුමා 1881 පෙබරවාරි මස 13 වන දින කොළඹ පරම විඥානාර්ථ සමාගමේ දී ප්‍රථම ඉරු දින දහම් පාසල ආරම්භ කරයි. මීට



Not For Sale - CMSP

ප්‍රථම මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් 1879 වර්ෂයේ දී කොටහේන දීප දුත්තමාරාමයේදී ඉරුදින දහම් පාසලක් ආරම්භ කළ බව සඳහන් වුවද ගුරු හිඟය නිසා නොබෝ දිනකින්ම මෙම දහම් පාසල් වැසී ගිය බව කියවේ.

කෙසේ වෙතත් තම උත්සාහය අත් නොහළ ඕල්කට් තුමා දිවයිනේ මේ පිළිබඳව හැඟීමක් ඇතිව සිටි පැවිදි සහ ගිහි නායකයන්ගේ ඇප උපකාර සහිතව ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල 1895 අගෝස්තු මස 03 වන දින ගාල්ල වැලිවත්ත විජයානන්ද විහාරස්ථානයේදී පූජ්‍ය ඇහැලේපොළ ජිනෝරස ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළේය. එය ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරු සේවයේ නිළ ආරම්භය වන අතර එවකට මේ ප්‍රදේශයේ සිටි ප්‍රභූන් පිරිසක් දහම් පාසල් ගුරුවරුන් වශයෙන් ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී ක්‍රියා කළ බව අතීත වාර්තා සඳහන් කරයි.

මේ ආරම්භයත් සමඟම කෙටි කලක් තුළ රට පුරා විහාරස්ථානවල දහම් පාසල් ආරම්භ වූ අතර බෞද්ධ ප්‍රබෝධය ද ඇතිවන්නට විය. විශේෂයෙන් අනගාරික ධර්මපාල - වලිසිංහ හරිස්චන්ද්‍ර වැනි ගිහි නායකයන්ගේ සමාජ - ආගමික හිතවාදී ක්‍රියාකාරකම් මේ තත්ත්වයට හේතු වූ බව නොරහසකි.

මේ වන විට මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන සහ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනත් දහම් ගුරු සේවය වෙනුවෙන් වැදගත් මෙහෙවරක් ඉටු කරමින් සිටි අතර දහම් පාසල් ගුරු සේවය තව දුරටත් විකාශනය වන්නට එම ආභාසය වැදගත් විය. එමෙන්ම දහම් පාසල තුළින් ද මතු වූ බෞද්ධ ප්‍රබෝධය රටේ නිදහස් සටනට පන්නරයක් එක්කළ බව ද කිව යුතුය. ඒ අනුව දහම් පාසල් සංඛ්‍යාව ද



Not For Sale - CMSP

ප්‍රමාණාත්මක වශයෙන් ව්‍යාප්ත වෙමින් පැවති අතර එයට සමගාමීව දහම් පාසල් ගුරුවරුන්ගේ සංඛ්‍යාව ද වර්ධනය විය. මේ වන විටත් කොළඹ පරම විඥානාර්ථ සමාගමේ උපදෙස් හා මඟ පෙන්වීම් අනුව ක්‍රියාත්මක වූ දහම් පාසල් පද්ධතිය 1960 දශකය වන විට කොළඹ තරුණ බෞද්ධ සංගමයේ මඟ පෙන්වීම අනුව ක්‍රියාත්මක වීම වැදගත් කරුණකි. ඒ අනුව දිවයිනේ සියලු දහම් පාසල් වල 6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා විභාග ඔවුන්ගේ අනුග්‍රහයෙන් පැවති අතර දරුවන්ට සහතික පත්‍ර ලබා දුන්නේ ද ඔවුන්ගේ අනුග්‍රහයෙනි. එමෙන්ම වරින් වර දහම් පාසල් ගුරුවරුන්ට පුහුණුව ලබා දීමට ද කොළඹ තරුණ බෞද්ධ සංගමය කටයුතු කිරීම තුළින් ඔවුන්ගේ ගුණාත්මක තත්ත්වය වර්ධනය වීමක් ද සිදු විය.

මුල් අවධියේ රාජ්‍ය අනුග්‍රහයක් නොලබා ක්‍රියාත්මක වූ දහම් අධ්‍යාපනය වෙත සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම 70 දශකයේ අග භාගයේ සිට සිදු විය. අනතුරුව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ද බුද්ධ ශාසන අමාත්‍යංශයේ ද සහාය ලැබමින් විෂය නිර්දේශ ද සංවර්ධනය කොට නව ඉගෙනුම් ක්‍රියාවලියකට දහම් පාසල යොමු කිරීම ද දහම් පාසල් ගුරු සේවයේ ගුණාත්මක බව වර්ධනය වීම සඳහා හේතු විය.

2000 නව සහශ්‍රකය ආරම්භයත් සමඟ ලොව බොහෝ රටවල් තම සංවර්ධන උපාය මාර්ග නව මං මාවත් ඔස්සේ ගෙන යාමට උනන්දුවක් දක්වන ලදී. මේ කාලයේ දී පෙරට ආ, ගෝලීයකරණ, සංකල්පය යටතේ අධ්‍යාපනික සංකල්පයන් ද නව්‍යකරණය වූ අතර එය දියුණුවෙමින් පවතින අප රටට ද ඉතා වැදගත් විය. ලොව බොහෝ රටවල් තම අධ්‍යාපන ක්‍රම වේදයන් නිපුණතා පාදක ක්‍රම වේදයන් මත ඉදිරියට ගෙන



Not For Sale - CMSP

යාමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාව ද ඒ අනුව යමින් රටේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට ජාතික අරමුණු 10 ක් සහ නිපුණතා 07 ක් හඳුන්වා දෙන ලදී. මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින් 2006 වර්ෂය වන විට දහම් පාසල් සඳහා ද එක් ප්‍රධාන පරමාර්ථයක් සහ නිපුණතා 10 ක් හඳුන්වා දෙන ලදී.

මෙය දහම් පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තව තවත් විධිමත් වීම කෙරෙහි සාධනීය ලෙස බලපා ඇති සාධකයකි. විශේෂයෙන් දහම් පාසල් පද්ධතිය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට පවරා ගැනීම දහම් පාසල් ගුරු සේවය තව දුරටත් විකාශනය වන්නට හේතුවක් විය. ඒ අනුව දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම. ඇගයීම් සිදු කිරීම, දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාවක් සහ ගමන් වියදම් දීමනාවක් ලබා දීම ද වාර්ෂිකව නිල ඇඳුම් ප්‍රදානය කිරීමට ද කටයුතු කරමින් අනුග්‍රහය දක්වයි. මේවා දහම් ගුරු සේවයේ උන්නතිය සඳහා ගනු ලැබූ සාධනීය පියවර ලෙස දැක්විය හැකිය.

මෙයට අමතරව ලංකාවේ ඒ ඒ පළාත් සභා මඟින්ද ගුරුවරුන් ඇගයීම් ආදී සේවා සිදු කරන අතර විශේෂයෙන් දකුණු පළාත් සභාව මගින් දහම් ගුරු සේවය ඵලදායී බවට පත් කිරීමට නේවාසික ගුරු පුහුණු වැඩමුළු ඇගයීම්, පදක්කම් ප්‍රදානය, සුබ සාධන කටයුතු සිදු කිරීම ආදිය ද දහම් ගුරු සේවාවේ උන්නතිය සඳහා සිදුකරන සුවිශේෂී කාර්යයක් බව ප්‍රශංසාත්මකව සඳහන් කළ යුතු ය.

Not For Sale - CMSP

# 02. බෞද්ධ අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට දහම් පාසල් අධ්‍යාපනයෙන් ඉටුකළ හැකි මෙහෙය

අධ්‍යාපන කාර්යාවලියෙන් දැනුම, ආකල්ප, කුසලතා (ප්‍රජානන, ආවේදන, මනෝචාලක) සංවර්ධනය අපේක්ෂා කෙරේ. එහි වර්තමාන ක්‍රියාදාමයේ දී යහපුරුදු වර්ධනයට මඟ පෙන්වීම හා ඒ සඳහා යොමු කිරීම ද අන්තර්ගතය. මෙම අධ්‍යාපන ක්‍රියාවලිය ආගමික අධ්‍යාපනයේ ද සුවිශේෂව ඇතුළත්ව ඇත. ශ්‍රී ලාංකික අධ්‍යාපන ක්‍රමය හා එහි ක්‍රියාකාරකම් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය මත ක්‍රියාත්මක කරන, කරවන ඒ සඳහා කැපවෙන එකම ආයතනය බෞද්ධ දහම් පාසල බව අවිවාදිත ය.

ආගමික අධ්‍යාපනයේ අරමුණු අතර යහපුරුදුවලින් යුත් පුද්ගලයන් බිහිකිරීම මගින් යහ සමාජ සංවර්ධනයක් අපේක්ෂිතයි. මෙම කරුණ සාක්ෂාත්කර ගැනීම සඳහා දහම් පාසල් ගුරුභවතාට කෙසේ දායක විය හැකිද යන්න විමසිය යුතුය. ශ්‍රී ලාංකික සමාජය තුළ ජාතීන් කිහිපයක් පදනම් වූ ජන වර්ග ඇත්තේ ය. ඉන් එක් කොටසක් සිංහල බෞද්ධ වශයෙන් වෙයි. දහම් පාසල බැඳී පවතින්නේ සිංහලකමත් බෞද්ධකමත් එකට එක් වූ දම්වැලක් පරිද්දෙනි.

ශ්‍රී ලාංකික අනන්‍යතාව පදනම්ව බෞද්ධාගමික පරිසරයක සමාජගත අන්‍ය ජාතීන්, ආගමිකයන් හා කටයුතු කිරීමට විවිධ අවස්ථාවන්හි සිදුවේ. මෙහි දී එකම ජාතියක් එනම් ශ්‍රී ලාංකිකයන් බෞද්ධයන් ලෙස අන්‍ය ජාතිකයන්, ආගමිකයන් සමඟ සහජීවනයෙන් යුතුව ජාතික සමගිය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීම අපේක්ෂිතය. එසේ වූ විට

Not For Sale - CMSP

සාමය තහවුරු වෙයි. මේ සඳහා දහම් පාසල් ගුරුවරයාට ඍජුව මැදිගත්ව කටයුතු කළ හැකිය.

ශ්‍රී ලාංකික සමාජයේ බෞද්ධයන් හැටියට අපට උරුම වූ දායාද රාශියකි. ඒවා අප සුරක්ෂිතව පවත්වා ගනිමින් මතු පරපුරට එහි භුක්තිය පැවැරිය යුතුය. එහි දී අප ජාතික උරුමයන් පිළිබඳව හඳුනාගෙන වටහා ගෙන ක්‍රියාකළ යුතුය. ඒවා සංවේදී මනසින් යුතුව දකින්නට දහම් පාසල් ගුරුභවතා දක්ෂ විය යුතුය. සමත් විය යුතුය. අධ්‍යාපන ක්‍රියාවලියේ දී දහම් පාසල් ගුරුභවතාගෙන් ඉටුවිය යුතු අරමුණු රාශියකි. ඒවා බෞද්ධ මුහුණුවරින්ම සමාජ ගත කිරීම ඔහු සතුය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංස්ථාපනය කරන ලද මානව අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව දහම් පාසල් ගුරුභවතා දැනුවත් විය යුතුය. එකී අයිතිවාසිකම් හා යුතුකම් සුරක්ෂා කරමින් ඉටුකරන්නට අන්‍යයන්ට ද මග පෙන්වීම දහම් පාසල් ගුරුභවතාගේ ද වගකීමක් හා යුතුකමක් වනු ඇත. අන්‍යෝන්‍ය බැඳීම, එකිනෙකාට ගරුකර ගැනීම හා එකිනෙකා පිළිගැනීම වැනි මූලික කරුණු සමාජයට ප්‍රදානය කිරීමට දහම් පාසල් ගුරුභවතාට දහම් පාසල මගින් කළ හැකි වනු ඇත.

කායික සෞඛ්‍ය මෙන්ම මානසික සෞඛ්‍යය ද මිනිසාගේ පැවැත්මට ඉතා වැදගත්ය. මෙය සමබරව නිවැරදිව පවත්වා ගැනීම මඟින් නිරෝගී සමාජයක් බිහිකරගැනීමේ පෙර ගමන්කරුවා වශයෙන් දහම් පාසල් ගුරුභවතාට පැවරෙන කාර්යය සුළුපටු එකක් නොවේ. අද මිනිසා නිමක් නැති තරගයක නිරන්තරයෙන්ම යෙදී සිටී. මේ නිසා ඔහුට අනුන් ගැන තබා තමන් ගැනවත් අවධානය යොමු කරන්නට අවස්ථාව උදා නොවේ. ඔහු තමාගේ විවේකය නිසි පරිදි භුක්ති



Not For Sale - CMSP

විඳින්නේ නැත. මේ නිසාම කායික සුවයක් නොලබයි. කායික සුවයක් නොලැබෙන විට මානසික සුවයක් නොලබන්නේ ම ය. එසේ වන්නට හේතුව ඔවුන් මහිච්ඡතාවෙන් යුතුවීම ය. අල්පේච්ඡතාව, යථාලාභ සන්තුෂ්ටිය බෞද්ධ ඉගැන්වීම වේ. ඉන් බැහැර නොවී එයට අනුගතව ක්‍රියා කිරීමෙන් මානසික සහනය මෙන්ම කායික පීඩාවන් ගෙන් වැළකීමටද හැකිය. මේ සඳහා දහම් අධ්‍යාපනයෙන් ලැබෙන සහය සුළුපටු නොවේ.

සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ නිර්මාණාත්මක හැකියාව, ආරම්භක ශක්තිය වඩවා ගැනීම, විචාරශීලි චින්තනයෙන් යුතුව කටයුතු කිරීම, වගවීම හා වගකීම බෞද්ධයන් වූ අපට අලුත් දෙයක් නොවේ. මේ සියල්ල බුද්ධ භාෂිත ඉගෙනීම නිසා අප ඔබ දැනුවත් වී ඇත. විශේෂයෙන්ම කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය, ඇසුරු කොට සිතීමේ හා විමසීමේ නිදහස අවධාරණය කොට ඇත.

මිනිසාගේ පෞරුෂ සංවර්ධනය ඇති කිරීම දහම් අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යයක් වේ. සෑම කෙනෙකුම තමා යන අභිමානයෙන් කටයුතු කරන්නට කැමැත්ත දක්වති. එහෙත් විවිධත්වයෙන් යුතු සමාජයක එසේ කටයුතු කළහොත් ගැටීම් ඇතිවීම වැළැක්විය නොහැකිය. මේ නිසා එකිනෙකාට ගරු කිරීම මත පිහිටා කටයුතු කිරීමෙන් අන්‍යෝන්‍ය සුහදත්වය, එකමුතුකම ඇතිකර ගත හැකිවනු ඇත. බෞද්ධ ඉගැන්වීම් පදනම් කොට මෙය ඉටුකර ගත හැකිය. මෙය සිදුකළ හැක්කේ දහම් පාසල් ගුරුවරයාටම ය.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස අතීතයේ සිට පැවතිය ද නූතනයේ කාර්මික සංවර්ධනයෙන් ද දියුණුව කරා ගමන් කරන රටක් ලෙස පිළිගැනේ. ඒ අනුව කෘෂිකාර්මික මෙන්ම කාර්මික යන දෙ අංශයෙන් ම ආර්ථිකය ශක්තිමත්



Not For Sale - CMSP

කරගැනීමට හැකි ජීවනෝපායන් පිළිබඳව මාර්ගෝපදේශ බුදුදහමේ ඉගැන්වෙන පරිදි ලබා දෙන්නට දහම් අධ්‍යාපනය සමත් විය යුතුය.

ලොව පවත්නා සියල්ල නිරන්තර වෙනස්වීම් වලට භාජනය වන බව බුදුරජාණන් වහන්සේගේ දේශනයයි. එම සත්‍යය නූතන ලෝකය දෙස බැලීමෙන් තහවුරු වේ. මෙහි දී අනපේක්ෂිත අවස්ථාවන්ට මුහුණ දීමට ලොව ජීවීන්ට අනිවාර්යයෙන්ම සිදුවේ. එවැනි අවස්ථාවල දී ධර්මානුකූලව සිතා අභියෝගාත්මකව නැගී සිටීමට අනාගත පරම්පරාව දැනුවත් කිරීමේ භාරදූර කාර්යය දහම් පාසල් ගුරුභවතාට පැවරී ඇත. අටලෝ දහමින් කම්පා නොවීම, සතර අගතියෙන් තොරව කටයුතු කිරීම, චතුබ්‍රහ්ම විහාර අනුගමනයෙන් අනපේක්ෂිත අවස්ථාවන්ට මුහුණ දීමේ හැකියාව වර්ධනය කරගත හැකිය.

බෞද්ධ ඉගැන්වීම් මගින් යහපත් ජීවන රටාවක් ගොඩ නගා ගැනීමට අවශ්‍ය මූලික කරුණු බෞද්ධ අධ්‍යාපනයේ හඳුන්වා දී ඇත. නිවැරදි වෘත්තියක මැනවින් යෙදීමේ ඇති අවශ්‍යතාව බුදු දහම අවධාරණය කරයි. හිංසනය, සමාජ විරෝධී ක්‍රියා, දූෂණ, භීෂණ සමාජයේ නිරන්තර ගැටුම්වලට හේතු වේ. ඊර්ෂ්‍යාව, වෛරය මෙන්ම ඇත්ත ඇති සැටියෙන් නොදැන සිටීම ද, ආගමික පසුබිම නොසලකා හැරීම ද, නීති ගරුක නොවීම ද හේතු කොට ගැටුම් ඇති වේ. මෙසේ ඉටුවිය යුතු අරමුණු රාශියකි.

මේ අවස්ථා අවම කිරීමට බෞද්ධ අධ්‍යාපනයෙන් උපදෙස් සපයයි. යුක්තිය ඉටුකිරීම, සමාජ සාධාරණත්වය, එකිනෙකා අතර ඇති ගරුත්වය මැනවින් පවත්වා ගන්නට දහම් පාසල් ගුරුභවතාට සහය විය හැකිය. දහම් පාසල්

Not For Sale - CMSP

අධ්‍යාපනය මැනවින් ඉටුකිරීම තුළ මෙම අපේක්ෂාව ජයගත හැකි වේ. ශ්‍රී ලංකික බෞද්ධ උරුමයේ දායාද අනාගත පරපුරට පැවරීමේ දී දහම් පාසල් ගුරු භවතාට සුවිශේෂී වටිනාකමක් හිමි වේ.

මහින්දාගමනය හා දුමින්දාගමනය මුල්කොට ලංකාවේ ආරම්භ වූ සංස්කෘතික හැදියාව අපේ උරුමයකි. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සිව් බඹ විහරණය පාදකව සිංහල බෞද්ධයා කටයුතු කරන්නට අතීතයේම සිට හැඩගැසී ඇත. එහෙත් වර්තමානයේ මෙම කරුණු යම් තරමක හෝ නොසලකා හැරීමක් සිදුවී ඇතිදැයි සැක සිතේ. මේ තත්ත්වයන් මග හරවා ගැනීමට දහම් පාසල් ගුරුවරයාට පැවරී ඇති කාර්යය සුවිශේෂී වේ.

පන්සල හා බැඳුන ජීවිතය බෞද්ධයාගේ අවිච්ඡේදනීය වූවකි. ආගමික ශාස්තෘ ගෞරවය පෙරදැරිව, භික්ෂූන් වහන්සේලා හා එක්ව, උන්වහන්සේලාගේ අවවාද අනුශාසනා පිළිපදිමින් කටයුතු කිරීමේ ඇති වැදගත්කම සමාජගත කිරීමේ වගකීම දහම් පාසල් ගුරුභවතෙකු වන ඔබ සතුය.

අනුන් ගැන සිතන දයාව, කරුණාව පෙරදැරි කරගත් මානුෂික හදවතක් ඇති අනාගත පරපුරක් තනන්නට ඔබ දක්වන කැපවීම සම්බන්ධයෙන් ඔබ අනතිමානී විය යුතුය. ආගමික සහනශීලතාව, සහයෝගිත්වය, සමානාත්මතාව, අනතිමානී බව තහවුරු කරගැනීම බෞද්ධ අධ්‍යාපනයේ මග පෙන්වීම යටතේ සිදුකරගත හැකි ආකාරය වෙනුවෙන් මග පෙන්වන්නට ඔබ මග පෙන්වන්නෙකු විය යුතුය. බුදු සිරිත, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, ශාසනික වශයෙන් බැඳුන සෙසු ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශයට ගනිමින් එම චරිතයන්හි සුවිශේෂී ලක්ෂණ

Not For Sale - CMSP

තම ජීවිතය ගොඩනගා ගැනීම උදෙසා ළමා පරපුරට මග පෙන්වමින් කටයුතු කරන්නේ දහම් පාසල් ගුරුභවතා ය.

ශාසන ගෞරවය, විනය ගරුකත්වය ඇති කිරීම ආගමික අධ්‍යාපනයේ අපේක්ෂාවකි. එමගින් පෞරුෂයට හිමිවන්නේ ආලෝකයකි. සමාජ විෂමතාවන් බැහැර කිරීම උදෙසා බෞද්ධ මාර්ගෝපදේශ සමාජගත කිරීමේ වගකීම ඔබ සතු ය. ජාති, කුල, ගෝත්‍ර වැනි පටු ආකල්ප ඉවත දමා සමාජගත සියල්ලන් ම මනුෂ්‍යයන් ලෙස සලකා ඔවුන්ට වටිනාකම ප්‍රදානය කරන්නට බෞද්ධ අධ්‍යාපනයේ මග පෙන්වා ඇත. භෞතික වටිනාකම මෙන් ඉන් ඔබ්බට ගිය ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳව සැලකීමෙන් ධර්මානුකූලව හැඩගැසුණ පුද්ගලයකු සමාජගත කිරීමේ හා දැනුමෙන් පෝෂිත පුරවැසියකු තැනීමේ වගකීම බෞද්ධ අධ්‍යාපනික අරමුණුවලින් අපේක්ෂිත ය.

බෞද්ධ අධ්‍යාපන අරමුණු දහම් පාසල, දහම් පාසල් අධ්‍යාපනය හරහා සාක්ෂාත් කරගන්නට කටයුතු කිරීමට දහම් පාසල් ගුරුභවතා කටයුතු කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. බෞද්ධ අධ්‍යාපන අරමුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් දහම් පාසල් අධ්‍යායන කටයුතු සාර්ථකව මෙහෙයවන්නට ඔබ සමත් විය යුතුය.

**සුණාථ** - අසන්න

**ධාරේථ** - දරන්න

**චරාථ** - හැසිරෙන්න

Not For Sale - CMSP

# 03. දහම් පාසල් ගුරුවරයාගේ වගකීම හා වගවීම.

වගකීම හා වගවීම යන පද දෙකෙන් ම වගවීම යන පදය ඇතැම් කෙනෙකුට එතරම් හුරු පුරුදු පදයක් නොවේ. එහෙත් මේ පද දෙකේ කිසියම් සමානකමක් දැකිය හැකිය. එසේම ඒ පද දෙකේ අදහසෙහි ද කිසියම් සබඳතාවක් තිබෙන බව පෙනේ. ඕනෑම වෘත්තියක යෙදෙන සේවා දායකයෙකු වගකීමට හා වගවීමට බැඳී සිටී. රජයේ පාසලක සේවය කරන ගුරු භවතෙකුට මෙන්ම දහම් පාසල් ගුරු භවතුන් ද සේවය වෙනුවෙන් වගවීමට මෙන්ම වගකීමට ද බැඳී සිටී. ඔබ විවිධ අවස්ථාවන් හිදී නොයෙක් දේ සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන්ට හා ආයතන වලට වගකීම ඔබේ රැකියා අවශ්‍යතාවයකි.වැටුපක් දීමනාවක් ලබන වෘත්තිකයෙකු තමා ලබන වැටුප හෝ දීමනාව වෙනුවෙන් වැටුප් ගෙවන ආයතනයට හෝ පුද්ගලයන්ට තමා සපයන සේවය වෙනුවෙන් වගකිව යුතුය. එහෙත් තමා සපයන සේවය සම්බන්ධයෙන් වගවිය යුත්තේ තමාටම ය. එය බෙහෙවින්ම තම හෘදසාක්ෂියට සම්බන්ධ කරුණකි.එසේම සම්ප්‍රදාය,සිරිත් විරිත්, සංස්කෘතිය දරුවන්ට පවරා දීම දහම් පාසල් ගුරුවරයාගේ වගවීමයි. එසේම චර්යාවාදීන් දක්වා ඇති පරිදි චර්යාවේ පැහැදිලි වෙනසක් ඇති කිරීම ඔහුගේ වගකීමයි.

වගකීම හා වගවීම එකිනෙකට සම්බන්ධ බව මුලින් දක්වා ඇත. ගුරුවරයා තමාගේ වෘත්තිය වගකීම් මෙන්ම වගවීම් පිළිබඳව ද මනා අවබෝධයකින් කටයුතු කළ යුතුය. ගුරු සේවයට සම්බන්ධ වගකීම් රාශියක් ඇත. එම වගකීම් මෙන්ම යුතුකම් ද ඉටු කළ යුතුය. ඒවා නොපිරිහෙලා ඉටු කිරිමට ගුරුවරයා බැඳී සිටී. එය ගුරුවරයා සතු වගවීමයි. මෙම

Not For Sale - CMSP

වගවීම පන්ති කාමරයේ සිට ඉන් පිටතට ද ගුරු අරමුණ සාක්ෂාත් කර ගන්නා තෙක් ඉදිරියට ද පවත්වා ගතයුතු වෙයි. එය ගුරුවරයාගෙන් සිදුවන සේවය ඵලදායී වීමට හේතු වේ. ගුරු භූමිකාවට අයත් කාර්යයන් පිළිබඳව අවබෝධය මෙහිදී වැදගත් වේ. එසේම ඒ පිළිබඳව හැඟීමක් ද තිබිය යුතුය. තමා සිදුකරන සේවය අවබෝධයෙන් හා භක්තියෙන් කළ යුතුය. ඒ සඳහා තමා සුදුස්සෙක් වීමද අනිවාර්ය වේ. තුනුරුවන් ගුණ හඳුනාගත් සිසු දරුවෙකු දහම් පාසලෙන් සමාජගත කළ යුතුව ඇත.

ඒ සඳහා ගුරුභවතා

★ ආදර්ශවත් චරිතයක් ඇති තැනැත්තෙක් විය යුතුය.
★ දැනුමෙන් පිරිපුන් වීම වැදගත් වේ.
★ ශ්‍රද්ධා ගුණය තමා වෙත තිබීම වැදගත් වේ.
★ තම උතුම් සේවයට ගැලපෙන ලෙස ඇඳුමෙන් සැරසිය යුතුය. (පන්සලට,දහම් පාසලට ගැලපෙන ඇඳුම් )
★ හොඳ ගුරු පෞරුෂයක් ඇති කර ගත යුතුය.

තම වගකීම් හා වගවීම පිළිබඳව මනා අවබෝධයෙන් දහම් පාසලේ සේවය කළ යුතුය. එසේ වූ විට දහම් පාසල් සේවයේ අපේක්ෂා මැනවින් ඉටු වේ. දහම් පාසල් ගුරුභවතා අධ්‍යාපන අමාත්‍යාංශයට, ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයන්ට, අධ්‍යාපන නිළධාරීන්ට තම සේවය පිළිබඳ වගකිව යුතු නොවේ. එහෙත් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට, ප්‍රාදේශිය ශාසනාරක්ෂක බලමණ්ඩලයන්ට තම සේවය පිළිබඳ කිසියම්

Not For Sale - CMSP

වගවීමක් ඇති බව වටහා ගත යුතු වේ. රජයේ ගුරුවරයෙකු මෙන් ඔහු නීතිමය රාමුවකට කොටුවී නැත. දහම් පාසල් ගුරු භවතා වගවිය යුත්තේ තම හෘද සාක්ෂියටයි. ආගම දහමටයි. හුදු ශ්‍රද්ධාවෙන් ඉගැන්වීම් කාර්‍යයේ නියුතු වුවහොත් අපේ අරමුණ ඉටුවේ. ඒ නිසාම වෙනත් වෘත්තියක මෙන් වෘත්තීයමය වගකීමක් බැඳීමක් ඇතිකරගත යුතු නොවේ. ගුරු භවතා ඉගෙනුම් අවස්ථා පන්ති කාමරය තුළ නිර්මාණය කරන්නෙක් වේ. එහිදී ගුරුවරයා අවශ්‍ය පන්ති කළමනාකරණය කරගත යුතුය. එහි වගකීම ගුරුභවතා සතුය. ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම ගුරු භවතාගේ වගකීම වේ. ගුරුභවතා හා ශිෂ්‍යයා අතර සම්බන්ධතාවයන් මැනවින් පවත්වා ගැනීමේ වගකීම ද ගුරුභවතා සතුය. ගුරුවරයා හොඳ සංනිවේදකයෙක් විය යුතුය. එසේ ම ශිෂ්‍යයා ද මනා ග්‍රාහකයෙකු විය යුතුය. ගුරු භූමිකාවේ මනා සංනිවේදන කාර්‍යය සඵල වන්නේ එවිටය. ඉගෙනුම ගැන සඳහන් කරන අධ්‍යාපන විද්‍යාඥයින් ඉගෙනුම යනු චර්‍යාවේ වෙනසක් ඇතිකිරීම යනුවෙන් දක්වා තිබේ.

"ඉගෙනුම චර්‍යාවේ වෙනසක් ඇති කරන ක්‍රියාවලියකි"

(චර්යාවාදීන් )

දහම් පාසල් අධ්‍යාපනයට මෙම විග්‍රහය බෙහෙවින් අදාල වේ. දහම් පාසලේ අධ්‍යාපනය දරුවාගේ චර්‍යාවේ පූර්ණ වෙනසක් ඇතිකිරීමට සමත් විය යුතුය. එහි වගකීම දහම් පාසල් ගුරු භවතා මත පැවරේ. ඊට සමගාමීව ගුරු භවතා එම අරමුණ ඉටුකරදීමට සමත් පුද්ගලයකු වීම සඳහා අවශ්‍ය



Not For Sale - CMSP

වටපිටාව ගොඩනඟා ගත යුතුය. එහිදී ඔහු සාර්ථක ගුරුවරයකු වීම අවශ්‍ය වේ. රජයේ පාසල් ගුරුභවතෙකු වගකීමෙන් සේවය කරන්නේ ද යන්න විමසා බැලීමට ආයතනික මට්ටමින් විවිධ ඇගයීම් කරනු ලැබේ. (අධීක්ෂණ) රජයේ ගුරු භවතා විවිධ මානයන්ට යටත්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදවීම ගැන රජය ආයතන හා නිළධාරීන් වගකීමෙන් කටයුතු කළ යුතුය. ගුරුවරයා ද තම වෘත්තිය සම්බන්ධව සියලු අවශ්‍යතා මැනවින් සපුරා ගැනීමේ වගකීම දැරිය යුතුය.

සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේ ම නියමුවා ගුරුවරයා නිසා ඔහු සතු වගකීම් සම්භාරය ඉතා විශාලය. අධ්‍යාපනයෙන් බලාපොරොත්තුවන දරුවාගේ දැනුම, ආකල්ප කුසලතා වර්ධනය කිරීමේ සම්පූර්ණ වගකීම් භාරය ගුරුවරයා මත පැවරී ඇත. එම වගකීම් වෙනත් කෙනෙකු මත පටවා ගුරුවරයාට කිසිසේත් නිදහස් විය නොහැකිය. ශිෂ්‍යයා අධ්‍යාපන ක්‍රියාවලියේ හදවත ලෙස සලකා තිබුණද ඩේවිඩ් මැක්නමාරා අධ්‍යාපන විද්‍යාඥයා දක්වන හැටියට ගුරුවරයා අධ්‍යාපන ක්‍රියාවලියේ හදවතයි. ඒ නිසා ගුරුවරයා මත අධ්‍යාපනය සම්බන්ධයෙන් පැවරෙන වගකීම් සම්භාරය සුවිශේෂී වේ.

**වගවීම**

ගුරුභවතෙකු වශයෙන් තමන් වෙත පැවරී ඇති කාර්යභාරය මැනවින් ඉටු කිරිමේ වගවීම හිසින් දරා ගෙන දහම් පාසල් ගුරුභවතා තම සේවයේ යෙදිය යුතුය.රජයේ පාසලක ගුරුභවතෙකු කළමනාකරණ කමිටුවේ පටන් විදුහල්පතිට,අධ්‍යාපන නිලධාරින්ට,අමාත්‍යංශයට තම සේවය

Not For Sale - CMSP

පිළිබඳව වගවිය යුතුය. දහම් පාසල් ගුරුභවතාගේ වගවීම මෙයට බෙහෙවින් ම වෙනස් ය. දහම් පාසල් ගුරුභවතෙකු වශයෙන් තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් රාශියකි. ඒවා අඩුවක් නැතිව සම්පූර්ණයෙන් ඉටු කිරිමට දහම් පාසල් ගුරුභවතා බැඳී සිටී. ඒ සඳහා රජයේ පාසලක ගුරු භවතෙකුට මෙන් චක්‍රලේඛ ආයතන සංග්‍රහය දහම් පාසල් ගුරුභවතාට නැත.එහෙත් සියල්ලටම වඩා ඔහු තම සේවය හරියාකාරව ඉටු කිරීම ඔහු සතු වගවීමයි.

ඔහු වෘත්තීය වශයෙන් ජාතික, ආයතනික, දේශපාලනික,වගකීම් වලින් නිදහස් ය. 1991 යුනෙස්කෝ වාර්තාවකින් නිර්දේශ කර ඇති ගුරුවරයා සතු වගවීම වූ තම රටට තම සේවය අවංකව සපයන්නේ නම් එය තම සේවය පිළිබඳව වගවීම හා සම්බන්ධ වේ.

ගුරු භවතෙකු වශයෙන් තමන් වෙත පැවරී ඇති කාර්යභාරය මැනවින් ඉටුකිරීමේ වගවීම හා වගකීම සෑම ගුරුභවතෙකුට ම පොදු කරුණකි. වෘත්තීය වශයෙන් තමාගෙන් සිදුවිය යුතු සේවය ඉටුකිරීමට සේවාදායකයා බැඳීසිටී. තමා මෙහෙයවන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට, රජයට, සේවා ආයතනයට, තමන්ට පවරා දුන් කාර්යය ඉටුකිරීමට ඇති බැඳීම වගකීමයි. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ දී දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථකව සිදුකිරීමට අවශ්‍ය අවස්ථා නිර්මාණය කිරීම ගුරුභවතාගේ වගකීමයි. ඔහු දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දෙමාපියන්ට, රජයට, සේවය කරන ආයතනයට හා සමස්ත ප්‍රජාවට ම වගකිව යුතුය. අධ්‍යාපනය රාජ්‍ය ආයෝජනයක් වශයෙන් සලකන නිසා එම ආයෝජනයේ ප්‍රතිලාභ රටට ලැබෙන ආකාරයට

Not For Sale - CMSP

වෘත්තියේ යෙදීම, සේවය කිරීම, ගුරුභවතාගේ වගකීම වේ. සමස්ත ජාතියම අපේක්ෂා කරන අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලැබීමට වගකීමෙන් කටයුතු කිරීමේ වගකීම ගුරුභවතා වෙත වේ. විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමයක් රටේ පවතින නිසා විභාග ප්‍රතිඵල ගැන ගුරුවරයා වගකිව යුතු වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක භාවය මනිනු ලබන්නේ විභාග ප්‍රතිඵලවලින් නිසා සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට ගුරුවරු වගකිව යුතුය. හොඳම ප්‍රතිඵල ලබාගත හැකිවන අයුරින් අධ්‍යාපනය දීම ගුරුවරයා සතු වගකීමයි. සරලව සඳහන් කළහොත් දරුවාගේ අධ්‍යාපන ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව රජයේ ගුරුවරයා මව්පියන්ට, රජයට, ආයතනයන්ට, වගකිව යුතුය. දරුවන්ගේ වගකීම හොඳින් ඉගෙන ගැනීමයි. ගුරුකේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේදී දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වා ගැනීම කෙරෙහි විවිධ උපක්‍රම ආයතනික මට්ටමින් අනුගමනය කරනු ලබයි. නූතන අධ්‍යාපන ක්‍රමයේ දී ප්‍රමුඛත්වය ලැබෙන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයටයි. ඒ අනුව ගුරු භවතා උගන්වන්නෙක් නොව ඉගෙනුම් ක්‍රියාවලියේ දී දරුවාට මඟ පෙන්වන්නෙකි.

දහම් පාසල් ගුරුභවතාගේ වගකීම සම්බන්ධයෙන් පහත දැක්වෙන දෑ බෙහෙවින් වැදගත් වේ.

- සදාචාරාත්මක වගවීම
- ආයතනික වගවීම
- වෘත්තීමය වගවීම
- සංස්කෘතික වගවීම
- ජාතික වගවීම

Not For Sale - CMSP

මේ සියල්ල කැටිකරගත් විට ඔහු තම හෘද සාක්ෂියට වගවිය යුතුය. විශේෂයෙන් තම සේවය පිළිබඳව රජයේ ගුරුවරයකු නම් විවිධ ආයතන හා නිළධාරීන්ට තම සේවය පිළිබඳ විවිධ වාර්තා ඉදිරිපත් කළ යුතුය. ඉන් ගුරුවරයා තම සේවය නිසි පරිදි සිදුකිරීමට හදවතින් බැඳී සිටිය යුතුය යන්න ගම්‍ය වේ. එවන් වගකීම් රාශියක් අධ්‍යාපන විද්‍යාවේ දැක්වේ.

1. කොන්ත්‍රාත්තුමය වගවීම
2. වෘත්තීමය වගවීම
3. සදාචාරාත්මක වගවීම
4. මූල්‍යමය වගවීම
5. දේශපාලනමය වගවීම

ඉහත දැක්වෙන වගවීම් මාලාවෙන් දහම් පාසල් ගුරුභවතෙකු තම සේවය පිළිබඳව සදාචාරාත්මක වගවීමට පමණක් යටත්වේ. එයින් දහම් පාසල් ගුරුභවතා සිදුකරන උතුම් සේවයේ ගරුත්වය ආරක්ෂා වේ. එසේම ඔහුගේ සේවයේ ඵලදායීතාවය අපේක්ෂිත මට්ටමින් සම්පූර්ණ වේ. මේ නිසා දහම් පාසල් ගුරුභවතා තම උතුම් සේවයේ වගවීම් සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලක් දක්වමින් දහම් පාසල්ගුරු සේවයේ යෙදීමට අධිෂ්ඨාන කරගත යුතුය.

"වගකිව යුත්තේ අනුන්ටය, වගවිය යුත්තේ තමන්ටය "

Not For Sale - CMSP

# 04. දහම් පාසල් ගුරුවරයාගේ කාර්යභාරය

"ගුරුවරයා" යන වචනය කියැවෙන ඇසෙන හැමවිටම අපේ සිහියට නැගෙන්නේ අපට විවිධ විෂයන් ඉගැන්වූ, උගන්වන තැනැත්තා යන්නයි. අධ්‍යාපනය ලබා දෙන තැනැත්තා යන අරුත ඉන් කියවේ. "අධ්‍යාපනය" දෙන්නා ගුරුවරයා ලෙසත් "අධ්‍යයනය" කරන්නා ශිෂ්‍යයා ලෙසත් සාමාන්‍යයෙන් හඳුන්වනු ලැබේ. එහෙත් බුදු දහම ඇසුරෙන් විමසා බලන කල්හි ඉන් ඔබ්බට ගිය අදහසක් ද ගම්‍ය වේ. එනම් ප්‍රතිපත්තිය - ධර්මය - දර්ශනය ගුරුවරයා වන බවයි. ඒ අනුව පුද්ගලාර්ථය ඉක්මවන වන බව පැහැදිලිය. බුදුරදුන් ගුරු තනතුරෙහි තබා ගන්නා ලද්දේ ධර්මයයි.

ගුරුවරයා විවිධ විෂයන් උගන්වන අතර දහම උගන්වන ගුරුවරයා දහම් ගුරුවරයා යනුවෙන් නම් කළ හැකි අතර ධර්මය ඉගැන්විම ප්‍රධාන අරමුණ කරගත් පාසල්හි ගුරුවරයා දහම් පාසල් ගුරුවරයා යි. ඒ අනුව ධර්මය ඉගැන්වීම දහම් පාසල් ගුරුවරයාගේ ප්‍රධාන කාර්යය විය යුතුවේ.ඒ පිළිබඳ අවධානය ප්‍රධාන වශයෙන් යොමු කිරිමෙන් තොරව ඔහුගේ වගකීම් පිළිබඳව සලකා බැලිය නොහැකි වනු ඇත.

**දහම් අධ්‍යාපනය**

වසර සියයකට වඩා වැඩි ඉතිහාසයක් ලංකාවේ දහම් පාසල් වලට තිබේ. විශේෂයෙන්ම දහම් පාසල් අධ්‍යාපනයේ අරමුණ දරුවන්ට බුදු දහම ඉගැන්වීමයි. දහම කුමක් සඳහා ද ? දහම යනු කුමක්ද? පුද්ගලයාගේ චරිතය නිවැරදිව ගොඩනගා ගැනීම සඳහා ධර්මය අවශ්‍යය. ධර්මයෙන් තොරවූ විට මිනිසා



Not For Sale - CMSP

සතුනට වඩා විශේෂයක් නොමැත. ඒ අනුව ධර්මය යනු මිනිස්කම ඉස්මතු කිරීමට අවශ්‍ය ගුණාංගයෝ ය. ඊට අවශ්‍ය පදනම ආරම්භ කළයුත්තේ ශිෂ්‍ය අවධියේදීම ය. දහම් පාසල මගින් ඉටුකරනුයේ එම උතුම් කාර්යයයි.

අධ්‍යාපන ක්‍රියාවලිය විධිමත් අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය හා අවිධිමත් අධ්‍යාපනය යනුවෙන් ක්ෂේත්‍ර තුනක් ඔස්සේ සංවිධානය වී තිබේ. ඒ අතර නියමිත වයස් සීමාවක් සහිත විෂය නිර්දේශයන් සහිත, ඇගයීම් හා කිසියම් කාලසීමාවක් පවත්වාගෙන යන සමත් අසමත්වීම් සහිත එමෙන්ම ශ්‍රේණිගතව හා විභාග කේන්ද්‍රීයව පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනය වැඩපිළිවෙළ විධිමත් අධ්‍යාපන ගණයට අයත් වේ.

නොවිධිමත් අධ්‍යාපනය තුළ වුව ද ඉහත දක්වූ යම් යම් ලක්ෂණ පැවතිය හැකි වුව ද විවිධ නිර්දේශයන්ට සීමාවීමක් එහි දක්නට නොමැත. අනිවාර්යෙන්ම සහතිකයක් හිමිකර දීමක් හෝ ඊටම ප්‍රමුඛතාවය හිමිවීමක් නොවිධිමත් ක්ෂේත්‍රයේ අන්තර්ගත නොවේ.

එහෙත් අවිධිමත් අධ්‍යාපනය යම් ස්ථානයකින්, යම් විෂය මාලාවකින් හෝ කිසියම් කාල වකවානුවකින් යටත් වන්නා වූ අධ්‍යාපනයක් නොවේ. සීමා රහිත වූවකි. විවිධ අවස්ථාවන්හි දී, විවිධාකාරයෙන්, විවිධ වූවන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අවිධිමත් අධ්‍යාපනයෙන් දැනුවත් වේ. එය යාවජීව වූ අධ්‍යාපනයක් ලෙස අර්ථ දැක්විය හැකිය. රූපවාහිනිය, පුවත්පත් හා වෙනත් ජනමාධ්‍ය ඔස්සේ ද යම් සිදුවීම් හා ඒවාට ක්‍රියා - ප්‍රතික්‍රියා දැක්වීම මගින් ද මේ ඔස්සේ යම් ඉගෙනීමක් ලබාගත හැකිය. එසේ නම් දහම් පාසල් අධ්‍යාපනය මේ අතරින් කවර ගණයට අයත්වේ ද යන්න අපි දැන හඳුනා ගත



Not For Sale - CMSP

යුතුව ඇත. සරලව හැඳින්විය හැක්කේ විධිමත් තරම් විධිමත් නොවන්නා වූ අවිධිමත් තරම් අවිධිමත් නොවන්නා වූත් ස්ථානයක දහම් පාසල් අධ්‍යාපනය පිහිටා ඇති බවයි. එසේ අර්ථ දැක්වූ පමණින් විෂය නිර්දේශයක් - පාඨ ග්‍රන්ථ, විභාග, ඇගයීම්, යම් කාලවකවානුවක් නැත යන අදහසක් ඉන් ගම්‍යමාන නොවේ. එහෙත් ඉහත දැක්වූ යම් යම් ගති ලක්ෂණ සහිත වුවද හුදෙක් ඒවාට කොටු වූ - සීමාවූ බවක් දහම් පාසල් අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක නොවේ. දහම් පාසල් ගුරුවරයා සිය වගකීම් ඉටුකරනුයේ එම අවබෝධය මත පිහිටා සිටීමෙන් විය යුතුය.

වර්තමාන දහම් පාසල් අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයේ සියලු අංග හා ක්‍රියාකාරකම් ඇතුළත් කොට ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට දරන උත්සාහයක් දක්නට ලැබේ. මේ තත්ත්වය දිගු කාලීන වශයෙන් දහම් අධ්‍යාපනයේ අරමුණු පරමාර්ථයන්ට පටහැනි වූවකි. එමෙන්ම එය අනාගතයේ දහම් පාසල් අධ්‍යාපනය අවශ්‍ය නොවන තැනට යාමට වුව ද හේතු වියහැකි තත්ත්වයකි.

දහම් පාසල් අධ්‍යාපනය ලබන දරුවාගේ ඇඳුම - පැළඳුම වෙනස්ය. ඔහුගේ හැසිරීම් රටාව ද නිදහස් ය. පරිහරණය කරනු ලබන පාඨ ග්‍රන්ථ ඉතා සීමිතය. වර්ගීකරණයට අනුව අසමත් කිරීම් මෙහි දක්නට නැත. විධිමත් අධ්‍යාපනය ලබන ආකාරයෙන් ඒ සියලු පහසුකම්වලින් දහම් පාසල සමන්විත නොවේ. කොහෙත්ම පාසල හා සමාන ආකාරයකින් දහම් පාසල ක්‍රියාත්මක නොවිය යුතුය. මෑත භාගයේ සිට මේ සැසඳීම මගින් සමාන කිරීමට යම් වෑයමක් දරන බැවින් ඒ පිළිබඳව දහම් පාසල් ගුරුවරයා පරෙස්සම් විය යුතුය. සතියේ දින පහක් පාසලට ගොස් ඉගෙනුම ලබන

Not For Sale - CMSP

දරුවා දහම් පාසලට පැමිණෙනුයේ හයවෙනි දිනටත් පාසලට යන හැඟීමෙන් නොවේ. දහම් පාසල එවැන්නක් නොවේ. 1968 වර්ෂයේ ප්‍රකාශිත පූජ්‍ය හීනටිගල පියනන්ද, පූජ්‍ය ගින්නලියේ දේවසිරි යන ස්වාමීන් වහන්සේලාගේ සංස්කාරකත්වයෙන් පළවූ "දහම් පාසල් සේවය" නම් සඟරාවට ලිපියක් ඉදිරිපත් කරන ශාස්ත්‍රාචාර්ය ගෝනාපීනුවල පුඤ්ඤසාර නාහිමියෝ මෙසේ පවසති.

***"දහම් පාසල කියන්නේ ශුද්ධ ස්ථානයක් බවත් එයින් පිටවන ළමයි සාන්තුවරයන් බවත් හැඟෙන සේ දහම් පාසල සකස් කරන්නට පුළුවන්නම් එදාට රට බලාපොරොත්තු වන සේවාව ඉටුවනවා ඇත. "***

දහම් පාසල් අධ්‍යාපනය සම්බන්ධව හා ගුරුවරයාගේ කාර්යභාරය වඩාත් කාලීන හා මනාව සංවිධානය කර ගැනීමෙහි ලා එම අදහස අදට ද ඉතා අදාළ වන බව නිසැකය.

**සොබාදහමට සමීපවීම**

පාසල් අධ්‍යාපනයේදී විධිමත් පන්තිකාමරයක් තුළ සිසුන්ට ඉගැන්වීම කරනු ලැබේ. එහෙත් දහම් පාසල් පන්ති කාමරය යනු බොහෝ විට විහාරස්ථාන පරිශ්‍රයක පූජනීය ස්ථාන සමීපයෙහි හා ඒවා ඇසුරු කරගෙන පවත්වාගෙන යන්නකි. ස්වභාවික පරිසරයේ ද ආස්වාදය හා සෙවන ලබන, නිදහස්ව, බාධාවලින් තොරව, වඩාත් හෘදයාංගමව දහම් පාසල් අධ්‍යාපනය ලබාදීම අවැසිය. එසේ කළයුතු වන්නේ දහම් පාසල් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ වලට අනුකූලවය.



Not For Sale - CMSP

එවිට දහම් ගුරුවරයා සුහද - මිත්‍රශීලී ලෙන්ගතු මෙන්ම ශිෂ්‍යයාට සමීප අයෙකු බවට පත්වේ. ඔහු නීතිරීති වලින් හිර වූවකු නොවිය යුතු වේ. ඉන් අදහස් වන්නේ ඔහු වගකීමෙන් තොරවූවකු ය යන්න නොවේ. ශිෂ්‍යයාට ප්‍රබෝධමත් මනසක් පුබුදුවාලීම වෙනුවෙන් ඉන් ලැබෙන පිටිවහල අපමණ ය. විශේෂයෙන්ම පාරිසරික වශයෙන් ලැබෙන ආස්වාදය මනසේ සන්සුන් බව ඇතිකරලීම පිණිස බෙහෙවින්ම හේතු වේ. වීතරාගී උතුමන්ට පවා සුන්දර වූ පරිසරය එම තත්ත්වයට පත්වීම පිණිස හේතු වූ අයුරුත් උන්වහන්සේලා ඒ පරිසරය අගය කළ අයුරුත් බෞද්ධ ඉගැන්වීම්වල දක්වේ. විශේෂයෙන්ම අද පන්ති කාමරය පිරිසිදු වාතාශ්‍රයකට බොහෝවිට අවකාශ නොවූවකි. අධික තදබදයක් සමඟ ඉතා කෘත්‍රිම වූ වාතාවරණයක ශිෂ්‍ය ප්‍රජාව කොටුවී සිටිති. ගස් කොළන්වලින් සමන්විත ආස්වාදජනක පරිසය වෙනුවට දරුවන්ට අත්දකින්නට සිදුවී ඇත්තේ කොන්ක්‍රීට් වනාන්තර බඳු වටපිටාවකි. එබඳු වාතාවරණයක් පවතින තත්ත්වයක් යටතේ විහාරස්ථාන පරිශ්‍රයක නිදහස්ව තුරු සෙවණක -එළිමහන් පරිසරයක අකුරු කරන්නට තවමත් යම් පමණකට දහම් පාසල පිටිවහලක් වී තිබේ.මේ වටපිටාව උදාකර ගැනීමට දහම් පාසල් ගුරුවරයා හැකි සෑම විටම උත්සුකවීම අද වඩාත් අවශ්‍යය.

දහම් පාසල් ගුරුවරයා දහම් දැනුමෙන් මනාව සන්නද්ධ වීම අවශ්‍යය. විශේෂයෙන්ම බුදුදහම, ශාසන ඉතිහාසය හා බෞද්ධ සාහිත්‍යය පිළිබඳ මනා දැනුමක් ඇතිකර ගැනීම තම කාර්යය ඉතා ඵලදායීව හා නිර්මාණාත්මකව මෙහෙයවීමට බෙහෙවින් ඉවහල් වේ. විශේෂයෙන් සෞන්දර්ය ක්‍රියාකාරකම් ඔස්සේ ශිෂ්‍යයාගේ ආවේදනික කුසලතා ඉස්මතු

Not For Sale - CMSP

කරවීමට හැකිය. එමෙන්ම යහපත් ආකල්ප වර්ධනය කළ හැකිය. හෘදයාංගම හා සංවේදී වීමේ ප්‍රවණතා ද ඉන් සිදුවේ.

**ආදර්ශ සම්පන්න බව**

දහම් පාසල් ගුරුවරයා විෂය දැනුමෙන් දරුවන් දැනුවත් කිරීම අභිබවා ගොස් ආදර්ශමත් අයෙකුව ශිෂ්‍යයාට නිවැරදි මඟ පෙන්වන්නෙකුගේ කාර්ය ඉටු කළයුතුව ඇත. නූතන අධ්‍යාපන ක්ෂේත්‍ර ඔස්සේ විවිධාකාරයෙන් දැනුම පුළුල් කිරීමට බොහෝ අවස්ථා උදාවී තිබේ. එහෙත් දහම් පාසල් ගුරුවරයා ධර්මයෙන් සිය ජීවිතය ආදර්ශමත් කර ගත් මනා පෞරුෂයකින් යුතුව ජීවිතාදර්ශ සපයන්නෙකු වන්නේ නම් එය ඉතා අගනේය. ගැටුම් - අරගල හා අතෘප්තිකර වාතාවරණයක දරු පරපුරට ප්‍රබෝධමත් දිවියක් උදා කරලීමට ඉන් මඟ සැලසේ. යහපත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම එමගින් ප්‍රදර්ශනය වන්නේය.

බොහෝ විට සාමාන්‍ය අධ්‍යාපනය කේන්ද්‍ර වනුයේ දැනුමට ප්‍රමුඛතාව හිමිවන ප්‍රජානන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසාය. එහෙත් දහම් පාසල් අධ්‍යාපනය ඉලක්ක කරනුයේ ආවේදනික ක්ෂේත්‍රයට ය. එමෙන්ම ප්‍රායෝගික ජීවිතය තුළ යහපත් ආකල්ප වලින් යුතුව ක්‍රියාත්මක වන දියුණුවක් ඇති කිරීම උදෙසා ය. යහපත් ආකල්ප වර්ධනය මූලික අවශ්‍යතාවයක් වන බැවින් දහම් පාසල් ගුරුවරයා දහම් දැනුම හා අවබෝධය ලබාදිය යුත්තේ ඊට මූලික තැන ලබාදීමට හැකිවන ආකාරයෙනි. දහම් පාසල් ග්‍රන්ථ සම්පාදක වගකීම් දරන පුද්ගලයන් සේම ඊට මඟපෙන්වීම් කරනු ලබන බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය මේ සම්බන්ධ අවශ්‍ය පසුබිම විශේෂ අවධානයකින්



Not For Sale - CMSP

යුතුව නිර්මාණය කිරීමට උත්සුක විය යුතුවේ. ශිෂ්‍යයාට ඔරොත්තු නොදෙන තරම් විෂය කරුණු වලින් ගහණව පාඨ ග්‍රන්ථ සම්පාදනය නොවිය යුතු වේ. දහම ජීවිතයට සමීප වීම උදෙසා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට ප්‍රමුඛතාව හිමිවිය යුතුව ඇත. ඇගයීම වූ කලී දැනුම මිනුමට පමණක් සීමා නොවිය යුතුව ඇත.

ජීවිතය මනා පෞරුෂයකින් හෙබි දිවියක් බවට පත්කර ගතහැකි වන්නේ ප්‍රධාන වශයෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය පදනම්කොට ගෙනය. බෞද්ධ ජීවිතය, බෝධිසත්ව චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ආදර්ශ සම්පන්න ඉතිහාසය හා බුදුදහමින් සම්භාවිත වූ බෞද්ධ සංස්කෘතිය ඒ සඳහා අපට අනන්ත නිදසුන් සපයයි.

**දහම් ගුරුවරයා ගේ අනන්‍යතාව**

දහම් පාසල් ගුරුවරයා සිය කාර්යභාරය මුදලින් තක්සේරු නොකරයි. ඔහු කරනුයේ උතුම් සේවයකි. නිස්සරණාධ්‍යාශයෙන් ඔහු සිය වගකීම ඉටු කරයි. වසර සියයකට අධික කාලයක් මුළුල්ලේ දහම් පාසල් ගුරුවරයා ක්‍රියාකරන ලද්දේ එපරිද්දෙනි. වැටුපක් ලබන සේවයක් නොවේ. එය උතුම් ගරු සේවාවකි. එහෙත් කාල - දේශ වශයෙන් සිදුවන වෙනස්වීම් හමුවේ අධ්‍යාශය නිස්සරණ වුවද දහම් පාසල් ගුරුවරයා දිරිගැන්වීම කළයුතු වේ. එය වගකිව යුත්තන්ගේ යුතුකම වන්නේය. උතුම් ගරු සේවයක් ලෙස දහම් පාසල් ගුරුවරයා සිදුකරනුයේ මහත් පරිත්‍යාගයකි. ඔහු සිය දැනුම - අවබෝධය - කාලය හා ශ්‍රමය සමාජය වෙනුවෙන් කැප කරයි. එම පරිත්‍යාගය ගුරුවරයාට ඉතිරි කරනුයේ අපමණ සතුටකි. යහපත් ජනසමාජයක්, සදාචාර සම්පන්න

Not For Sale - CMSP

පරපුරක් බිහිකරලීම වෙනුවෙන් සාඩම්බර හා අභිමානවත් හැඟීම් ඔහුට ඉතිරි කරයි.

**දහම් අධ්‍යාපනයේ වෙනස**

පවත්නා සාමාන්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් අද ඇති වී තිබෙන්නේ ප්‍රශ්නාර්ථයකි. ඉන් යහපත් පුද්ගලයෙකු බිහිකළ හැක්කේ ද? යන්න සාකච්ඡාවට ලක්වී තිබේ. හුදෙක් දැනුම පමණක් ඉලක්ක කරගත් අධ්‍යාපනයකින් යහපත් මිනිසකු බිහිකරලීමට හැකිවේ ද? යන්න සාකච්ඡාවට ලක්වී පිළිතුරක් නැති - ගැලවීමක් නැති තත්ත්වයකට සමාජය ඇද දමා ඇත. මේ අධ්‍යාපන ක්‍රමයේ හිරකරුවන් බවට පත්වීමට දරුවන්ට පමණක් නොව දෙමාපියන්ට ද සිදු වී තිබේ. මේ තරගකාරීත්වයත් සමඟ මානුෂික හැඟීම්, මිනිස් ගුණ ක්‍රමයෙන් ගිලිහී යන්නට පටන් ගෙන තිබේ. විශේෂයෙන් ශිෂ්‍ය පරම්පරාව විවිධ මානසික හැල හැප්පිලිවලට පත්වෙමින් තිබේ. විවිධ රෝගාබාධයන්ට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ යමින් තිබේ. මානසික ආතතියට ගොදුරු වෙමින් පවතින බව මනෝ වෛද්‍යවරුන් ද ප්‍රකාශ කර ඇත. මේ තත්ත්වයත් සමඟ දරා ගැනීමේ හැකියාව ඇත් වෙමින් තිබේ. ඔරොත්තු දීමේ කුසලතා පලායමින් තිබේ. ඔවුනොවුන් හා එක්ව වාසය කිරීමට ඇති කැමැත්ත දුර්වල කරයි. සමාජගත වීම හීන කරයි. ඔවුනොවුන් ප්‍රියශීලි ඇසින් බැලීම ඈත් කරයි. ප්‍රබෝධමත් බව තුරන් කරයි. පරාර්ථකාමී හැඟීම් දුරස්කර ආත්මාර්ථකාමී වීමේ ප්‍රවණතා දක්නට ලැබේ. කණ්ඩායම් ගතවීමේ අවශ්‍යතාව හීන කරයි.

මෙවැනි ගැටලු වලට පිළියම් සෙවිය හැකි අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් දහම් පාසල් ගුරුවරයා මෙවැනි තත්ත්ව පිළිබඳ මනා අවදියකින් සිටිය යුතුය. තමා



Not For Sale - CMSP

වෙත හිමි නිදහස් බව මේවාට පිළිතුරු සෙවීම වෙනුවෙන් සිය කාර්යභාරයට එක්කරගත යුතුව ඇත. බෞද්ධ දර්ශනය අපව මෙහෙයවන්නේ පටිසෝතගාමී මගට පිවිසීම පිණිසය. දහම් පාසල් ගුරුවරයා ඉටු කරන සමාජ මෙහෙවර වඩාත් ඵලදායී වනුයේ පවතින සමාජ වාතාවරණය පිළිබඳ පුළුල් දෘෂ්ටියකින් දැකිය හැකි වීමෙනි. එම වටපිටාව අමතක කර සිය වගකීම් ඉටු කිරීමට දහම් පාසල් ගුරුවරයාට අවකාශ නැත.

දහම් පාසල් ගුරුවරයා ලොව දෙස, සමාජය දෙස, ප්‍රායෝගිකව විනිවිද දැකිය හැකි ලක්ෂණයන්ගෙන් සමන්විත වීම අවශ්‍යය. ඔහු ඉටු කරන සමාජ මෙහෙවර අර්ථවත් වනුයේ එසේ කිරීමෙනි. අනුකරණවාදී අධ්‍යාපන රටාවෙන් ඔබ්බට ගිය මනුෂ්‍යත්වය - පරාර්ථකාමීත්වය ඔප මට්ටම් කළ හැකි අධ්‍යාපන ක්‍රමවේදයක් බෞද්ධ අධ්‍යාපනයෙන් අපට උරුමකර තිබේ. ඒ යටගියාව යළි ඉස්මතු කර ගැනීමේ ක්‍රියාවලිය දහම් පාසල් ගුරුවරයාට විශේෂයෙන්ම සලකා බැලීමට සිදු වේ.

ඉන් අදහස් වනුයේ අපි ආපස්සට යායුතුය යන්න නොවේ. අතීතයට යා යුතුය යන්න ද නොවේ. ස්වභාවධර්මය හා බැඳුණු ගහකොළ - ඉරහඳ තාරකා - ඇළ දොළ ගංගා අගයන, පාරිසරික වටිනාකම් ඇගයීමට ශිෂ්‍යයා යොමු කිරීමේ වගකීම් දහම් පාසල මගින් යළි ආරම්භ කිරීමේ වගකීම අප දැරිය යුතුව ඇත.

ජීවිතයට සැපත සතුට සොම්නස උදාකර ගත හැක්කේ මහිච්ඡතාවයෙන් නොවේ. භෞතික බඩු භාණ්ඩ - මිළ මුදල් වැඩියෙන් රැස්කර ගැනීමෙන් හෝ අධික බලාපොරොත්තු ගොන්නක් කර පින්නාගෙන සිටීමෙන් එය ඉටුකර ගත නොහැකි ය. එසේ අතෘප්තිකර සමාජයකට අවැසි සාමාජිකයන් බිහිකිරීමට දහම් පාසල් ගුරුවරයා ඉදිරිපත්

Not For Sale - CMSP

නොවිය යුතුය. අනවරත තරගයක් ඔස්සේ ගොස් නොසතුට උදාකරන මඟ දැන් වෙනස් කළ යුතුව ඇත.

එකිනෙකා දෙස ප්‍රියශීලී ඇසින් බැලිය හැකි, ඔවුනොවුන්ට ගරු කරන -දැහිතකාමී, පරාර්ථකාමී හැඟීම් පෙළඹවීම් දහම් අධ්‍යාපනයෙන් ලබා දීමේ වගකීම් දහම් පාසල් ගුරුවරයා දැරිය යුතුව ඇත.

### නිදහස් ආගමික පරිසරය

දහම් පාසල් ගුරුවරයාට මේ සඳහා අවශ්‍ය පූර්ණ නිදහස හා අවබෝධය - දැනුම බෞද්ධ අධ්‍යාපනයෙන් හිමිකර දී තිබේ. දහම් පාසල් ගුරු භූමිකාව ක්‍රියාත්මක විය යුතුව ඇත්තේ එපරිද්දෙනි.වාර සටහනට - දින සටහනට -විෂය නිර්දේශයට - විභාග සමත් කිරීමට, ලකුණු පසුපස එකිනෙකා පරයා හඹා යෑමට, තරගකාරීත්වයට දහම් ගුරුවරයා කොටු වී නොමැත. නොමැති විය යුතුය. ඔවුන්ගෙන් ප්‍රදර්ශනය වනුයේ යාන්ත්‍රික බවක් හෝ කෘත්‍රිම බවක් නොවේ. ඔහු සිය ඉගැන්වීම් නිදහස් වාතාවරණයක සිට මෙහෙයවිය හැකි තත්ත්වයට පත්වීම අවශ්‍යය. ඔහුගේ එකම අරමුණ විභාග සමත් කිරීම ම නොවේ. එකිනෙකා අභිබවා යෑමට උත්සාහ ගන්නාවූ තරගයට සිසුවා යොමු කිරීම ඔහුගේ කාර්යය නොවේ.

බොහෝ විට විහාරස්ථානය හා තුනුරුවන් ඇසුරු කරගෙන පවත්වනු ලබන දහම් පාසල් භූමිය ශිෂ්‍යයාට, ගුරුවරයාට මහත් ආශිර්වාදයකි. ආගමික වතාවත්වලට ප්‍රමුඛතාව ලබාදී උදාකර දෙන ක්‍රියාකාරකම් ශිෂ්‍යයා තුළ සන්සුන් බව, විධිමත්බව, සංවිධානාත්මක බව, පටුවාද භේද දුරලා ඇති වන එකමුතු බව, සමානාත්මතාව, ළමා මනසේ සටහන් වීම භාග්‍යයකි. දයාව, කරුණාව, සෙනෙහස, ආදරය,

Not For Sale - CMSP

පරිත්‍යාගශීලී බව, සෞන්දර්ය රසාස්වාදය, සුන්දර පරිසරයේ ආස්වාදජනක බව අගයන ජීවන අත්දැකීම් තම ජීවිතය සරු කර ගැනීමට ඉවහල් වන හැඟීම් ජනිත කර ගත හැකිය.

**කාලීන අවශ්‍යතාව**

වර්තමාන සමාජ වාතාවරණය තුළ දහම් පාසල් ගුරුවරයාගේ අවශ්‍යතාව වඩාත් දැනෙන්නට පටන්ගනු ඇත. සුවිශේෂ වශයෙන්ම පූර්ණ පෞරුෂයකින් හෙබි තෘප්තිමත්, ප්‍රබෝධමත්, දරුවෙකුට අවශ්‍ය අත්තිවාරම ගොඩ නැංවීම පිණිස සිය මෙහෙවර ඉටු කිරීමට දහම් ගුරුවරයා උත්සාහ විය යුතුව තිබේ.

වර්තමාන ලාංකික සිසු පරපුර විභාග මානසිකත්වය, ඔරොත්තු නොදෙන තරම් වැඩ කටයුතු, සතුට සොම්නස පලායෑම, විවිධ කායික - මානසික පීඩාවන්ගෙන් ගහණවීම ආදිය සිසුන් වෙත කර ඇති බලපෑම් අපමණය. මේ තත්ත්වය තීව්‍රකරන හා ඊට අනුබල දෙන, ඊට අනුකූල වූ ඒ මග යෑමට පෙළඹවීම් දහම් පාසල් අධ්‍යාපනයෙන් අවම කළ යුතුව ඇත. මෙම උතුම් කාර්යය දහම් පාසල් ගුරුවරයාගෙන් ඉටුවිය යුතුම වූ කාලීන අවශ්‍යතාවකි.

Not For Sale - CMSP

# 05. ඉගැන්වීමේ ඉගෙනීමේ සම්පත්

ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට උපකාර කරගත හැකි කවර හෝ සාධකයක් අධ්‍යාපන සම්පතක් ලෙස හැඳින්වීමට පුළුවන.

අප මෙහිදී උත්සාහ දරන්නේ දහම් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යේදී දහම් පාසල, ඒ ආශ්‍රිත පරිශ්‍රය මෙන්ම ඉන් බැහැර දී ලබාගත හැකි සම්පත් මොනවාද යන්න සොයා බැලීමත් ඒවා භාවිතයට ගතහැකි අවස්ථා හඳුනාගැනීමත් ය.

යාවජීව අධ්‍යාපන ක්‍රියාවලියක් වෙනුවෙන් එයට ශක්තිය ලබා දීම සඳහා සම්පත් භාවිතය අත්‍යවශ්‍ය සාධකයකි. නව දැනුම සොයා යන්නට පෙළඹෙන ශිෂ්‍යයාට සම්පත් භාවිතය මගින් පෙන්වීමට කටයුතු සැලැස්වීම ඉතා වාසිදායකය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ගැටලු හඳුනාගෙන ඒවා විසඳාලීමට කටයුතු කිරීමේ දී අපට අප සමීපයේ ඇති සම්පත් පිළිබඳ වැටහීමක් තිබිය යුතුය.

මෙහි දී අප සම්පත් හඳුනාගැනීම හා ඒවා කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ඇතැම් විට අපට සම්පතක් වන යමක් සම්බන්ධයෙන් අපට වැටහීමක් නොමැති විය හැකිය. ඒ නිසාම එය සම්පතක් වශයෙන් භාවිතයට ගැනීමට අප නොදැන සිටිනවා විය හැකිය. ඒ නිසා අප කළ යුත්තේ අවස්ථාවට අනුරූප ව සම්පත් හඳුනාගෙන ඉන් ප්‍රයෝජන ලබා ගැනීමයි.

පළමු වෙන්ම අප කළ යුත්තේ අප වටා ඇති සම්පත් හඳුනා ගැනීමයි. ඒවා පහසුව තකා මෙසේ බෙදා දැක්විය හැකිය.

Not For Sale-CMSP

- භෞතික සම්පත්
- මානව සම්පත්
- ආයතනික සම්පත්
- මූල්‍ය සම්පත් වශයෙනි.

ඉහත බෙදා දැක්වීමට අනුව අප සතු සම්පත් මොනවාදැයි වටහාගත හැකිය. ඒ අනුව දහම් පාසල සතු ආශ්‍රය සම්පත් පිළිබඳ වර්ගකර ගැනීමක් කරගැනීමට හැකිවනු ඇත. අප සතුව ඇති මෙම සම්පත් අවස්ථාවෝචිතව සැලසුම් සහගතව භාවිතයට ගැනීමට කටයුතු කිරීම ඉතාම ඵලදායක කාර්යයක් වනු ඇත.

දහම් පාසල ද දිනපතා පාසල් හි ඇති බොහොමයක් සම්පත්වලින් සමන්විතය. එහි දී දහම් පාසලේ ඇති සම්පත් ප්‍රමාණය දිනපතා පාසලේ භාවිතවන සම්පත් වලට වඩා අඩු බවට මැසිවිලි නැගේ. එහෙත් අප වෙතින් ගිලිහී ඇති සම්පත් මැනවින් හඳුනා ගෙන භාවිතයට යොදා ගත හොත් අධ්‍යාපනික කාර්යය ප්‍රියජනක එකක් කරගත හැකිය.

දහම් පාසල් අධ්‍යාපනයේ දී භාවිතයට ගතහැකි සම්පත් හඳුනාගෙන ඒවා විධිමත්ව හා ඵලදායකව යොදා ගනිමින් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව සිදුකරන්නට උත්සුක වෙමු.

පළමු කොට අපි පන්ති කාමරය සතු භෞතික සම්පත් මොනවාදැයි බලමු. සාමාන්‍ය හුණු පුවරුව (කළුලෑල්ල) මෙන් ම විශේෂ වශයෙන් සකස් කරන ලද හා සකස්කර ගත හැකි පුවරු භෞතික සම්පත් වශයෙන් පන්ති කාමරය සතුය. චිත්‍ර,

Not For Sale - CMSP

වගු, පාඩම් සාරාංශ ලියා දැක්වීම් ප්‍රදර්ශනයට මෙම පුවරු භාවිත කළ හැකිය.

බිත්ති පුවත්පත පන්ති කාමර සම්පතකි. විවිධ දැනුම් ඒකක පිළිබඳව වන නිර්මාණ මෙහි ප්‍රදර්ශනය කළහැකිය. මෙහි ප්‍රදර්ශනය සඳහා ලිඛිත මෙන්ම වෙනත් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යොදාගත හැකිය.

භූගෝලීය වැදගත්කමකින් යුතු කරුණු පන්ති කාමරයේ සාකච්ඡා කරන අවස්ථාවල ඉගෙනුම් ආධාරකයක් ලෙස සිතියම් භාවිත කළ හැකිය. විශේෂයෙන් ඉතිහාසගත කරුණු මෙන්ම රාජ්‍යතාන්ත්‍රික කරුණු පහදා දීමට ද මෙම සම්පත භාවිත කළ හැකිය.

රැස්කරන ලද ස්වාභාවික වස්තු මෙන් ම නිර්මාණය කරන ලද සම්පත් ද පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයට ආධාර කරගත හැකිය. සමහර විට දහම් පාසල් පරිශ්‍රය සතු පෞරාණික වැදගත්කමකින් යුතු පුරා විද්‍යාත්මක වස්තූන් විය හැකිය. නැතහොත් ඒ අනුසාරයෙන් නිර්මාණය කරන ලද අනුරූ විය හැකිය. ඉගැන්වීම් කාර්යයේ දී මේවා සම්පත් ලෙස යොදා ගැනීම වැදගත් ය.

ප්‍රහේළිකා විසඳීම, උපදේශාත්මක ක්‍රීඩා සම්පත් වශයෙන් භාවිත කිරීම මගින් සිසුන්ගේ තර්කන ශක්තිය මෙන් ම සාමූහික ක්‍රියාකාරකම් හි වැඩි වර්ධනයක් ද ඇතිකර ලීමට අවස්ථාව සලසාගත හැකිය.

පුස්තකාලය දහම් පාසලක් සතු වටිනාම ඉගෙනුම් සම්පතකි. සෑම දහම් පාසලක් ම ආශ්‍රය කොට පවතින විහාරස්ථානය සතුව පුස්තකාලයක් හෙවත් පොත්ගුලක් පවතී. විවිධ පොත පත භාවිතයට දරුවා යොමු කිරීම අතිශය වැදගත්

Not For Sale - CMSP

ය. පුස්තකාලය භාවිතයෙහි ඇති වැදගත්කම පහදා දීම මගින් කියවීමේ රුචිය දරුවා තුළ වර්ධනය කළ හැකිවනු ඇත.

දෘෂ්‍යාධාර භාවිතයේ දී තාක්ෂණික උපකරණ පිළිබද ව වූ සම්පත් දහම් පාසලේ නොවුවත් එයට වඩා වැදගත් කමෙන් ඉහළ අගයක් සහිත සම්පත්වලින් දහම් පාසල පොහොසත් ය. බුද්ධ මන්දිරය, චෛත්‍ය රාජයන් වහන්සේ, බෝධීන් වහන්සේ හා බෝ මළුව, විහාර සිතුවම්, පියගැට පෙළ, සඳකඩ පහණ, ඇතුළත් වූ විවිධ කලාත්මක නිර්මාණ දහම් පාසල සතුව පවතී. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී මෙම සම්පත් භාවිතයට ගැනීම දහම් පාසල් ගුරු භවතාගේ වගකීමකි.

දහම් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මානව සම්පත ඉතා වැදගත් එකක් වේ. විවිධ දක්ෂතා ඇති ගුරු භවතුන් මෙන්ම ශිෂ්‍යයෝ ද පන්ති කාමරයේ සිටිති. ඔවුන්ගේ හැකියා, දක්ෂතා ඇති උපයෝගි කොට ගෙන ඉගෙනුම් කාර්යයට සම්පත් සපයා ගත හැකිය. ඒ මගින් සිසු දැනුම, ආකල්ප, කුසලතා, සංවර්ධනයට කටයුතු කළ හැකිවේ. විශේෂ විෂය කරුණු ඉගැන්වීමේ දී ව්‍යක්ත පඬිවරයකුගේ සහය ලබාගත හැකිය. එමෙන්ම ආචාර්ය මණ්ඩලයේ සහෝදර ගුරු භවතෙකුගේ සහය වුවද මේ සඳහා ලබා ගන්නට අවස්ථාව ඇත. අදාළ විෂය කොටස් පිළිබඳ විශාරද දැනුම මේ මඟින් ලබාගත හැකිය.

ආයතනික සම්පත් සම්බන්ධයෙන් පෙර ද කරුණු දක්වා ඇත. පුස්තකාලය ආයතනික සම්පතකි. සමහර ලිපි ලේඛන, දත්ත පත්‍රිකා, දෘව භාණ්ඩ, භූමිය වැනි දෑ ආයතනික සම්පත් වේ. මේවා නිසි අයුරින් පරිහරණය කරමින් ශිෂ්‍ය සාධනය වැඩි දියුණු කරන්නට පුළුවන.

Not For Sale - CMSP

දහම් පාසලෙන් බැහැර වූ සම්පත් කෙරෙහි ද අප අවධානය යොමු කළ යුතුය. දහම් පාසල් පරිශ්‍රයෙන් බැහැර ඇති සම්පත් හඳුනාගෙන ඒවා ඵලදායක සම්පත් ලෙස භාවිත කරන්නට යොමු වීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායක කරගත හැකිය. එම අවස්ථාවන් කිහිපයක් මෙසේ නම් කළ හැකි වුවත් එවැනි සම්පත් ගුරුවරයාගේ දක්ෂතාව හා කැපවීම මත හඳුනාගත හැකි වනු ඇත.

- උයන් වතු
- කුඹුරු යාය
- ගංගා, ඇළ දොල
- මුහුදු වෙරළ
- කඳු ආශ්‍රිත ප්‍රදේශ
- කුරුළු උයන්

එමෙන්ම විවිධ හැකියා, දක්ෂතා ඇති ස්වාමීන් වහන්සේලා, ගෘහ නිර්මාණ ශිල්පීන් , ගොවියා, වෛද්‍යවරයා, විවිධ විෂය ප්‍රවීනයන් හඳුනා ගෙන අවශ්‍ය අවස්ථාවන් හි සම්පත් ලෙස භාවිත කළ හැකිය.

ඉගෙනුම් සම්පත් භාවිත කිරීම නිසා ගුරුවරයකු වශයෙන් අපට ලැබෙන පහසුව මෙන්ම ශිෂ්‍යයාට ප්‍රබෝධාත්මකව සිය ඉගෙනුම සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ඉඩකඩ සැලසේ.

ඒ අනුව

- නිශ්ක්‍රිය රටාවෙන් මිදී සක්‍රිය ඉගෙනුම් රටාවක් සම්පාදනය වේ.
- ශිෂ්‍යයන් ක්‍රියාකාරකම් පාදකව දැනුම සොයා යන්නට පෙළඹේ.
- ඉගෙනීම තෘප්තිමත් එකක් බවට පත් වේ.



Not For Sale - CMSP

- සුභග හා පසුබට සිසුන් ක්‍රියාකාරකම් හි යෙදෙමින් තම දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට පෙළඹේ.
- සිසුන් පර්යේෂණාත්මක අධ්‍යනයට පෙළඹේ.

සාර්ථක ඉගැන්වීමක් සඳහා ඉගෙනුම් සම්පත්වල ඇති වටිනාකම දන ඒ උපයෝගී කරගනිමින් ඉගැන්වීමෙහි යෙදෙමු.

Not For Sale - CMSP

# 06. පාඩම් සැලසුම් කිරීම

අතීතයේ ඉතාම සාර්ථක දේශීය අධ්‍යාපන ක්‍රමයක් මෙරට ක්‍රියාත්මක විය. බෞද්ධ දර්ශනය අනුව ගොඩනැගුනු එම අධ්‍යාපන සම්ප්‍රදාය ක්‍රියාත්මක කිරීමේ මූලිකත්වය ගෙන කටයුතු කළේ විහාරස්ථානයයි. දැනුම එක්රැස් කිරීම දැනුම බෙදා දීම සඳහා සංවිධානය වූ එම පරිසරය විහාරස්ථානය සතුව අදත් ඒ ආකාරයෙන්ම පවතී. ඒ පසුබිම වත්මන් දරුවාගේ දහම් අධ්‍යාපනය සංවර්ධනයට ඉතා යෝග්‍ය ලෙස භාවිතා කළ හැකි ය. විධිමත් පාසල, පාසල් දරුවා වෙනුවෙන් ඉගෙනුම් ආධාරක නිර්මාණය කරගත යුතු වුවත් දහම් අධ්‍යාපනයට අවශ්‍ය බොහෝ අංග ප්‍රායෝගිකව ම විහාරස්ථානය සතුවීම පාඩම් සැලසුම් කිරීමට විශාල පහසුවකි.

දරුවාට තමන් පැහැදිලි කරන කරුණු වඩා පහසුවෙන් වටහා දීම සඳහා පාඩම් සැලසුම් කිරීමේදී ඒ සඳහා ඉතා හොඳ නිදහසක් දහම් ගුරු උතුමන් වෙත හිමි වී ඇත. පෙළ පොතට හෝ ගුරු අත්පොතට සීමා නොවී තම දැනුම කුසලතා උපයෝගී කර ගනිමින් වඩා හොඳින් තම පාඩම සංවිධානය කිරීමට පුළුල් දැක්මක් බුදු දහම තුළ පැවතීම එයට හේතු වේ.

දරුවාගේ දැනුම, ආකල්ප, කුසලතා, වර්ධනයට අවශ්‍ය පසුබිම පාඩම තුළින් මතුකර ගැනීමට නම් ඒ සඳහා හොඳ පාඩම් සැලසුමක් ගුරුවරයා සතුවිය යුතුය. විශේෂයෙන් කෙටි කාලයක් තුළදී මේ අරමුණු ජයගැනීමට සැලසුම්කරණය අත්‍යවශ්‍ය වනු ඇත.

එහිදී දරුවා සමග පාඩමට පිවිස කරුණු පැහැදිලි කරදෙන අතර දරුවා තුළ ඇති කළ යුතු ආවේදන ඇති කිරීම ඔබ අතින් සිදුවිය යුතු ය. එසේම ඒ දැනුම දරුවා තුළ ස්ථාවර

Not For Sale - CMSP

ලෙස තහවුරු කිරීම හා එය ඒ ආකාරයෙන් සිදුවී ද නැද්ද යන්න විමසා එසේ නැතිනම් ඒ සඳහා ප්‍රතිකාරක ක්‍රියාමාර්ග ද අනුගමනය කළ යුතුව ඇත. ඔබ පාඩම අවසන් කළ යුත්තේ දරුවාගේ දැනුම පරීක්ෂා කිරීමෙන් හා ප්‍රතිපෝෂණ අවස්ථා ඇතිකිරීමෙන් අනතුරුව ය.

පාඩම් සැලසුම් කිරීමේදී පාඩම සංවර්ධනයට ඉතා හොඳ පරිසරයක් විහාරස්ථානය සතුව ඇත. බෝ මළුව, විහාරය, චෛත්‍යය ධර්ම ශාලාව, දහම් පුස්තකාලය, දාන ශාලාව හා නිසංසල පරිසරය ගුරුවරයාට තම පාඩම ඉතා හොඳින් සංවිධානය කර ගනිමින් වඩා නිරවුල් දැනුමක් දරුවාට ලබාදීමට මනාව උපයෝගකර ගත හැකි ය.

චරිත කතාවක් පාරිසරික කතාවක් මෙන්ම ගැඹුරු දහම් කරුණු කියාදෙන අවස්ථාවලදී බෝමළුව, විහාරගෙය කොතරම් හොඳින් යොදාගත හැකි ද යන්න ඔබේ අවධානයට ලක්විය යුතුය. සරලව සලකා බැලීමේදී පෙනී යන්නේ දහම් පාසල් පෙළ පොතේ ඇති පාඩම් ඉතා හොඳින් පැහැදිලි කිරීමට, පාඩම මනාව සැලසුම් කර ගැනීමට ප්‍රායෝගික ස්ථාන විශාල ප්‍රමාණයක් විහාරය සතුව පවතින බවයි.

පාඩම් සැලසුම් කිරීමේදී ලිවීම මෙන්ම කියවීම කථනය හා ශ්‍රවනය (ඇහුම්කන් දීම) සඳහා දරුවාට අවස්ථාව ලබාදිය යුතු ය. මේ සියලුම අංග සෑම පාඩමකදීම යොදාගත නොහැකි වුවත් මෙයින් වැඩි අංග ප්‍රමාණයක් පාඩම සංවර්ධනයට යොදා ගැනීමෙන් ඉගැන්වීම සජීව හා සක්‍රිය ක්‍රියාවලියක් බවට පත්කර ගැනීමට ඔබට හැකිවනු ඇත.

Not For Sale - CMSP

## පාඩම් සැලසුම් කිරීමේදී

1. දහම් පාසල් දින දර්ශනය හා වාරය තුළ ඇතුළත් විශේෂ සිද්ධි
2. ජාතික නිවාඩු දින
3. දහම් පාසල ක්‍රියාත්මක කරන විශේෂ වැඩසටහන්

පිළිබඳ අනිවාර්යෙන් අවධානය යොමු කළ යුතුය. එසේම පන්තියට අදාළ පෙළ පොතෙහි අඩංගු පාඩම් මාලාව ඉගැන්වීමට ඔබට ලබා දෙන කාලච්ඡේද ප්‍රමාණය අනුව ප්‍රධානාචාර්යතුමන් සමග සාකච්ඡා කර අවශ්‍ය සැලසුම් සකස්කර ගැනීම ද වඩා සාර්ථක දැනුමක් දරුවාට ලබා දීමට හේතු වේ. ඔබට ඇති කාලය අනුව වාර ඒකක ලෙස බෙදා වෙන්කර ගැනීම සාර්ථක පාඩම් සැලසුම්කරණයට උපකාරී වේ.

දහම් පාසල් අධ්‍යාපනයෙන් ප්‍රධාන ලෙස අපේක්ෂා කරන්නේ ඉදිරි ජීවිත කාලය තම ආගමික පසුබිම අනුව ජීවත් වීමට අවශ්‍ය ආකල්ප දරුවා තුළ තහවුරු කිරීමයි. එය ඉතා සැලසුම් සහගතව ඉටු කිරීම සාමය සමගිය සපිරි අනාගතයක් වෙනුවෙන් ඔබේ යුතුකම ඉටු කිරීමක් ද වනු ඇත.

Not For Sale - CMSP

# 07. ඉගෙනුම් උපාය මාර්ග

ඉගැන්වීමේ ක්‍රමවේදය තුළ අපේක්ෂිත අරමුණ වන්නේ ශිෂ්‍යයා තුළ ස්ථාවර චර්යාත්මක වෙනස්වීමක් ඇති කරලීම යි. දහම් පාසලට පැමිණෙන දරුවා බෞද්ධ ආචාර ධර්ම අනුගමනය කරන යහපත් පුද්ගලයා තුළ චර්යාමය වෙනස්කමක් ඇතිකරලිය හැක්කේ ඉගැන්වීම තුළින් වන නිසා යි. මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් යන අංග දෙකේ අනෙක් ප්‍රධාන සාධකය වන්නේ ඉගැන්වීමේ උපාය මාර්ග හා ක්‍රම ශිල්ප යි. ඒනිසා දහම් ගුරුවරයා තුළ ඉගැන්වීමේ ක්‍රම ශිල්ප පිළිබඳ හොඳ දැනුමක් ද තිබිය යුතු ය. එයට අවශ්‍ය ක්‍රමවේදයන් ද ඇති කරලිය යුතු ය. දැනුම ලබා දීමේසාර්ථක ම ක්‍රමවේදය අනුගමනය කළ ගුරුවරයා වන්නේ අප අමාමෑණී බුදුරජාණන්වහන්සේ ය.ඒ උතුම් මග අනුගමනය කරන බෞද්ධයකු බවට දරුවා පත්කිරීමේ වගකීම දහම් ගුරුභවතුන් අතින් ඉටුවිය යුතු වගකීමකි. එබැවින් ඒ උතුම් දහම පිළිබද දරුවන්ට අවබෝධව ලබාදෙන දහම් ගුරුවරයකු වශයෙන් බුදු දහමේ ඉගැන්වීමේ ක්‍රම ශිල්ප ගැන මනා අවබෝධයක් අප ගොඩනගා ගත යුතු ය. දහම් පාසල් පොත්පත් ගත් විට එහි අඩංගු පාඩම් වල ද බුදු දහමේ ඉගැන්වෙන ක්‍රම ශිල්ප හා ක්‍රමවේදයන් දැකිය හැකි ය.

ඒ අනුව බුදු දහමේ දක්වා ඇති දැනුම ලබා දෙන ප්‍රධාන ක්‍රමවේද අතර බුදු හිමියන් විසින් අනුගමනය කර ඇති ඉගෙනුම් ක්‍රම ශිල්ප ගණනාවක් ඇත. ඒ අතරින්,

1. ඒකංස ව්‍යාකරණ (දේශනා ක්‍රමය)
2. පටිපුච්ඡා ව්‍යාකරණ (ප්‍රශ්නෝත්තර ක්‍රමය)



Not For Sale - CMSP

3. විභජ්ඣවාදී ව්‍යාකරණ (සාකච්ඡා ක්‍රමය)
4. ඨපනීය ව්‍යාකරණ (තුෂ්නිම්භූත ක්‍රමය)

යන ක්‍රමවේදයන් බහුල ලෙස ව්‍යවහාර කර ඇති බව බෞද්ධ සාහිත්‍ය හැදෑරීමේදී දැකිය හැකි ය.

**දේශනා ක්‍රමය (ඒකංස ව්‍යාකරණ)**

බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීම් අතර දැකිය හැකි ක්‍රමවේදය කි  දේශනා ක්‍රමය.මෙහිදී සිදුවන්නේ යම් කිසි මාතෘකාවක් පාදක කරගෙන එම මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීමයි. මෙම ක්‍රමවේදය අදත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ දී බහුලව යොදා ගනී. එසේම ඇතැම් විට පාසල් වල ද මෙය අනුගමනය කරනු ලබයි. එහෙත් මෙම ක්‍රමවේදය දහම් පාසල් වල ද අනුගමනය කළ හැකි ය. බුද්ධ චරිතය, පුද්ගල චරිත, විශේෂ දේශනා හෙවත් සූත්‍ර දේශනා ආදී පාඩම් විග්‍රහ කිරීමේ දී මෙම දේශනා ක්‍රමය අනුගමනය කළ හැකි ය. එපමණක් නොව දහම් පාසල් 6 ශ්‍රේණියේ සිට ධර්මාචාර්ය විභාගය දක්වා ඉගැන්වීමේ සෑම පාඩමක් සඳහා ම මෙම දේශනා නැමැති ඉගැන්වීමේ උපාය මාර්ගය ඉගැන්වීමේ ක්‍රම ශිල්පයක් හැටියට භාවිතා කළ හැකි ය. බුදුරජාණන් වහන්සේ මෙම ක්‍රමවේදය ඉගැන්වීමේ ක්‍රම ශිල්පයක් හැටියට උන්වහන්සේගේ මංගල ධර්ම දේශනාව වන පිරිත් පොතෙහි එන ධම්ම චක්කපවත්තන සූත්‍ර දේශනාව ඉන් එකකි. තවද මජ්ඣිම නිකායේ එන චූල්ලහත්ථි පදෝපම සූත්‍රය ද මෙම දේශනා ක්‍රමය යටතේ කාර්යයෙහි නියුක්ත වී ඇති සැටි පැහැදිලි වේ. තවද මහාහත්ථි පදෝපම සූත්‍රය වැනි සූත්‍ර ද ආදී ත්‍රිපිටක සාහිත්‍යය තුළ බහුලවම දැකිය හැක්කේ මෙම දේශනා

Not For Sale - CMSP

ක්‍රමවේදය යටතේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසටම ධර්ම දේශනා කර ඇති බවයි.

**ප්‍රශ්නෝත්තර ක්‍රමය (පටිපුච්ඡා ව්‍යාකරණ)**

ප්‍රශ්නෝත්තර ක්‍රමවේදය නම් ප්‍රශ්නයකට ප්‍රශ්නයෙන්ම උත්තර දීමයි. මෙම ක්‍රම වේදයද අපට දහම් පාසල් ගුරු කාර්‍යයේ දී භාවිතා කළ හැකි ය.

කෙසේ ද යත් බුදු දහමට අදාළ කරුණු ඉගැන්වෙන බැවින් මෙම ක්‍රම ශිල්පයද අනුගමනය කළ හැකි ය. මෙම ක්‍රම වේදය වඩාත් පැරණි ඉගැන්වීමේ ක්‍රමවේදයක් හෙවත් වෛදික සාහිත්‍යයේ සිට පැවත ගෙන එන්නක් වුවත් එය ඉතා හොඳින් භාවිතයට ගනිමින් තම දහම ශ්‍රාවකයන්ට අවබෝධ කර දීම සඳහා එම ක්‍රමය භාවිතා කර ඇත්තේ තථාගත බුදුරජාණන් වහන්සේ විසිනි. අද මේ ක්‍රමවේදය බහුල වශයෙන් බොහෝ දෙනා පන්ති කාමර ඉගැන්වීමේ දී භාවිතා කරනු ලබන්නකි. වඩාත් මෙම ක්‍රම ශිල්පය භාවිතා කරනු ලබන්නේ වඩාත් කරුණු කාරණා මතකයේ තබාගනු පිණිස ය. යම් කිසි ගැටලුවක් වේ නම් එය හාරා අවුස්සා විමසා දැන ගත හැකි ය. එනිසා මෙම ඉගැන්වීමේ ක්‍රම ශිල්පය සංවිධානාත්මක සම්භාවයෙන් යුක්ත වන්නකි. එනිසා මෙම ක්‍රම ශිල්පය යටතේ දහම් කරුණු ඉගැන්වීම මනා පහසුවක් වනු ඇත. නිදසුනක් වශයෙන් ගෙනහැර දැක්වුව හොත් පිරිත් පොතෙහි එන සච්ච විභංග සූත්‍රය මෙම ක්‍රම ශිල්පය යටතේ සැකසුනකි. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ අතර චතුරාර්‍ය සත්‍ය පිළිබඳ මනා සංවාදයකින් යුක්ත ය. තවද දැනුම උරගා බැලීමකි. එසේම මජ්ඣිම නිකායේ චුල්ල වේදල්ල සූත්‍රය ද මෙයට නිදසුනකි.

Not For Sale - CMSP

එනිසා දහම් පාසල් පොත්පත් වල ද ඇත්තේ ධර්මය වන බැවින් මෙම ක්‍රමවේදය ද අපට භාවිත කළ හැකි ය.

**විභජ්ඣවාදී (සාකච්ඡා ක්‍රමය)**

යම් කිසි කරුණක් කොටස් වශයෙන් හෝ අංග වශයෙන් හෝ වෙන්කර ඉන් එක් එක් අංගයන් වෙන් වෙන් වශයෙන් වෙන්කර දක්වමින් පැහැදිලි කිරීම විභජ්ඣවාදී ඉගැනුම් ක්‍රමයයි. මෙම ඉගෙනුම් ක්‍රම ශිල්පය බෞද්ධ සාහිත්‍යයේ බහුලව දැකිය හැක. කෙසේදයත් බුදුදහමේ ඉගැන්වෙන බොහෝ ධර්ම කරුණු ඇත්තේ කොටස් කොටස් වශයෙනි. එනිසා එම කරුණු ඉගැන්වීමේ දී මෙය භාවිතා කළ හැකි ය. උදා : චතුරාර්‍ය්‍ය සත්‍ය වැනි කරුණු ඉගැන්වීමේ දී මෙම ක්‍රමය භාවිතා කළ හැක. කොටස් වශයෙන් බෙදා දැක්විය හැකි නිසා ය. තෙවන ධර්ම සංගායනාවේදී තීර්ථකයන් නෙරපා හැරීමේ දී ඔවුන්ගෙන් විමසා සිටියේ ද බුදුරජාණන් වහන්සේ කිනම් වාදියෙක් ද? යන්නයි' එහිදි අනුගමනය කරගත් න්‍යාය වූයේ බුදුරදුන් විභජ්ඣවාදී බවයි. ඒ අනුව විභජ්ඣවාදී කියන පිරිස රඳවා ගැනීමත් අන් අය නෙරපා හැරීමත් යන්නයි ' ඒ අනුව විභජ්ඣවාදී ක්‍රමය හෙවත් සාකච්ඡා ක්‍රමය අනුගමනය කළ අය ඉතිරිකර ගැනීමත් තුළින් පැහැදිලි වනුයේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීමේ ක්‍රමය වනුයේ විභජ්ඣවාදී ඉගගෙනුම් ක්‍රම ශිල්පය බවයි.

මෙම ඉගැන්වීමේ ක්‍රමවේදය බෞද්ධ සාහිත්‍යයේ දැකිය හැක ය. නිගණ්ඨනාථපුත්තතුමාගේ ආගම ඇදහූ උපාලි පිරිවැජියාට ධර්මය අවබෝධ කරනු ලැබුවේද මෙම උපාය මාර්ගය අනුගමනයෙනි. එසේම මිළිඳු නාගසේන සංවාදය



Not For Sale - CMSP

ගත්තත් මිලින්ද ප්‍රශ්නය නැමැති ග්‍රන්ථය ද සම්පූර්ණ වශයෙන් අනුගමනය කර ඇත්තේ මෙම ඉගැන්වීමේ ක්‍රම වේදයයි. එනිසා බෞද්ධ සාහිත්‍ය පුරාම මෙම ක්‍රමවේද අනුගමනය කොට ඇත්තේ එම ක්‍රම ශිල්ප වඩාත් තාත්වික වන නිසා ය.

**ඨපනීය ව්‍යාකරණ (තුෂ්නිම්භූත ක්‍රමය)**

මෙම ක්‍රමවේදයන් පන්ති කාමර ඉගැන්වීමේ ද භාවිතා කළයුතුම ක්‍රමවේදයකි. සමහර විට ඇතැම් ළමයි වැඩකට නැති ප්‍රශ්න ඇසිය හැකි ය. සමහර විට පිළිතුරු දිය හැකි ඒවා ද විය හැක. සමහර විට පිළිතුරු දිය නොහැකි ද විය හැකි ය. එබඳු අවස්ථාවකදී මෙය අනුගමනය කළ යුතු ක්‍රම වේදයකි. බුදුරජාණන් වහන්සේ මෙම ඉගැන්වීම් ක්‍රම ශිල්පය භාවිතා කොට ඇත්තේ වච්ඡගොත්ත හිමියන් විසින් අසන ලද ප්‍රශ්න වලට උත්තර නොදී සිටි අවස්ථා ඇත. එය හේතු ඵලධර්මය ගැන විමසන විටදී උන්වහන්සේ දේශනා කළ හේතු ඵල ධර්ම ප්‍රතිවිරුද්ධ සේ කරුණු විමසන විට මෙසේ නිහඬ බව අනුගමනය කර ඇත්තේ ද ඉගෙනුම් ක්‍රමවේදයකි.

බෞද්ධ සාහිත්‍යයේ එන මෙම ඉගෙනුම් ක්‍රමවේදයන්ට අමතරව පහත සඳහන් ඉගනුම් ඉගැන්වීම් ක්‍රම ශිල්ප ද දරුවා දහම හා සමීප කරවීමටඅපට භාවිතා කළ හැකි ය.

**බුද්ධි කලම්බනය**

බුද්ධි කලම්බනයෙන් අදහස් වන්නේ යම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් සිසුන්ට ඉදිරිපත් කොට එය හැකි තාක් ප්‍රතිචාර දැක්වීමට ඉඩ සලස්වීමයි. ඒ අනුව බුද්ධි කලම්බනය පියවර වශයෙන් ද භාවිතා කළ හැක. කල්පිත අදහස් ඉදිරිපත් කිරීමෙන් ප්‍රශ්නය ගැටලුවට අදාළ කරුණු විමසා දැන ගත හැකි



Not For Sale - CMSP

ය. බුද්ධි කලම්බනය ඇති කරලීම සඳහා බුදුරදුන් භාවිතා කළ අවස්ථාවන් වන්නේ චුල්ල පන්ථක හිමියන්ට සුදු රෙදි කැබැල්ලක් දී (රාජෝ හරණ) ආදී වශයෙන් මෙනෙහි කිරීමට දීම තුළින් ඔහුගේ මනස අවදි කරලීමයි. එනිසා මෙම ක්‍රමවේදය ද සාර්ථක ඉගැනුම් ක්‍රමවේදය කි.

එසේම මෙම ඉගැන්වීම් ක්‍රමවේදයට අමතරව බෞද්ධ ඉගැන්වීම් ක්‍රම ශිල්ප විශාල ප්‍රමාණයක් පවතී. බෞද්ධ ධර්මය ඉගැන්වීම් සඳහා බෞද්ධ ඉගැන්වීම් ක්‍රමවේද අනුගමනය කරන්නේ නම් වඩාත් අගනේ ය.

1. හවුල් ඉගැන්වීම් ක්‍රමය
2. කේවල ඉගැන්වීම් ක්‍රමය
3. අනාවරණ ඉගැන්වීම් ක්‍රමය
4. කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමය

ආදී ක්‍රමවේද දහම් දැනුම ලබාදීමේ දී සාර්ථකව දරුවාට දහම් දැනුම ලබා දීම සඳහා භාවිතයට ගත හැකි ය.

Not For Sale - CMSP

# 08. ඉගෙනුම් ආධාරක

ඉගෙනුම් ආධාරක භාවිතා කිරීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා සාර්ථක හා පහසු එකක් කර ගත හැකි ය. ඉගෙනුම් ආධාරක භාවිතය ඉගෙනුම ප්‍රායෝගිකව කෙරෙන්නක් නිසා ඒ දැනුම දරුවා තුළ ස්ථාවර වන්නේ නිතැතිනි.

වචන භාවිතා කරමින් පාඩම කියාදීම සාර්ථක ඉගැන්වීම් ක්‍රමයක් නොවේ. ඔබ ලබා දෙන දැනුම දරුවාගේ ඉන්ද්‍රිය සියල්ලටම ගෝචර ලෙස සිදුකළ හැකි නම් එය ඉතා ඵලදායී ඉගැන්වීමක් වනු ඇත. එක් එක් ඉන්ද්‍රියන් ගෙන් ලබන අවබෝධය එකිනෙකට වෙනස් වේ. ඉගැන්වීම් කාර්යේ දී ඉගෙනුම් ආධාරක භාවිතා කරනු ලබන්නේ වඩාත් අවබෝධයෙන් පැහැදිලිව හා නිරවුල්ව දැනුම ලබාදීමට ය. ඒ අනුව,

1. ඉගෙනුම් තාත්වික කිරීමට
2. පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවීම
3. සිසුන් ක්‍රියාකාරී කරවීමට
4. සංකීර්ණ සංකල්ප සරල කොට ඉගැන්වීමට
5. පාඩම සරල කොට ඉගැන්වීමට
6. ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සම්බන්ධය වැඩි වීමට
7. කාලය අඩුකර ගැනීමට

ඉගෙනුම් ආධාරක උපකාරී වේ. තමා ලබාදෙන දැනුමට ගැළපෙන ඉගෙනුම් උපකරණ නිවැරදි ලෙස භාවිතා කිරීමට

Not For Sale - CMSP

ගුරුවරයා අවධානය යොමු කළ යුතු ය. පාඩම අදාළව භාවිතා කළ යුතු ආධාරකය කුමක් ද යන්න තීරණය කළ යුත්තේ ගුරුවරයා විසිනි. විහාරස්ථානය සතුව ඉතා හොඳ ඉගෙනුම් ආධාරක විශාල ප්‍රමාණයක් පවතී. ඒවා නිවැරදිව භාවිතා කිරීමේ හැකියාව දහම් ගුරුතුමාට ඇත. නිදසුනක් වශයෙන් වන්දනා ගාථා පාඩමක් නම් එය මනාව පැහැදිලි කළ හැකි ක්‍රමවේදයක් හැටියට විහාර ගෙට ගොස් වන්දනා කරන ආකාරය කියා දී එය සාර්ථකව ඉටු කළ හැකි ය. එමෙන්ම අනගාරික ධර්මපාලතුමා ගැන පාඩමකදී එතුමාගේ රූපයක් ගෙන පෙන්වා එතුමා ගැන ලියූ ලිපි පොත්පත් ආදිය හැකිතාක් රැස් කරන්නට පැවරීම හා සංවිධානය කොට ඒ හරහා වඩා දැනුමක් ලබාදීමට උත්සහ කරන්නේ නම් ඉගෙනුම් ආධාරක භාවිතා කිරීමකි.

මෙහි දී තමන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග රැසකි. දහම් පාසල් අධ්‍යාපනය තුළ දී බුද්ධ චරිත කථා, චරිත කථා ආදී අවස්ථාවන් වල දී විහාරස්ථානයේබුද්ධ මන්දිරයේ ඇති චිත්‍ර භාවිතා කරමින් එය ආධාරක කරගෙන ඉගැන්විය හැකි ය. ප්‍රබල වශයෙන් භාවිතා කළ හැකි ආධාරක හැටියට දාගැබ, විහාර ගෙය, බෝධි මළුව, ධර්ම ශාලාව, වැලි මළුව, සදකඩපහණ මෙන්ම ත්‍රිපිටකය ඇතුළු ධර්ම ග්‍රන්ථ ඇති ධර්ම පුස්තකාලය නිසංසල පන්සල් පරිසරය පෙන්වා දිය හැකි ය. එසේම වර්තමාන අධ්‍යාපනයේ භාවිතයට ගැනෙන පහත දැක්වෙන

1. පෙළ පොත
2. කළුලෑල්ල
3. ඡායා පිටපත්

Not For Sale - CMSP

4. ඡායා රූප
5. චිත්‍ර
6. පෝස්ටර්
7. සිතියම්

ආදී දෘෂ්‍යාධාර ද භාවිතා කළ හැකි ය.

එසේම

- ශබ්ද තැටි
- කැසට් පටි
- ගුවන් විදුලිය භාවිතා කළ හැකි ය.

අතීතයේ පටන් බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ විහාරස්ථානයයි. ඒ නිසා ආරම්භයේ පටන් විහාරස්ථානයේ සෑම අංගයක්ම සකස් වී ඇත්තේ අධ්‍යාපනය, අවබෝධය, විද්‍යාර්ථයන් තුළ පහසුවෙන් ඇති කරවන ආකාරයෙනි. ඒ යහපත් පරිසරය හොඳින් භාවිතා කරමින් ඔබ සෙවනේ දහම් දැනුම ලබන දරුවා තුළ වඩා හොඳ නිවැරදි දැනුමක් ස්ථාවර කිරීමට මේ උතුම් විහාර පින් බිම මනාව භාවිතයට ගැනීමට උත්සාහවත් වන්න.

Not For Sale - CMSP

# 09. දහම් පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ඉගැන්වීමේ උපාය මාර්ග සහ ශිෂ්‍ය සාධනය ඇගයීම

දස දහසකට අධික ශ්‍රී ලංකේය දහම් පාසල් පද්ධතිය මඟින් ඉටු කෙරෙන ජාතික ආගමික සහ අධ්‍යාපන මෙහෙවර ශ්‍රී ලාංකීය සමස්ත ප්‍රජාවගේ ගෞරවයට සහ ප්‍රසාදයට පත් වී ඇත. තම දරුවන්ට දහම් අධ්‍යාපනය ලබාදීම වර්තමාන බොහෝ දෙමව්පියන්ගේ ප්‍රබල අවශ්‍යතාවක් වී ඇත. සිය වටිනා කාලය ශ්‍රමය හා දැනුම දරුවන්ගේ දහම් දැනුම සහ සහජීවන පුරුදු සංවර්ධනය කිරීම සඳහා ස්වේච්ඡාවෙන් කැප කරන දහම් පාසල් ගුරුවරුන් ද ලාංකික ප්‍රජාවගේ ඇගයීමට හා ගෞරවයටම පාත්‍ර විය යුතු ය. එසේ ම ඔවුන්ගේ වෘත්තීය කුසලතා ප්‍රගුණ කිරීමට ඉඩලැබෙන වැඩ සටහන් ශාස්ත්‍රීය ලිපි ලේඛන හා මග පෙන්වීම් ලබාදීම ද අවශ්‍ය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මැනවින් පවත්වා ගැනීම ගුරුවරයාගේ මූලික වගකීමකි. ඒ සඳහා වඩාත් ඵලදායී ඉගැන්වීමේ උපාය මාර්ග තෝරා ගැනීමට සහ භාවිතයට ගුරුවරයා සමත් විය යුතු ය. සෑම ඉගැන්වීමේ කටයුත්ත ම මනෝ විද්‍යාත්මක සාධක සහ අධ්‍යාපන මූලධර්ම මත පදනම් වේ. විශේෂයෙන් ම ළමා සංවර්ධනය ට අනුකූල වීම, ශිෂ්‍ය ළැදියා හැකියා සහ අවශ්‍යතාවලට සුදුසුවීම අනුක්‍රමික ව සරල පියවරේ සිට භූමිකාව ඉදිරිපත් කිරීම යන කරුණු සලකා බැලිය යුතු ය. ශිෂ්‍ය ක්‍රියාකාරී සහභාගීත්වය ලබාගැනීමට ද සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද තෝරා ගත යුතු ය. වර්තමානයේ පෙරදිග මෙන් ම අපරදිග ද විද්වතුන් පිළිගත් ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රම බොහොමයක් බුදුරදුන් විසින් සියවස් විසි පහකටත් පෙර භාවිතා කරන ලද එසේ ම විවිධ

Not For Sale - CMSP

සූත්‍ර දේශනා තුළින් ප්‍රකට කෙරෙන ඒවා ය. මෙහි දී අපගේ විශේෂ අවධානය යොමු කරන්නේ දහම් පාසල් ගුරුවරුන්ට අනුගමනය කළ හැකි ඒ සඳහා සුදුසු ඉගැන්වීමේ උපාය මාර්ග කිහිපයක් පිළිබඳව ය. දහම් අධ්‍යාපනය මඟින් මූලික වශයෙන් අපේක්ෂා කරන්නේ දහම් දැනුම දරුවන් වෙත සම්ප්‍රේෂණය කිරීම තමා සහ තම පරිසරය නිවැරදිව අවබෝධ කරගත් උතුම් දරු පරපුරක් බිහිකිරීම ය. ඒ නිසා දහම් පාසල් ගුරුවරයාගේ භූමිකාව එයට අනුකූලව පැවතිය යුතු ය. කුමන ආකාරයේ ඉගැන්වීමේ උපාය මාර්ග භාවිත කළත් පළමුව ගුරු ආදර්ශය මඟින් ගුරුවරයා ලබාදෙන අවාචික සන්නිවේදනය සියලු ඉගැන්වීමේ උපාය මාර්ග වලට මහත් ආලෝකයක් වන්නේ ය.

කෙබඳු ඉගැන්වීමකට වුව ද පළමුව අපේ මතකයට නැගෙන්නේ දේශන ක්‍රමය යි. බුදුන් වහන්සේ මෙන් ම පෙරපර දෙදිග විවිධ දාර්ශනිකයෝ මූලික ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස දේශන ක්‍රමය යොදා ගත්හ. එහෙත් දේශකයාගේ ඉගැන්වීම වචන වලට සීමා නොවී විවිධ උදාහරණ, උපමා, නිදර්ශන වලින් පෝෂිත විය යුතු ය. ඇසූ දේ අමතක නොවන්න ට දෘෂ්‍ය අත්දැකීම් ලබාදීමට පුළුවන. ඛේමා බිසවගේ කථා පුවත, නන්ද තෙරුන්ගේ කථා පුවත, සිංසපා සූත්‍රයේ සිද්ධි වලින් උන්වහන්සේ දෘශ්‍යාධාර භාවිත කළ අයුරු පසක් වේ. සරල උදාහරණයක් ගත හොත් ධම්මපදය පුරාම විවිධ උදාහරණ උපමා භාවිතා කොට ඇත. ඒ මගින් ව්‍යුක්ත සංකල්පය වුව ද සංයුක්ත තත්ත්වයට ගෙන ඒමට ගුරුවරයාට අවස්ථාව ලැබේ.

ගුරුවරයාගේ කථන විලාසය, ඉරියව්, අභිනය, හැඟීම් ප්‍රකාශය යන සියල්ල දේශන ක්‍රමය වඩාත් හරවත් කිරීමට උපස්ථම්භක වේ. දේශන ක්‍රමය මෙන් ම සාකච්ඡාව ද



Not For Sale - CMSP

ඉගැන්වීමේ උපාය මාර්ගයක් ලෙස යොදා ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ ද නොයෙක් බමුණන්, රජවරුන්, ගෘහපතියන් සමග කළ සාකච්ඡා ත්‍රිපිටක සාහිත්‍ය තුළින් පැහැදිලි වේ. සෝණදණ්ඩ, සච්චක වැනි බමුණන් කෝසල, අජාසත්ත වැනි නරපතියන්, අනේපිඬු, උපාලි වැනි ගෘහපතියන් සමග කළ සාකච්ඡා හා එම අවස්ථාවන් හි සාධිත ඉගෙනුම්වල වත්මන් ගුරුවරුන්ට හොඳ මගපෙන්වීමක් කරයි.

කතන්දර ක්‍රමය ද ඉගැන්වීමේ උපාය මාර්ගයක් ලෙස ඵලදායී ලෙස යොදාගත හැකි ය. කතන්දර ඇසීම ලොකු කුඩා කවුරුත් කැමති ය. ඒ නිසා ඉගෙනුම් ලාභියා තුළ හොඳ අවධානයක් ස්වයං පෙළඹීමක් කතන්දර ඇසීමට ඇති බව අපි දනිමු. ඇතැම් පාඩම් ඉගැන්වීමේ දී මෙම ක්‍රමය භාවිත කිරීමට ගුරුවරයාට පුළුවන. විෂ්ණු ෂර්මන් පඬිවරයා ලියූ පංචතන්ත්‍රය, ඉගෙනීමට අසමත් කුමාරවරුන් තිදෙනෙකුට රාජ්‍ය පාලන මූලධර්ම ඉගැන්වීමට මගපෙන්වූ කදිම ග්‍රන්ථය කි. එයින් පැහැදිලි වන්නේ කතාන්දර ක්‍රමය ගැඹුරු මූලධර්ම පවා ඉගැන්වීමට හේතුවන බව ය. ප්‍රශ්න ක්‍රමය ද ඉගැන්වීමේ ප්‍රබල උපාය මාර්ගය කි. ත්‍රිලක්ෂණය වැනි ගැඹුරු සංකල්පයක පවා බුදුරදුන් පස්වග භික්ෂූන් වහන්සේලාට පැහැදිලි කළේ ප්‍රශ්න ක්‍රමයෙන් බව අනත්ත ලක්ඛණ සූත්‍රයෙන් ප්‍රකට වේ. බුද්ධ චරිතයේ විවිධ අවස්ථා අධ්‍යයනය කරන විට කතන්දර ක්‍රමය සහ ප්‍රශ්න ක්‍රමය භාවිත කළ අවස්ථා අපට හමු වේ. ලෝක නිර්මාණය පිළිබඳ බෞද්ධ ආකල්පය මැනවින් ඉදිරිපත් කළ අග්ගඤ්ඤ සූත්‍ර දේශනාව, කූටදන්ත සූත්‍රයේ එන රාජ්‍ය පාලනය පිළිබඳ සුවිශේෂ කරුණු ඇතුළත් කථා පුවත ද කතාන්දර ක්‍රමය අවස්ථාචෝචිතව බුදුරදුන් භාවිත කළ අයුරු අපට පෙන්වා දෙයි.



Not For Sale - CMSP

අනාවරණ ක්‍රමය සහ පැවරුම් ක්‍රමය දහම් පාසලේ ඉගැන්වීමේ දී භාවිතා කළ හැකි සුවිශේෂ ඉගෙනුම් උපාය මාර්ග දෙකකි. අවශ්‍ය මඟ පෙන්වීමකින් පසු පොතපත ඇසුරින් හෝ ක්‍රියාකාරකමක් මගින් කරුණු තමන් විසින් ම අනාවරණය කරගත් විට වඩාත් හොඳින් ධාරණය වේ. ඉහළ ශ්‍රේණිවල සිසුන් සඳහා බොහෝ කරුණු සූත්‍ර දේශනා ඇසුරින් අනාවරණ කරගැනීමට අවස්ථා සලසාදිය හැකි ය. උදාහරණ වශයෙන් චුල්ලකම්ම විභංග සූත්‍රය මගින් කර්මය පිළිබඳ මූලධර්ම අනාවරණයට අවස්ථා සැලසිය හැකි ය. බුදු සිරිත සම්බන්ධ බොහෝ තොරතුරු සූත්‍ර දේශනා ඇසුරින් අධ්‍යයනයට යොමු කළ හැකි ය. සිසුන්ට විෂය කරුණු ආශ්‍රිතව ක්‍රියාකාරී හෝ ලිඛිත පැවරුම් ලබා දී ඒ සම්බන්ධ තොරතුරු සෙවීමට යොමු කළ හැකි ය. සිසුන්ට විවිධ මාර්ග ඔස්සේ පැවරුම සඳහා කරුණු රැස්කළ හැකි ය. වැඩිහිටියන්ගෙන්, ඇසුරු කිරීමෙන්, නිරීක්ෂණයෙන්, සමීක්ෂණයෙන් තොරතුරු රැස්කිරීමට හැකි ය. එසේ තමන්ගේ උත්සාහයෙන් කරුණු සොයාගත් විට ඒවා ක්‍රමවත්ව ලේඛනගත කළ විට වඩාත් හොඳින් කරුණු ධාරණය වේ. බුදු පියාණන් වහන්සේ ද කිසා ගෝතමියට මරණය පොදු ධර්මතාවක් බව දැනගන්නට සැලැස් වූයේ ඒ පිළිබඳ අනාවරණයට සැලසීමෙනි. චුල්ලපන්ථක තෙරණුවන්ට අනිත්‍ය සංකල්පය අවබෝධයට සැලැස් වූයේ පැවරුමක් මඟිනි.

මේ අනුව විවිධ පාඩම් සඳහා සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ගුරුවරයාට භාවිතා කළ හැකි ය. විශේෂයෙන් ම සිසුන් තුළ පෙළඹීමක් ඇති වන පරිදි උගත් කරුණු හොඳින් ධාරණය වන පරිදි ශිෂ්‍යයා තුළ චර්යාමය වෙනසක් ඇතිවන

Not For Sale - CMSP

පරිදි අවස්ථාවෝචිතව විවිධ ඉගෙනුම් - ඉගැන්වීම් උපාය මාර්ග තෝරා ගැනීමට ගුරුවරයා සමත් විය යුතු ය.

ක්‍ෂුද්‍ර ඉගැන්වීම හෙවත් සූක්ෂ්ම ඉගැන්වීම ද පියවර පාඩම් ක්‍රමය ද (Micro teaching and programmed learning) වර්තමානයේ අධ්‍යාපනඥයන් යොමු වූ සුවිශේෂ ඉගැන්වීම් ක්‍රම දෙකකි. ක්‍ෂුද්‍ර ඉගැන්වීම යනු කුඩා කණ්ඩායමකට කෙටි කාල පරාසයක් තුළ එක් කුසලතාවක් හෝ එක් සංකල්පයක් පැහැදිලි කිරීමයි. උදාහරණයක් ලෙස ඇතැම් ගාථා නිවැරදිව සජ්ඣායනා කිරීමට අපොහොසත් දරුවෝ වෙත් නම් ඔවුන් වෙනම ගෙන ගුරුවරයාගේ මඟ පෙන්වීම අනුව ගාථාව සජ්ඣායනා කිරීමේ කුසලතාව ඔවුන් තුළ වර්ධනය කළ හැකි ය. නිර්වාණය වැනි ව්‍යුක්ත සංකල්පයක් උදාහරණ මගින් අවබෝධ කළ හැකි ය. පියවර පාඩම් ක්‍රමය යනු පාඩම කුඩා අනු කොටස් ගණනාවකට බෙදා එක් එක් කොටසක් අනුපිළිවෙළින් ඉගෙනීමට සැලැස්වීම යි. උස් කඳු ගැටයකට වුව ද පඩි පෙළක් දිගේ ගමන් කරන්නාක් මෙනි. බුදු පියාණන් ද පස්වග භික්ෂූන් වහන්සේලාට සෝවාන් ඵලය පසක් කිරීමට අනුගමනය කළේ මෙම ක්‍රමයයි. ක්‍ෂුද්‍ර ඉගැන්වීම හෙවත් සූක්ෂම ඉගැන්වීමේ ක්‍රමවේද යයි. දම්සක් පැවතුම් සූත්‍රය අසා සෝවාන් වූයේ කොණ්ඩඤ්ඤ තවුසා පමණි. ඉතිරි සිව් දෙනා වහන්සේ සෝවාන් ඵලයට පත්වූයේ සූක්ෂම ඉගැන්වීම මගින්.

අනුපුබ්බේන මේධාවී - ථොක ථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සේව - නිද්ධමේ මල මත්ථනො

Not For Sale - CMSP

යන ධම්මපද ගාථාවෙන් කියවෙන්නේ ද පියවර පාඩම් ක්‍රමයට සමාන අනුපූර්ව ශික්‍ෂණයයි. මජ්ඣිම නිකායේ එන කිටාගිරි සූත්‍රයේ සඳහන්

සද්ධාජාතෝ උපසංකමති-උපසංකමිත්වා සොතං ධදග්ගි
ධදග්ගි සොතො ධම්මං සුණාති - සුණිත්වා ධම්මං ධාරෙති

යනාදී වශයෙන් බුදුරදුන් පෙන්වා දුන්නේ වත්මන් විද්වතුන් පියවර පාඩම් ක්‍රමය යනුවෙන් පෙන්වා දෙන පියවර පාඩම් ක්‍රමයට පදනම් වූ අනුපූර්ව ශික්ෂණය යි.

මේ හැර දහම් පාසල් ගුරුවරුන්ට භාවිතා කළ හැකි **භූමිකා රංගන, කණ්ඩායම් ක්‍රමය, සමරූපනය, බුද්ධිකලම්බනය, හවුල් ඉගැන්වීම, ප්‍රදර්ශන ක්‍රමය, ගැටලු විසඳීමේ ක්‍රමය, ව්‍යාපෘති ක්‍රමය** වැනි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද (උපාය මාර්ග) ගණනාවක් වර්තමානයේ අධ්‍යාපනඥයෝ අවධාරණය කරති. මේ එක් ක්‍රමවේදයක් පන්ති කාමරය තුළ හෝ පන්ති කාමරයෙන් බැහැරව ක්‍රියාකිරීමට ගුරුවරයාට ඒ පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික කුසලතා තිබිය යුතු ය. පොත පත පරිශීලනය කිරීමෙන් න්‍යායික අවබෝධය ලැබිය හැකි අතර, එම ක්‍රම පිළිබඳ පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රායෝගික කුසලතා වර්ධනය කර ගත හැකි ය.කෙසේ වෙතත් කිනම් ඉගෙනුම් - ඉගැන්වීම් උපාය මාර්ග භාවිතා කලත් ඒ පිළිබඳ ගුරුවරයාගේ අනන්‍යතාව ද ඉවහල් වේ. කථනය, අභිනය, අවාචික සන්නිවේදනය, ආකල්ප යන සියල්ල ප්‍රබෝධවත් ලෙස ආකාර්ශණීය ලෙස ඉදිරිපත් කිරීමට ගුරුවරයාගේ දක්ෂතාව ද ඉවහල් වේ. එසේ ම ඒ පාඩම් වල ස්වභාවය, අන්තර්ගතය, ළමා සංවර්ධන මට්ටම පවත්නා

Not For Sale - CMSP

භෞතික පහසුකම්, ශිෂ්‍ය ප්‍රමාණය, උගන්වන වේලාව අනුව වඩාත් ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් උපායමාර්ග තෝරා ගැනීමට ගුරුවරයා සමත්විය යුතු ය.

ඉගැන්වීමේ උපාය මාර්ග පිළිබඳ පුළුල් විග්‍රහයක් මෙවන් ලිපියකින් ඉදිරිපත් කිරීම අපහසුය. ඒ නිසා ඒ පිළිබඳ ලියැවුනු පොත පත, ශාස්ත්‍රීය ලිපි අධ්‍යනය කිරීම හා ස්වාධීනව අත්හදා බැලීම්, නිරීක්ෂණය මගින් සිය කුසලතා ප්‍රගුණ කර ගැනීම ගුරුවරයාගේ වගකීම යි. මෙම ලිපියේ දෙවන කොටසින් බලාපොරොත්තු වන්නේ ශිෂ්‍ය සාධනය ඇගයීම පිළිබඳ සාකච්ඡා කිරීම යි.

ඕනෑම ඵලදායී කාර්යයක සාර්ථකත්වය හෝ තත්ත්වය විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය "ඇගයිම" යනුවෙන් සරල ලෙස අර්ථකථනය කළ හැකි ය. ඒ අනුව කිසියම් විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධව ශිෂ්‍යයා විසින් ඉගෙනුම් අරමුණු/ ඉගෙනුම් ඵල කෙතෙක් දුරට සාධනය කරන්නේ ද යන්න නිශ්චිතව පරීක්ෂා කොට නිවැරදි තීරණයක් ගැනීමේ විධිමත් ක්‍රියාපිළිවෙළට අධ්‍යාපන ක්‍රියාවලියේ දී "ඇගයීම" යනුවෙන් ව්‍යවහාර කරනු ලැබේ. මෙහි දී ශිෂ්‍ය සාධනය ඇගයිම සඳහා යොදා ගැනෙන විවිධ ක්‍රමවේද අතුරින් පාසල් පරීක්ෂණ ප්‍රධාන වේ. " පරීක්ෂණයක් යනු යම් පුද්ගලයකු ගේ චර්යාව නිවැරදිව නිරීක්ෂණය කොට සංඛ්‍යාවක් මගින් හෝ ශ්‍රේණි මගින් එම චර්යාවේ මට්ටම හෝ තත්ත්වය විස්තර කිරීමේ වැඩ පිළිවෙළක් " ලෙස ක්‍රොන්වක් නැමැති අධ්‍යාපනඥයා විග්‍රහ කරයි.

මෙසේ යොදා ගැනෙන පරීක්ෂණ රාශියක් තිබේ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පරීක්ෂණයේ අරමුණු, ආකෘතිය, පිළිතුරු



Not For Sale - CMSP

සැපයීමේ ක්‍රමය, පිළිතුරු පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය අනුව පරික්ෂණ වර්ගය ද විවිධ වේ. මේවා අතරින් පාසල් මට්ටමේ දී ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ක්‍රියාත්මක වන වඩාත් ප්‍රකට පරික්ෂණ දෙවර්ගයක් වේ එනම් රචනා වර්ගයේ පරීක්‍ෂණ හා වාස්තවික පරීක්‍ෂණ යන දෙවර්ගය යි. රචනා වර්ගයේ පරීක්‍ෂණ වලදී පිළිතුරු ලිවීම හා පිළිතුරු ඇගයීම බොහෝ දුරට පුද්ගල බද්ධ වේ උදාහරණ වශයෙන් ගතහොත්

- බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය උදාහරණ මගින් පැහැදිලි කරන්න.
- ප්‍රථම ධර්ම සංගීතියට ඉවහල් වූ හේතු පරීක්ෂා කරන්න.
- මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ප්‍රජාව ලද සංස්කෘතික දායාද පිළිබඳ ඇගයීමක් කරන්න.

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පිරික්සන්නාට තමාගේ අභිමතය පරිදි පිළිතුරු සැපයිය හැකි ය. පිළිතුරු ඇගයීමේ දී පරීක්‍ෂක වරයාගේ අදහස් හා ආකල්ප බලපාන නිසා පුද්ගල බද්ධ වේ. ඒ නිසා ලැබෙන ලකුණු මට්ටම වෙනස් විය හැකි ය. එකම පිළිතුරක් සඳහා "A"පරීක්‍ෂකවරයා $^{12}/_{20}$දෙන අතර "B"පරීක්‍ෂකවරයා ලකුණු $^{16}/_{20}$ හෝ $^{10}/_{20}$ ප්‍රදානය කළ හැකි ය. එම දුර්වලතාවය මග හැරීමට "ව්‍යුහගත රචනා " ප්‍රශ්න ඉදිරිපත් කිරීම සුදුසු ය. එවිට පිරික්සෙන්නාගේ පිළිතුර සීමාවක් තුළ පවත්වා ගැනීමට සිදු වේ. ඉහත ප්‍රශ්න ව්‍යුහගත කළ විට,

* බුදුරජාණන් වහන්සේ ගේ මහා කරුණා ගුණය උදාහරණ සිද්ධි තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. බුදුරජාණන් වහන්සේ ගේ

Not For Sale - CMSP

මහා කරුණා ගුණය රජ්ජුමාලා, පටාචාරා, සෝපාක යන තැනැත්තන්ට පිහිටවීමේ සිද්ධි ඇසුරින් පැහැදිලි කරන්න.

* ප්‍රථම සංගීතියට තුඩු දුන් / ආසන්න හේතු තුනක් දක්වා ඒවා යේ අදාලත්වය පරීක්ෂා කරන්න.
* ප්‍රථම සංගීතියට තුඩු දුන් හේතු සාධක තුනක් ඇසුරින් පරීක්ෂා කරන්න.
* මහින්දාගමනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාව ලද දායාද උදාහරණ තුනක් ඇසුරින් ඇගයීමට ලක්කරන්න.

යන වශයෙන් ව්‍යුහගත කළ හැකි ය. එසේම පිළිතුරට හිමිවන උපරිම ලකුණු ගණන ද ඉදිරියෙන් දක්වීම අවශ්‍ය වේ.

"වාස්තවික පරීක්ෂණ" යනු නිශ්චිත පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් ඇගයීම් ක්‍රමවේදයකට ය. මෙහි දී පුද්ගල බද්ධ භාවිතයත් නමින් නිසා නිවැරදි ඇගයිමක් සිදු වේ. එහෙත් මැනිය හැක්කේ ඉගෙනුම් ඵල වලින් සීමිත ක්ෂෙත්‍රයක් පමණි. වාස්තවික ප්‍රශ්න ඇතුළත් පරීක්ෂණ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

1)සැපයීම් වර්ගය
- කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න
- හිස්තැන් පිරවීමේ ප්‍රශ්න

**2)**තේරීම් වර්ගය
- ඇඳීමේ වර්ගය
- දෙවරණ වර්ගය
- බහුවරණ වර්ගය

Not For Sale - CMSP

මනා සැලසුමක් හා සූදානමක් මේ සඳහා අවශ්‍ය වේ. හොඳ පරීක්ෂණයක තිබිය යුතු මූලික ලක්ෂණ තුනකි. ඒ පිළිබඳව ද දහම් පාසල් ගුරුවරුන් අවධානය යොමු කළ යුතු ය.

1. ප්‍රායෝගික බව (Practicality)
2. විශ්වසනීයතාව (Reliability)
3. වලංගුතාව (validity) යනුවෙනි.

මෙහි"**ප්‍රායෝගික බව** "යනු පරීක්ෂණය දීමේ පහසුව හා පිළිතුරු පත් ලකුණු කිරීමේ පහසුව යන කරුණු ය.

**විශ්වසනීයතාව**යනු පරීක්ෂණයෙන් අපේක්ෂකයන් ලබාගන්නා තත්වය/ස්ථානය පිළිබඳ විශ්වාසනීයත්වය යි. **වලංගුතාව** යනු පරීක්ෂණයෙන් ඉටුවිය යුතු අපේක්ෂා ඉටුවීමේ ස්වභාවයයි. වලංගුතාව ආරක්ෂාවීමට ඒ සඳහා සුවිශේෂණ/පිරිවිතර වගුවක් (Blue Print) පළමුවෙන් සැකසිය යුතු ය. සුවිශේෂණ වගුවක් සැකසීමේ දී ද්විමාන වගුවක් ලෙස සිරස් අක්ෂයේ විෂය ඒකක ද තිරස් අක්ෂයෙහි අධ්‍යාපන අපේක්ෂණ ද දැක්විය යුතු ය.

කෙසේ වෙතත් ඉහත දක්වන අන්දමේ පරීක්ෂණයකින් වුව ද දහම් අධ්‍යාපනය ලබන දරුවන්ගේ සාධනය නිවැරදිව ඇගයීම කළ නොහැකි ය. ඒ නිසා පරීක්ෂණවලට අතිරේකව ඔවුන් චර්යාවන් නිරීක්ෂණය, විෂය සමගාමී ක්‍රියාකාරකම් වලදී දක්වන දායකත්ව ය. දහම් පාසලේ භෞතික සම්පත් කෙරෙහි දක්වන ආකල්ප සම්මුඛ සාකච්ඡා මගින් ද ආකල්ප හා කුසලතා ඇගයීමට වැඩපිළිවෙළක් දහම් පාසල තුළ ක්‍රියාත්මක විය යුතු ය. මේ පිළිබඳ ව දහම් ගුරුවරුන්ගේ කැපවීම හා අවබෝධය අත්‍යවශ්‍ය වේ.

Not For Sale - CMSP

# 10. සාරධර්ම සංවර්ධනයට දහම් පාසල් ගුරුවරයාගේ මග පෙන්වීම.

ඉතාම කලාතුරකින් ජාතියක් තුළ සදාචාර ජීවිතයය පිළිබඳ නව පරමාදර්ශ ඇති මනුෂ්‍යයකු පහළ වී වෙනත් අයට ද ඒවා අවබෝධකොට මනුෂ්‍ය වර්ගයාගේ සදාචාර අදහස් වැඩි දියුණු කරයි. බුදුරජාණන් වහන්සේ එවැනි පරමාදර්ශයන් සහිතව ක්‍රියා කළ උතුමෙකි.

බුදුහිමියන් තමා අවබෝධ කරගත් දහම සමාජය කරා ගෙන යාම ඉතා වැදගත් කටයුත්තක් ලෙස සැලකූ හෙයින් තම අනුගාමික පිරිස ධර්ම චාරිකාවේ නිරතවීම අගය කළේ බහුජන හිතසුව පිණිස චාරිකාවේ නියලෙන්නැයි උපදෙස් දෙමිනි. වර්තමානයේ මහ සඟරුවන ප්‍රධාන දහම් ගුරුභවතුන් අතින් ඉටුවන්නේ බුදුහිමියන් අනුදත් ඒ උතුම් කටයුත්තයි.

දහම් අධ්‍යාපනයේ නියැලෙන පුද්ගලයා තම චර්යාව තුළ සදාචාර ගුණාංග අඛණ්ඩව රැකගත යුතුව ඇත. දහම් පාසලේ දී සදාචාර සම්පන්න වීමත් ඉන් බාහිරව එසේ නොවීමත් සිදු නොවිය යුත්තකි. සාරධර්ම සංවර්ධනයේ නියමුවන් වන ඔබ තුළ ඇති 'යථාවාදී තථාකාරී තථාවාදී යථාකාරී' බව එම අරමුණ ජයගැනීමට මහෝපකාරී වනු ඇත.

මිනිසා පෘථග්ජන යයි පවසන්නේ මමය, මාගේය යන සිතුවිල්ල පෙරටු කර ගනිමින් ක්‍රියා කරන බැවිනි. එම සිතුවිල්ල මම කැමති මම අකමැති ලෙස ලෝකය දෙකට බෙදා වෙන් කරන්නේ සමාජයේ යහපැවැත්ම විශාල අනතුරකට ලක් කරමිනි.

Not For Sale - CMSP

මේ පෘථග්ජන ස්වභාවය පාලනය කරමින් සාරධර්ම සපිරි සමාජය පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ දහම් අධ්‍යාපනයේ ආරම්භක ස්ථානය වූ දහම් පාසල වෙතය.

එම අරමුණ ඉටුකිරීමට නම් දහම් අධ්‍යාපනය ලබාගැනීමට පැමිණෙන දරුවන්ට දැනගතයුතු යහපත් දේ අවබෝධය ලබාදීමත් ඒ අනුව දිවි ගෙවීමට හුරුකිරීමේ වගකීමත් පිළිබඳව දහම් ගුරුභවතුන් වෙත පැවරී ඇත. එම ප්‍රයත්නය සාර්ථක වන තරමට සමාජය වඩා මානව හිතවාදී යහපත් සමාජයක් ලෙස පවතිනු ඇත.

මෙරට ජන සමාජය ඓතිහාසිකව ගොඩනැඟී ඇත්තේ බෞද්ධාගමික පසුබිමක් සහිතවය. ඒ ජන විඥානය තේරුම් නොගෙන ඉදිරි පරපුර වෙත සංස්කෘතිය පවරාදීමේ වගකීම විධිමත් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් පමණක් ඉටුකර ගැනීමට වෙර දැරීම එතරම් ප්‍රායෝගික ප්‍රයත්නයක් නොවේ.

අතීතයේ මෙරට පැවති යුරෝපීය ආධිපත්‍ය දේශීය සාරධර්ම පිරිහීමට හේතුවූ ප්‍රධාන කරුණකි. විහාරස්ථානය සමාජයට අධ්‍යාපනය බෙදාදෙන කේන්ද්‍රස්ථානය ලෙස පැවතීමත්, යටත් විජිත යුගයේ දී මෙම බැඳීම බිඳවැටීමත් නිසා කුමක් හෝ කර සුවපහසු ජීවිතයක් ගත කිරීමේ අරමුණ වේගයෙන් සමාජගත විය.

ඒ සමාජ ආකල්ප නිසා බිහිවූ පුද්ගලයින්ගේ බුද්ධිය විෂය දැනුමට පමණක් සීමා වූයේ චරිත සංවර්ධනයට නිසි අවධාරණය නොසාදමිනි. සමාජ සාර්ධර්ම පිරිහීමේ ප්‍රතිවිපාක අද සමස්ත ලෝකයම අත්විඳිමින් සිටී. මරාගෙන මැරෙන ප්‍රහාර, ස්වයංක්‍රිය ගිනි අවි භාවිතයෙන් ජනතාව මරා දැමීම වැනි මහත් කුරිරුකම් සේම එතරම් බිහිසුණු බවක් නොපෙන්වන තම ලාභ අපේක්ෂාව පමණක් පෙරටුව සිදුකරන



Not For Sale - CMSP

සෑම ක්‍රියාවකදීම දැක ගත හැක්කේ සමාජ සාරධර්ම පිරිහීමේ ප්‍රතිඵලයකි.

උගතා නූගතා අතර චර්යාමය වෙනසක් පවා නොපෙන්වන මට්ටමට පත්වී ඇති මේ සාරධර්ම පිරිහීම වැළැක්වීමේ යුතුකම හා හැකියාව ඇත්තේ නිස්සරණාධ්‍යාශයෙන් දහම් අධ්‍යාපනය උදෙසා කැපවූ දහම් ගුරුභවතුන් වෙතය.

1943 ලංකාවේ අධ්‍යාපනය විශේෂ කාරක සභා වාර්තාවේ චරිත සංවර්ධනයේදී ආගමික පදනමේ ඇති වගකීම අවධාරණය කර තිබේ. ඒ වගකීම ඉටුකිරීමට නම් තම සෙවනේ සිප්සතර හදාරන දරුවන්ට ප්‍රතිපෝෂණය ලැබිය හැකි මට්ටමේ සාරධර්ම ප්‍රමාණයක් තම ජීවිතාදර්ශයෙන් පෙන්නුම් කරමින් ජීවත්වීමට දහම් පාසල් ගුරුවරයා අධිෂ්ඨානශීලීව කටයුතු කළ යුතුය.

සාරධර්ම සහිත සමාජයක් යනු තමාටත් අනුන්ටත් අහිතකරවූ සියලු ක්‍රියාවන්ගෙන් වැලකී තමන්ටත් අනුටත් හිතකර දෙයට ප්‍රමුඛත්වය ලබාදෙන සමාජයකි. අන් අයගේ සැපත සතුට රකිමින් සමාජ සාමයට සංවර්ධනයට හේතුවන තම ගමේ, පළාතේ ඕනෑම කටයුත්තකට හෘදයංගමව එකතුවීමේ හැකියාව නිසරණාධ්‍යාශයෙන් සමාජ මෙහෙවරට කැපවූ දහම් ගුරුභවතුන් තුළින් ප්‍රකට විය යුතුය.

බුදුදහමේ දැක්වෙන සූත්‍ර විශාල සංඛ්‍යාවක සාරධර්ම පිළිබඳව සාකච්ඡා වී ඇති ආකාරය දැක ගත හැකි ය. විශේෂයෙන් තම චරිතය උදාරවත් කර එයින් තම සිසුන්ට ප්‍රතිපෝෂණ ලබා දෙන ලක්ෂණ විශාල ප්‍රමාණයකි.

තමන් අතින් ඉටුවන මේ වගකිවයුතු කාර්ය පිළිබඳ තමන් තුළම ඉහළ අවබෝධයක් ගොඩනගා ගැනීම



Not For Sale - CMSP

ප්‍රථමයෙන් දහම් ගුරුවරුන් සිදු කළ යුතුව ඇත. එම අවබෝධය ඕනෑම දුෂ්කර අවස්ථාවකදී පවා නිවැරදිව වඩා විශ්වාසයෙන් ඉදිරියට යන්නට හේතුවන ගුණයක් වනු ඇත. දහම් ගුරුවරයා තුළ ඒ ශක්තිය ගොඩනැගීමට තම ක්ෂේත්‍රය පිළිබඳ ඇති දැනුම අවබෝධය මෙන්ම අධ්‍යාපන මනෝවිද්‍යාව, අධ්‍යාපන මූලධර්ම, ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ දැනුම විශාල ශක්තියක් වනු ඇත. එමෙන්ම පෞද්ගලික ජීවිත සාර්ථකභාවය ඔබ උදාකරගත් ගුරු පෞරුෂය තම විද්‍යාර්ථයන්ට සාරධර්ම යනු කවරක්ද යන්න වටහා දීමට උපකාරී වනු ඇත.

ඔබ තුළින් පිළිබිඹුවන සාධාරණ, මධ්‍යස්ථ බව ඔබගේ ඍජු ගුණය විදහා දක්වනු ඇත්තේ දරුවන් තුළ ඒ සාරධර්මය ගොඩනැගෙන අයුරිනි. ඒ ආකාරයෙන් ඔබගෙන් මතුවන මෘදු බව නිහතමානී බව ඒ අපරිහානීය සාරධර්ම දරුවා තුළ ස්ථාපිත කිරීමට හේතුවනු ඇත.

සාරධර්ම සපිරි සමාජයක් යනු ජීවත්වීමට ඉතා ප්‍රිය මනාප ස්ථානයකි. ලෝකයේ රාජ්‍ය නම් කිරීමේදී පවා මේ ප්‍රිය මනාප බව සඳහන් කරන්නේ ඒ සමාජයේ මිනිසාට ඇති සුරක්ෂිත බව එයින් පිළිබිඹුවන බැවිනි.

සමාජ සාරධර්ම රකින පුද්ගලයා අත්හරින ප්‍රධාන කරුණු පහකි. ප්‍රාණඝාතය, නුදුන්දේ ගැනීම, කාමයේ වරදවා හැසිරීම, බොරුකීම, මත්පැන් භාවිතය.

මේ වැරදි වලින් අත්මිදිය හැකි නම් එය සාරධර්ම සපිරි සමාජයකි. දහම් අධ්‍යාපනයේදී අප උත්සාහ කළ යුත්තේ මේ පුරුද්ද විද්‍යාර්ථයින් තුළ තහවුරු කිරීමටයි.

අත්හළ යුතු දේ මෙන්ම සමාජයේ එක් එක් පාර්ශව සමග ඇති බැඳීම විධිමත්ව වැඩිදියුණු කර ගත යුතු ආකාරය සිඟාලෝවාද සූත්‍රයෙන් සාකච්ඡා කෙරේ. එහිදී දෙමාපියන්,



Not For Sale - CMSP

ගුරුවරුන්, අඹුදරුවන්, මිතුරු සමාජය, දාසි දසුන්, පූජ්‍ය පක්ෂය සමඟ කටයුතු කළ යුතු ආකාරය පෙන්වා දී තිබෙන්නේ දහම් ගුරුවරයා අතින් තම ශිෂ්‍යයාට පවරා දිය යුතු සාරධර්ම පිළිබඳ පුළුල් දැක්මක් සහිතවය.

නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වීමේදී ආගම ඉගැන්වීම පාසල් විෂයට ඇතුළත් විය. එහෙත් ඒ තුළින් ආගම් විෂය විභාග සමත්කම් ලබන තවත් එක් විෂයක් ලෙස මිස ප්‍රායෝගික භාවිතයට ගැනෙන විෂයක් ය යන්න පිළිබඳ ශිෂ්‍යයා තුළ අදහස් ගොඩ නොගැනිනි. එහි අඩුව පුරවාලීම සත්‍ය වශයෙන් සිදුවූයේ ආරාමය කේන්ද්‍ර කර ගෙන බෞද්ධ ඉගැන්වීම් ක්‍රමය සැකසූ දහම් පාසල් මගිනි.

බුදු දහම සමාජ සාරධර්ම වලටත් ඉදිරියේ වූ සසරින් එතෙර වීම පිළිබඳ අවබෝධය ලබාදෙන දහමකි. ඒ නිසා එහි සමස්ත දහම් කරුණු සියල්ලම තුළ ඇත්තේ අත්හළ යුතු නරක දේ හා එක්කර ගත යුතු හොඳ දේ පිළිබඳ සමාජය දැනුවත් කරන දැනුම් සම්භාරයකි.

ඒ උතුම් දැනුම් සම්භාරය එක් තැන්වූ විහාරස්ථානයන්ගේ පැවැත්වෙන දහම් පාසල් හුදෙක් දරුවාට ධර්මය පිළිබඳ අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් පමණක් නොවේ. දරුවාට ජාතික ආගමික සංස්කෘතික හුරුකම් හා ලැදි කම් ලබාදෙන කේන්ද්‍රස්ථානය ද වේ. එමගින් ලැබෙන සාරධර්ම අධ්‍යාපනයෙන් පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියකු සමාජයට බිහිකරනු ඇත. ඒ සඳහා දහම් පාසල් ගුරුවරයා අතින් ඉටු කෙරෙනුයේ අනුපමේය සේවාවකි.

# 11. වර්තමානයේ දහම් ගුරු අධ්‍යාපනය කෙසේ විය යුතුද?

ගුණ නැණ බෙලෙන් යුතු දරු පරපුරක් බිහිවීම රටකට වාසනාවකි. එහෙත් මෙම වාසනාව ඉබේටම රටකට පහළ නොවන්නේය. උනන්දුවීම හා දැඩි කැපවීම අනුව ළඟාකර ගත හැකි වන්නකි. අප රටේ දහම් පාසල් අධ්‍යාපනය ද මෙකී අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කරන වෑයමකි. එබැවින් දහම් ගුරු අධ්‍යාපනය වර්තමානයේ කෙසේ විය යුතු ද යන්න සාකච්ඡා කිරීම කාලෝචිත වනවාසේ ම ඵලදායී උත්සාහයක් ද වන්නේ ය.

**දහම් පාසල් පරමාර්ථ**

දහම් පාසල් මාර්ගෝපදේශ සංග්‍රයන් සහ පෙළ පොත් පරීක්ෂා කිරීමේදී දහම් පාසල් අධ්‍යාපනය සඳහාවූ පොදු පරමාර්ථයක් පවතින බව පැහැදිලි ය. "බුදු දහම පදනම් කරගෙන තමා හා අවට පරිසරය පිළිබඳව අවබෝධයක් ඇති එම අවබෝධය අනුව හැසිරෙන හා එසේ හැසිරීමේ ප්‍රතිඵල අත්දකින ගුණ නැණ බෙලෙන් යුතු දරු පිරිසක් බිහි කිරීම" යනුවෙන් එය සඳහන් වේ.

දහම් ගුරු අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා කරනු ලැබීමේදී දහම් පාසල් අධ්‍යාපනයේ ඉහත පරමාර්ථය තුළ ගැබ්වී ඇත්තේ කවර කරුණු වන්නේ දැයි විමසීම වැදගත් ය. පරමාර්ථ අනුව පළමුව සිසුවා තමා අවට පරිසරය පිළිබඳව මනා අවබෝධයක් ඇතිකර ගත යුතුය. මෙහි තමා අවට පරිසරය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ස්වභාවික පරිසරය, ආර්ථික හා දේශපාලන පරිසරය, තමා ජීවත්වන



Not For Sale - CMSP

වටපිටාව වශයෙන් යමෙකුට පරිසරය යන වචනය විග්‍රහ කළ නමුත් සමස්තයක් වශයෙන් ගත් කල පරිසරය යන සාධකය සීමා රහිත වූවකි. පුද්ගලයා හා සමාජයේ සිතුම් පැතුම් මෙන්ම ක්‍රියා පිළිවෙත් ද එයට සහසම්බන්ධතා දක්වන සියලු දෙය ද පරිසරය වශයෙන් මෙහිදී සැලකිල්ලට බඳුන් කළ යුතු ය.

අවට පරිසරය පිළිබඳව අවබෝධයක් ලබන සිසුවා දෙවනුව "එම අවබෝධය අනුව හැසිරෙන හා එසේ හැසිරීමේ ප්‍රතිඵල අත්දකින" වශයෙන් පරමාර්ථය තුළ සඳහන් වේ. මුල් පරමාර්ථය හා දෙවන පරමාර්ථය අතර එකිනෙක සම්බන්ධතාවක් පවතී. මුලින් සඳහන්වූ කරුණු මත දෙවන කරුණු පදනම් වන බව ද අදහස් වේ.

පරිසරය අවබෝධ කර ගැනීමට හැසිරීමට හෙවත් ක්‍රියාත්මක වීමට අවශ්‍ය පදනම සකසන අතර හැසිරීමේ ප්‍රතිඵල අත්දකින වශයෙන් සිසුවා කරන කියන දෙය පිළිබඳව හොඳ නොහොඳ අදහස් වේ.

ගුණ නැණ බෙලෙන් යුතු දරු පරපුරක් බිහි කිරීම. පොදු පරමාර්ථයේ අන්තර්ගත ඊළඟ කාරණය යි. හොඳින් උගත් බුද්ධිමත් යන්න මෙයින් අදහස් වේ. සිසුවා ගුණ නැණ බෙලෙන් යුක්ත වූ විට අවබෝධය අනුව හැසිරෙන හා එහි ප්‍රතිඵල අත්දකින තත්ත්වයට පත්වේ. එවන් විට දී ඔහුගේ ක්‍රියා පිළිවෙත තමාටත් සමාජයටත් වැඩදායක වන්නේය. මෙම කරුණින් ද පොදු පරමාර්ථ යේ පවතින සහසම්බන්ධතාවය පැහැදිලි වේ.

දහම් පාසල් අධ්‍යාපනයේ පොදු පරමාර්ථය තුළ ගැබ්වී ඇති වෙන්වෙන්ව සලකා බලන කරුණු තුනක් පිළිබඳ මෙහිදී සාකච්ඡා කරන්නට යෙදුණි. මෙම කරුණු මුදුන් පමුණුවා ගැනීමට නම් පොදු පරමාර්ථයේ ආරම්භයේ ඇති "බුදු දහම



Not For Sale - CMSP

පදනම් කරගෙන " යන්න අමතක කිරීමට හෝ ඉවත හෙලිය නොහැකි සුවිශේෂී කරුණකි.

බුදු දහම යනු කුමක් ද? දීර්ඝ ව කරුණු විමසා බැලිය යුතු මාතෘකාවකි. මෙහිදී ඒ සඳහා උනන්දු නොවන අතර කෙටි අදහසක් පමණක් ඉදිරිපත් කරනු ඇත. බුදුදහම සුවිශේෂී දර්ශනයක් පදනම්ව පවතින්නකි. මිනිසත්බව ලබා උපන් අයෙකුට බුදු දහමින් මෙලොව යහපත් අන්දමින් සැප සම්පත් පරිහරණය කරමින් ජීවත්වීමට මග පෙන්වාදීමත් එලොව සඳහා තම තමන් විසින් ඉටුකර ගතයුතු ක්‍රියා පටිපාටි මොනවාද යන්න පැහැදිලිකර දීමක් සිදුකරයි. මිථ්‍යාමත වලින් බැහැරවී බුදුදහමේ පවතින අන්තර්ගතය හරිහැටි තේරුම්කර ගැනීම මිනිසාගේ පරම වගකීමකි. දහම් පාසල් පොදු පරමාර්ථයේ සියලු කරුණු බුදු දහම පදනම්ව සම්පූර්ණ කරගත යුතු බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ. දහම් පාසල් පරමාර්ථයේ ප්‍රායෝගික බව සියල්ලන්ගේ ඇගයීමට ලක්විය යුතුය.දහම් ගුරුභවතුන් විසින් මෙම පරමාර්ථය අවබෝධ කර තිබීම ඉතා වැදගත්ය. දහම් ගුරු අධ්‍යාපනයෙන් සමාජය බලාපොරොත්තු වන්නේ සිසු දරුවනට අවශ්‍ය යහපත් සමාජ පදනමක් සකස්කර දීමයි. කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා කිරීමකින් තොරව සිදුකරනු ලබන මෙම සත්කාරයේ අගය යහපත් සමාජයක් නිර්මාණය වීම තුළම වටිනාකමක් බවට පත්වන බව කිවමනාය.

**දහම් අධ්‍යාපන ඉතිහාසය සැකවින්.**

හෙළදිව පුරාණ ජන දිවිය සොබා දහම හා බැදී පැවති බව සියලුදෙනා දන්නා කරුණකි. වැව, දාගැබ, කුඹුරු යාය, වන පෙත හා ගම්ගොඩ අපගේ උරුමයයි. වැව් ඉදිකර ජලය



Not For Sale - CMSP

එක්රැස්කර කෘෂිකර්මය ආශ්‍රයෙන් දිවිපෙවෙත පවත්වා ගැනීම පුරාණ ජනතාව විසින් සිදුකර ඇත. ඇසූ පිරූ තැන් හා දැන උගත්කම් ද ගුණදහම ද බුදු දහම ඇසුරින් හා භික්ෂුන්වහන්සේලා ඇසුරින් පෝෂණය කරගෙන තිබේ. භික්ෂුන් වහන්සේලා විසින් ද උපදෙස් ලබාදීම හා යායුතු මඟ නොමඟ පෙන්වාදීම නො අඩුව සිදුකර තිබේ. මහින්දාගමනයෙන් පසුව වෙහෙර විහාර ගොඩනඟා ඇත. භික්ෂුන් වහන්සේලා විසින් ත්‍රිපිටකය අටුවා ආදිය මගින් ජනතාවගේ දහම් දැනුම ගොඩනඟා ඇත. පසු කාලවලදී නම්පොත, මගුල් ලකුණ, වදන් කවිපොත, බුද්ධගජ්ජය, සකස්කඩ, ශතක පොත් වැනි පොත්පත් ආශ්‍රයෙන් කියවීමට ලිවීමට හුරු කිරීමත් දහම් දැනුම හා ගුණ දහම් සමාජයට ළඟාකරදීමත් සිදුකර තිබේ. සුභාෂිතය, ධම්මපදය, යන පොත්පත් ද මංගල, පරාභව වැනි සූත්‍ර යනාදිය ද ජනතාවට කියාදී එම කරුණු අවබෝධකර දීම තුළ, යහපත් සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සකස්කර ඇත.

යටත් විජිත පාලනය යටතේ මිෂනාරී අධ්‍යාපන ක්‍රමය හා ක්‍රිස්තියානි ආගමික අධ්‍යාපන ක්‍රම මෙරටට හඳුන්වා දෙනු ලැබුව ද බුදු දහමින් ඔපවත් වූ අධ්‍යාපන ක්‍රමය අභාවයට යානොදී රැකගනිමින් පවත්වාගෙන ඒමට බාධා මධ්‍යයේ වුවද හැකියාව තිබී ඇත. මෙහිදී භික්ෂූන් වහන්සේලා විසින් සිදුකර ඇති කැපකිරීම හා කළා වූ සේවාව අති මහත් ය. බෞද්ධ හා හින්දු ආගම්වලට ඇතිව තිබූ බලපෑම් හේතුවෙන් බෞද්ධ හා හින්දු පුනරුදය උදෙසා අරගල කිරීමට සිදුවී තිබුණි. මෙම අවධියේ පිරිවෙන් වෙතින් සලසා ඇති සේවය මිළ කළ නොහැකිය. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඇතුළු ගිහි පැවිදි උගතුන් මෙම අවස්ථාවේ

දී විශාල මෙහෙයක් සිදුකර ඇත. ඕල්කට්තුමා ශ්‍රී ලංකාවට පැමිණීම සිදුවන්නේ 1880 වර්ෂයේ දීය. එතුමාගේ මඟපෙන්වීම හා නායකත්වය යටතේ පරම විඥානාර්ථ සමිතිය ආරම්භවීම සිදුවී ඇත. මේ සමඟ 1895 වර්ෂයේ ගාල්ල වැලිවත්ත විජයානන්ද විහාරයේ දහම් පාසලක් වශයෙන් මෙම ආයතනය ආරම්භවූ පසුව දිවයින පුරා දහම් පාසල් ආරම්භ කිරීම ව්‍යාප්තවී ඇත. එහි විකාශනයක් වශයෙන් වර්තමාන දහම් පාසල් හැඳින්විය හැකිය.

**දහම් පාසල්වල වර්තමාන පැවැත්ම.**

දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා රජයේ අනුග්‍රහය ලබාදීම සිදුවේ. බෞද්ධ කටයුතු වෙනුවෙන් බුද්ධ ශාසන අමාත්‍යංශයක් පිහිටුවා ඇති අතර බෞද්ධ කටයුතු කොමසාරිස් දෙපාර්තමේන්තුවක් ද ස්ථාපිත කර පවත්වාගෙන යමින් පවතී. මෙම ආයතනය බුදුදහමේ උන්නතිය සඳහා කටයුතු කරන අතර දහම් පාසල් කටයුතු ද ඊට අදාළව සිදු කරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවා ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සමායෝජක තනතුරු ද ඇතිකර තිබේ. දිවයිනේ ඇති විහාර ආරාම ආශ්‍රිතව වැඩි වශයෙන් දහම් පාසල් පවත්වා ගෙන යන අතර බාහිර ස්ථානවල පවත්වාගෙන යනු ලබන දහම් පාසල් සුලු ප්‍රමාණයක් ඇත.

විහාර ආරාමවල වැඩ වසන භික්ෂූන් වහන්සේලා විසින් දහම් පාසල් මෙහෙයවන අතර දහම් ප්‍රධානාචාර්ය තනතුරු ද උසුලනු ලබයි. දහම් පාසලට අවශ්‍ය ගුරුවරුන් විදුහල්පතිවරුන්ගේ උත්සාහය මත සම්බන්ධ කරගනු ලැබේ. දහම් පාසල් ගුරුවරුන් බඳවාගනු ලබන ක්‍රමවේදයක් ඍජුව



Not For Sale - CMSP

පවතින බවක් නොපෙනේ. දහම් පාසල් සඳහා අවශ්‍ය පහසුකම් සමහරක් දෙපාර්තමේන්තු විසින් සපයා දෙන අතර දරුවන් ගේ ඉගෙනුම් අවශ්‍යතාවන් සදහා පෙළ පොත් ලබාදීම විශේෂ ස්ථානයක් ගනී. පහළ ශ්‍රේණි සදහා පෙළ පොත්වලට අමතරව ගුරුවරුන් වෙනුවෙන් ගුරු අත්පොත් ලබාදීමක් ද සිදුවේ. එබැවින් ගුරුවරුන් හට ඉගැන්වීමට මඟපෙන්වාදීමක් ද සිදුවී ඇත. මේ වන විට නිපුණතා පදනම්ව දහම් පාසල් අධ්‍යාපනය ලබාදෙන අතර, එය නව අධ්‍යාපන සංකල්පයක් වේ. දහම් පාසල් කටයුතු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලිඛිතව ලබාදීමක් ද දෙපාර්තමේන්තුව මගින් සිදුකර ඇත.

**සමාජය පරිවර්තනය**

දහම් ගුරු අධ්‍යාපනය වර්තමානයේ කෙසේ වියයුතු ද යන්න සාකච්ඡා කිරීමේදී වර්තමාන සමාජ පසුබිම හා එහි හැඩතළයන් පිළිබඳ විමසා බැලිය යුතුය. එමෙන්ම ලාංකීය සමාජ විකාශනය ද විමසා බැලිය යුතුය. ඒ මන්ද යත් වර්තමාන සමාජ හැඩතල එක්වර ගොඩනැගුණු දෙයක් වන නිසාත් එය ඉතිහාසයේ සිදුවීම්වල විකාශනයේ ප්‍රතිඵලයක් වන නිසා වෙනුත්ය. පුරාණයේ ශ්‍රීලාංකිකයන් කෘෂිකාර්මික හා දැහැමි දිවිපෙවතක් ගතකළ බව අප පූර්වයෙන්ම ද අවධානයට ලක්කෙරිණ. අප රට භූ විෂමතා අනුව මධ්‍ය කඳුකරයත් වටේට තැනිතලා භූමියකුත් වශයෙන් පිහිටා ඇත. තැනිතලා ප්‍රදේශවල බොහෝ ස්ථානයන්හි ශේෂ වූ කඳු දක්නට තිබේ. කඳුකර ප්‍රදේශයේ වනාන්තර වූ බැවින් වැසි නොඅඩුව ලැබුණි. ගංගා ඇළදොළ සක්‍රියව පැවතුණි. මිනිසා වැව් අමුණු ආදිය සකස්කර ජලය රැස්කර ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල

Not For Sale - CMSP

නිරත විය. ජනතාව ජීවත්වූයේ තැනිතලා ප්‍රදේශවලය. අනුරාධපුරය. පොලොන්නරුව, දිගාමඩුල්ල, තිස්සමහාරාමය වැනි ප්‍රදේශවල පැවති ශ්‍රී විභූතිය කෙසේද යන්න වර්තමානයේ පවතින පුරාවිද්‍යා ස්මාරක සාක්ෂි දරයි. තිස්සමහාරාමයේ වහලක් මතට ගොඩවන කුකුළෙකුට අනුරාධපුරය තෙක් යෑමට හැකියාව තිබූ බවත් රත්රන් ආභරණ පැළඳ කාන්තාවකට මහමග නිරුපද්‍රිතව යාමට හැකියාව තිබූ බවත් ජනප්‍රවාදයේ අදටත් පවත්නා කතාවකි. එදා සමාජයේ වූ සුරක්ෂිත බව හා සමාජයේ වූ දියුණු බව මෙයින් පැහැදිලි කරයි.

විදේශ ආක්‍රමණයන් සිදුවනුයේ මෙයින් අනතුරුවයි. පෘතුගීසින්, ලන්දේසින් හා ඉංග්‍රීසින් මෙරට ආක්‍රමණය කළ අතර, වරින් වර මෙහි පාලන බලය ඔවුන් වෙතට ලබාගන්නා ලදී, ප්‍රථමයෙන් පෘතුගීසින් පැමිණි අතර ඔවුන් මුහුදුබඩ පළාත් සියතට ගැනීම සිදුවිය. ඔවුන්ගෙන් වූ දුක්ගැහැට හේතුවෙන් යුධ අරගල නොවඅඩුව රට තුළ පැවතිණි. පසුව පෘතුගීසින් පළවා හැරීම සඳහා ලන්දේසීන් මෙරටට ඇතුළු විය. ඔවුන්ගේ කාලයේද කරදර අඩු නොවූ අතර යුධ ගැටුම් ද ඇති විය. මින් අනතුරුව ඉංග්‍රීසි ජාතිකයන් මෙරටට පැමිණීම ද සිදුවිය. මෙම වකවානුවද යුධ ගැටුම් බහුල විය. ඉංග්‍රීසි ජාතිකයින් මුළු රටම යටත්කර ගැනීමට සමත් විය. එහෙත් වරින් වර කැරලිගැසීම සහ අරගල පැවතුණි. මේ වන විට සමාජය පරිවර්තනය වෙමින් පැවතුනි. ශ්‍රී ලාංකිකයන් වෙත තිබී ප්‍රබල සංස්කෘතිය හා හැදියාවන් ද එඩිතර බවද නිරන්තර ගැටුම් සඳහා හේතු විය. යුධ ශක්තියෙන් වහලුන් යටපත් කිරීමට නොහැකි බව මෙහිදී ඉංග්‍රීසි ජාතිකයන් තේරුම්ගෙන තිබුණි. එමෙන්ම අපගේ සංස්කෘතිය බිඳ හෙළීම මත ජාතීන් අඩපන කළ හැකි බව ඔවුන් සිතන්නට විය.



Not For Sale - CMSP

ප්‍රථමයෙන් කඳුකර වනාන්තර කපා එම බිම්වල කෝපි වගාව හා තේ වගාව ව්‍යාප්ත කරන ලදී. වියලි කලාපයේ වූ සශ්‍රීක පෙදෙස් කාලය සමඟ වනාන්තර බවට පත්විය. අන්‍ය ආගම් මෙරට ප්‍රචලිත කළ අතර පන්සල් වෙහෙර විහාර විනාශ මුඛයට ඇද දැමුනි. අඳින පලඳින දේ කෑම්බීම් හා සිරිත් විරිත් සියල්ල වෙනස් වන්නට විය. වෙළෙඳාම් ක්‍රමය ව්‍යාප්ත විය. අධ්‍යාපන ක්‍රමය වෙනස් විය. අලුත් නීතිරීති හා පාලන ක්‍රමයක්ද ඇතිවිය. රටේවූ සියලු දේ උඩුයටිකුරු විය. 1948 වසර නිදහස ලැබීම සිදුවුව ද සමාජයේ වූ පරිවර්තනයවීම් නතර නොවිනි. ලාංකිය සමාජයේවූ මෙම ඓතිහාසික වෙනස්වීම මෙතෙක් නියමාකාරයෙන් තේරුම්ගත තිබේද යන්න තවමත් ගැටලුවකි.

සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකයින් ප්‍රධාන වශයෙන් දැනට මෙරට ජීවත්වන අතර බෞද්ධාගම, හින්දු ආගම. ක්‍රිස්තියානි හා ඉස්ලාමීය ආගම වැනි ආගම් ප්‍රචලිතව පවතී. විවිධ ආගමික හා සංස්කෘතික ලක්ෂණ මුලු සමාජය තුළම පවතී. සෑම ආගමකින්ම යහපත පමණක් සමාජගත කරනු ලැබුවත් සමස්ත සමාජයම වල්මත්වී ඇතිවාක් මෙනි. සිරිත් විරිත් අවිධිමත්ය. ගතිපැවතුම් බෙහෝ අවස්ථාවල සමාජයේ යහපැවැත්මට බාධාවක්ය. පවුල් සබැඳියාව හා යුතු අයුතුකම් අමතකවී ගොසිනි. මුදල් පසුපස හඹා යන තරගකාරී බවන් යුතු ගුණ ගරුක බැවින් තොර සමාජයකි. මත්ද්‍රව්‍ය, දුරාචාරය, අපචාර, සමාජය වසා පැතිර ඇත. රටතුළ ආර්ථික දේශපාලන හා සංස්කෘතික ස්ථාවර බවක් නොපෙනේ. වර්තමාන සමාජයේ ස්වභාවය මෙයයි.

Not For Sale - CMSP

**ආත්මාර්ථකාමී බව සහ දහම් අධ්‍යාපනය.**

පාසල් අධ්‍යාපනයේ ශිෂ්‍යත්ව විභාගයෙන් ළමයා තරගය ආරම්භ කරයි. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව ද තරගය නොනවතී. තමා අසල සිටින අනෙක් සිසුවා පිළිබඳව පවා නොසලකා හැර ආත්මාර්ථකාමීව ගමන් කරයි. පවත්නා සුලු රැකියා ප්‍රමාණය හා අවස්ථාවන් උගත් දක්ෂයෝ හිමිකර ගනිති. එහෙත් තරගයෙන් ඉවතට යන උදවිය සමාජගත වනුයේ කෙසේදැයි යන කරුණ මෙතෙක් විධිමත්ව අවධානයට ලක් නොවූවකි. සමස්ත සමාජය දෙස යහපත්ව බලා කටයුතු කිරීමට හැකියාව පවතින සමාජයක් ගොඩනගාගත හැකි වන්නේ නම් ඉහත ගැටලුවලට පිළිතුරු සෙවීම පහසුය. මෙය කවදා කොතැනකින් හෝ ආරම්භ විය යුතුය. වර්තමානයේ දහම් ගුරු අධ්‍යාපනය පවතින සමාජ ඉඩෝරයට සුලු වැහි වළාවක් පමණි. මෙය ධාරානිපාත වර්ෂාවක් බවට පත්කරගත යුතුය. මෙය වර්තමාන සමාජයේ වගකීමය. දහම් ගුරු අධ්‍යාපනයේ වර්තමාන අවශ්‍යතාව මෙයයි. දහම් ගුරු අධ්‍යාපනයේ සහ දහම් ගුරුවරයා සතු විශාල වගකීමක් පවතී. තරගකාරී අධ්‍යාපන රටාව තුළ රටේ උගතුන් ඕනෑවටත් වඩා බිහිකර ඇත. එහෙත් වර්තමානයේ රටට අවශ්‍ය බුද්ධිමතුන්ය. පළමුවන ශ්‍රේණියේ සිට පාසල් අධ්‍යාපනය ලබන දරුවන් බොහෝ දෙනෙකු ඊට සමගාමීව දහම් අධ්‍යාපනය ලැබීම සිදුකරනු ලබයි. අධ්‍යාපනයෙන් උගත් බව ලබන අතර දහම් අධ්‍යාපනය තුළ ගුණ ගරුක බවින් යුතුවන දරුවන් බුද්ධිමත් බවට පත්කරගත හැකිය. බුද්ධිමත්තු සමාජයේ ප්‍රශ්නවලට විසඳුම් සොයති. සමාජය පරිවර්තනය කරනු ලබන්නේද ඔවුන් විසින් මය.

Not For Sale - CMSP

**දහම් ගුරු භූමිකාවට නව ප්‍රවේශයක්.**

දහම් අධ්‍යාපනයේ පරමාර්ථ කවරේ ද යන්න හා සමාජයේ වර්තමාන ස්වරූපය කෙබඳුද යන්න මෙතෙක් විමසා බැලීමට යෙදුනි. සමාජය පත්ව ඇති අනුවේදනීය තත්ත්වය හා ස්වභාවය අවබෝධ වන්නට ඇතැයි සිතමි. මෙම තත්ත්වයෙන් අත්මිදීම සඳහා දහම් ගුරු අධ්‍යාපනය කෙසේ අනුගත විය යුතු ද යන්න විමසා බැලීම වැදගත්ය. රාජ්‍ය මැදිහත්වීම තුළ දැනට දහම් අධ්‍යාපනය සඳහා යාන්ත්‍රණයක් ගොඩනගා ඇත. මෙහි දහම් ගුරුවරුන්ගේ භූමිකාව විස්තර කර තිබේ. නමුත් අපගේ අවධානය යොමු විය යුතු වන්නේ නව ප්‍රවේශයන් වෙතය. දහම් ගුරු භූමිකාව විධිමත්ව සිදුකරගෙන යන්නේ නම් සමාජ පරිවර්තනය උදෙසා කිසියම් කාර්යභාරයක් ඉටුකරවා ගත හැකිය. එබැවින් සමාජ පරිවර්තනය උදෙසා විවිධ ප්‍රවේශයක් පදනම්ව දහම් ගුරු අධ්‍යාපනය කෙසේ අදාළ කරගත හැකිදැයි සාකච්ඡා කිරීම සුදුසුය.

**දහම් ගුරුවරයා පරිසරවේදියකු වශයෙන්**

භූමිය, වෘක්ෂලතා, ජලය, වාතය. ජීවීන් සහ ඉර හඳ ස්වභාවික පරිසරයේ අංග වේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදී වශයෙන් මෙම කරුණු බුදු දහමින් විග්‍රහ කර පෙන්වයි. පරිසරයේ මුලින් සඳහන් කළ කොටස් පහ ඉරෙහි සහ සඳෙහි බලපෑම් අනුව ක්‍රියාත්මක වේ. තවද මෙම එක් එක් කොටස තුළ එයටම බැඳුනු අභ්‍යන්තර ක්‍රියාවලියක් පවතින අතර අනතුරුව කොටස් අතර සහ සම්බන්ධතාවයෙන් යුතු ක්‍රියාවලියක් ද පවතී. එක් එක් පරිසර කොටස් විවිධ ය. විෂම ය. භූමිය ගත් කළ ගල්, වැලි, පස්, මඩ වශයෙන්ද භූවිෂමතා අනුව කඳු, හෙල්, ප්‍රපාත, කාන්තාර, මඩ වගුරු ආදී වශයෙන්



Not For Sale - CMSP

විෂමය. වෘක්ෂලතා ගත්කල ගස්, වැල්, පස, ජලජ පැළෑටි වශයෙන් පවතී. තවද ගසක් ගත් කල එහි ප්‍රභේද පවතී. කෙසෙල් ගසක් සලකා බලන විට එහි ප්‍රභේද කෙතරම් තිබේදැයි විමසිය හැකිය. ජලය පිළිබඳ සාකච්ඡා කරන විට උණු ජලය, සිසිල් ජලය, හිම කැට, ලුණු මිශ්‍ර මුහුදු ජලය වශයෙන් විවිධය. වාතය ගත්විට මදනල, සුළිසුලං, වාසුලි, වැලි කුණාටු ආදී වශයෙන් පවතී. ජීවීන් ගත් කල භූමිය ඇසුරු කරන ජීවීන්, භූමිය හා අහස ඇසුරු කරගනිමින් ජීවත්වන පක්ෂීන්, ජලය ඇසුරුකර ජීවත්වන මසුන් ආදී වශයෙන් ප්‍රධාන කොටස් තුනකි. ගෘහස්ථ හා වනගත වශයෙන් ජීවීන් තවදුරටත් වර්ග කළ හැකිය. මෙයින් ගෘහශ්‍රිතව සිටිමින් භූමිය මත ජීවත්වන ජීවියෙකු වශයෙන් මිනිසා හැඳින්විය හැකිය. පරිසර කොටස් එකිනෙකට පොදු වූ අන්තර් ක්‍රියාවලියක් ද පොදුවේ එක්ව සහ සම්බන්ධතාවකින් යුතු ක්‍රියාවලියක් ද පවතින බව මීට පෙර සඳහන් විය. මෙහි ක්‍රියාකාරීත්වයේ ස්වභාවය තේරුම් ගැනීම වැදගත්ය. වෙන් වෙන්ව ක්‍රියා කරනු ලබන විට ඇතිවන, ගැටෙමින් පවතින, වෙනස්වන සහ නැවත ඇතිවන ස්වභාවයක් පවතී. මෙය දහම් අධ්‍යාපනයේදී ගුරුවරයා, පැහැදිලිව හඳුනාගත යුතු කරුණකි. ජීවීන් ගැන සඳහන් කරන විට කෝටි සංඛ්‍යාත ජීවීන් වර්ග අතර මිනිසා එක් ජීවී වර්ගයක් පමණි. මිනිසා ලෙස හඳුන්වනුයේ උසස් මනසක් ඇති යන අර්ථයෙනි. ඉහත කරුණු සැලකිල්ලට ගත්විට ජෛව විවිධත්වය අවබෝධ කරගත හැකි අතර ජෛව විවිධත්වය රැකගත යුතු බවද සිහිතබා ගත යුතුය.

සමස්ත පරිසරයේ කුඩා ස්ථානයක් හිමිවන මිනිසා විසින් තමාගේ අවශ්‍යතා සඳහා අනෙකුත් සියලු දෙනාගේ හිමිකම් ග්‍රහණය කරගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස

Not For Sale - CMSP

පරිසර විනාශය හඳුනාගත හැකිය. පරිසර තුලනය බිඳදමා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගංවතුර, නායයෑම්, සුළිසුලං වැනි තත්ත්වයන් ඇතිවෙමින් පවතී. පරිසර අංග මනා ලෙස ආරක්‍ෂා කරමින් තම තමන්ට පරිසරය තුළ හිමිකම් පවතින ප්‍රමාණය පමණක් භුක්ති විඳීමට කුඩා අවධියේ සිටම දරුවන් පුරුදු පුහුණු කළ යුතුය. පරිසරය ක්‍රියාකාරීත්වය ජෛව විවිධත්වය පිළිබඳ මනා අවබෝධයක් දරුවනට ලබාදීම කළ යුතුය. ලෝකයේ ස්වභාවය හා තමාසතු වගකීම දරුවන් අවබෝධ කරගනී. එය අත්‍යවශ්‍ය කටයුත්තකි.

"මම" යනු කවරෙක්ද වශයෙන්

මම කවුද යන්න හඳුනාගෙන තිබීම දහම් ගුරුවරයාගේ කාර්යභාරය සම්පූර්ණ කිරීම උදෙසා භාවිත කළ හැකි තවත් ප්‍රවේශයකි. මෙහිදී "මම " යන්න දහම් පාසල් ගුරුවරයා තමාට අදාළ කරගත යුතුය. සමාජය එක තැන නොනවතී. විකාශනය වෙමින් පවතී. මා සමාජයේ වර්තමානයේ සිටී. මට සමාජයේ අතීතයක් තිබුණි. එමෙන්ම මට සමාජයේ අනාගතයක්ද ඇත. එබැවින් සමාජයේ මම යනු කවරෙක්ද? මෙය විග්‍රහ කර බැලිය යුතුය. අතීතය දෙස බලන විට මට මගේ මව පියා හැඳිනිය හැකි ය. මගේ මවටත් පියාටත් ඔවුන්ගේ මව පියා හැඳිනිය හැකි ය. මේ අයුරින් ඈත අතීතය දෙසට සලකා බලන විට දම්වැල් රාශියක් පුරුක් මගින් එකට එක්ව පවතින බවක් පෙනේ. "මම" මාගේ කලත්‍රයා, සහෝදර, සහෝදරියන්, නැන්දා, මාමා වශයෙන් විග්‍රහ කර බැලිය හැකිය. මෙම තත්ත්වය අනාගත කාලය සඳහා ද විග්‍රහ කර බැලිය යුතුය. මම කවුද යන්න විග්‍රහය තුළ තමා අතීතයේ සිට පැවතෙන සමාජයේ තමා වර්තමාන පුරුකක් බවත් මෙම තත්ත්වය



Not For Sale - CMSP

අනාගතයට පුළුල් වෙමින් ගලායන බවත් පැහැදිලි වේ. දහම් ගුරුවරයා වර්තමානයේ සේවය කරනු ලබන්නේ තමාගේ පරපුරට බව තේරුම් ගත යුතුය. වෙනත් අයෙකුට නොවන බවත් අවබෝධකර ගත යුතුය. මෙම තත්ත්වය දහම් පාසැල් දරුවනට අවබෝධ කර දිය යුතුය. එකම පරපුරක සාමාජිකයින් අතර අන්තර් සම්බන්ධතා ගොඩ නැගීම පහසු කටයුත්තක් වන අතර සාරධර්ම ගොඩ නැඟීමට ද පහසුවේ.

**සමාජය පරිවර්තනය කරන්නෙකු වශයෙන්**

සමාජ පරිවර්තකයකු ලෙස ක්‍රියා කිරීම දහම් ගුරුවරයකුගේ තවත් ප්‍රවේශයක් ලෙස හඳුනාගත හැකිය. විදේශ ආක්‍රමණ වලින් පසුව දැඩි ලෙස ඔද්දල් වූ සමාජය අද සංකීර්ණ තත්ත්වයේ පවතී. බටහිර සිරිත් විරිත් වලට පුරුදුවීම, මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතය, අවිධිමත් අන්තර්ජාල පරිහරණය, ආගම දහමට අඩු නැඹුරුතාව, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව දැඩි ලෙස පැතිරයාම, අනවබෝධය හා මුලාව, ජංගම දුරකථන අනවශ්‍ය ලෙස භාවිතයට ගැනීම ඉහත තත්ත්වය ඇති වීමට හේතු සාධක වී ඇත. උසාවි, පොලිසි, සිරගෙවල් කොතෙක් පිහිටුවනු ලැබුවත් එමගින් මෙම තත්ත්වය වළක්වා ගත නොහැකි ය. සමාජයේ කරුණු වරද්දාගත් උදවිය පුනරුත්තාපනය කර පරිවර්තනය කිරීමද කෙසේවත් කළ නොහැකිය. අනාගත පරපුරට මග නොමග පෙන්වාදීමත්, කළ නොකළ යුතු දෑ කියාදීමත් තුළ සමාජ පරිවර්තනයකට අත්තිවාරම් දැමීමක් කළ හැකිය. දහම් පාසල් අධ්‍යාපනය පහළ ශ්‍රේණිවල සිට ඉහළ ශ්‍රේණි දක්වා සිසු දරුවනට ලබාදීමේදී මෙම සත්කාර්ය ආරම්භ කළ හැකිය. දරුවන්ගේ සිතුම් පැතුම් සඳහා වන යහපත් ආකල්ප ගොඩනැඟීම තුළත් ගුණ දහම්

Not For Sale - CMSP

සපිරි කුසලතා වර්ධනය කිරීම තුළත් මෙම පරිවර්තනය ඉදිරියට ගෙනයා හැකිය. විධිමත් අවබෝධයක් ලබන සිසුවා සමාජයේ ගොදුරු බවට පත් නොවී අවධානමින් ඉවත්වන බැව් දැකිය හැකිය. නොනවතින වෑයමක් දැරීම තුළ අත්පත්කරගත හැකි ප්‍රතිඵල බොහෝ විය හැකිය.

**මානව සම්පත සංවර්ධනය කරන්නෙකු ලෙස**

මානව සම්පත් සංවර්ධනය කරන්නෙකු ලෙස දහම් ගුරුවරයාගේ ප්‍රවේශය සලකා බැලීම සිදු කළ යුතුය. ලොව ලස්සන කිරීමේ හැකියාව මෙන්ම අවලස්සන කිරීමේ හැකියාව මානවයාට ඇත. ගස් ගල් මෙන් මානවයා සහ ඔහුගේ සිත එකතැන නොරඳවයි. විතැන්වේ. ක්‍රියාත්මක වේ. එබැවින් මානවයා කළමනාකරණය කළ යුතුය. මානවයා යනු සම්පතකි. මෙම සම්පත පලදායී ලෙස ගොඩනගා ගැනීමත් කළමනාකරණය කිරීමත් සමාජයේ වගකීමකි. මානව සම්පතෙහි සමබරතාවය ගොඩනැගීම බුදු දහම අනුව කළහැකි බව අටලෝ දහම මගින් පෙන්වා දී තිබේ.දහම් අධ්‍යාපනය තුළ මේ සඳහා අවශ්‍ය පරිසරය පවතී. පළමුවන ශ්‍රේණියේ සිට ධර්මාචාර්ය ශ්‍රේණිය දක්වා දහම් පාසල් අධ්‍යාපනය සංවිධානය කර ඇත. පහළ ශ්‍රේණි වලදී දහම් සිතුවිලි, සිරිත් විරිත් හා විහාරය කේන්ද්‍ර කරගෙන පවත්නා ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම ලබා දෙති. මෙම අවස්ථාවේදී නිපුනතා පදනම්ව කටයුතු කිරීමට දහම් ගුරුවරුන්ට උපදෙස් සපයා ඇත. ඉගෙනුමෙන් සිසුන් නිපුනතා මට්ටමට ළඟාවේ. අනතුරුව දහම් දැනුම හා සමාජ ධර්ම කොටස් ද අභිධර්මය ඇතුළත් වන පරිදි විෂය මාලා සංවිධානය කර ඇත. කුඩා අවධියේ සිට ධර්මාචාර්ය ශ්‍රේණිය දක්වා දහම් අධ්‍යාපනය ලබන සිසුවා සමාජයේ



Not For Sale - CMSP

යථාර්ථය හඳුනාගැනීමට උනන්දුවේ. පාසල් අධ්‍යාපනයෙන් දරුවන් විෂය කරුණු ඉගෙන ගනී. දහම් අධ්‍යාපනයෙන් සාරධර්ම ඉගෙන ගනී. දැනුමෙන් හා ගුණයෙන් පිරිපුන් දරුවා සමාජයේ හොඳ නොහොඳ අවබෝධ කරගනී. නොහොඳ සමාජයෙන් ඉවත් කිරීමට උනන්දු වේ. සංවර්ධනය වූ මානව සම්පතෙහි ස්වභාවය එයයි. මානව සම්පත සංවර්ධනය කිරීමට දහම් ගුරුවරයාට හැකියාව පවතින බව සඳහන් කළ යුතුය.

**සැලසුම් කරන්නෙකු ලෙස**

කරුණු සැලසුම් කරන්නෙකු වශයෙන් දහම් ගුරුවරයාගේ ප්‍රවේශය ඉතා වැදගත්ය. මෙයින් අදහස් වනුයේ දහම් පාසල් වල සාමාන්‍ය ක්‍රියාකාරීකම් සැලසුම් කිරීම නොවේ. වර්තමාන සමාජයේ පවතින ගැටලු අවම කිරීම සඳහා වන ක්‍රියාකාරකම් කෙසේ දහම් පාසල් අධ්‍යාපන කටයුතු වලදී අදාළ කරගනු ලබන්නේදැයි සලකා බැලීමයි. මේ සඳහා දහම් ගුරුවරයා උපායශීලී විය යුතුය. ඔහුගේ දැනුම වැදගත්ය. දහම් ගුරුවරයාගේ දැනුම සහ අවබෝධය දියමත පාවෙන අයිස් කන්දක් සේ පැවතිය යුතුය. අයිස් කුලක් දියමත පාවෙන විටදී සුලු ප්‍රමාණයක් ජලයෙන් මතුවී පෙනේ. වැඩි ප්‍රමාණයක් ජලය අභ්‍යන්තරයේ ඇත. දහම් ගුරුවරයාගේ දැනුම ද එසේ විය යුතුය. ඇසූ පිරූ තැන් හා දන උගත්කම් පවතින විට ගැටලු පහසුවෙන් තේරුම් ගැනීමටත් විසඳුම් සොයා ගැනීමටත් අවකාශව ඇත. උගත් හා දැනුවත් බවින් දහම් ගුරුවරයා ශක්තිමත් විය යුතුය. දහම් පාසල් අධ්‍යාපනය තුළ බාහිර කරුණු සම්බන්ධකර ගත හැකි වනුයේ එවිටය. සැලසුම් කිරීමේ හැකියාව සහ උපායශීලී බව සමාජ පරිවර්තනය කිරීමේ කටයුතු වලදී පැවතිය යුතු වැදගත් ගුණාංගයන්ය.



Not For Sale - CMSP

**සිසු දරුවන්ට සහාය දක්වන්නෙකු ලෙස**

සිසු දරුවන් සමඟ එක්ව කටයුතු කරන්නකු වශයෙන් හා ඔවුන්ගේ ගැටලු සදහා විසඳුම් සෙවීමට සහය ලබා දෙන්නෙකු වශයෙන් පවත්නා ප්‍රවේශයන් මෙහිදී සාකච්ඡාවට බඳුන් කළ හැකිය. සමාජයේ දැන උගත්කම් හා අද්දැකීම් බහුල වැඩිහිටි අයෙකු ලෙස සහ කළ්‍යාණ මිත්‍රයකු වශයෙන් දහම් ගුරුවරයා කටයුතු කිරීම මෙයින් අදහස් වේ. පාසලක පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන දරුවාට ඔහුගේ ගුරුවරයා තරම් වෙනස් කිට්ටු වන්තයෙක් නොමැත. ගෙදරදී මව හෝ පියා යමක් කීවත් ඔහු බලාපොරොත්තු වන්නේ ගුරුවරයාගේ මතයයි. සිසු දරුවන් ගුරුවරුන් විශ්වාස කරනු ලබයි. ගුරුවරුන් සිසු දරුවන්ගේ සිතුම් පැතුම් ක්‍රියා පිළිවෙත් තේරුම්කර ගත යුතුය. මෙම ප්‍රවේශයන් දහම් පාසල් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට සහ සමාජ පරමාර්ථ සකස්කර ගැනීම සඳහා යොදාගත හැකිය.

**පොදු කරුණු පිළිබඳ අවධානයට**

දහම් පාසල් කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සදහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලිඛිත උපදෙස් ලබාදී තිබේ. එහි දහම් ගුරු භූමිකාව සහ ගුරුවරයා තුළ තිබිය යුතු ගුණාංග රාශියක් පිළිබඳව සාකච්ඡා කර ඇත. ලාංකීය ඉතිහාසයේ තිබූ සමෘද්ධිමත් බවත් ගුණගරුක හා දැන උගත්කම් පිළිබඳවත් සලකා බැලීමක් සිදු කරන ලදී. යහපත් සමාජයක් ගොඩනගා ගැනීම දැනට පවතින අවශ්‍යතාවය තේරුම්ගෙන ඒ සඳහා දහම් ගුරු අධ්‍යාපනය පවතින සමාජ වගකීම ඉටුකිරීම සඳහා කෙසේ අනුකූල කරගත යුතු දැයි



Not For Sale - CMSP

ප්‍රවේශයක් ඇසුරින් කරුණු සලකා බලන ලදී. පවත්නා විධිවිධාන අනුව දහම් පාසල් අධ්‍යාපනය දෙන අතරතුර පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය ලක්කිරීම කළහැකි බව අවධානය කරනු කැමැත්තෙමි.

දහම් පාසල් දරුවන් කරනු ලබන යහපත් වැඩ සම්බන්ධයෙන් ලේඛනයක් සකස් කිරීම. මෙම ලේඛණය දරුවාගේ නෙතට නිරන්තරයෙන් යොමුවේ. බාහිර පාර්ශවයන්ට ද එම ලේඛනය දැකගත හැකිය. දරුවාගේ සිතෙහි සොම්නසක් ඇතිවන අතර උදාර බවක්ද ජනිත වේ. ඔහු නිරන්තරයෙන්ම යහපත් දේ කිරීමට උනන්දු වේ. දහම් ගුරුවරුන් නිරන්තරයෙන් මෙම ලේඛනය පරීක්ෂා කළ යුතු අතර සිදුකර ඇති සත් ක්‍රියාවන් අගය කළ යුතුය. අනෙක් දරුවනට ද මෙම තොරතුරු දැන ගැනීමට ඉඩ සැලසීම වැඩදායක ය.

දහම් පාසල් දරුවන් බුදු දහම වැළඳගෙන ඇත්තේ එහි පරමාර්ථයන් හෝ වටිනාකම් අවබෝධ කරගෙන නොවේ. දෙමාපියන්ගෙන් ලද උරුමයක් පරිද්දෙනි. එම නිසා සැබෑ බෞද්ධකම හා බෞද්ධයා යනු කවරෙක් ද යන්න මැනවින් සිසුන් හට අවබෝධකර දිය යුතුය. තවද රටේ ආගමික සහජීවනය උදෙසා අනෙකුත් ආගම් පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් සිසුන් වෙත ලබාදීම වැදගත් වේ. ඕනෑම ආගමක් විසින් කටයුතු කරනු ලබන්නේ සමාජ යහපත උදෙසා වන බැවින් මෙම ක්‍රියාව අවැඩක් නොවන්නේ ය.

සිසු දරුවන්ගේ නිවෙස්වල පවතින පරිසරය අනුව ඔවුන්ගේ ක්‍රියාපිළිවෙත් අනුගත වන නිසා දරුවන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳව දහම් ගුරුවරුන් විමසිලිමත් විය යුතුය. මව්වරුන් විදේශගතව සිටීම, විරැකියාව, බීමත් බව හා මත්



Not For Sale - CMSP

ද්‍රව්‍යවලට ඇබ්බැහිවී තිබීම, ආර්ථික අගහිඟකම්, ගෘහස්ථ ප්‍රචන්ඩත්වය වැනි සාධක දරුවන්ගේ මනස ව්‍යාකූලවීමට හේතුවී තිබිය හැකිය. බිඳුනු හා තැලෙන සිත් දහම් ගුරුවරයා තම අවබෝධය තුළ හඳුනාගත යුතුය. අභියෝග ජයගත හැකි පරිදි දරුවන්ගේ මනස ශක්තිමත් කිරීමට දහම් පාසල් ගුරුවන්ට හැකි විය යුතුය. දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථය ද සමාජ වගකීම ද මෙය බව ගුරුවරුන් අවබෝධකරගත යුතුව ඇත.

දරුවනට ජීවිතයේ පළමු වැරැද්ද නොකර සිටීමට දහම් ගුරුවරුන් විසින් ස්වයං ප්‍රතිඥාවක් ඇති කළ යුතුය. මෙයින් අදහස් වනුයේ තම තමන්ගේ දිනපතා වැඩ කටයුතු සිදුකරන අතරතුර දී අත්වැරැද්දක් හෝ සිදු නොවන තත්ත්වයට දරුවන් පෙළඹවීමයි. පළමුවන වැරැද්ද සිදු කරනු ලබන දරුවාට දෙවන වැරැද්ද කිරීම මුල් අවස්ථාවේ දී ප්‍රමාණයට අපහසු නොවේ. තෙවන සිව්වන වැරැදි කිරීමට හා දිගින් දිගට වැරැදි කිරීම පහසු වේ. එබැවින් ආරම්භයේ දී පටන් පළමුවන වැරැද්ද නොකිරීමට දරුවන් පුරුදු පුහුණු කරන විට ඔවුන් හොඳ නරක අවබෝධ කරගෙන වැඩකටයුතු කිරීමට පෙළඹේ. අත් වැරදීම් සිදුවීම ස්වාභාවිකය. එහිදී දරුවන් සිදුවූ වැරැද්ද අවබෝධකර ගනු ඇත. ළමා අවධියේ දී මෙම ප්‍රතිපත්තිය දරුවන් තුළ ඇති කිරීමට උනන්දු විය යුතුය. වැඩිහිටියන් බවට දරුවන් පත්වන විට ප්‍රතිපත්තිය හා භාවිතය අනුව ඔවුන් යහපත් කටයුතු කරන්නන් බවට පත්වේ.

තුනුරුවනට මාපිය ගුරුවරුන් හා වැඩිහිටියනට ගරුකරන ගුණ දහමින් යුතු සමාජයට වැඩදායී බුද්ධිමත් පරපුරක් රටේ අනාගතය වෙනුවෙන් බිහිකිරීමේ මහඟු කාර්ය භාරයේ වගකීම් කොටසක් දහම් පාසල් ගුරුභවතුන් වෙත ද



Not For Sale - CMSP

පැවරේ. වර්තමානයේ දැවෙන තැවෙන සමාජය සුවපත් කළ හැකි වන්නේ මෙය යථාර්ථයක් බවට පත්කර ගතහොත් පමණි. මෙම තත්ත්වය දහම් ගුරුවරුන් පමණක් නොව සියලු පාර්ශවයන් අවබෝධකරගත යුතුය. දහම් පාසල් අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය විධිවිධාන ඇති කළ යුතුය.

ඉරිදා දින පවත්වනු ලබන පෞද්ගලික උපකාරක පංති දහම් පාසල් කටයුතු වලට මහත් බාධාවකි. ඉරිදා දින දහම් පාසල් කටයුතුවලට අවහිර වනසේ බාහිර පංති නොපැවැත්විය යුතු බවට තරමක් දුරට විධිවිධාන දැනට සලසා ඇතත් එය ප්‍රායෝගිකව සිදු නොවේ. බලධාරීන්ගේ කඩිනම් අවධානය මේ සඳහා යොමුවිය යුතුය. තවද සුදුසුකම් සහිත තැනැත්තන් දහම් ගුරු සේවාවට යොමුකර ගැනීමට සුදුසු ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඇතිවිය යුතු බවට අවධාරණය කරයි. දැනට ගුරුවරුන් විසින් ස්වේච්ඡාවෙන් ඉටුකරනු ලබන සේවයද නිරන්තර ඇගයීමට ලක්විය යුතුය. සම්පත් හිඟකම නිසා සහ ඒවා අත්පත් කර ගැනීමට පවතින බාධා හේතුවෙන් දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් මහත් අසීරුතාවයට ලක්වන අවස්ථා නැතුවා නොවේ. දහම් පාසල් උදෙසා කරනු ලබන ආයෝජනයක් කිසිදා අපතේ නොයන බව සියලු පාර්ශවයන් අවබෝධ කරගත යුතුය. දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම හා මඟ පෙන්වීම් නොඅඩු නිරන්තරව සිදුවිය යුතුය. දෙමාපියන්ගේ සහ සුබපතන්නන්ගේ අවධානය දහම් පාසල් වෙත යොමුකරගත යුතුය. දහම් පාසල් වැඩ පිළිවෙළ සහ එහි පරමාර්ථ අවට ප්‍රජාව දැන අවබෝධකරගෙන තිබීම සමාජ යහපත ඇතිවීමට ද හේතුකාරක වන බව කිව යුතුය.

Not For Sale - CMSP

# 12. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවේද දහම් ගුරුවරුන්ට පෙන්වන මග

පරිපූර්ණ දැනුමෙන් (සර්වඥතා ඥානයෙන්) යුත්, අසම සම පෞරුෂයෙන් හෙබි, ශ්‍රේෂ්ඨ ගුරුභවතෙකු තුළ තිබිය යුතු අති උත්තම ගුණයන්ගෙන් පිරුණු ලොව පහළ වූ ආදර්ශවත් ගුරු උතුමා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ යි. ඒ නිසාම ලෝකගුරු නමින් හැඳින්විණි. තමන් වහන්සේ ස්වයංභූඥානයෙන් ලත් දැනුම, ශ්‍රාවකයන්ට විධිමත්ව, එමෙන්ම සරලව පහසුවෙන් උකහා ගතහැකි පරිදි ඉගැන්වූ ජ්‍යෙෂ්ඨතම ගුරු උතුමා බුදුරජාණන් වහන්සේ යි. බුදුරජාණන් වහන්සේ සාර්ථක ගුරුභවතෙකු ලෙසින් නිගමනය කිරීමට අවශ්‍ය සාධක ත්‍රිපිටකය පුරාම විසිරී පවතී. තම ශ්‍රාවක ප්‍රජාවට හෙවත් සිව්වනක් පිරිසේ ශික්ෂණය සඳහා බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය පහදා දීම සඳහා යොදාගත් ශිල්ප ක්‍රමය සිත්ගන්නා සුළු වේ. මෙම ඉගෙනුම් උගැන්වීම් රටාව දහම් පාසල් පන්ති කාමරයේ දී ඔබට මැනවින් යොදාගත හැකි ය. භාරතයේ විසූ ශ්‍රේෂ්ඨ ගුරු භවතා හැඳින්වීමට ව්‍යවහාර කළ නිල නාමය "දිසාපාමොක් " යන්න යි. සැනසීමට මගපෙන්වන්නා යන අරුත ඉන් ලැබේ. (මෝක්ෂය)ඔහුගේ පාසල තක්ෂිලාව විය. අධ්‍යාපනය = අධි+ආපන යන්න අරුත් සපයන්නේ උසස් පැවැත්ම යනුවෙනි. ඔබ හමුවට පැමිණෙන දරුවාගේ උසස් පැවැත්මේ වගකීම ඔබ අත රැඳී පවතී. දහම් අධ්‍යාපනය දරුවාට මේ සඳහා ඉඩ පහසුකම් සලසයි. එහි මෙහෙයුම්කරු වනුයේ දහම් පාසල් ගුරුභවතා යි. බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ දේශනා ශෛලීන් ඒ සඳහා හේතුවනු ඇත. ප්‍රශස්ත දහම් පාසල් ගුරුභවතෙකු වීමට ඉන්



Not For Sale - CMSP

ඔබට ආදර්ශ සපයයි. ලේඛන කලාවේ පහසුකම් නොතිබූ යුගයක, උපකරණ භාවිතයේ අවම තාක්ෂණික පහසුකම් පැවති යුගයක, සාර්ථක ගුරුභවතෙකු වශයෙන් සුවිසල් දැනුමක් සූවාසූ දහසක් ධර්මස්කන්ධය ඔස්සේ වසර 45 ක් වැනි කෙටි කාලසීමාවක දී මැනවින් සමාජගත කර ඇත. නූතන අධ්‍යාපන විද්‍යාවෙන් හා මනෝ විද්‍යාවෙන් ගුරු සේවය සාර්ථක කරගැනීමට නිර්දේශ කර ඇති සියලු විධික්‍රම බුදුරජාණන් වහන්සේ අනුගමනය කර ඇති බවට ත්‍රිපිටකය සාක්ෂි දරයි.අපේක්ෂිත අරමුණු වූ චර්යාමය වෙනස දරුවා තුළ ඇති කිරීමට මෙකී විධික්‍රම දහම් පාසල් ගුරු භවතා අනුගමනය කරන්නේ නම් ඔහු නිතැතින්ම දරුවන්ගේ සිත්ගත් මග පෙන්වන්නෙකු වනු ඇත.

දහම් පාසලේ පන්ති කාමරය තුළ හමුවන දරුවන් විවිධ ගති ලක්ෂණ වලින් යුත් පිරිසකි. ඔවුන් පුද්ගල, කායික, මානසික තත්වයෙන් එකිනෙකට වෙනස් වේ. එසේම ඔවුන්ගේ සමාජ පසුබිම හා බුද්ධි මට්ටම ද වෙනස් ය. මේ ගැන ඔබ බෙහෙවින් සැලකිලිමත් විය යුත ය. පන්ති කාමරයේ කවුරුත් ඔබට පොදුවේ දරුවන් ය. ඔවුන්ගේ වෙනස්කම් පිළිබඳව අවබෝධයෙන් යුතුව ඔබ පාඩම ගොඩනැගිය යුතු ය. ඔබගේ දැනුම පහසුවෙන් ග්‍රහණය කරගත හැකි අයුරින් පාඩම සංවර්ධනය කළ යුතු වේ. බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවන් හි දී අනුගමනය කළ විධික්‍රම ඔබට ගුරු උපදේශකයෙකු වනු ඇත. එහිදී වඩා වැදගත් වනුයේ ප්‍රවේශය යි.හොඳ ඉදිරිපත් කිරීමක් වීමට ශ්‍රාවකයාගේ සුවදුක් විමසීම, කතාවක් කීම, ප්‍රශ්නයක් නැගීම, සිද්ධි නිරූපණයක් කිරීම, කවියකින් ගාථාවකින් පාඩම ආරම්භ කිරීම, කුතුහලය දනවන අයුරින් ප්‍රවෘත්තියක් නිර්මාණය කිරීම සාර්ථක ප්‍රවේශ ලෙස



Not For Sale - CMSP

යොදාගත හැකි ය. එහි දී පළමුව දරුවාගේ මානසික ආවශ්‍යතා ගැන  සැලකිලිමත් විය යුතු ය. බඩගින්නේ පැමිණි ගොවියෙකුට ආහාර ලැබෙන්නට සලස්වා පසුව බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළ පුවතක් ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. අධ්‍යාපන විද්‍යාවේ එය අවශ්‍යතා සංකල්පය යනුවෙන් දක්වේ. එසේම දරුවාගේ සංවර්ධන අවධි ගැන සැලකිළිමත් විය යුතු ය. පූර්ව ළමා අවධියේ ගැඹුරු ධර්ම කරුණක් ග්‍රහණය කර ගැනීම පහසු නොවනු ඇත. චුල්ල පන්ථක හාමුදුරුවන්ට එක් ගාථාවක් මාස කිහිපයක් ගත වුණත් වනපොත් කිරීමට නොහැකි විය. තම සොයුරු මහා පන්ථක හිමියෝ කුඩා සාමණේර නම ආරාමයෙන් බැහැර කළහ. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ආරාමයේ දොරටුව ළඟ දී සාමණේර හිමියන්ගේ අතින් අල්ලාගෙන තම කුටියට කැඳවාගෙන චිත් හිස අතගා පුත්‍ර ප්‍රේමයෙන් පිරිසිදු රෙදි කැබැල්ලක් අතට දී හිරු එළියේ තැන්පත් වී එය " රජෝ හරණං " යනුවෙන් කියමින් අතින් පිරිමැදීමට උපදෙස් දුන්හ. වැඩෙන දරුවන්ගේ මනසට මැනවින් ගැලපුන එම උපක්‍රමය නිසා හත් හැවිරිදි වියේ පසු වූ සාමණේර හිමියෝ කරුණු අවබෝධ කර ගත්හ.

හැමදෙනාගේම යහපත ඔබගේ ගුරු දිවියේ පදනම විය යුතු ය. ප්‍රථම රහත් හැට නමට බුදුරජාණන් වහන්සේ මෙසේ අවවාද කළහ.

"චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය,බහුජන සුඛාය ......" දහම් පාසල් ගුරුභවතෙකු වන ඔබ කටයුතු කළ යුත්තේ හැම දෙනාගේ ම සුව පහසුව සඳහා යි.  එසේ සේවය කරන ඔබ ශිෂ්‍යයාගේ ගති ලක්ෂණ හොඳින් තේරුම් ගැනීම අවශ්‍ය වේ. එම ගති ලක්ෂණ විවිධාකාරය.



Not For Sale - CMSP

1. පාඩම වහාම ග්‍රහණය කර ගත හැකි දරුවන්. (උග්ඝටිතඥ)
2. සාරාංශයෙන් ම පාඩම ග්‍රහණය කර ගන්නා (විපටිතඥ)
3. කරුණු තවත් පැහැදිලිකර තේරුම් ගන්නා (ශ්‍රේය්‍ය)
4. ගුරුවරයාගේ උත්සාහය අපතේ යවමින් පාඩම අවබෝධ කර ගැනීමට අපහසු දරුවා (පදපරම)

මේ සෑම තත්ත්වයක් ම ඉවසීමෙන් දරාගෙන පාඩම සංවර්ධනය කළ යුතු ය. එය දරුවන් අවබෝධ කර ගැනීම ට ඔබට පහසුවක් වනු ඇත. නිදහස්ව සිතීමට සෑම දරුවෙකුට ම අවස්ථා සැලසිය යුතු ය. බුදු දහම නිදහස් චින්තනයෙන් බැබළෙන දහමකි. එහි ගුරුමුෂ්ටි නැත. සැඟවුණ රහස් නැත. විවෘත ය. ධර්මය විවෘත වූ තරමට බැබළේ. " විවටෝ විරොචති නො පටිච්ඡන්නෝ" ඒහි පස්සික ගුණය ධර්මයේ තිබේ. ඔබ දරුවන්ගේ පිබිදෙන විවෘත මනස ගැන සැළකිලිමත් වන්න. පුංචි දෙයකින් ලොකු දෙයක් ග්‍රහණය කර ගැනීමේ හැකියාව ඔවුන්ට ඇත. පුංචි රාහුල සාමණේරයන්ට ජලයෙන් පිරුණ බඳුන හිස්කර, එහි අනිත් පස පෙන්වීම තුළින් ගැඹුරු දහම් කරුණක් අවබෝධකර දීමට බුදුපියාණෝ සමත් වූහ. දහම් පාසල් ශිෂ්‍යයන් දින පහක් රජයේ පාසලෙන් වෙහෙසට පත් වූ මනසින් දහම් පාසලට පැමිණෙති. දරුවන් ප්‍රබෝධවත්ව පන්ති කාමරයේ තබා ගැනීම ඔබ සතු වගකීම යි. ඔවුන් පාඩමට ඇද බැඳ තබා ගැනීම ඔබගේ දක්ෂකම යි. ඒ සඳහා පාඩමේ ආරම්භය ප්‍රණීත විය යුතු ය. මැද සරල විය යුතු ය. අවසානය ද ප්‍රණීත විය යුතු ය. බුදුරජාණන් වහන්සේ මුල, මැද, අග තුන් තැන සරල වූ ප්‍රියශීලී වූ, පහසුවෙන් වටහා



Not For Sale - CMSP

ගතහැකි ලෙසට දහම් දෙසූහ. “ආදි කල්‍යාණං ” එහි සෑම තැනම සාර්ථක විය. සරු විය. “සාත්ථං සබ්බඤ්ජනං” පිළිවෙළකට දේශනය කළහ. (ආනු පුබ්බ කථා ) සරල බවින් ආරම්භව ගැඹුරින් කෙළවර විය. ඉහළ මානසික තලයකට ශ්‍රාවකයා ගෙන ඒමට ගුරු උතුමා සමත් විය. (සාමුක්කංසික දේශනා) දානකථං, සීල කථං, සග්ග කථං , කාමානං ආදීනව ඕකාරං සංකිලේසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසේසි ...”ඔබ දරුවා හමුවට යා යුත්තේ පාඩම මනාව සැලසුම් කරගෙනයි. පෙර සූදානම බෙහෙවින් ම වැදගත් වේ. ඒ සඳහා පෙළ පොත මනාව පරිශීලනය කළ යුතු ය. පාඩම සැලසුම් කළ යුතු ය. පෙළ පොත ඉදිරියෙන් තබාගෙන දේශනයක් කිරීම, පාඩම තේරීම, දක්ෂ ගුරුවරයකුගේ කාර්ය භාරය නොවේ. ඉන් දරුවා තුළ බුද්ධි කලම්බනයක් සිදු නොවේ.

- **කෙවල පරිපූණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති.**

අපූර්ව විධික්‍රමයන් භාවිත කරමින් බුදුරජාණන් වහන්සේ මිනී මරු දරුණු අංගුලිමාල දහමට නැඹුරු කරගත්හ. “නවතිනු මහණ !”යනුවෙන් අංගුලිමාල බුදුන් ඇමතූ විට බුදුරජාණන් වහන්සේ වදාළේ “මම නැවතුනෙමි”යනුවෙනි. මේ ගැඹුරු ප්‍රකාශයට සිත් යොමු කළ අංගුලිමාල ප්‍රකාශයේ අරුත වටහා ගත්තේය. ජීවිතයේ ගැඹුර තේරුම් ගැනීමට නොහැකි වූ කිසා ගෝතමියට එය පහදා දෙන්නට උත්සහ නොකළහ. නොමළ ගෙයකින් අබ ගෙනෙන්නට නියම කිරීමෙන් ක්‍රමානුකූල චින්තනයෙන් ජීවිතයේ ගැඹුර සොයාගන්ට කිසා ගෝතමියට අවස්ථා සලසා දුන්හ. වේදනාවෙන් රෝගී වූ මහා කාශ්‍යප මහ

Not For Sale - CMSP

රහතන් වහන්සේ, මහ මොග්ගල්ලාන මහ රහතුන්වහන්සේ හමුවේ ගැඹුරු ධර්මය නොවදාළහ. ඒ උතුමන්ගේ සුවදුක් පළමුව විමසූහ. පසුව ධර්මයේ ගැඹුරු කරුණු සිහිපත් කළහ. " කච්චි තේ මොග්ගල්ලාන ඛමනීයං කච්චි යාපනීයං, කච්චි වේදනා" පාඩමක් ආරම්භ කිරීමට දක්ෂ ගුරුභවතා විවිධ උපක්‍රම භාවිතා කරයි. ප්‍රශ්නයකින් පාඩම ආරම්භ කිරීම එවන් එක් උපක්‍රමයකි. සමහර අවස්ථාවන් හි ගුරුවරයා ප්‍රශ්නය ඉදිරිපත් කර ගුරුවරයාම පිළිතුරු දෙයි.ධම්මචක්කපවත්තන සූත්‍රය එවන් එක් අවස්ථාවකි. දම්සභා මණ්ඩපයේ රැස්ව සිටින භික්ෂූන් හමුවට වැඩමකරවන බුදුරජාණන් වහන්සේ ඔබ වහන්සේලා කිනම් කථාවකින් කාලය ගත කළේ දැයි විමසති. ලැබෙන පිළිතුර පාදක කරගෙන පාඩම සංවර්ධනය කිරීම එහි දී සිදු වේ. බොහෝ විට අතීත කථාවකින් පූර්වාපර සන්ධි ගැලපීම සිදු විය. කතාවකින් පාඩම ආරම්භ කිරීම ද හොඳ විධික්‍රමයකි. ජාතක පොත පුරාවට ඇති කථා පාදක කරගෙන දස පාරමිතා විස්තර කර ඇත. සිද්ධි අධ්‍යාපනය තවත් හොඳ විධික්‍රමයකි සිගාල ගෘහපති පුත්‍රයා සිදු කළ සය දිසා වන්දනා සිද්ධිය පාදක කරගෙන ගිහි ජීවිතයට අදාළ වටිනා පාඩමක් බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයෙන් ඉදිරිපත් කර ඇත.ඍජුවම ප්‍රශ්නය අසා පිළිතුරු ලබාදුන් අවස්ථා (ඒකංස ව්‍යාකරණ) ප්‍රශ්නය කොටස්වලට කඩා වෙන්කර විග්‍රහ කළ අවස්ථා (විභජ්ජ ව්‍යාකරණ) ප්‍රති ප්‍රශ්න අසමින් විග්‍රහ කළ අවස්ථා (පටිපුච්ඡා ව්‍යාකරණය) ඉදිරිපත් වූ ප්‍රශ්නය නොසලකා හැරීම (ඨපනීය ව්‍යාකරණ) බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ ඉගැන්වීම් රටාවන් වේ. දම්සක් පැවතුම් සූත්‍රය ආරම්භක දේශනය වූ නිසාම දේ කොණ්ඩඤ්ඤ හිමියන් පමණක් මාර්ග ඵලලාභී වීමට හේතු විය. ධර්මය (පාඩම) මැනවින් විවරණය



Not For Sale - CMSP

කර බෙදා කොටස් කර විග්‍රහ කිරීමට සැරියුත් මුගලන් හිමිවරුන් සමත් බව පෙන්වා දීම (විභජ්ජ) ව්‍යාකරණය නිදසුනක් වෙයි.උදා :- (සච්චවිභංග සූත්‍රය) මෙවැනි අවස්ථාවන්ට ගුරු භවතුන්ට මුහුණදීමට සිදුවනු ඇත. එහි දී බුදුරජාණන් වහන්සේ ආදර්ශයට ගැනීම වඩා යහපත් වේ.සුනාමි විපත පාදක කරගෙන දුක, කර්මය වැනි දේ පැහැදිලි කළ හැකි ය.

රජයේ වැටුප ලබන ගුරුවරයෙකුගේ කාර්යභාරයට වඩා දහම් පාසල් ගුරුභවතාගේ කාර්ය භාරය වෙනස් ය. වැටුප් නොලබන නිසා එම සේවය උතුම් ය. එහෙත් පැවරී ඇති වගකීම අනෙක් සෑම වෘත්තියකට ම වඩා බෙහෙවින් ම වෙනස් ය. ගුණ දහමින් පෝෂිත හොඳ බෝසත් දරුවෙකු සමාජගත කිරීම ඔබගේ වගකීමයි. දරුවාගේ ඇවතුම් පැවතුම් සියල්ල සකස් කිරීම ඔබගෙන් බලාපොරොත්තු වේ. වගකීමෙන්, ලැදියාවෙන් සේවය සිදු කිරීම අපේ අපේක්ෂාවයි. දරුවාගේ වැරදි චර්යා ආදර්ශයෙන් අවබෝධ කරදීමට, පුත්‍ර ප්‍රේමයෙන් කටයුතු කළ යුතු ය. බුදුරජාණන් වහන්සේ හොඳ මගපෙන්වන්නෙක් වූහ. (අක්ඛාතාරෝ තථාගතා) එම මග පෙන්වීම ඔබගේ ආදර්ශය යි.

බුදුරජාණන් වහන්සේ තම දහම් පණිවිඩය ශ්‍රාවකයනට සමීප කරවීම සඳහා සාසනික කාර්‍යයේ කැපවීමෙන් කටයුතු කළ සිව්වනක් පිරිසට තනතුරු ප්‍රදානය කළහ. ඒතදග්ග පාලිය පුරාම මේ ප්‍රදානයන් පිළිබඳ විස්තර විසිරී පවතියි. දක්‍ෂයා තේරීම එහි මුඛ්‍ය පරමාර්ථයයි. දක්‍ෂයා ඇගයීම හොඳ අධ්‍යාපන ක්‍රියාවලියක අවශ්‍ය ම ලක්‍ෂණයකි. තක්සේරු කිරීම හා ඇගයීම අධ්‍යාපන විද්‍යාව අගය කරයි. මහා ප්‍රාඥයන් අතුරෙන් සැරියුත් මහ රහතන් වහන්සේ අග්‍ර වේ. උන්වහන්සේ



Not For Sale - CMSP

ධර්ම සේනාධිපති තනතුර ද හෙබ වූහ. මුගලන් මහරහතන් වහන්සේ ඍද්ධිමතුන් අතුරින් අගතැන් ලැබූහ. මෙලෙසින් දක්ෂයන් සිව්වනක් පිරිසෙන් ම තෝරා තනතුරු ප්‍රදානය කර ඇත. පන්ති කාමරයේ දක්ෂ සිසුන් තෝරා ඔවුන් ඇගයීම ඉගෙනුම් ඵල සාර්ථක වීමට හේතුවක් වනු ඇත. දරුවා තුළ නායකත්ව ලක්ෂණ ඇති කරවීමට එය උදව්වක් වනු ඇත.

නූතන පන්ති කාමර තුළ ඉතා සාර්ථක ඉගෙනුම් විධික්‍රමයක් ලෙස බහුලව යොදා ගන්නා උපක්‍රමය දෘෂ්‍යාධාර භාවිතය යි. දෘෂ්‍යාධාර ආශ්‍රය කරගෙන ගොඩනැගෙන පාඩම දරුවා කැමැත්තෙන් හා පහසුවෙන් ධාරණය කර ගනී. විද්‍යාව හා තාක්ෂණය දියුණු නූතන කාලයේ පන්ති කාමර තුළ විද්‍යාත්මක තාක්ෂණික දෘෂ්‍යාධාර භාවිත කිරීමේ වරම ගුරු භවතුන් සතුව තිබේ.එවන් පහසුකම් නොතිබූ යුගයක බුදුරජාණන් වහන්සේ මේ ක්‍රමය සාර්ථක ලෙස භාවිත කරමින් අවබෝධය සඳහා පහසුකම් සලසා ඇත. රූමත් ජනපද කල්‍යාණිය පිළිබඳ ප්‍රේමයෙන් මුසපත්ව සිටි නන්ද තෙරණුවන්ට තවදලි හේනක පිළිස්සී ගිය වැඳිරියක පෙන්වීමෙන් යහමගට ගත්හ.ඛේමාගේ රූප මදය නැති කිරීමට රූමත් ස්ත්‍රියක මවා දෘෂ්‍ය මායාවක් ඉදිරිපත් කරමින් රූප මදය දුරු කළහ. නිය පිටට ගත් පස් ඇබිත්තක් දක්වමින් හා සිංසපා (ඇට්ටේරිය) දෘෂ්ටාන්තය ඉදිරිපත් කරමින් දේශනා කර ඇති ධර්මයේ ප්‍රමාණයත් නොදෙසූ ධර්මයේ ප්‍රමාණයත් පැහැදිලි කළහ. එසේම නල කලාප සූත්‍රය අනුව එකක ආධාරයෙන් තවත් එකෙක පැවත්ම විග්‍රහ කරමින් හේතුඵල වාදය දෘෂ්ටාන්තයකින් පැහැදිලි කළහ. දන දන බොරුකීමේ හිස් බව හිස් ජල බඳුන නිදර්ශනයට ගෙන කුඩා රාහුල හිමියන්ට පහදා දුන්හ.



Not For Sale - CMSP

මඩ වගුරෙන් ඉහළට නැගුණු පියුමේ මඩ නො තැවරී බැබළෙන්නාක් මෙන් ආයභීයන් වහන්සේ පවතින සමාජ වතාවරණය යටතේ මතුවී බැබළෙන බව පැහැදිලි කළහ. දෘෂ්‍යාධාර භාවිතයෙන් මනා අවබෝධයක් ලබාදී මේ ඔබට හැකියාව තිබේ. එහිදී දැඩි අවධානය යොමු විය යුත්තේ විහාර ගෙයි සිතුවම්, ත්‍රිවිධ චෛත්‍ය ආදී කොට ඇති විහාර භූමිය සතු සම්පත් ය. දහම් පාසල් ගුරු භවතා මේවා යොදා ගැනීම වඩා ගැලපේ.

වරක් බුදුරජාණන් වහන්සේගෙන් සුප්‍රකට අශ්වයන් හික්මවන්නෙක් වූ කේසි මෙසේ ප්‍රශ්න කළේ ය. ඔබ වහන්සේ හොඳින් ශිෂ්‍ය පිරිස හික්මවන්නේ කෙසේ ද? බුදුරජාණන් වහන්සේ පෙරලා ඔහුගෙන් ප්‍රශ්න කර ඔහු දැක්වූ අශ්වයින් හික්මවන විධික්‍රම හතර ආශ්‍රය කරගෙන දන්නා දෙය ඇසුරෙන් නොදන්නා දෙයක් පැහැදිලිකර දීමේ විධික්‍රමය බුදුරජාණන් වහන්සේ උපයෝගි කරගෙන ඇත. වඩු කාර්මිකයා දත් ඔහුගේ කර්මාන්තය ඇසුරුකරගෙන, ගවයන් පාලනය කරන ගව පාලකයාගේ දැනුම උපයෝගී කරගෙන. වීනා වාදකයාගේ වීණා වැයීමේ අවබෝධය උපයෝගී කරගෙන දන්නා දේ ඇසුරින් නො දන්නා දේ පැහැදිලි කරදීමේ උපක්‍රමය බුදුරජාණන් වහන්සේ උපයෝගී කරගෙන ඇත. දහම් පාසල් දරුවාගේ අත්දැකීම්, දැනුම පාදක කරගෙන දහම පිළිබඳ අවබෝධය ලබාදීමේ උපක්‍රමය දහම් පාසල් ගුරුභවතාට යොදාගත හැකි ය.

බුදුරජාණන් වහන්සේ බොහෝ විට පරිසරය ආශ්‍රය කර ගත්හ. පරිසරයේ වැඩ වෙසෙමින් පරිසරය ආශ්‍රිත දේ සහය කරගෙන කරුණු පැහැදිලි කළහ. දහම් පාසල් ගුරු භවතා හැකි හැම විට පරිසරය ආශ්‍රිතව පාඩම ගොඩ නැගිය යුතුය.



Not For Sale - CMSP

පන්ති කාමරයට වඩා බෝ මළුව, විහාර මන්දිරය, වෙහෙර මළුව, රුක් සෙවණ යන ස්ථානයන් හි දරුවන් රැස්කරගෙන එලෙසින් පන්තිය පැවැත් වේ නම් එය දරුවන්ට ද අලුත් අත්දැකීමක් වනු ඇත. ප්‍රථම ධර්ම දේශනය එළිමහනේ පියකරු පරිසරය ඇසුරු කරගෙන පස්වග තවුසන් පිරිවරාගෙන පවත්වා ඇත. දහම් පාසල් අධ්‍යාපනය ගෞරවනීය ලෙස භුක්ති විඳීමේ අවස්ථාව මේ නිසා දරුවන්ට ලැබේ. ගුණ යහපත් පුරවැසියන් බිහි කිරීම අධ්‍යාපනයේ පරමාර්ථය විය යුතු ය. ලාභය, තරගකාරීත්වය පදනම් වූ සමාජ රටාවක විශේෂයෙන් දහම් පාසල් ගුරු භවතා ඒ ගැන අවබෝධයෙන් තම උතුම් සේවය දරුවන්ට කරුණාවෙන් ලබාදිය යුතු ය. මනුෂ්‍යත්වය ගොඩ නැගීම වෙනුවෙන් කැපවිය යුතු ය. මානසිකව කායිකව, නිරෝගී වූ සාධාරණව තීරණ ගැනීමේ හැකියාව ඇති කාරුණික හදවතින් කටයුතු කිරීමට හැකි දරු පරපුරක්, ගුණ ගරුක දරුපරපුරක් බිහි කිරීම දහම් පාසල් ගුරු භවතාගේ වගකීම වේ. විෂය කරුණු වලින් ඔළුගෙඩි පිරවීමට වඩා අභියෝග ජයගත හැකි පරපුරක් සමාජයට උරුම කරදීම දහම් ගුරුවරයාගේ වගකීම විය යුතු වේ.

**මේ ගැනත් ඔබේ අවධානය යොමු කරන්න.**

★ පන්ති කාමරය තුළ දරුවාගේ හැසිරීම පිළිබඳ පරීක්ෂාකාරී වන්න. අසුනේ නිසි පරිදි වාඩි වෙනවාද? පිරිසිදුව පැමිණ ඇත්ද? ගැලපෙන ඇඳුමකින් සැරසී ඇත්ද? නිය සපනවාද? නාසයේ හා මුඛයේ ඇඟිලි දමයි ද?

★ ගුරුවරයාට මැනවින් සවන්දේ ද? පන්තියේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වේද?

Not For Sale - CMSP

- ★ දරුවන් අතරේ සිටිමින් දරුවන් ක්‍රියාකාරකම් හි යෙදවීම (පුටුවේ වාඩි වී ඉගැන්වීම නො ගැලපේ)
- ★ නිශ්ශබ්ද දරුවන් පන්ති කාමරය තුළින් අපේක්ෂා නොකරන්න.
- ★ පෙර සූදානම පන්ති කාමරයට යන විට නියමිත පාඩම පිළිබඳ පෙර සූදානමක් ඇතිව යන්න.
- ★ හැකි හැමවිට ශ්‍රව්‍ය, දෘෂ්‍ය උපකරණ භාවිතයට ගන්න. පරිසරයෙන් සොයාගත හැකි හා ඉවත දමූ දේ යොදා ගැනීම වඩා යෝග්‍ය ය.
- ★ දරුවාගේ චිත්තවේග ගැන සැලකිලිමත් වන්න.
- ★ දරුවාට හැමවිට ආදරය දක්වන්න.
- ★ වැඩි වැඩියෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි යොදවන්න.
- ★ ගුරු කේන්ද්‍රීය නොවී, ශිෂ්‍ය කේන්ද්‍රීය වන්න.
- ★ පාඩම කියා දීමට නොගොස් පාඩම ඇසුරෙන් ඉගෙනුම් අවස්ථා මතුකර ගන්න. දේශකයෙක් නොවීමට වගබලා ගන්න.
- ★ වතාවත්වලට මුල්තැන දෙන්න.
- ★ උදෑසන රැස්වීමට අනිවාර්යයෙන් ම සහභාගි වන්න.
- ★ නියමිත වෙලාවට දහම් පාසලට එන්න.
- ★ කාල පරිච්ඡේදයේ ආරම්භය පාඩමේ ආරම්භය විය යුතු අතර නියමිත කාලයේ දීම පාඩම අවසන් කරන්න. ඔබට හිමි කාලය ගැන සැලකිලිමත් වන්න.
- ★ විහාර ගෙය, බෝ මළුව, සෑ මළුව ඇසුරු කරගෙන හැකි හැමවිට පන්තිය පැවැත්වීමට උත්සාහ ගන්න.
- ★ අසිරිමත් ගුරු භූමිකාව ගුරුකම පාරමිතාවක් වශයෙන් සලකාගෙන ක්‍රියාකරන්න.

Not For Sale - CMSP

- ★ ආධ්‍යාත්මික සතුටක් භුක්ති විඳීමේ චේතනාවෙන් බෙහෙවින් ම පිබිදුණු සිතින් පන්තියට යන්න. (ප්‍රබුද්ධ මනසින්)
- ★ ඔබ සිදුකරන්නේ විශිෂ්ට සේවාවක් බව හැම විට සිතන්න.
- ★ භේද, උස් පහත්කම් නො සිතා හැම දරුවෙක් ම තමාගේ දරුවෙක් ය යන ආකල්පයෙන් ඉගැන්වීමේ ක්‍රියාවලියේ කරුණාවෙන් යෙදෙන්න.දරුවන් කෙරෙහි බෙහෙවින් ම කාරුණික වන්න.
- ★ සන්සුන් මනසින්, සිනහවකින් මුඛ සරසාගෙන පන්ති කාමරයට පිවිසෙන්න.

"මනුෂ්‍යත්වය වෙනුවෙන් ඔබ කරන දෙයින් බොහෝ ප්‍රමාණයක් වැදගත් ඒවා ලෙස නොපෙනෙනු ඇත. එහෙත් වැදගත් වන්නේ ඒවා කිරීමයි. "

- මහත්මා ගාන්ධි -

Not For Sale - CMSP

## උප ග්‍රන්ථය

### හැඳින්වීම

දහම් පාසල් හි ගුරු භවතුනට භාවිත කළ හැකි පරිදි බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ප්‍රාථමික ශ්‍රේණි (1 -5) සඳහා මේවන විට ගුරු අත්පොත් සපයා ඇත.

එම ප්‍රාථමික ශ්‍රේණි ගුරු අත්පොත් හි දක්වා ඇති අපේක්ෂිත උපනිපුණතා එකී පන්තිවලට අදාළ ව උපුටා ගෙන පාඩමේ නම සඳහන් කරමින් ඒ යටතේ දක්වා ඇත.

ද්විතීයික ශ්‍රේණි සඳහා නියමිත පෙළ පොත් සඳහා ගුරු මාර්ගෝපදේශ මෙතෙක් නොමැති බැවින්, 6-10 ශ්‍රේණි පෙළ පොත්වල ඇතුළත් පාඩම් මාතෘකාවලට අනුව සකස්කරන ලද අපේක්ෂිත ඉගෙනුම් ඵල දක්වා ඇත.

පාඩම ඉගැන්වීමෙන් අනතුරුව ශිෂ්‍යයා තුළ ගොඩනැගෙන අධ්‍යාපනික සංවර්ධනය ඉගෙනුම් ඵල ආශ්‍රයෙන් මැනිය හැකිය. ඒ සඳහා සුදුසු පරිදි නිර්ණායක සකස්කර ගැනීමට ගුරු භවතාට අවසර ඇත. තවද මෙම මගපෙන්වීම්වලින් ඔබ්බට ගිය ඉගෙනුම් ඵල සකස් කරගන්නට ගුරුභවතා සමත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම ඉගෙනුම් ඵල සකස් කර ඇත්තේ දැනුම (ප්‍රජානන) ආකල්ප (ආවේදන) කුසලතා (මනෝචාලක) සහ යහපුරුදුවල සංවර්ධනාත්මක බව පදනම් කොට බවද සලකන්න.

Not For Sale - CMSP

## දහම් පාසල් අධ්‍යාපනයේ පොදු නිපුණතා

**(දහම් පාසල් ගුරු අත්පොත් ආශ්‍රයෙනි.)**

1. දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හැඳිනගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියාකරයි.
2. බුද්ධ චරිත හා වෙනත් ශ්‍රේෂ්ඨ බෞද්ධ චරිත හැඳින ඒවා චරිතායනය කරයි.
3. පන්සිල් සුරකිමින් සඟරුවනට හා ගුරු දෙගුරුන්ට ගරු බුහුමන් දක්වයි.
4. ධර්මය පිළිබඳ නිවැරදි, නිරවුල් දැනුමක් ඇතිව තමන්ටත්, අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගැනීමට ක්‍රියාකරයි.
5. කායික හා මානසික සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වෙමින්, විවේකය ඵලදායී ලෙස ගතකරයි.
6. දේශාභිමානයෙන් යුතුව ශාසනික උරුමය හා බෞද්ධ සංස්කෘතික දායාද ආරක්‍ෂාකර ගැනීමට ක්‍රියා කරයි.
7. බෞද්ධ නිර්ණායක අනුව කළයුතු නොකළයුතු දේ නිවැරදිව හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.
8. බෞදධ ආර්ථික හා දේශපාලන දර්ශනය හැඳිනගෙන එයට අනුගත වේ.
9. බෞද්ධ සිරිත් විරිත් වත්පිළිවෙත් හා පරිසරය හැඳින ඊට අනුගතව ක්‍රියා කරයි.
10. පාලි භාෂා කුසලතාව සහ අභිධර්මය පිළිබඳ මූලික දැනුම ඇතිකර ගැනීමට ක්‍රියාකරයි.

Not For Sale - CMSP

ඉහත පොදු නිපුණතා 10 පදනම් කරගෙන උප නිපුණතා 20 ක් තීරණය කරගෙන ඇත.

ප්‍රාථමික (1-5 ශ්‍රේණි)

1. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.
2. බුදුගුණ පාඨය නිවැරදි උච්චාරණ සහිතව කියයි.
3. ශාසනික වචන භාවිතා කරයි.
4. කුඩා සතෙකුටවත් හිංසා නොකරයි.
5. හොඳ යහළුවන් ඇසුරු කරයි.
6. තම කටයුතු තමාම කරගනියි.
7. පිරිසිදුව සිටීම සඳහා තමා දිනපතා කරන ක්‍රියා ලියා දක්වයි.
8. දිනපතා විනාඩි කිහිපයක් නිවැරදි ඉරියව්වෙන් යුතුව මෛත්‍රී භාවනාවේ යෙදෙයි.
9. ජාතක කතාවක් රංගනයෙන් ඉදිරිපත් කරයි.
10. බොරු කීමෙන් වළකියි. සත්‍ය කථා කරයි.

ද්විතීයීය (6-12 ශ්‍රේණි)

11. අටලෝ දහමට සමබරව මුහුණ දෙයි.
12. සොළොස්මස්ථාන වඳින ගාථාව සහ එහි අදහස සිංහලෙන් දක්වා එම ස්ථාන ලංකා සිතියමේ ලකුණු කරයි.
13. ලෝවැඩ සඟරාවෙන් කවියක් කියා එහි අර්ථය පැහැදිලි කරයි.
14. පරිසරයෙන් සපයාගතහැකි අමුද්‍රව්‍ය යොදාගෙන වෙසක් පහන් කූඩුවක් තනයි.
15. දිනපතා විනාඩි 10 ක් ආනාපාන සති භාවනාවේ යෙදෙයි.



Not For Sale - CMSP

16. පුරාවස්තු රැකගැනීමේ අවශ්‍යතාව යන මාතෘකාව යටතේ ශිෂ්‍ය සමිතියේදී කථාවක් පවත්වයි.
17. ප්‍රදේශයේ දියුණුවටපත් පුද්ගලයකුගේ ක්‍රියාකලාපය සලකා බලා ඔහුගේ දියුණුවට හේතුවූ කරුණු මංගල සූත්‍රය ඇසුරෙන් ඉදිරිපත් කරයි.
18. ආහාරයට ගතහැකි එළවළු හෝ පලාවර්ග ගෙවත්තේ වගාකරයි.
19. බෞද්ධ සාරධර්ම තුනක් නම්කර තමා හා තම නිවසේ අය ඉන් එකක් ක්‍රියාවට නංවන අවස්ථා තුනක් ප්‍රකාශ කරයි.
20. පාලි ගාථාවක් නිවැරදිව ලියා එහි සිංහල තේරුම ද ලියා දක්වයි.

Not For Sale - CMSP

# 1 ශ්‍රේණිය  දහම් පාසල් ගුරු අත්පොත
# අපේක්ෂිත උප නිපුණතා (ඉගෙනුම්ඵල)

1. අපේ බුදු හාමුදුරුවෝ

* බුද්ධ ප්‍රතිමාව ඇසුරෙන් බුදුහාමුදුරුවන් දකියි.
* තෙරුවන් අතුරෙන් පළමු රත්නය බුද්ධ රත්නය බව තේරුම් ගනියි.
* බුදුහාමුදුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක්, ආදරයක්, ගෞරවයක් ඇතිකර ගනියි.
* බුදුන් වඳින ආකාරය ප්‍රදර්ශනය කරයි.
* මල් වට්ටියක් ලස්සනට පිළියෙල කරයි.
* බුදුගුණ ගීයක් තාලයට ගායනය කරයි.

2. සිදුහත් බෝසත් උපත

* සිදුහත් කුමාරයා යනු බුදුරජාණන් වහන්සේගේ ළමා කාලය බව කියයි.
* සිදුහත් කුමරුගේ මව, පියා නම් කරයි.
* සිදුහත් කුමරුගේ උපත ලුම්බිණි සල් උයනේදී සිදුවූ බව පවසයි.
* සිදුහත් කුමරුගේ උපත සිදුවූ ආකාරයෙහි අසිරිමත් බව පිළිබඳ සතුට පළකරයි.
* සිදුහත් කුමාරයාගේ ජීවිතය ගැන ඉගෙන ගැනීමට කැමැත්ත පළකරයි.
* සිදුහත් උපත දැක්වෙන පාඩමේ චිත්‍රය හැඳිනගනියි.

Not For Sale - CMSP

* මහාමායා දේවිය දුටු සිහිනය කියයි.
* හොඳ පින්වත් දරුවන්ට දෙවියන් ද, සතුන් ද ප්‍රියකරන බව පවසයි.
* සිදුහත් කුමරු උපන්නේ වෙසක් පෝදින බව කියයි.

3. බුදුවීම.

* සිදුහත් බෝසතාණන්ගේ උපතේ සිට බුදුවීම දක්වා කතා පුවත කියයි.
* බුද්ධත්වය යනු ලෝකයේ උසස්ම තත්ත්වයට ළඟාවීම ලෙස තේරුම්ගෙන පවසයි.

* සිදුහත් බෝසත් උතුමා බුදු බවට පත්වූ දවස, වෙසක් පෝය දවස බව දන පවසයි.
* "උත්සහවත්වීමෙන් උසස් තත්ත්වයට පත්විය හැකිය" යන ආකල්පය ගොඩනගා ගනී.
* බුද්ධ රූප රැස්කිරීමට කැමැත්ත පළකරයි.
* බුදුරජාණන් වහන්සේට ගරු කරයි. පූජා පවත්වයි.
* බුදුන් වඳින ගාථාව කියයි.
* වෙසක් පොහෝ දිනයේ වැදගත්කම කියයි.

4. අපේ ගෙදර

* අම්මා සහ තාත්තා අපට ආදරයෙන් සලකන බව පවසයි.
* අම්මා සහ තාත්තා අපට ආදරයෙන් කරුණාවෙන් ක්‍රියාකරන බව ප්‍රකාශ කරයි.



Not For Sale - CMSP

* අම්මාට තාත්තාට ගරු බුහුමන් දක්වයි, උදව් කරයි.
* අම්මාට තාත්තාට වඳින ගාථා, කවි කියයි.
* අම්මාට තාත්තාට තමන් ගැන හොඳ ආරංචි ලැබෙන අන්දමින් ක්‍රියා කරයි.
* අම්මා තාත්තා පිළිබඳ ලියවුනු ගීතයක් තාලයට ගායනා කරයි.
* නිසි ඉරියව්වෙන් යුතුව දෙමව්පියන්ට වඳින ආකාරය පෙන්වයි.

5. අපේ ගෙදර සිටි අය

* ගෙදර සිටින සහෝදර සහෝදරින් පිළිබඳව සැලකිලිමත්ව ආදරයක් ඇතිව ක්‍රියා කරයි.
* සාමූහිකව නිවසේ කටයුතු කරයි.
* තම නිවසේ බඩුමුට්ටු ආදිය රැකගැනීමට ක්‍රියාකරයි.
* ගෙදර ලස්සනට පිරිසිදුව තබාගැනීමට උනන්දුවෙන් ක්‍රියාකරයි.
* ගෙවත්තේ ලස්සනට බුදු පුදට අවශ්‍ය මල් වවයි.
* ගෙදර සිටින සහෝදර සහෝදරියන්ගේ සිත් නොරිදෙන අයුරින් කථා කරයි, හැසිරෙයි.
* මල් පැළ වලට වතුර දමයි.

6. බුදුහාමුදුරුවන්ට වඳිමු.

* බුදුහාමුදුරුවන්ට වන්දනා කළ යුතු බව කියයි.
* බුදුන් වැඳීම නිසා ලෙඩදුක් අඩුවන බවත්, හොඳින් ඉගෙන ගැනීමට හැකිවන බවත් පවසයි.
* පසඟ පිහිටුවා වන්දනා කරන ආකාරය පෙන්වයි.
* ඇඟිලි එකතු කර නළලේ තබා වන්දනා කරයි.



Not For Sale - CMSP

* සිත සංසුන්කරගෙන වන්දනා කරයි.
* නිවසේදී උදේ සවස බුද්ධ වන්දනා කරයි.
* ගාථා, කවි නිවැරදි උච්චාරණයෙන් යුතුව ගයයි.
* නමස්කාරය සරණයාම, පන්සිල් ගැනීම, තෙරුවන් වන්දනාව, යනුවෙන් අනුපිළිවෙල ක්‍රියාවට නගයි.

7. මව්පියන්ට වදිමු.
* මව්පියන්ගේ අගය, වටිනාකම ප්‍රකාශ කරයි.
* මව්පියන්ට වැඳිය යුතු අවස්ථා නම්කරයි.
* මව්පියන්ගෙන් ලැබෙන ආශිර්වාදය යහපතට හේතුවන බව ප්‍රකාශ කරයි.
* මව්පියන්ට වඳින ගාථා නිවැරදිව කියයි.
* නිසි ගෞරවය ඇතිව මව්පියන්ට වන්දනා කරයි.
* දෙමව්පියන්ට වැඳීම පුරුද්දක් කරගනියි.
* මවත් පියාත් දරුවන්ට ආරක්ෂාව සලසා පෝෂණය කරන බව පවසයි.
* මව්පියන් දරුවන්ගේ දියුණුව බලාපොරොත්තුවන බව පවසයි.

8. පන්සල් යමු
* බෞද්ධ අපි පන්සලට යාමට අවශ්‍ය බව පවසයි.
* පන්සලේ තුනුරුවන් වැඩ සිටින බව කියයි.
* පන්සලට යනවිට සුදු ඇඳුමින් සැරසී යායුතු බව කියයි.
* පන්සලට යනවිට තෙල්, මල් ආදිය රැගෙන යායුතු බව කියයි.
* බුදු පුදට ගනුලබන මල් වර්ග නම්කරයි.



Not For Sale - CMSP

* පාවහන් හිස් වැසුම් ගලවා විහාර භූමියට ඇතුළු විය යුතු බව කියයි.
* දාගැබ්, මහබෝ, පිළිම ආදී වශයෙන් වන්දනා කිරීමේ අනුපිළිවෙළ අනුගමනය කරයි.
* පන්සලේ හාමුදුරුවන්ට වැඳ ආශිර්වාද ලබා ගනී.

9. අපේ පන්සල
* පන්සල පිහිටි ස්ථානය දැන ප්‍රකාශ කරයි.
* පන්සලේ වැඩසිටින ස්වාමීන්වහන්සේලා ගැන කියයි.
* පන්සලේ ඇති පූජනීය ස්ථාන නම් කරයි.
* පූජ්‍ය ස්ථාන වන්දනා කරන අනුපිළිවෙල පවසයි.
* පන්සලේ දී භාවිත කරන විශේෂ වචන පවසයි. (පැන්, දෝවනය, විහාර මළුව, බෝධීන් වහන්සේ ආදිය).
* පන්සල් යෑමට කැමැත්ත පළ කරයි.
* පන්සලේ දී දුටු චිත්‍ර ගැන කථාකරයි.
* මල් වට්ටි, මල්මාලා ආදිය සැකසීමට පෙළඹේ.

10. අපේ හාමුදුරුවෝ
* අපේ ස්වාමීන්වමන්සේලා අපට බණ කතා කියාදෙන බව කියයි.
* බෞද්ධ අපට හොඳ ළමයින් වනහැටි ස්වාමීන් වහන්සේලා කියාදෙන බව පවසයි.

Not For Sale - CMSP

* පන්සලේදී පමණක් නොව මහමඟදීත් බස්රියේදීත් වෙනත් ස්ථාන වලදීත් උන්වහන්සේලාට ගෞරවයෙන් සැලකිලි දක්වයි.
* උන්වහන්සේලාගෙන් අපට සේවයක් සිදුවන බව පවසයි.
* ස්වාමීන්වහන්සේලා ඉදිරියේ ගෞරවයෙන් යුක්තව කටයුතු කරයි. හැසිරෙයි.
* ස්වාමීන්වහන්සේලාට වඳින ආකාරය ප්‍රදර්ශනය කරයි.

11. අපි දහම් පාසල් යමු.
   * දහම් පාසලට පැමිණෙ විට මල් බඳුනක් රැගෙන එයි.
   * දහම් පාසලේ පිහිටීම හා වටපිටාව විස්තර කරයි.
   * දහම් පාසලේ හැසිරෙන ආකාරය කියයි.
   * දහම් පාසල් ඒමට කැමැත් පළ කරයි.
   * දහම් පාසල ගැන සතුටින් කතා කරයි.
   * මල් වට්ටියක් සකස් කරයි.
   * පේලියට එකතුවී විහාරයට යයි.
   * පේලියට සිට මල් අතගස්වා පූජා කරයි.
   * සුදු ඇඳුමින් සැරසී දහම් පාසලට යයි.
   * නොකඩවා දහම් පාසලට පැමිණෙයි.
   * දහම් පාසලේ ගුරුවරුන්ට ආදරය දක්වයි.

12. දහම් පාසලේ දී තෙරුවන් වඳිමු.
   * දහම් පාසල තෙරුවන් වැඩසිටින තැනක් බව පවසයි.
   * තෙරුවන් නම් කරයි.

Not For Sale - CMSP

* තෙරුවන් වැඳීමට කැමැත්ත පළකරයි.
* වන්දනාවට පෙර අත් දෝවනය කර ගනී.
* මල් පහන් පිළිවෙලකට සකස්කර පැන් ඉසියි.
* නිසිලෙස මල්, පහන්, සුවඳ දුම් ආදිය පුදා තෙරුවන් වඳියි.
* තෙරුවන් වඳින අවස්ථාවේදී වන්දනා ඉරියව්වෙන් සිටියි.
* 'සෙත්සිරි දෙනමහ ගුණ මුහුදාණන් ' කවිය ගායනා කරයි.

13. අපේ පන්තිය
* දහම් පාසලේ පන්තියේ දක්නට ලැබෙන වෙනස්කම් පවසයි.
* දහම් පාසලේ ගුරුතුමියගේ වෙනස පෙන්වා දෙයි.
* ගුරුතුමිය තෙරුවන් සරණයි කියා පිළිගන්නා ආකාරය පවසයි.
* පන්තිය අලංකාර ලෙස පිරිසිදුව තබාගැනීමට ක්‍රියාකරයි.
* දිනපතා පන්ති කාමරය අපිරිසිදුවන ක්‍රියාවන්ගෙන් වළකියි.

14. පසළොස්වක පෝය
* පෝය හතර නම් කරයි.
* පුර පසළොස්වක පෙහොයේ විශේෂත්වය පවසයි.
* පෝය දිනයට පන්සල් යාමට කැමැත්ත පළ කරයි.
* පොහෝ දිනවල දී වන්දනා ගමන් යාමට, කැමැත්ත ඇතිකර ගනියි.
* පුර පසළොස්වක පොහෝ දිනවල රාත්‍රී කාලයේ දී ඇති සුන්දරත්වය විඳගැනීමට කැමති වෙයි.



Not For Sale - CMSP

15. මෙත් වඩමු.

* මෙත් වැඩීම යන්නේ තේරුම කියයි.
* මෙත් වැඩීම සඳහා භාවිතා කරන වචන කියයි. (නිදුක් වෙත්වා ! නිරෝගි වෙත්වා ! සුවපත් වෙත්වා !)
* මෛත්‍රී භාවනා ඉරියව් පුරුදු කරයි.
* "නිදුක් වෙත්වා" ආදී වචන නිවැරදිව කීමට හුරුවෙයි.
* අන්‍යයන්ට මෙත් වැඩීම හොඳ පුරුද්දක් බව පිළිගෙන පවසයි.
* මෙත් වැඩීමේ ප්‍රයෝජන කියයි.

16. පෙරහැර

* බෞද්ධ පෙරහරක ලක්ෂණ හා අංග නම් කරයි.
* පෙරහරක අනුපිළිවෙළ පවසයි.
* පෙරහරක දී කියන ගීත, කවි, ගාථා ගායනා කරයි.
* පෙරහරක දී ගෙනයන කුඩ, කොඩි, සේසත්, මල් බඳුන්, මල් ගස් ආදිය සකස් කරයි.
* ධාතු කරඬුව පෙරහැරේ දී වඩමවන ආකාරය ප්‍රදර්ශනය කර පෙන්වයි.
* බෞද්ධ පෙරහරක දී සුදු ඇඳීම, සංයමය, අවශ්‍ය බව පවසයි.

17. අපේ යාළුවෝ

* අපට යහළුවන් අවශ්‍ය බව පවසයි.
* හොඳ යහළුවන් නම් කරයි.
* සමගියෙන් සහයෝගයෙන් ක්‍රියාකරයි.
* තමන්ට ලැබෙන දේ බෙදා හදාගැනීමට පුරුදුවෙයි.



Not For Sale - CMSP

* යහළුවන්ට සංග්‍රහ කරන්ට, උදව් උපකාර කරන්නට කැමැත්ත පළකරයි.
* යහළුවන්ට හිරිහැර නොකරයි.

18. අපේ තවත් යාළුවෝ
   * තම ගෙවත්තට එන පක්ෂීන් නම් කරයි.
   * සතුන්ට ආදරය කරුණාව දක්වයි.
   * සුරතල් සතුන්ගෙන් අපට ඇති ප්‍රයෝජන පවසයි.
   * සතුන්ට ආහාරපාන දීමට පෙළඹෙයි.
   * සුරතල් සතුන් නිරීක්ෂණයෙන් වින්දනයක් ලබයි.
   * එම සතුන්ගේ නිදහසට බාධා නොකරයි.
   * තමන් ගැන මෙන් ම ලේනුන්, කුරුල්ලන් ආදී සතුන් ගැන සිතා පළතුරු වවයි.
   * තම නිවසේ සතුන් සඳහා පින්තාලි තබයි.

19. හොඳ පුරුදු
   * තම ගෙවත්ත, නිවස, කාමරය පිරිසිදුව පිළිවෙළට තබාගැනීමට ක්‍රියාකරයි.
   * පිරිසිදුකම පිළිබඳ ආකල්පය ඇතිව කටයුතු කරයි.
   * අපිරිසිදු නොකිරීම පිළිබඳ ආකල්පයෙන් ක්‍රියාකරයි.
   * පරිසරය පවිත්‍රව තබාගැනීමේ අවශ්‍යතාව පිළිගෙන ක්‍රියාකරයි.
   * ගෙමිදුලෙහි වවා ඇති මල් ගස්වලට වතුර සහ පොහොර දමයි.
   * ගෙවත්තේ ඇති ගස්වලට හානි නොකරයි.

Not For Sale - CMSP

20. හොඳ සිරිත්

* ලෙඩ රෝග ඇතිවීමට හේතු කිය යි.
* නිරෝගී බව රැකගැනීමට ක්‍රියා කරයි.
* බිම වැටී ඇති පළතුරු අනුභවය ලෙඩරෝග ඇතිවීමට හේතුවන බව දැන ඉන් වැළකෙයි.
* පළතුරු ආදිය සෝදා පිරිසිදු කර අනුභව කරයි.
* ආහාර ගැනීමට පෙර අත් සෝදයි.
* ඉඳුල් අතින් භාජන ඇල්ලීම, ආදී නුසුදුසු ක්‍රියාවන්ගෙන් වළකියි.
* කෑම, බීම, ඇඳුම්, පැළඳුම් පිරිසිදුව පරිහරණය කරයි.
* හොඳ සිරිත් කවි/ගී කියයි.
* රාත්‍රී නින්දට යෑමට පෙර දත් මැද මුහුණ සෝදයි.

Not For Sale - CMSP

## 2 ශ්‍රේණිය  දහම් පාසල් ගුරු අත්පොත
## අපේක්ෂිත උප නිපුණතා (ඉගෙනුම්ඵල)

1. අපේ දහම් පාසල

* දහම් පාසල පවත්නා විහාරස්ථානය නම් කරයි.
* දිනපතා පාසලට වඩා දහම් පාසලේ වෙනස පවසයි.
* දහම් පාසලට යන විට මල්, හඳුන්කූරු ආදිය රැගෙන යා යුතු බව පවසයි.
* දහම් පාසලේ පවත්නා ශාන්ත ආගමික පරිසරය අගය කරයි.
* දහම් පාසලට පැමිණීමට කැමැත්ත පළ කරයි.
* මල් වට්ටි සකස් කරයි.
* මළු පෙත් මං ඇමදීම කරයි.

2. තෙරුවන් සරණ යමු.

* තෙරුවන් නම් කරයි
* තෙරුවන් නැමදීමට කැමැත්ත පළ කරයි.
* තෙරුවන් කෙරෙහි ගෞරවයක්, ඇල්මක්, හැඟීමක් ඇතිව කතා කරයි.
* තෙරුවන් ගුණ ප්‍රකාශ වන ගාථා, පද්‍ය, ගීත ගායනා කරයි.
* තෙරුවන් වන්දනාවට අවශ්‍යවන මල් බඳුන් කලාත්මකව සකස් කරයි.
* සැදැහැසිතින් නිසි ඉරියව්වෙන් යුතුව තෙරුවන් නමදියි.
* මල් හෝ මල් බඳුන් පිළිවෙළකට මල් ආසන මත තැන්පත් කරයි.

Not For Sale - CMSP

3. බෝසත් උපත

* බුදුවීමට පෙර අවධිය බෝසත් අවධිය ලෙස නම් කරයි.
* බෝසත් උපත සිදු වූයේ වෙසක් පොහෝ දිනයක බව පවසයි.
* උපත සිදු වූයේ දඹදිව ලුම්බිණි නම් උයනක දී බව ප්‍රකාශ කරයි.
* බෝසත් උපත හා සම්බන්ධ අසිරිමත් සිදුවීම පිළිබඳ සතුට පළ කරයි.
* බෝසත් උපත නිරූපණය කෙරෙන චිත්‍ර රැස් කරයි.

4. බුදුවීම.

* බුද්ධත්වයට පත්වීම දක්වා බුද්ධ චරිතයේ ප්‍රධාන සිද්ධි කෙටියෙන් කියයි.
* බෝසතුන් බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධි මූලයේ දී බුදු බව ලැබූ බව පවසයි.
* බුදු වීම නම් උසස් ම තත්ත්වයට පත්වීම බව පවසයි.
* මහන්සි වී ඉගෙන ගතහොත් තමන්ටත් උසස් තත්ත්වයකට පත් විය හැකි බව කියයි.
* බුදුහාමුදුරුවන්ට වන්දනා කිරීමට, මල් පහන් පූජා කිරීමට කැමැත්ත පළකරයි.
* දොහොත් මුදුනේ තබාගෙන බුදුහාමුදුරුවන් වහන්සේට වන්දනා කරයි.
* බුද්ධ ප්‍රතිමාවක් දුටු විට බුදුරජාණන් වහන්සේ සිහියට නඟා ගනියි. ගරු කරයි.

Not For Sale - CMSP

5. පිරිනිවන් පෑම.

* බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනක බව පවසයි.
* බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය දඹදිව කුසිනාරා නුවර බව පවසයි.
* බුද්ධ පරිනිර්වාණය ගැන සංවේගයෙන් කතා කරයි.

6. මව්පියන්ට සලකන බොදු දරුවෝ වෙමු.

* සාම කුමාරයාගේ කතාව කෙටියෙන් කියයි.
* සාම කුමාරයා තුළ දක්නට ලැබුණ හොඳ ලක්ෂණ ප්‍රකාශ කරයි.
* තමන්ද සාම කුමාරයා මෙන් දෙමාපියන්ට වැඩිහිටියන්ට සැලකීම ට අදිටන් කර ගනියි.
* දෙමාපියන්ට සලකන උදව් කරන දරුවන්ට දෙමාපියන්ගේ ද ආදරය කරුණාව ලැබෙන බව පවසයි.
* යහපත් දරුවන්ට යහපතක් ම සැලසෙන බව පිළිගෙන ක්‍රියා කරයි.
* ගෙදරදී දෙමව්පියන්ට උදව් කල හැකි අන්දම කථා කරයි.
* සාම ජාතකයේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.

7. යාලුවෝ තුන් දෙනෙක්

* වැඩිහිටියන් කවුරුන් දැයි නම් කරයි.
* යාළුවෝ තුන් දෙනෙක් යන පාඩමේ එන කතා පුවත කෙටියෙන් කියයි.



Not For Sale - CMSP

* වැඩිහිටියන්ට සැලකිය හැකි ක්‍රම සහ අවස්ථා ප්‍රකාශ කරයි.
* වැඩිහිටියන්ට සැලකීම අගය කරයි.
* ගෙදරදී වෙනත් ස්ථානවලදිත් වැඩිහිටියන්ට ගරු සරු දක්වයි. උදව් කරයි.
* 'යාළුවෝ තුන් දෙනෙක් ' යන පාඩම රංගනයෙන් ඉදිරිපත් කරයි.

8. සමඟි වෙලා ජය ගනිමු.
* සමඟියේ අනුසස් සහ අසමඟියේ නරක ප්‍රතිඵල කියයි.
* අසමඟිය නිසා සිදුවන විපත්, කරදර ඉදිරිපත් කරයි.
* බුදුහාමුදුරුවන් වහන්සේ සමඟිය අගය කළ බව පවසයි.
* සමඟියෙන් කටයුතු කළ යුතු බව පවසයි.
* සමඟියෙන් කටයුතු කළ යුතු බව පවසයි.
* සමඟිවෙලා ජය ගනිමු. පාඩමේ එන කතා පුවත කියයි.
* පාසලේ දීත් නිවසේ දීත් සමඟියෙන් සිටීමේ අදිටන ඇතිව ක්‍රියා කරයි.

9. සෝපාක පොඩි හාමුදුරුවෝ
* සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතා පුවත කියයි.
* බුදු හාමුදුරුවන්ගේ කරුණා ඇසට යොමු වූ වෙනත් දරුවන් නම් කරයි.
* අපි ද අපේ වයසේ පොඩි අයට කරුණාව දැක්විය යුතු බව පිළිගෙන පවසයි.
* අන්‍යයන්ට කරදරයක් විපතක් සිදු වූ විට උදව් කිරීම කරුණාව දැක්වීම බව පවසයි.
* සෝපාක කතා පුවත රංගනයෙන් ඉදිරිපත් කරයි.



Not For Sale - CMSP

10. රාහුල පොඩි හාමුදුරුවෝ

* රාහුල කුමාරයාගේ මව සහ පියා නම්කරයි.
* රාහුල කුමරු පැවිදි වූ ආකාරය කියයි.
* රාහුල පොඩි හාමුදුරුවන්ගේ කතාවේ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.

11. අම්මාට තාත්තාට වඳිමු.

* මව් පියන්ටගේ ගුණ ප්‍රකාශ කරයි.
* මව්පියන් දරුවන්ට කරන උදව් උපකාර පවසයි.
* දසමාසේ උරේකත්වා යන ගාථා දෙක සහ දසමාස උරේ කත්වා යන ගාථා මිහිරියට ගයයි.
* මව්පියන්ගේ ගුණ ලැයිස්තුගත කරයි.
* මව්පියන්ගේ අවවාද උපදෙස් පිළිපදින බව කියයි.
* මව්පියන්ට තමන් පිළිබඳ හෝ ආරංචි දැන ගැනීමට ඉඩ සලසයි.
* උදේ සවස මව්පියන්ට වඳියි.
* අම්මාට තාත්තාට ගරු බුහුමන් දක්වයි. උදව් කරයි.

12. විහාර මහා දේවි

* විහාර මහා දේවිය හඳුන්වා දෙයි.
* කාවන්තිස්ස, කැලණිතිස්ස, දුටුගැමුණු, සද්ධාතිස්ස යන රජවරුන් නම් කර දක්වයි.

Not For Sale - CMSP

* ලංකාවේ සිතියමක කැලණිය, කිරින්ද, අනුරාධපුරය යන නගර පෙන්වයි.
* රටට ආදරයක් ඇතිව ක්‍රියා කරන බව පවසයි.
* ගැටලුවක් ඇති වූ අවස්ථාවක දී හොඳින් සිතා බලා මුහුණ දිය යුතු බව කියයි.
* විහාර මහා දේවිය පිළිබඳ කතා පුවත කියයි.
* විහාර මහා දේවී කතා පුවතට අදාළ අවස්ථාවන් චිත්‍රයට නඟයි.
* පුහුණුවට දී ඇති පද්‍ය ගායනා කරයි.

13. පිරිසිදු කම සුරකිමු.
    * මුහුණ අත කට පිරිසිදු කර ගන්නා අවස්ථා කියයි.
    * පිරිසිදුව සිටීමේ ප්‍රයෝජන ලියා දක්වයි.
    * මුහුණ අත කට පිරිසිදු කරගන්නා ආකාරය කියයි.
    * සෞඛ්‍ය පුරුදු ක්‍රියාවට නඟයි.
    * සෞඛ්‍ය පුරුදු රැක ගැනීමේ අදහස් අගය කරමින් කතා කරයි.

14. භාවනාවට වාඩි වෙමු.
    * භාවනාව යන්නේ අරුත පවසයි.
    * භාවනාව කිරීමට සුදුසු ස්ථානයයේ ලක්ෂණ කියයි.
    * භාවනාවේ වැදගත්කම අගය කරයි.
    * භාවනා ඉරියව් පැහැදිලි කරයි.
    * නිසි ඉරියව්වෙන් භාවනාවට හිඳ ගනියි.
    * භාවනාවට පූර්ව සූදානමක් වශයෙන් නිසි වත් පිළිවෙත් අනුගමනය කරයි.



Not For Sale - CMSP

15. අපි භාවනා කරමු.

* මෛත්‍රී භාවනාව හඳුන්වයි.
* මෛත්‍රී භාවනාවේ යෙදීමේ අනුපිළිවෙළ දක්වයි.
* මෛත්‍රී වැඩීමේ අනුසස් අගය කරමින් කථා කරයි.
* මෛත්‍රී භාවනාවේ යෙදෙයි.
* මෙත් වැඩීම ජීවිතයේ පුරුද්දක් කරගනියි.

16. වඳිමු පුදමු සෑ රදුන්

* ත්‍රිවිධ චෛත්‍ය නම් කරයි.
* ශාරීරික චෛත්‍යය වෙන්කොට දක්වයි.
* සෑ රදුන් වෙනුවට යෙදෙන වෙනත් නම් පවසයි.
* මල් වට්ටි පිළියෙල කරයි.
* මල් ආසන මත පැන් ඉස ලස්සනට මල් තැන්පත් කරයි.
* සෑ රදුන් චිත්‍රයට නගයි.
* ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කරන අනුපිළිවෙළ කියයි.
* ත්‍රිවිධ චෛත්‍යය සැදැහැයෙන් යුතුව වන්දනා කරයි.

17. වෙසක් උත්සවය

* වෙසක් දිනයේ වැදගත් සිදුවීම් නම් කරයි.
* වෙසක් දිනය ගතකළ යුතු නිවැරදි ක්‍රමය ප්‍රකාශ කරයි.
* වෙසක් දිනයේ දී පුණ්‍ය කටයුතු වල යෙදීමේ වැදගත්කම අගය කරයි.
* වෙසක් සැරසිලි කිරීමට කැමැත්ත පළ කරයි.
* වෙසක් කූඩු වෙසක් කොඩි ආදිය සාදයි.

Not For Sale - CMSP

* සැදැහැ ගීත ගායනා කරයි.
* පෙළ පොතේ එන පාඩම කියවයි. චිත්‍රය විස්තර කරයි.
* බෝසත් ගුණ තම ජීවිතයට අදාළ කරගෙන ක්‍රියා කරයි.

18. සිංහල අලුත් අවුරුද්ද
* සිංහල අලුත් අවුරුද්ද යනු කුමක්දැයි හඳුන්වයි.
* අපේ සිංහල බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරයි.
* අවුරුද්දට ඉටු කරන සිරිත් විරිත් නම් කරයි.
* දෙමාපියන්ට වැඩිහිටියන්ට ගරු කරයි.
* නැකත් අනුව ක්‍රියා කරන අකාරය පවසයි.
* පුහුණුවට දී ඇති කවිය ගායනා කරයි.
* අලුත් අවුරුදු ක්‍රීඩා වල යෙදෙයි.

19. අපි හොඳ බොදු දරුවෝ වෙමු.
* සතුන්ට ආදරය දක්වයි.
* සත්ව හිංසාවෙන් තමන්ද වැළකී අන්‍යයන්ද වැළැක්වීමට ක්‍රියා කරයි.
* අන් සතු දේ ගැනීමෙන් වැළකී ඒවා රැකදෙයි.
* බොරු නොකියයි - සත්‍යය ම කියයි.
* අනුන්ගේ දොස් අහන ක්‍රියා වලින් වැළකී ප්‍රශංසාවට ලක්වන දේ කරයි.
* හොඳ වැඩ කිරීමට කැමැත්ත පළ කරයි.
* කුරුල්ලන්ට වතුර සහ ආහාර දීමට කුරුලු ලැල්ලක් සවි කරයි.

Not For Sale - CMSP

* හොඳ බොදු දරුවෙකු වීමට අවශ්‍ය ගුණාංග දියුණු කර ගැනීමට ක්‍රියා කරයි.

20. හොඳ වචන කථා කරමු.
    * වචනයෙන් සිදුවන අකුසල් හෙවත් වැරදි නම් කරයි.
    * තමන් කථා කරන වචන ප්‍රිය උපදවන ඒවා විය යුතු බව පවසයි.
    * කථා කිරීමේ දී කල්පනාකාරීව වචන භාවිතා කළ යුතු බව පවසයි.
    * මිනිසුන් පමණක් නොව සතුන් පවා ප්‍රියවචනයට කැමති බවට නිදසුන් කතා ඉදිරිපත් කරයි.
    * පෙළ පොතේ පාඩම රංගනයෙන් ඉදිරිපත් කරයි.
    * ප්‍රිය වචනය කථා කිරීම ජීවිතයේ පුරුද්දක් කර ගනියි.

21. හොඳින් ඉගෙන ගනිමු.
    * ඉගෙනීමේ අගය කියයි.
    * පාසලේදීත් නිවසේදීත් ඉගනීමට කාලය ගත කිරීමේ අගය පවසයි.
    * උගත් කමේ අගය ප්‍රකාශවන ගීත පද්‍ය ඉදිරිපත් කරයි.
    * ඉගෙනීම සාර්ථක කර ගැනීමට පොත පත කියවිය යුතු බව පවසයි.
    * ඉගෙනුම් පුරුදු හුරු කර ගැනීමට ක්‍රියා කරයි.
    * කාල සටහනට අනුව ඉගෙනීමේ කටයුතු සැලසුම් කර ක්‍රියාවට නගයි.

Not For Sale - CMSP

* පුරාණයේ සිටි අය දුක් මහන්සියෙන් ඉගෙන ගෙන ඇති බවට නිදසුන් දක්වයි.
* පාඩමේ සඳහන් වන යහළුවන් ඉගෙනීම කළ හැටි අගයමින් කථා කරයි.

22. අපි තුන් බෝ වඳිමු.

* තුන් බෝ නම්කර දක්වයි.
* තුන් බෝ යන්නට යෙදෙන අනෙක් යෙදුම පවසයි.
* තුන් බෝ වන්දනා කිරීමට උනන්දුව දක්වයි.
* තුන් බෝ හෙවත් ත්‍රිවිධ චෛත්‍ය විස්තර කරයි.
* ත්‍රිවිධ චෛත්‍ය සිතුවමට නගයි.
* තුන් බෝ වඳින ගාථා, ගායනා කරයි.
* විහාරස්ථානයකට ගොස් වන්දනා කළ යුතු ස්ථාන පිළිවෙළින් කියයි.

23. හොඳ සිරිත්

* ආහාර පාන ගැනීමේ දී පිළිපැදිය යුතු හොඳ සිරිත් නම්කර දක්වයි.
* ආහාර පාන ගැනීමේදී හොඳ සිරිත් අනුගමනය කරයි.
* ආහාර පාන ගැනීමට අදාල හොඳ සිරිත් ලැයිස්තු ගත කරයි.
* හොඳ සිරිත් කියවෙන පද්‍ය, ගී ආදිය කටපාඩමෙන් කියයි.
* සිරිත්, විරිත් යන වචන දෙකේ වෙනස නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.

Not For Sale - CMSP

* ආහාර පාන, ගැනීමේ දී බැහැර කළ යුතු නරක සිරිත් බැහැර කිරීමට ක්‍රියාකරයි.

24. හොඳ පුරුදු
   * හොඳ පුරුදු යනු කවරේදැයි නම් කරයි.
   * හොඳ පුරුදු ගැන කියවෙන ගී, පද්‍ය කතා පුවත් ආදිය කියවීමට කැමැත්ත පළ කරයි.
   * හොඳ පුරුදු ලැයිස්තු ගතකර දක්වයි.
   * හැසිරීම තුළින් හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
   * හොඳ පුරුදු අගයමින් කථා කරයි.
   * දෛනික ජීවිතයේදී හොඳ පුරුදු ක්‍රියාත්මක කරයි.

25. බුදුහාමුදුරුවන්ට මල් පූජා කරමු.
   * මල් පූජා කිරීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙළ පවසයි.
   * සැදැහැයෙන් යුතුව මාලා කර්මවල යෙදෙයි.
   * එකඟ සිතින් මනා ඉරියව්වෙන් යුතුව මල් පූජා කරයි.
   * මල් පිදීමට පෙර මල් අස්න පිරිසිදු කළ යුතු බව පවසයි.
   * බිම වැටුණු මල් සහ පරවුණු මල් පූජාවට නුසුදුසු බව කියයි.
   * මල් පූජා කිරීමේ ගාථා කට පාඩමින් නිවැරදිව කියයි.
   * මලක සුවඳ මෙන් තමන් ද ගුණයෙන් සුවඳවත් විය යුතු බව පවසයි.
   * දහම් පාසල් යැමට කැමැත්ත පළ කරයි.

Not For Sale - CMSP

* අත් දෝවනය, පැන් ඉසීම, මල් ආසනය වැනි ශාසනික වදන් භාවිතා කරයි.

Not For Sale - CMSP

## 3 ශ්‍රේණිය දහම් පාසල් ගුරු අත්පොත
## අපේක්ෂිත උප නිපුණතා (ඉගෙනුම්ඵල)

1. දින දින තුනුරුවන වඳිමු.

* තෙරුවන් නම් කරයි.
* වෙන් වශයෙන් තෙරුවන් හඳුන්වයි.
* පුහුණුවට දී ඇති තෙරුවන් ගුණ ප්‍රකාශ වන පද්‍යය මිහිරියට ගායනා කරයි.
* දිනකට එක් වරක් හෝ තෙරුවන් වන්දනා කරයි.
* තෙරුවන් සරණ ගිය අයෙකු වශයෙන් යහපත් ජීවිතයක් ගත කරයි.

2. පින්වත් කුමාරයෙක් උපන්නා

* බෝසතාණන් වහන්සේගේ උපත සිදු වූ නගරය සහ මව්පියන් නම් කරයි.
* මහාමායා දේවිය දුටු අසිරිමත් සිහිනය ප්‍රකාශ කරයි.
* මහ බෝසතාණන් වහන්සේගේ උපත සිදු වූ ආකාරය ප්‍රකාශ කරයි.
* බෝසතාණන් වහන්සේගේ උපත පිළිබඳව කපිලවස්තුපුර වාසීන් සතුටු වූ ආකාරය කියයි.
* අසිරිමත් සිදුවීම් ඇසුරින් බෝසතාණන් වහන්සේගේ පුණ්‍ය මහිමය අගය කරමින් කතා කරයි.

* බෝසත් උපත චිත්‍රයට නගයි.
* සිදුහත් කුමරුගේ උපතට අදාළ කවි, ගී ගායනා කරයි.

Not For Sale - CMSP

3. සිදුහත් බෝසතාණෝ පැවිදි වෙති.

* සිදුහත් බෝසතාණන් වහන්සේගේ ළමා හා තරුණ කාලයට අදාළ සිද්ධි විස්තර කරයි.
* බෝසතාණන් වහන්සේ දුටු සතර පෙර නිමිති නම් කර දක්වයි.
* බෝසත් සිරිතෙන් ආදර්ශ ගෙන තම ජීවිතය ප්‍රයෝජනවත් ලෙස, අර්ථවත් ලෙස ගත කළ යුතුය යන ආකල්පයෙන් ක්‍රියා කරයි.
* පාඩමේ සිත් ගත් අවස්ථා චිත්‍රයට නඟයි.

4. බුදුවීම

* සිදුහත් බෝසතාණන් වහන්සේ සත්‍යය සොයා යාමේ කතා පුවත විස්තර කරයි.
* සත්‍ය සොයා යන බෝසත් තවුස් තුමාට මුලින්ම මුණගැසුණු ආචාර්ය වරුන් නම්කරයි.
* සිදුහත් බෝසතාණන් හා බිම්බිසාර රජතුමා අතර ඇතිවූ සංවාදය ඉදිරිපත් කරයි.
* බෝසතාණන් වහන්සේ සමඟ උරුවෙල් දනව්වේ වාසය කළ පස්වග තවුසන් නම්කරයි.
* බෝසත් සිරිතෙන් ආදර්ශ ගෙන තම ජීවිතය සාර්ථක කරගැනීමට ක්‍රියාකරයි.
* පාඩමේ තම සිත්ගත් අවස්ථා චිත්‍රයට නඟයි.

5. සදහම් දෙසීම

* බුදුරදුන් සත්සති ගතකර අන්දම කෙටියෙන් පවසයි.

Not For Sale - CMSP

* බුදුරදුන් පලමු දහම් දෙසුම සඳහා සුදුස්සන් තෝරාගත් අයුරු දක්වයි.
* ප්‍රථම ධර්මදේශනාව හා සම්බන්ධ ප්‍රධාන සිද්ධි පෙළගස්වා ඉදිරිපත් කරයි.
* ලෝක සත්වයා කෙරෙහි බුදුරදුන් තුළ පැවති මහා කරුණාව හා මෛත්‍රිය අගයකරමින් කතාකරයි.
* බුදුසිරිත ආදර්ශයට ගෙන තමා දන්නා දේ අන්‍යයන්ට ද කියා දීමට ක්‍රියා කරයි.
* පාඩමේ සිත්ගත් සිද්ධි චිත්‍රයට නඟයි.

6. පිරිනිවන්පෑම
   * සම්බුද්ධ පරිනිර්වාණයට අදාල සිද්ධි විස්තර කරයි.
   * බුදුසිරිත ආදර්ශයට ගෙන ක්‍රියාකිරීමේ අදිටන ඇතිව තම ජීවිතය ගතකරයි.
   * බුදුරදුන්ගේ අන්තිම අවවාදය අගයමින් ඒ අනුව ක්‍රියා කරයි.
   * සම්බුද්ධ පරිනිර්වාණය හා සම්බන්ධ සිද්ධි පෙළගස්වා දක්වයි.
   * සම්බුද්ධ පරිනිර්වාණය නිරූපණය කෙරෙන චිත්‍ර රැස් කරයි.
   * බුදුරජාණන් වහන්සේගේ අන්තිම අවවාදය පිළිගෙන තමන්ට කළ හැකි හා තමන් විසින් කළයුතු හොඳ වැඩ කරයි.

7. සිහි කර කර ගුණ මුදු මුණි සඳ නමදිමු සාධු
   * තෙරුවන් නම් කරයි.
   * අරහන් ආදී බුදුගුණ නවය ඇතුළත් පාළි පාඨය සජ්ඣායනා කරයි.

Not For Sale - CMSP

* බුදුගුණ වෙන්කර දක්වයි.
* සැදැහැයෙන් යුතුව බුදුගුණ ගයයි.
* නින්දට පෙර නව අරහා දී බුදුගුණ පාඨය කීම පුරුද්දක් කරගනී.

8. කළගුණ දත් සිංහයා
   * පාඩමේ ඇතුළත් කතා පුවත පන්තියට ඉදිරිපත් කරයි.
   * කළගුණ සැලකීමේ උතුම් ගුණය අගය කරයි.
   * කරදරයකට, විපතකට පත් වූවන්ට තමන්ට කළහැකි උපකාර කරයි.
   * කතාපුවත තුළින් මතු කරගත හැකි ආදර්ශ තම ජීවිතයට සම්බන්ධ කරගනී.
   * කළගුණ දත් සිංහයා පිළිබඳ කතා පුවත රංගනයෙන් ඉදිරිපත් කරයි.
   * කතා පුවතේ සිත්ගත් අවස්ථා චිත්‍රයට නගයි.

9. දෙමව්පියන් හට සලකමු ලෙසට.
   * මව්පියන්ගේ අගය පවසයි.
   * මව්පියන්ට සැලකීම,ගරු බුහුමන් දැක්වීම, හොඳ කරුණක් බවට හේතු දක්වයි.
   * මව්පියන්ගේ කටයුතුවලට හැකි පමණින් සහය දක්වයි.
   * තමන් පිළිබඳ හොඳ ආරංචි මව්පියන්ට දැනගන්නට සැලසෙන ආකාරයේ ක්‍රියාවල නිරත වේ.
   * මව්පියන්ගේ අවවාද උපදෙස් පිළිපදින බව පවසයි.



Not For Sale - CMSP

* මව්පියන්ගේ අගය පැවසෙන කවි ගීත ආදිය රැස්කරයි.

10. මට දැන් පුළුවන්
    * වැඩිහිටි කාගේවත් උදව්වක් නැතිව තමන්ට කරගත හැකි දේ නම් කරයි.
    * තමන්ගේ වැඩ තමන් විසින්ම කරගැනීමෙන් ලබන සතුටට ප්‍රකාශ කරයි.
    * පිරිසිදුව, පිළිවෙළකට මෙන්ම නිවැරදිව වැඩ කිරීමට හුරුවක් ලබාදෙයි.
    * පෙළපොතේ පාඩමට අදාළ චිත්‍ර ඇසුරින් තමන්ට කළ හැකි වැඩ චිත්‍රයට නඟයි.
    * පාඩමේ ඇතුළත්වන ගීත කාණ්ඩ තාලයට ගායනා කරයි.

11. භාවනා ඉරියව් හුරු කර ගනිමු.
    * භාවනාවට යෝග්‍ය ඉරියව් පැහැදිලි කරයි.
    * පහසු ඉරියව්වකින් භාවනා කිරීමෙන් නිසි ප්‍රතිඵල ලද හැකි බව අගය කරමින් කතා කරයි.
    * භාවනා ඉරියව් හැඳින ගෙන ඒවා පුහුණු කරයි.
    * නිසි ඉරියව්වෙන් සිට භාවනා කරයි.

12. භාවනා කරමු.
    * ආනාපාන සති භාවනාව හඳුන්වයි.
    * ආනාපාන සතිය වඩන අන්දම විස්තර කරයි.

Not For Sale - CMSP

* ආනාපාන සතිය වැඩීමේ අනුසස් අගය කරමින් කතා කරයි.
* අනාපාන සතිය වඩයි.
* ආනාපාන සතිය වැඩීම ජීවිතයේ පුරුද්දක් කර ගනියි.

13. විසිතුරු ලෙස දහම් දෙසූ පොඩි හාමුදුරුවෝ
    * කුමාර කාශ්‍යප තෙරණුවන්ගේ චරිත කතාව කියයි.
    * කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන් තුළ පැවති හොඳ ගුණාංග අගය කරමින් කතා කරයි.
    * කුමාර කාශ්‍යප නමින් උන් වහන්සේ හැඳින්වීමට හේතු කියයි.
    * කුමාර කසුප් තෙරණුවන්ට බුදුරදුන්ගෙන් ලැබුණු අග තනතුර පවසයි.
    * කුමාර කාශ්‍යප තෙරුන්ගේ දක්ෂ හා යහපත් ගුණාංග ප්‍රකට කෙරෙන අවස්ථා සඳහා නිදසුන් දක්වයි.
    * චරිත කතාවේ සිත් ගත් අවස්ථාවක් සිතුවමට නගයි.

14. ධම්මපද ගාථා
    * ධම්මපදය අපට ඉතා ප්‍රයෝජනවත් දහම් පොතක් බව පවසයි.
    * ධම්මපද ගාථා වලින් ප්‍රකාශ වන උපදෙස් පිළිගෙන අගය කරයි.
    * පෙළ පොතේ දැක්වෙන චිත්‍ර වලින් නිරූපණය වන දෑ පැහැදිලි කරයි.
    * පෙළ පොතේ ඇතුළත් ධම්මපද ගාථා දෙක කට පාඩමෙන් කියයි.
    * ධර්මෝපදේශ ඇසුරින් ජීවිතය හැඩ ගසා ගැනීමට ක්‍රියා කරයි.

Not For Sale - CMSP

15. විවේකය ගත කරමු මෙලෙසට

* විවේකය ඵලදායීව ගත කිරීමට උචිත ක්‍රියා මාර්ග හැඳින නම් කරයි.
* කායික හා මානසික සෞඛ්‍යය රැකෙන පරිදි විවේක කාලය ගත කරයි.
* කියවීමට යෝග්‍ය පොත පත තෝරාගෙන කියවයි.
* සුදුසු මල් සහ ඔසු පැල වගා කරයි.
* විවේකය ඵලදායී ලෙස ගත කිරීමෙන් සිත සැහැල්ලු කරගෙන දිවි ගෙවයි.

16. ලක්දිවට පෑයූ පොසොන් සඳ

* ලක්දිවට පෑයූ පොසොන් සඳ නම් මිහිඳු මා හිමියන් බව පවසයි.
* මිහිඳු මා හිමියන් ලංකාවට වැඩම වීමේ සිද්ධිය විස්තර කරයි.
* මිහිඳු මා හිමියන් අපේ රටට අලෝකයක් වූ බව අගයමින් කතා කරයි.
* මහා මහින්ද තෙරණුවන්ගේ චරිතයේ සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.
* මිහිඳු මා හිමියන්ට ගරු කිරීම සඳහා පින්කම් කරයි. උත්සව පවත්වයි.
* මිහිඳු මා හිමියන්ගෙන් මෙරටට සිදු වූ සේවාවන් ලැයිස්තු ගත කරයි.

17. දෙවනපෑතිස් රජතුමා

* දෙවනපෑතිස් රජතුමා පිළිබඳව හඳුන්වයි.



Not For Sale - CMSP

* දෙවනපෑතිස් රජතුමාගෙන් සිදු වූ ශාසනික හා ජාතික සේවාව අගය කරමින් කතා කරයි.
* රජතුමා විසින් කරවන ලද බෞද්ධ සිද්ධස්ථාන නම් කරයි.
* දෙවනපෑතිස් රජතුමාගේ උදාර චරිත ලක්ෂණ චරිතායනය කරයි.
* තමාට කළ හැකි ශාසනික හා ජාතික සේවා ඉටු කිරීමට ක්‍රියා කරයි.

18. කයින් පිරිසිදු වෙමු.
   * ශාරීරික පවිත්‍රතාව රැක ගැනීම නිරෝගි ජීවිතයක් ගත කිරීමට හේතු වන බව පවසයි.
   * ශාරීරික පවිත්‍රතාව රැක ගැනීමේ වටිනාකම අගය කරමින් කතා කරයි.
   * සෞඛ්‍ය පුරුදු රැක ගැනීමේ අනුසස් පවසමින් කතා කරයි.
   * මව්පියන්ගේ උදව්වෙන් තොරව කායික පිරිසිදුකම රැක ගැනීමට ක්‍රියා කරයි.
   * ශාරීරික පවිත්‍රතාව රැක ගැනීමට කටයුතු කරයි.

19. ගුරු සිත පිනවා උගනිමු සොඳවා
   * ගුරුවරුන්ට ගරු බුහුමන් දැක්විය හැකි අන්දම පවසයි.
   * ගුරුවරුන්ට ගරු බුහුමන් දැක්වීම යුතුකමක් ලෙස අගය කරයි.
   * ගුරු ගෞරව අගය කරමින් කතා කරයි.

Not For Sale - CMSP

* ගරු බුහුමන් දක්වමින් ගුරුවරුන්ට සැලකිලි දක්වයි.
* ගුරු වන්දනා ගාථාව නිවැරදි උච්චාරණයෙන් යුතුව කියයි.
* ගුරු ගෞරවය ජීවිතයේ පුරුද්දක් කර ගනියි.

20. පෝදා සිල් සමාදන් වෙමු.
    * මාසයේ පෝය හතර නම් කරයි.
    * සිල් සමාදන් වීම සඳහා පූර්ව සූදානම් වීම පිළිබඳව විස්තර කරයි.
    * පන්සිල් අටසිල් නම් කර පවසයි.
    * පන්සිල්වලට වඩා අටසිල් වෙනස් වන අන්දම ප්‍රකාශ කරයි.
    * සිල් සමාදන් වූ දිනෙක වත් පිළිවෙත් සපුරමින් දවස ගෙවන හැටි පැහැදිලි කරයි.
    * සිල් සමාදන් වූ දිනයක දී ඇති වන විශේෂත්වය අගය කරයි.
    * ප්‍රයෝජනවත් ලෙස පෙහෙවස් සමාදන් ව දවස ගත කරයි.

21. පොදු දේපළ රැක ගනිමු.
    * පොදු දේපළ නම් කරයි.
    * පොදු දේපළ සුරැකීමේ අගය කියයි.
    * ඒ ඒ ආයතනවලට අයත් දේපළ වස්තු වලට හානි නොකිරීමේ අගය පවසයි.
    * පොදු දේපළ වලට හානිකර ඇති අවස්ථාවන්ට නිදසුන් දක්වයි.
    * පොදු දේපළ ලැයිස්තු ගත කරයි.

Not For Sale - CMSP

* අන්‍යයන්ට ප්‍රයෝජනවත් වන ද්‍රව්‍ය, වස්තු, ආයතන රැක ගැනීමේ අගය පැවසෙන පෝස්ටර් නිර්මාණය කරයි.
* "පොදු දේපළ රැක ගනිමු " යන මාතෘකාවට අදාලව පද්‍යයක් නිර්මාණය කරයි.
* පොදු දේපළ සුරැකීම නිරූපණය කෙරෙන චිත්‍ර නිර්මාණය කරයි.

22. බුදු පුද ලද බෝ රද
* ත්‍රිවිධ චෛත්‍ය නම් කරයි.
* ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම වීමේ සිද්ධිය විස්තර කරයි.
* පාරිභෝගික චෛත්‍ය වෙන් කොට දක්වයි.
* බෝරදුන් වෙනුවට යෙදෙන වෙනත් නම් පවසයි.
* බෝ රදුන් වන්දනා කරන විට භාවිත කරන ගාථා, කවි, ගායනා කරයි.
* ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන අනුපිළිවෙල කියයි.

23. පොසොන් උදාවයි - මිහින්තලාවයි.
* පොසොන් පොහෝ දින වැදගත් සිදුවීම් නම් කරයි.
* පොසොන් පෝ දිනය ගතකළ යුතු නිවැරදි ක්‍රමය පැහැදිලි කරයි.
* පොසොන් පොහෝ දින කළයුතු දෑ පෙන්වා දෙයි.
* පොසොන් පොහොය දිනයේ ශාසනික හා ජාතික වැදගත්කම අගය කරයි.

Not For Sale - CMSP

* පෙරහැර පැවැත්වීමට සැරසිලි කිරිමට කැමැත්ත පළ කරයි.
* පෙරහැර හා සැරසිලි කරයි.
* සැදැහැ ගී ගායනා කරයි.
* දන්සල් පවත්වයි. පෙහෙවස් සමාදන්ව දවස ගත කරයි.
* මිහිඳු පෙරහැරක් පවත්වයි.
* අපේ සංස්කෘතික අංග ආරක්ෂා කරගැනීමට ක්‍රියා කරයි.

24. මව්පියන්ට සැලකූ ගිරවා
   * දෙමාපියන්ගේ ගුණ ප්‍රකාශ කරයි.
   * දෙමාපියන් දරුවන්ට කරන උදව් උපකාර පවසයි.
   * දෙමාපියන්ගේ ගුණ අගය කරමින් කථා කරයි.
   * දෙමාපියන්ට ගරු බුහුමන් දක්වයි.
   * දෙමාපියන්ට සත්කාර සංග්‍රහ කරයි.
   * ලෙඩට දුකට පිහිට වෙයි.
   * දෙමාපියන්ගේ අගය ප්‍රකාශ කෙරෙන කතා පුවත් හා කවි ගීත රැස් කරයි.

25. දහම් කවි
   * මරණය නිසැක බව දැනගෙන පවසයි.
   * පමා නොවී කුසල් කළ යුතු බව පවසයි.
   * බුදුවරයෙකුගේ ලොව පහල වීම හා මිනිසත් බව ලැබීම දුලබ බව පවසයි.
   * බුදු ගුණ වැනීම, දන්දීම, සිත දියුණු කර ගැනීම, පරලොව ජය ගැනීමට හේතුවන බව පවසයි.

Not For Sale - CMSP

* මිනිසත් බව ලැබීම දුර්ලභ බව පිළිගෙන පවසයි.
* කුසල ක්‍රියා මඟින් සිත දියුණු කර ගැනීමට ක්‍රියා කරයි.
* බුදුගුණ ප්‍රකාශ වන පද්‍ය ගායනා කරයි.

Not For Sale - CMSP

1. වඳිමු අදරින් අනඟි තෙරුවන්

* තෙරුවන් නම් කරයි.
* තෙරුවන් වඳින ගාථා හා කවි සැදැහැයෙන් යුතුව ගායනා කරයි.
* පෙළ පොතේ දැක්වෙන පද්‍යවල අරුත් දක්වයි.
* අදාළ පද්‍යවලින් ප්‍රකාශ වන්නේ තෙරුවන් ගුණ බව පවසයි.
* තෙරුවන් වන්දනාව බෞද්ධකම පෙන්වන ලක්ෂණයක් බව පවසයි.
* පුරුද්දක් වශයෙන් දිනපතා ශ්‍රද්ධාවෙන් හා ගෞරවයෙන් යුතුව තෙරුවන් නමදියි.
* තෙරුවන් ගුණ ප්‍රකාශවන ගාථා, පද්‍ය පාඨ, ගීත එකතුකර පොත් පිංචක් සකස් කරයි.

2. සිරි සදහම් ගුණ

* දහම් ගුණ සය නිවැරදිව නම් කරයි.
* සදහම් ගුණ සිහි කොට වන්දනා කිරීම සඳහා" ස්වාක්ඛාතෝ......... පාඨය භාවිත කරන බව ප්‍රකාශ කරයි.
* "ස්වාක්ඛාතෝ......... පාඨයේ ඇති දහම් ගුණවල අර්ථ නිවැරදි දක්වයි.
* "ස්වාක්ඛාතෝ......... පාඨය ශබ්ද නගා විරාම සහිතව නිවැරදි උච්චාරණයෙන් යුතුව සජ්ඣායනය කරයි.
* ධර්මය දේශනා කිරීමත් ධර්මය ඇසීමත් පුණ්‍ය ක්‍රියාවක් බව ප්‍රකාශ කරයි.

Not For Sale - CMSP

* ධර්ම දේශනාමය අවස්ථාවක් චිත්‍රයට නඟයි.
* සංවරශීලිව ධර්මය ශ්‍රවණය කරයි.
* ධර්මානුකූලව ජීවත් වෙයි.

3. අකුරු උගනී කුමරු සොඳවා
   * බෝසත් උපත සිදු වූ පොහෝ දිනය හා ස්ථානය නම් කරයි.
   * සිදුහත් කුමාරයා තම පියාගෙන් පවා වැඳුම් ලැබීමට තරම් භාග්‍යවන්ත වූ බව පවසයි.
   * සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර උගත් ගුරුවරයා නම් කරයි.
   * සිදුහත් කුමාරයා තුළ පැවති ඉගෙනීමේ දක්ෂතා අගය කරයි.
   * යහපත් දරුවන් නිසා මව්පියන් අපමණ සතුටක් ලබන බව අගය කරමින් කතා කරයි.
   * වප් මඟුල් දිනයේ සිදුවූ අසිරිමත් සිදුවීම චිත්‍රයට නඟයි.
   * බෝසත් උපත, වප් මඟුල, අකුරු ඉගෙනීම නිරූපිත චිත්‍ර එකතු කරයි.
   * සිදුහත් කුමාර චරිතයෙන් ගත හැකි ආදර්ශ මතු කර දක්වයි.

4. සිදුහත් සිරිතෙන් අපේ දිවියට
   * උපතේ සිට ශිල්ප ඉගෙනීම තෙක් බෝසත් සිදුහත් කුමරා චරිතය කෙටියෙන් දක්වයි.
   * බෝසත් කුමාරයා, අධ්‍යාපන කටයුතුවල නිරතවූ ආකාරය විස්තර කරයි.
   * රාජ කුමරකුට වුවමනා සියලුම ශිල්ප ශාස්ත්‍ර මැනවින් හදාරා නිම කළ බව පවසයි.

Not For Sale - CMSP

* නොදන්නා දේ තරාතිරම නොබලා අසා දැන ගැනීමට තරම් බෝසත් කුමරු අනතිමානී වූ බව පවසයි.
* බෝසත් කුමාර චරිතයෙන් ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරයි.
* බෝසත් කුමරු මෙන් උනන්දුවෙන් ඉගෙන ගෙන සමාජයේ උසස් තත්ත්වයකට පත් වීමට කටයුතු කරයි.
* අධිෂ්ඨානයෙන් කටයුතු කිරීමෙන් ජය ලබා ගත හැකි බව පවසයි.
* ආත්ම විශ්වාසයෙන් කටයුතු කරයි.
* අභියෝගවලට සාර්ථකව මුහුණ දෙයි.

5. වෙසක් අසිරිය
* වෙසක් පෙහෝ දිනයේ සිදු වූ වැදගත් සිදුවීම් නම් කරයි.
* වෙසක් පොහෝ දින දක්නට ලැබෙන පින්කම් විස්තර කරයි.
* වෙසක් පොහෝ දින බෞද්ධ ආගමික වැඩ සටහන් සංවිධානය කරයි.
* දහම් පාසල මගින් සංවිධානය කෙරෙන සීල භාවනා වැඩ සටහනකට දායක වෙයි.
* බෝසත් ගුණ ආදර්ශයට ගෙන තම ජීවිතය හැඩ ගසා ගැනීමට ක්‍රියා කරයි.
* වෙසක් පහන් කූඩු, සල් උයන් නිර්මාණය කරයි.
* වෙසක් අසිරිය පිළිබඳ ගීත නිර්මාණය කරයි.
* වෙසක් පත් භාවිතා කරමින් තොරණක් නිර්මාණය කරයි.
* වෙසක් අසිරිය චිත්‍රයට නඟයි.



Not For Sale - CMSP

* වෙසක් සැදැහැ ගීත ගායනා කරයි.

6. ඇසුරක වෙනස
   * සත්තිගුම්භ ජාතක කතා පුවත කෙටියෙන් කියයි.
   * කතා පුවතෙන් මතු කෙරෙන ආදර්ශ නම් කරයි.
   * ඇසුර නිසා ඕනෑම පුද්ගලයෙකු වෙනස් විය හැකි බව පවසයි.
   * ගුණවත් අය ඇසුරු කිරීමෙන් යහපත සැලසෙන බව පවසයි.
   * අයහපත් පුද්ගලයන් ඇසුරු කිරීමේ විපාක විස්තර කරයි.
   * බෝසත් චරිතය ආදර්ශයට ගෙන තම ජීවිතය හැඩ ගස්වා ගනී.
   * ප්‍රිය මනාප ලෙස කතා කිරීම පුරුද්දක් කර ගනී.
   * මෙම කතා පුවතේ එක් අවස්ථාවක් චිත්‍රයට නගයි.

7. කලණ මිතුරන් දෙදෙනෙක්
   * පැවිදි වීමට පෙර අගසවු දෙනමගේ නම් ප්‍රකාශ කරයි.
   * කෝලිත, උපතිස්ස මිතුරන් දෙදෙනා පැවිදිව රහත් ඵලයට පත් වූ ආකාරය විස්තර කරයි.
   * අගසවු දෙනමගේ චරිතවල සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙයි.
   * යේ ධම්මා හේතුප්පභවා ..... ආදී ගාථාවේ සරල අදහස පැහැදිලි කරයි.
   * සැරියුත්, මුගලන් දෙදෙනා වහන්සේ දුරු තනතුරු නම් කරයි.
   * අගසවු දෙදෙනා වහන්සේ තුළින් මතුවන ආදර්ශවත් චරිත ලක්ෂණ අගය කරමින් කතා කරයි.

8. බුද්ධ මාතාව

Not For Sale - CMSP

* මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණියගේ චරිත කතාව කෙටියෙන් කියයි.
* සුළු මව වුවද මව් සෙනෙහස ලබා දෙමින් සිදුහත් කුමරු රැක බලා ගැනීමේ උදාර සේවාව අගය කරමින් කතා කරයි.
* ගෞතම බුද්ධ ශාසනයේ පළමුව අර්හත් ඵලයට පත් භික්ෂුණිය වූයේ මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය බව පවසයි.
* මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණිය ලද අග තනතුර හා ගෞරව නාමය වෙන වෙනම දක්වයි.

9. බෝධීන් වහන්සේ වන්දනා කරමු.
* බෝසතාණන් වහන්සේ බුදුබව ලබා ගන්නා අවස්ථාවේ උන්වහන්සේට සෙවණ දුන් පූජනීය වෘක්ෂය නම් කරයි.
* ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට බුදුරජාණන් වහන්සේ ගෞරව උපහාර දක් වූ ආකාරය පැහැදිලි කරයි.
* බෝධීන් වහන්සේ පාරිභෝගික චෛත්‍යය වශයෙන් හැඳින්වීමට හේතු දක්වයි.
* බුදුරජාණන් වහන්සේ පළමුවෙන් ම ක්‍රියාවෙන් ලොවට පෙන්වා දුන් ආදර්ශය අගය කරමින් කතා කරයි.

10. බුදු පුදට සැරසෙමු.
* ත්‍රිවිධ චෛත්‍ය නම් කරයි.
* ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන් යුතුව බුද්ධ වන්දනාවට සූදානම් වෙයි.
* බුද්ධ වන්දනාවට පෙර කළ යුතු වත් පිළිවෙත්වල නිරත වෙයි.
* ත්‍රිවිධ චෛත්‍ය අනු පිළිවෙලින් වන්දනා කරයි.



Not For Sale - CMSP

* නිවැරදි උච්චාරණ සහිතව ත්‍රිවිධ චෛත්‍යවඳින ගාථා හා සිංහල කවි මතයෙන් අනු පිළිවෙළට ගායනා කරයි.
* විහාරස්ථානයේ දී සංවරශීලීව හැසිරෙයි.
* නිවැරදිව සෑ රදුන් පැදකුණු කරයි.
* පූජාවට සුදුසු මල් පැළ රෝපණය කරයි.
* ගමේ පන්සල චිත්‍රයට නඟයි.
* තම නිවසේ මල් පහන් පූජා කිරීමට සුදුසු ස්ථානයක් සකස් කොට දිනපතා බුද්ධ වන්දනාවේ යෙදෙයි.

11. මෙත් වඩමු.
* මෛත්‍රී භාවනාව හඳුන්වයි.
* භාවනාවේ ඉරියව් පුහුණු කරයි.
* මෛත්‍රී භාවනාවේ පියවර අනුපිළිවෙළින් දක්වයි.
* මෙත් වැඩීමේ ආනිසංස විස්තර කරයි.
* සැමවිටම සියලු සත්වයා කෙරෙහි මෙත් සිතින් කටයුතු කරයි.
* බුද්ධ වන්දනාවෙන් අනතුරුව මොහොතක් මෛත්‍රී භාවනාවේ යෙදෙයි.

12. සත්තු අපේ මිතුරෝය.
* බුදුරජාණන් වහන්සේ සතුන්ට කරුණාව දැක් වූ අවස්ථා ගෙන හැර දක්වයි.
* සත්ව හිංසාවෙන් වළකින ලෙස බුදුරජාණන් වහන්සේ දරුවන්ට අවවාද කිරීම පිළිබඳ පුවතක් ඉදිරිපත් කරයි.
* සතුන්ට සැලකීමට කැමැත්ත පළ කරයි.

Not For Sale - CMSP

* සතුන් කෙරෙහි ආදරයෙන් හා කරුණාවෙන් කටයුතු කරයි.
* සත්ව හිංසාවෙන් වැළකෙයි.
* සතුන්ට ආහාර දීම සඳහා තම නිවසේ කුරුළු ලෑල්ලක් පිළියෙල කර පවත්වා ගෙන යයි.
* තම මිතුරන් ද සතුන්ට හිංසා පීඩා කිරීමෙන් වළක්වාලයි.

13. ප්‍රිය වදනක බල මහිමය
* නන්දි විසාල ජාතකය මතකයෙන් කියයි.
* කළ ගුණ සැලකීමේ උසස් ගුණාංග සතුන් පවා අගය කරන බව පවසයි.
* ප්‍රිය වචන භාවිතයේ වටිනාකම පහදා දෙයි.
* අමිහිරි වචනයේ ආදීනව පැහැදිලි කරයි.
* නන්දි විසාල කතාවෙන් ලබාගත හැකි ආදර්ශ පෙන්වා දෙයි.
* තම නිවසේ ඇති කරන සුරතල් සතුන් ද මිහිරි වචනයෙන් අමතයි.
* නන්දි විසාල කතාවේ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.
* ප්‍රිය වචන කතා කිරීමට පෙළඹෙයි.
* නන්දි විසාල කතාව නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීමට දායක වෙයි.

14. පූජ්‍ය පක්ෂයට ගරු බුහුමන් කරමු.
* තම නිවසට වැඩම කළ භික්ෂූන් වහන්සේ සඳහා කළ යුතු වතාවත් පිළිවෙළින් දක්වයි.



Not For Sale - CMSP

* භික්ෂූන් වහන්සේ උදෙසා අසුන් පැනවීමේ දී සුදු ඇතිරිල්ලක් එලීමේ හේතු පැහැදිලි කරයි.
* භික්ෂූන් වහන්සේ ගෞරවයෙන් අමතයි.
* භික්ෂූන් වහන්සේලා ඇසුරු කිරීමට කැමැත්ත පළ කරයි.
* මහා සංඝරත්නය පිළිබඳ ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.
* ශ්‍රද්ධාවෙන් යුතු තෙරුවන් නමදියි.
* ශාසනික වචන ලැයිස්තු ගත කරයි.

15. කළ කම් පල දෙයි.
   * පාඩමේ ඇතුළත් පද්‍ය මතකයෙන් ගායනා කරයි.
   * පද්‍යවල අර්ථ ලිහිල් බසින් කියයි.
   * හොඳ හෝ නරක හෝ ක්‍රියාවන් මෙලොව දී හෝ පරලොව දී හෝ විපාක දෙන බව පිළිගෙන පවසයි.
   * පාඩම අවසානයේ තමා තුළ ඇති වූ හැඟීම් ප්‍රකාශ කරයි.
   * මෙලොව හා පරලොව දියුණුව පිණිස හොඳ වැඩ කිරීමට අදිටනින් කටයුතු කරයි.
   * පව් කිරීමට බිය වෙයි.
   * කවිවලින් දක්වෙන පාප ක්‍රියා සහ එහි විපාක වගු ගත කරයි.

16. ආනාපානසති භාවනාව පුරුදු කරමු.
   * ආනාපානසතිය යන්නෙහි තේරුම කියයි.
   * වප් මගුල් දිනයේ දී සිදු වූ වැදගත් සිදුවීම විස්තර කරයි.
   * ආනාපානසති භාවනාවේ යෙදෙන ආකාරය පැහැදිලි කරයි.
   * භාවනා කිරීම සඳහා වාඩිවීමේ ඉරියව් විස්තර කරයි.

Not For Sale - CMSP

* ආනාපානසති භාවනාවේ අනුසස් අගය කරමින් කතා කරයි.
* ආනාපානසති භාවනාව වඩයි.

17. විවේකයෙන් නිසි පල ලබමු.
    * විවේකය ගත කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග නම් කරයි.
    * බෞද්ධ පෙරහැරක මූලික අංග නම් කරයි.
    * විවේක අවස්ථාවල පන්සල හා මහා සංඝරත්නය ඇසුරු කරයි.
    * විවේකයේ දී පෙරහැරක සැරසිලි නිර්මාණය කරයි.
    * සුභසාධක කටයුතු, පුණ්‍ය කටයුතු ආදියේ නිරත වෙමින් විවේකයෙන් නිසි පල ලබයි.
    * සහයෝගයෙන් හා කැපවීමෙන් වැඩ කරයි.
    * විවේක අවස්ථාවල දී විවිධ ආකෘති නිර්මාණය කරයි.
    * සාධු චර්යා පොත පවත්වා ගෙන යයි.

18. ශාසනික වචන භාවිතා කරමු.
    * ශාසනික යෙදුම් ඇති බව පවසයි.
    * ශාසනික වචන ලැයිස්තු ගත කරයි.
    * ශාසනික යෙදුම්වල ශ්‍රද්ධාව මෙන්ම ගෞරවය ද ඇතුළත් බව පවසයි.
    * ස්වාමීන් වහන්සේලා ඇමතීමේ දී ද ස්වාමීන් වහන්සේලා පිළිබඳව කතා කිරීමේ දී ද ශාසනික වචන භාවිතා කරයි.
    * ගෞරවාන්විතව හා ශ්‍රද්ධා සම්පන්නව ත්‍රිවිධ රත්නය අමතයි.
    * තැනට ඔබින ලෙස කතා බහ හසුරුවයි.



Not For Sale - CMSP

19. සුරකිමු හොඳ සිරිත්

* ආහාර ගැනීමේ දී අනුගමනය කළ යුතු හොඳ සිරිත් නම් කරයි.
* ඇඳුම් පරිහරණයේදී පිළිපැදිය යුතු හොඳ සිරිත් නම් කරයි.
* ආචාරශීලීව ආහාර ගනී.
* පිළිවෙළකට පිරිසිදුවට ඇඳුම් පරිහරණය කරයි.ආචාරශීලීව හැසිරීම අන්‍යයන්ගේ ප්‍රසාදයට හේතුවන බව පවසයි.
* හොඳ සිරිත් අනුගමනය කිරීමේ වටිනාකම අගය කරමින් කථා කරයි.
* හොඳ සිරිත් ඇතුළත් ආදර්ශ පාඨ නිර්මාණය කරයි.
* ජීවන පුරුද්දක් වශයෙන් හොඳ සිරිත් අනුගමනය කරයි.

20. සසුන ඔපවත් කළ අපේ නරනිඳු

* දුටුගැමුණු රජතුමාගේ මව්පියන් නම් කරයි.
* දුටුගැමුණු රජතුමා ජාතික සටන මෙහෙය වූ ආකාරය විස්තර කරයි.
* දුටුගැමුණු රජතුමා ජාතික සටන මෙහෙයවීමේ දී පෙරදැරි කරගත් උදාර අදහස අගය කරයි.
* රජතුමා විසින් කරවන ලද ශ්‍රේෂ්ඨ නිර්මාණ ලැයිස්තුගත කරයි.
* දුටුගැමුණු රජතුමාගේ ශාසනික සේවය අගය කරමින් කතා කරයි.
* දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය හා වීරත්වය පිළිබඳ අභිමානයෙන් කථා කරයි.
* රට, ජාතික හා බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා අදිටනින් ක්‍රියා කරයි.

Not For Sale - CMSP

* ජාතික අභිමානයෙන් කටයුතු කරයි.
* භික්ෂූන් වහන්සේලා ඇසුරු කරමින් අවවාද අනුශාසනා ලැබීමට කැමැත්ත පළ කරයි.

21. පිවිතුරු බව රැක ගනිමු.
    * හොඳ සෞඛ්‍ය පුරුදු නම් කරයි.
    * කායික පවිත්‍රතාව ලෙඩ රෝග වලක්වන බව පවසයි.
    * පිරිසිදුව සිටින දරුවා කා හටත් ප්‍රියමනාප බව පවසයි.
    * පිරිසිදුව සිටීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.
    * පිරිසිදුකම අගය කරමින් කථා කරයි.
    * නිතර තමාගේ ශාරීරික පවිත්‍රතාව පිළිබඳ සැලකිලිමත් වෙමින් යහළුවන් හට පිරිසිදුකම පිළිබඳ උපදෙස් දෙයි.

22. උපන් දිනේ සතුට දැනේ.
    * තම උපන් දිනය වෙනුවෙන් කළ හැකි හොඳ වැඩ නම් කරයි.
    * අමර උපන් දිනය පැවැත් වූ ආකාරය විස්තර කරයි.
    * දෙමව්පිය ආශිර්වාදය උසස් කොට සලකයි.
    * උපන් දිනය වෙනුවෙන් පුණ්‍ය කටයුතුවල යෙදීමට කැමැත්ත පළ කරයි.
    * විපතේ දී මිතුරන්ට පිහිට වෙයි.
    * උපන් දිනය ආදර්ශවත් අන්දමින් ගත කරයි.
    * උපන් දිනය වෙනුවෙන් හොඳ පොතක් තෑගි කරයි.
    * උපන් දින ආසිරි පතක් නිර්මාණය කරයි.

Not For Sale - CMSP

## 5 ශ්‍රේණිය දහම් පාසල් ගුරු අත්පොත
## අපේක්ෂිත උප නිපුණතා (ඉගෙනුම්ඵල)

1. අපි දහම් පාසල් යමු.
   * දිනපතා පාසලට වඩා දහම් පාසලේ වෙනස තේරුම් ගනී.
   * දහම් පාසල් අධ්‍යාපනයෙන් ඇති කරගත හැකි ජීවන පුරුදු විස්තර කරයි.
   * දහම් පාසලට පැමිණීම අගයමින් කථා කරයි.
   * දිනපතා දහම් පාසලට පැමිණෙයි.
   * දහම් පාසලෙන් ගමට හා සමාජයට ඉටුකළ හැකි සේවාවන් ඉටුකරයි.

2. අගය නිමක් නැති රුවන් තුනක් ඇති.
   * තෙරුවන් නම් කරයි.
   * බෞද්ධයන්ට වටිනාම රත්න තෙරුවන් බව කියයි.
   * සිංහල උපදේශ කාව්‍ය ග්‍රන්ථ 03 ක් නම් කරයි.
   * ශ්‍රද්ධාවෙන් තෙරුවන් සරණ යයි.
   * යහපත් කටයුතු ඇරඹීමේ දී තෙරුවන් සරණ යයි.
   * පාඩමේ ඇති කවි කටපාඩම් කරගෙන මිහිරි ලෙස ගායනා කරයි.

3. සඟ ගුණ සිහිකර වඳිමු.
   * සුපටිපන්නෝ පාඨයේ ඇතුළත් සඟ ගුණ සංඛ්‍යාව දක්වයි.
   * සඟ ගුණ නවය නිවැරදිව නම් කරයි.

Not For Sale - CMSP

* සඟ රුවන වදින පාඨය නිවැරදිව කටපාඩමින් සජ්ඣායනා කරයි.
* සඟ ගුණ ඇතුළත් කවි කටපාඩම් කරගෙන ගායනා කරයි.
* අට වැදෑරුම් ආර්යයන් වහන්සේ නම් කරයි.
* එක් එක් සඟ ගුණ සරල ලෙස හඳුන්වයි.
* සංඝ රත්නයට ගරු කළ යුතු බව පිළිගනී.
* සඟ රුවනට පසඟ පිහිටුවා වඳී.

4. පින්බර කුමාරයෙක්
   * මෙතෙක් ඉනෙගත් බෝසත් සිරිතේ ප්‍රධාන සිදුවීම් පෙළගස්වයි.
   * දියුණුව කැමති දරුවෙකුට බෝසත් සිරිතෙන් ගතහැකි ආදර්ශ මතුකර දක්වයි.
   * බෝසත් සිරිතේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අගය කරමින් කතා කරයි.
   * නිබ්බුත පද කට පාඩමින් කියයි.
   * යහගුණ ඇති පුද්ගලයන් අගය කරයි.

5. සිදුහත් බෝසතාණෝ බුදු බවට පත්වෙති.
   * බුදු බවට පත්වීමට ආසන්න සමයේ, බෝසත් සිරිත සාරංශකර දක්වයි.
   * ත්‍රිවිද්‍යාව නම් කරයි.
   * ඥානවන්ත බව හා උත්සහාහය තුළින් ජය ගතහැකි බව පිළිගනී.



Not For Sale - CMSP

* අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කරයි.
* වැරදි මගට පිවිසීමෙන් වැළකීමට ක්‍රියා කරයි.

6. සුභාෂිත වදනට හුරුවෙමු.
   * මහිලාමුඛ ජාතක කතාව කෙටියෙන් කියයි.
   * හොරුන්ගේ නපුරු වචන ඇසීමෙන්, මහිලාමුඛ ඇතා නපුරු වූ බව පවසයි.
   * ඇතාගේ නපුරු වීමට හේතු සොයා ගැනීමට, බෝසතාණන් වහන්සේ බුද්ධිමත් වූ බව කියයි.
   * ගැටලුවක දී, බුද්ධිමත් ලෙස කටයුතු කිරීම අගය කරමින් කතා කරයි.
   * බුද්ධිමත් ලෙස කටයුතු කිරීමේ පුරුද්දක් ඇතිකර ගනී.

7. සිත පිරිසිදු කර ගනිමු.
   * භාවනාවේ අවශ්‍යතාවය හා වැදගත්කම ගැන විස්තර කරයි.
   * සිහියෙන් යුතුව හුස්ම ඉහළට ගැනීම හා පහළට හෙළීම,ආනාපානසති නම් වන බව කියයි.
   * සිත සංවර කර ගැනීමේ අගය කියයි.
   * ආනාපානසතිය වැඩීමේ ප්‍රයෝජනය කියයි.
   * දිනපතා විනාඩි කීපයක් ආනාපානසති භාවනාව වඩයි.

8. රහත් මෙහෙණක වීය බේමා
   * මානය යනු කුමක්දැයි විස්තර කරයි.
   * අනතිමානීවීම අගය කරයි.

Not For Sale - CMSP

* මානය දුරුකොට, ධර්මය අවබෝධ කර ගැනීමට, බුදුරජාණන් වහන්සේ යෙදූ උපාය මාර්ග පිළිබඳව විමසයි.
* ජීවිතයේ ඇති අස්ථිර බව පිළිගෙන පවසයි.
* සමාජයේ ප්‍රශංසාවට ලක්වන හොඳ ගුණධර්ම ප්‍රගුණ කරයි.

9. විපතේ දී දිරිමත් වෙමු.
   * ගැල් නායකයා බුද්ධිමත්ව කටයුතු කළ නිසා, සියලු දෙනාගේ ජීවිත බේරුණු බව කියයි.
   * ගැල් සාත්තුව, යොදුන, කෙම්බිම, වැනි පදවල අරුත් පැහැදිලි කර ගනී.
   * තැනට සුදුසු නුවණ, නිවැරදි තීරණ ගැනීම වැනි ගුණාංග වටහාගෙන, අගය කරමින් කතා කරයි.
   * වණ්ණුපථ ජාතකය මතකයෙන් කියයි.
   * විපතක දී නොසැලී කටයුතු කරයි.
   * සහයෝගයෙන් කටයුතු කිරීම තුළින්, විපතක දී ජයගත හැකි බව පිළිගෙන, කථා කරයි.

10. ජලය මට ඇති ධනය යි.
    * අනුරාධපුරය වැව් බැඳි රාජ්‍ය ලෙස හඳුන්වන බව කියයි.
    * ධාතුසේන රජතුමා රට වෙනුවෙන් හා ආගම වෙනුවෙන් සිදුකළ මෙහෙය අගය කරමින් කථා කරයි.
    * තම ප්‍රදේශයේ ඇති පැරණි ආගමික ස්ථානයක් පිළිබඳ තොරතුරු රැස් කරයි.
    * පැරණි රජවරුන්ගේ චරිත අධ්‍යයනය කරයි.

Not For Sale - CMSP

11. පැහැර නොගනිමු - අනුන් සතු දෙය

* සොරකම ණයක් බැවින්, එය අත්හළ යුතු බව කියයි.
* පව් කරන්නවුනට, මෙලොවකදීම දඬුවම් විඳීමට සිදුවන බව පවසයි.
* සොරකමෙන් වැළකී සිටීමේ අගය වටහාගෙන, කතා කරයි.
* පොදු දේපළ හා අන්සතු දේ ආරක්ෂා කිරීමට, ක්‍රියා කරයි.
* තම මිතුරන්, පව්කම්වලින් මුදවා ගැනීමට කටයුතු කරයි.
* අන්සතු ධනයට ආශා කිරීමෙන් වැළකී, ත්‍යාගශීලී වීම.

12. නිති පන්සිල් - පොහොය අටසිල්

* පන්සිල් හා අටසිල් පද, පිළිවෙළින් තේරුම් සහිතව කියයි.
* සිල්වත්වීමේ ආනිශංස හැඳිනගෙන, අගය කරමින් කතා කරයි.
* පාප සහගත ක්‍රියාවලින් වැළකී සිටී.
* "මම නරක වැඩ නොකරමි" යන පාඨය ලියන ලද පුවරුවක්, තම කාමරයේ නිතර පෙනෙන තැනක ප්‍රදර්ශනය කරයි.
* තම මිතුරන්, වැරදි වැඩවලින් වළකා ගැනීමට කටයුතු කරයි.

13. උපුල්වන් යැයි පතළ තෙරණිය

* උප්පලවණ්ණා තෙරණියට, ඒ නම ලැබුණේ, උපුල් මලක පැහැයෙන් යුක්ත වූ නිසා බව කියයි.
* ඇයට ලැබුණු රූමත් බව, පැහැපත් බව, නැණවත් බව, පෙර කළ පිංකමක අනුසස් වශයෙන් ලද බව පවසයි.



Not For Sale - CMSP

* පිංකම් කිරීමේ වටිනාකම, අගය කරමින් කතා කරයි.
* හැකි හැම විටකම, පිංකම්වල නිරත වෙයි.

14. මෙත් සිත පතුරවමු.
    * මෙත් වැඩීම යන්න තේරුම් කරයි.
    * අන් අය කෙරෙහි,මෙත් සිත පතුරවයි.
    * මෛත්‍රී භාවනාවේ යෙදෙයි.
    * භාවනාවේ අනුසස් ගැන, සතුටින් කතා කරයි.
    * දිනපතා නින්දට පෙර, විනාඩි කීපයක් මෛත්‍රී භාවනාවේ යෙදීම හුරුකර ගනී.

15. අපේ කටයුතු අපි ම කර ගනිමු.
    * තම කටයුතු,තමා විසින් කරගත යුතු බව කියයි.
    * තමන්ගේ කටයුතු, අන් අයගේ සහායෙන් ඉටුකර ගැනීමට යාමෙන් ඇතිවන අපහසුතා ගැන කතා කරයි.
    * කුඩා අවදියේ සිටම, තම කටයුතු තමන් විසින්ම කරගැනීමේ වටිනාකම අගය කරමින් කියයි.
    * නිවසේදී හා පාසලේ දී, තම කටයුතු තමා විසින් කරගනී.
    * උදව් කළ හැකි අවස්ථාවල දී , මව්පියන්ට උදව් කරයි.

16. සුභාෂිත වැකි
    * සුභාෂිතයේ කතුවරයා,අලගියවන්න මුකවෙටි තුමා බව කියයි.
    * කව්වලින් කියවෙන උපදෙස්,ජීවිතය යහපත් කර ගැනීමට වටිනාබව, අගය කරමින් කියයි.

Not For Sale - CMSP

* පාඩමේ ඇතුළත් කවි,කටපාඩම් කරගෙන,නිවැරදිව ගායනා කරයි.
* වෙනත් උපදේශාත්මක කවි, ගායනා කරයි.
* උපදේශාත්මක වැකි එකතු කරයි.

17. පිරිසිදුකමින් දිවි සරසමු.
    * පිරිසිදුකම, නිරෝගී බවට හේතුවන බව කියයි.
    * තමන් පරිහරණය කරන දෑ, තම සිරුර හා අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වටිනාකම, අගය කරමින් කතා තරයි.
    * දහම් පාසලේ, පංති කාමරය හා අවට පරිසරය පිරිසිදු කිරීමට, උදව් කරයි.
    * පිරිසිදුව සිටීමේ අගය, තම මිතුරන්ට කියා දෙයි.
    * පිරිසිදුව සිටීම පුරුද්දක් කරගනී.
18. විවේකය ඵලදායී කර ගනිමු.
    * විවේකය, ප්‍රයෝජනවත් ලෙස යොදාගත හැකි ක්‍රම කියයි.
    * විවේකය, ඵලදායී ලෙස යොදා ගැනීමෙන්, ඉටුකළ හැකි සේවය, අගය කරමින් කතා කරයි.
    * විවේකය,ප්‍රයෝජනවත් ලෙස ගත කරයි.
    * විවේක දිනවල, මිතුරන් සමඟ එක්ව, ශ්‍රමදාන හා සුභසාධක වැඩවලට, ක්‍රියාකාරීව සහභාගී වෙයි.
    * දිනපතා, නින්දට පෙර විනාඩි කීපයක්, මෛත්‍රී භාවනාවේ යෙදීම හුරුකර ගනී.

Not For Sale - CMSP

19. බුදුගුණ සිහි කරමු.

* බුදුගුණ භාවනාව යන්න, තේරුම් කරයි.
* බුදුගුණ භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන, අගය කරයි.
* නිවැරදි ඉරියව්වක සිට, භාවනාව වඩයි.
* මිතුරන් සමග එක්ව, බුදුගුණ භාවානාවේ යෙදෙයි.

20. වෙසක් උත්සවය

* වෙසක් දිනයේ විශේෂත්වය, පැහැදිලි කරයි.
* වෙසක් දිනයේ දී සිදු කෙරෙන පිංකම් ගැන කියයි.
* වෙසක් දින අසිරිය සතුටින් වින්දනය කරයි.
* වෙසක් දිනයේ දී ආගමික වතාවත් වල යෙදෙයි.
* වෙසක් පිළිබඳව ලියැවුණු, කවි, ගී එකතු කරයි.
* වෙසක් පතක් නිර්මාණය කරයි.

21. ධම්මපදයෙන් බිඳක්

* ධම්මපදය, බෞද්ධයාගේ අත්පොත බව කියයි.
* දහම් උපදෙස් රාශියක්,ධම්මපදයට ඇතුළත් බව පවසයි.
* ධම්මපදයේ ඇතුළත් උපදෙස්, ජීවිතයට වඩාත් වැදගත් බව අගය කරමින් පවසයි.
* ගාථා හා කවි, කටපාඩමෙන් කියයි.
* දහමට අනුව හැසිරෙයි.

22. හුරුකර පිංකම් - දුරලමු පව්කම්

* පස් පව්, නම්කර දක්වයි.



Not For Sale - CMSP

* පස් පව්වලින් වැළකී සිටියයුතු බවට,යෝජනා කරයි.
* පව්කම්වල යෙදෙන අයට ලැබෙන දඬුවම් පිළිබඳව,කථා කරයි.
* පව්කම්වලින් වැළකීමේ අනුසස්, අගය කරමින් කථා කරයි.
* තම මිතුරන්, පව්කම්වලින් මුදවා ගැනීමට ක්‍රියා කරයි.
* පව්කම්වල ආදීනව හා පිංකම්වල ආනිසංස කියවෙන කවි, සිංදු විරිඳු එකතු කරයි.

23. ශාසනික ව්‍යවහාර

* සම්මත ශාසනික ව්‍යවහාර, නම්කර පවසයි.
* පූජ්‍ය ස්ථානවලදී හා ආගමික වත් පිළිවෙත්වල යෙදෙන විට, ශාසනික ව්‍යවහාර භාවිත කිරීම,අගය කරමින් පවසයි.
* ශාසනික ව්‍යවහාර ලැයිස්තුවක්, පිළියෙල කරයි.
* ශාසනික ව්‍යවහාර භාවිතා කිරීම, පුරුද්දක් කර ගනී.

24. පොසොන් උත්සවය

* පොසොන් පොහොය දිනයේ, ප්‍රධාන සිදුවීම් විස්තර කරයි.
* පොසොන් පොහොය දිනයේ වැදගත්කම, අගයමින් කථා කරයි.
* පොසොන් පෙහොය දිනයේදී ආගමික හා සමාජයීය කටයුතුවල යෙදෙයි.
* මහින්දාගමනය නිසා, අපට ලැබුණු දායාද අගයමින් කථා කරයි.
* මහින්දාගමනය දැක්වෙන චිත්‍රයක් නිර්මාණය කරයි.

Not For Sale CMSP

* පොසොන් දිනය ගැන ලියැවුණු, කවි ගී හා පිංතූර එකතුවකින්, පොත් පිංචක් සකස් කරයි.

25. වන්දනා ගාථා හා වන්දනා කවි
    * පාඩමේ ඇතුළත් ගාථා හා කවි නිවැරදිව කියයි.
    * තේරුම සහිතව, ගාථා කියා වන්දනා කිරීමෙන්, වැඩියෙන් පිංසිදුවන බව කියයි.
    * ගාථා හා කවි කටපාඩමෙන් කියයි.
    * පූජාසනය පිරිසිදු කොට, ඒ මත පුදපූජා තැන්පත් කොට, වන්දනාමාන කිරීමට පුරුදු වෙයි.

Not For Sale - CMSP

# 6 ශ්‍රේණියට යෝජිත ඉගෙනුම්ඵල
# (අපේක්ෂිත උප නිපුණතා)

1. මිහිරක් ලැබේ දම් පාසල වෙත ඒමෙන්
* දහම් පාසලකින් ලැබෙන ප්‍රයෝජන විස්තර කරයි.
* දහම් පාසලෙන් ලබන අධ්‍යාපනය වටිනා එකක් බව පිළිගනී.
* දහම් පාසලකින් ලදහැකි සේවාව ලේඛනගත කරයි.
* දිනපතා දහම් පාසල් පැමිණෙයි.
* දහම් පාසල් අධ්‍යාපනයේ වැදගත්කම දැන අනාගතයට ද උරුමකරන්නට කටයුතු කරයි.

2. බෞද්ධයාගේ ලක්‍ෂණ හැඳින ගනිමු.
* කාශ්‍යප බුදුරජාණන් වහන්සේ හා ජෝතිපාල තෙරුන් වහන්සේ ගැන විස්තර කරයි.
* බෞද්ධයකු තුළ පැවතිය යුතු ගුණ දැන ගැනීමට කැමැත්ත පළ කරයි.
* පාඩමේ දැක්වෙන අවස්ථාවක් චිත්‍රයට නගයි.
* බෞද්ධ යහගුණ ධර්‍ම දැන ඒ අනුව කටයුතු කරයි.
* බෞද්ධ සාරධර්‍ම අනාගතයට ද කියා දෙයි.

3. හැදෙන සිසු දිවියක ලක්‍ෂණ
* ශිෂ්‍ය ජීවිතයක පැවතිය යුතු ලක්‍ෂණ නම් කරයි.
* සාර්ථක ශිෂ්‍ය ජීවිතයකට බුදුදහමින් ලැබිය හැකි ගුණාංග පිළිගෙන කටයුතු කරයි.

Not For Sale - CMSP

* සාර්ථක ජීවිතයකට පදනම යන මැයෙන් කථාවක් පවත්වයි.
* බුදු සිරිතේ ගුණාංග සිසු ජීවිතයට ධාරනය කර ගනියි.
* යහපත් මනුෂ්‍යයෙකු වෙයි.

4. බුදු ගුණ ඇසුරෙන් අපි සිත සනසමු.
* බුද්ධ රත්නයේ ගුණ නවය ප්‍රකාශ කරයි.
* බුදුගුණ භාවනාවක් ලෙස වැඩීමට කැමැත්ත පළ කරයි.
* බුදුගුණ නවය විස්තර කරමින් ලියයි.
* බුද්ධානුස්සති භාවනාව වඩයි.
* බෞද්ධයකු ලෙස ජීවිතය පුරාවට බුද්ධානුස්සති භාවනාව වඩයි.

5. සසුන්බර එකළු කළ උපාලි තෙරණුවෝ.
* උපාලි තෙරණුවන්ගේ ජීවිත කථාව කියයි.
* බුදු සසුනේ පැවිද්ද සමානාත්මතාවය එළිකරන බව දැන ගනී.
* විනයධර භික්ෂුවක් වශයෙන් උපාලි හිමි කටයුතු කළ අවස්ථා ලේඛණගත කරයි.
* උපාලි මහරහතන් වහන්සේගේ චරිතයෙන් ආදර්ශගෙන ඒ අනුව කටයුතු කරයි.
* කුලය සමාජයේ වැදගත් සාධකයක් හැටියට නොසලකා කටයුතු කරයි.

6. ධනය පිළිබඳ රුවන් වැකි.
* සිංහල බෞද්ධ සාහිත්‍යයේ උපදේශ කෘති නම් කරයි.

Not For Sale - CMSP

* උපදේශ කෘතිවල ඉහළම කෘතිය ලෝකෝපකාරය බව පිළිගනී.
* "යහපත් ධන පරිභෝජනය"නමින් බිත්ති පුවත්පතට ලිපියක් ලියයි.
* සම්පත් ඉපයීමට ධාර්මික ක්‍රම භාවිතා කරයි.
* ධනය නොසඟවා අවශ්‍ය කටයුත්තෙහි යොදවයි.

7. අපි සැදැහැතියෝ වෙමු.
* බුද්ධෛනිය කථාව පන්තියට ඉදිරිපත් කරයි.
* ශ්‍රද්ධාවන්තයන් ඇසුරට කැමැත්ත පළ කරයි.
* "සැදැහැවත් උතුමෝ "යන මැයෙන් රචනාවක් ලියයි.
* සැදැහැතිව කටයුතු කරයි.
* පිංකම් වල සැදැහැතිව යෙදෙයි.

8. දම්සක් පැවතුම තෙක් බුදු සිරිත.
* පැවිදි වීමේ පටන් දම්සක් දේශනාව තෙක් බුදුසිරිතේ ප්‍රධාන සිදුවීම් නම් කරයි.
* බුද්ධත්වයට පත්වීමේදී නොපසුබට උත්සහායේ ඇති වැදගත්කම පිළිගනී.
* බුදුන්වහන්සේගේ ප්‍රථම උදානය කටපාඩමින් කියයි.
* උත්සහවත්ව අධ්‍යාපන කටයුතුවල යෙදේ.
* බුදුසිරිතේ යහගුණ දැන ඒ අනුව කටයුතු කරයි.

9. ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර ශාසනික තොරතුරු
* I හා II ධර්ම සංගායනා හා හේතු පැහැදිලි කරයි.



Not For Sale - CMSP

* සංගායනා මගින් බුදු දහම නිර්මලව පවත්වා ගැනීමට ආධාරක වූ බව පිළිගනී.
* පළමු හා දෙවන සංගායනා තොරතුරු වගුගත කරයි.ගැටලු විසඳ ගැනීමට උත්සහ දරයි.
* ගැටලු විසඳා ගනිමින් සාර්ථක ජීවිතයක් ගත කරයි.

10. සිහිය උපදවා බවුන් වඩමු.
   * වප් මගුල් උත්සවයක සිරිය කියයි.
   * භාවනාවේ ඇති වැදගත්කම දැන භාවනාවට කැමැත්ත පළකරයි.
   * ආනාපානසති භාවනාව වඩන ආකාරය වගුවක ලියා දක්වයි.
   * ආනාපානසති භාවනාවේ යෙදෙයි.
   * සිහිනුවණින් කටයුතු කරයි.

11. රකුසු පැනයට පිළිතුරු
   * සමගියෙන් ජීවත්වීමේ වටිනාකම පැහැදිලි කරයි.
   * බුද්ධිමත්ව ක්‍රියාකිරීම ඉතාවැදගත්බව පිළිගනී.
   * මහිංසාසක කථාව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
   * පවට බියෙන්, ලැජ්ජාවෙන් යුතුව කටයුතු කරයි.
   * විනාශයක් පැමිණ කළ නුවණැතිව, අධිෂ්ඨානශීලීව කටයුතුකරයි.

12. රට දැය සමය ඔපවත් කළ ධීරවීර රජවරු දෙදෙනෙක්
   * පොලොන්නරු යුගයේ රජවරු පිළිබඳව විස්තර කරයි.



Not For Sale - CMSP

* උදාර රජචරිතයන්ගේ එන ගුණ චරිතයට ගැනීමට පෙළඹේ.
* රාජ චරිත ස්වරූපය කරමින් කථා පවත්වයි.
* උත්සහවත්ව කටයුතු කරයි.
* දේශනුරාගය, ජාති වාත්සල්‍යය, ශාසන මාමකත්වය ඇතිකර ගනිමින් කටයුතු කරයි.

13. ධම්මපදයෙන් බිඳක් සවනට
* ධම්මපදය බෞද්ධයාගේ අත්පොත බව කියයි.
* ධම්මපදය බෞද්ධයකු වශයෙන් අධ්‍යනය කළ යුතුව පිළිගනී.
* "වෛරයෙන් වෛරය කිසි කලකත් නොසන්සිඳේ." යනුවෙන් බිත්ති පුවත්පතට ලිපියක් ලියයි.
* ධම්මපද ගාථාවන් හා අරුත් දැන ඒ අනුව පිළිපදියි.
* තමාවෙත පැවරෙන කටයුතු කල් නොදමා ඉටුකරයි.

14. ගුරු දෙගුරුන්හට සලකමු මෙලෙසට
* ගුරු දෙගුරුන්ට සැලකීමේ වැදගත්කම පැහැදිලි කරයි.
* දෙමාපියන් ධර්මකාමී කිරීමට දරුවන්ට හැකි බව පිළිගනී.
* "ගුරු දෙගුරුන් නැමදීම " මැයෙන් පද්‍ය පන්තියක් නිර්මාණය කරයි.
* ගුරු දෙගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කරයි.
* පොදු කටයුතුවල යෙදෙයි.

15. අපිත් වඳිමු ජයසිරි මහ බෝධි
* ශ්‍රී මහා බෝධිය වැඩම වීමේ පුවත කියයි.



Not For Sale - CMSP

* ශ්‍රී මහා බෝධිය උදෙසා විශේෂ වූ පූජා විධි පැවැත්වෙන බව දැන ඒවා විමසීමට පෙළඹේ.
* ශ්‍රී මහා බෝධිය හා බැඳුණු මංගල්‍ය පිළිබඳ ලේඛනයක් සකසයි.
* බෝධි පූජා පිංකම් සංවිධානය කරයි.
* බෝධි පූජා අනුසස් පිළිබඳව දේශනා පවත්වයි.

16. බොදු නිවසක සිරිය දකිමු.
   * බෞද්ධ නිවසක පැවතිය යුතු ලක්‍ෂණ විස්තර කරයි.
   * බෞද්ධ නිවසක් ක්‍රමවත් පරිසරයක් පැවතිය යුතුබව පිළිගනී.
   * නිවසේ ප්‍රදර්ශනයට සුදුසු පරිදි ආදර්ශවත්ව තබයි.
   * නිවස තුළ ක්‍රමවත් බවක් ඇති කරයි.
   * ගෙවත්ත ක්‍රමවත්ව සකස් කරයි.

17. සිව්සස් හැඳින ගනිමු.
   * චතුරාර්‍ය්‍ය සත්‍ය නම් කරයි.
   * චතුරාර්‍ය්‍ය සත්‍ය බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව පිළිගනී.
   * චතුරාර්‍ය්‍ය සත්‍ය චාට් සටහනකින් දක්වයි.
   * චතුරාර්‍ය්‍ය සත්‍ය මූලධර්‍මයක් ලෙස යොදාගනිමින් එදිනෙදා ජීවිතයේ ගැටලු විසදාගැනීමට කටයුතු කරයි.
   * දුකට පත්වූවන්ට පිහිට වෙයි.

Not For Sale - CMSP

18. මෑත කාලීන යුග කාරක තෙරවරු

* සියම්, අමරපුර, රාමඤ්ඤ නිකායික ආරම්භක මහනායක හිමිවරුන් පිළිබඳ කරුණු දක්වයි.
* මෙම හිමිවරුන් නිසා ශාසන ප්‍රබෝධයක් සිදුවූ බව පිළිගනී.
* මෙම පඬිවරුන් පිළිබඳ ජීවන දත්ත ලේඛන ගත කරයි.
* ශික්ෂාකාමීව, විනය ගරුකව, ජීවත් වෙයි,
* ශාසන උන්නතිය සඳහා දායක වෙයි.

19. සිත් තුළ මෙත්මල් පුබුදුවමු.

* මෛත්‍රීය යනු කුමක්දැයි පැහැදිලි කරයි.
* මෙත් වැඩීම භාවනාවක් බව පිළිගෙන කටයුතු කරයි.
* මෛත්‍රී භාවනාවේ ආනිසංස ලියා ප්‍රදර්ශනය කරයි.
* දිනපතා මෛත්‍රී භාවනාව වැඩයි.
* අන්‍යයන්ගේ හිතසුව පිණිස ක්‍රියා කරයි.

20. පින් දී සෙත් පතමු.

* පින් අනුමෝදන් කරවීමේ වැදගත්කම ඉදිරිපත් කරයි.
* පින් අනුමෝදන් කරවීම බෞද්ධ ගුණ ධර්මයක් බව පිළිගනී.
* පින් අනුමෝදනා කරන ගාථා කටපාඩමෙන් සජ්ඣායනා කරයි.
* ආදර්ශ සම්පන්නව කටයුතු කරයි.
* පිංකම්හි යෙදෙමින් අන්‍යයන් ද ඒවාට හවුල්කරගනී.

Not For Sale - CMSP

21. පින් මල් පිපෙන සිල්වැසි වසින කාලයක්

* ඇසල මාසය මුල්කොට පවත්වන ආගමික කටයුතු හා උත්සව නම්කරයි.
* වස්කාලය පැවිදි -ගිහි සමාජයන් හි පින් වැඩෙන පින්කම් කළහැකි කාලයක් බව පිළිගනී.
* 'මහනුවර ඇසල පෙරහැරේ සංස්කෘතික වටිනාකම' මැයෙන් ලිපියක් ලියයි.
* ආගමික පිළිවෙත් සුරකියි.
* බෞද්ධ සංස්කෘතිය පවත්වා ගැනීමට කටයුතු කරයි.

22. පැළයක් සිටුවා ඵලයක් ලබමු.

* රුක් රෝපණයේ ඇති වැදගත්කම විස්තර කරයි.
* පරිසර අලංකාරවත්ව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිගනී.
* ඔසු උයනක් සඳහා වූ සැලසුමක් සකස් කොට ඒ අනුව කටයුතු කරයි.
* වගා කටයුතු වල නිරත වේ.
* ගෙවත්ත මැනවින් සැලසුම් කොට පවත්වා ගනී.

Not For Sale - CMSP

## 7 ශ්‍රේණියට යෝජිත ඉගෙනුම්ඵල
## (අපේක්ෂිත උප නිපුණතා)

1. ඉසිපතනයෙන් ඇරඹුණු සදහම් චාරිකාව

* ප්‍රථම ධර්ම දේශනයේ පටන් අගසව් තනතුරු ප්‍රදානය තෙක් වූ කාලයේ බුදු සිරිතේ වැදගත් සිදුවීම් නම් කරයි.
* සුදුස්සාට සුදුසු තැන හිමිවිය යුතු බව පිළිගනී.
* ප්‍රථම ධර්ම දූත පිටත්කර හැරීම පිළිබඳව නිවේදකයකු ලෙසින් වර්ණනා කරයි.
* නායකත්ව ලක්ෂණ චරිතායනය කරයි.
* සමාජයට නායකත්වය සපයයි.

2. සැදැහැ වඩනා බුදුගුණ මහිම

* නව අරහාදී බුදු ගුණ නම් කරයි.
* බුදුගුණ සිහිකරන අයෙකු නිරන්තරයෙන් සැපෙන් වාසය කරන බව පිළිගනී.
* බුදුගුණ දැක්වෙන පද්‍ය නිර්මාණය කරයි.
* ආමිස, ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙයි.
* නිවැරදි මඟ ගමන් කරමින් අන්‍යයන් ද නිවැරදි මාර්ගයට ගැනීමට කටයුතු කරයි.

3. පැල්පතෙන් සිටු මැදුරට

* උත්සාහය හා කැපවීම දියුණුවේ රහස බව පැහැදිලි කරයි.

Not For Sale - CMSP

* උත්සාහවත්ව, ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට කැමති වේ.
* චුල්ල සෙට්ටි ජාතකය රඟ දක්වයි.
* සැමගේ සහයෝගය ලැබ කටයුතු සාර්ථක කර ගනියි.
* සාර්ථක ජීවිතයක් ගතකරයි.

4. භාවනාවේ ප්‍රයෝජන
* අකුසල සිතිවිලි නිසා සිත කිලිටි වන බව කියයි.
* සිත කිලිටි නොවී පිරිසිදුව තබා ගැනීමෙන් යහපත ළගාවන බව පිළිගනී.
* මෛත්‍රී භාවනාවේ ආනිසංස ලියා පන්තිකාමරයේ ප්‍රදර්ශනය කරයි.
* භාවනාවේ යෙදෙයි.
* සාර්ථක මනුෂ්‍යයෙකු වෙයි.

5. බවුන් වඩමු ගත සිත නිවනා
* භාවනාව පිළිබඳව මෙතෙක් ඉගෙනගත් දේ කියයි.
* භාවනාව වැඩීමට කැමැත්ත පළකරයි.
* බුදු ගුණ විස්තර සහිතව ලේඛනගත කරයි.
* අනාපානසති, මෛත්‍රී භාවනාපුරුදු කරයි.
* භාවනාවේ අත්දැකීම් අන්‍යයන්ටද කියා දෙයි.

Not For Sale - CMSP

6. හැදෙන බොදු දරුවකුගේ ලක්ෂණ හැඳින ගනිමු.

* මෙත්ත සූත්‍රයේ සඳහන් දියුණුවන්නෙකුගේ ලක්ෂණ පැහැදිලි කරයි.
* මෙත්ත සූත්‍රගත කරුණු චරිතායනයට කැමැත්ත පළ කරයි.
* පද්‍ය පන්තිය මිහිරිව ගායනා කරයි.
* අන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.
* සරල ජීවිතයක් ගතකරයි.

7. දස අකුසල් පල අසන්න.

* දස අකුසල් නම් කරයි.
* ලෝවැඩ සඟරාවේ පද්‍ය හැදෑරීමෙන් යහපත සදාගත හැකි බව පිළිගනී.
* තිදොරින් සිදුවන අකුසල වර්ගගත කර දක්වයි.
* පවින් වැළකේ.
* අකුසලය බැහැර කොට සුචරිතයේ හැසිරේ.

8. මම ආනන්ද බුදුහිමි උවටනෙහි සිටී.

* ආනන්ද හිමිගේ චරිත කතාව කියයි.
* උපස්ථායකවරයකු වීමේ ඇති වටිනාකම පිළිගනී.
* ආනන්ද හිමිගේ ඉල්ලීම් 4 හා ප්‍රතික්ෂේප 4 ලේඛනගතකර ප්‍රදර්ශනය කරයි.
* තනතුරු දැරීමට සුදුස්සෙකු වෙයි.
* උත්සහවන්තව කටයුතු කිරීමට පෙළඹෙයි.

Not For Sale - CMSP

9. දුක්ඛාර්ය සත්‍යය

* ධම්ම චක්කපවත්තන සූත්‍රයේ ඇතුළත් දුක පැහැදිලි කරයි.
* උපාදාය නිසා දුක ඇතිවන බව පිළිගනී.
* දුක්ඛ සත්‍යයේ දැක්වෙන එක් අවස්ථාවක් සිතුවමට නගයි.
* දුකින් මිදීමට මඟ සොයයි.
* දුක් හඳුනාගෙන ඒවාට ඔරොත්තුදෙන අයුරු ජීවිතය ගොඩනගා ගනියි.

10. දියුණුවේ දොරටු

* මංගල සූත්‍රයේ නිදාන කථාව කියයි.
* මංගල සූත්‍රාගත කරුණු ශිෂ්‍ය ජීවිතයට යොදාගැනීම කැමැත්ත පළ කරයි.
* මංගල සූත්‍රය තාලානුකූලව සජ්ඣායනා කරයි.
* සමාජ දියුණුවීම හේතුවන මංගල කරුණු දැන කටයුතු කරයි.
* ආධ්‍යාත්මික සුවයට හේතුවන මංගල කරුණු දැන ඒ අනුව හැසිරෙයි.

11. පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙමු.

* පිරිසිදුකම නම් කුමක්දැයි විස්තර කරයි.
* පරිසරය පිරිසිදුව තබා ගැනීම කළ යුතු බව පිළිගනී.
* පන්තිකාමරය පිරිසිදුව තබා ගැනීමට රීති මාලාවක් සාදයි.
* පෞද්ගලික පිරිසිදු භාවය ගැන සැලකිලිමත් වෙයි.
* පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමට පෙරමුණ ගෙන කටයුතු කරයි.

Not For Sale - CMSP

12. ධර්මාශෝක රාජ්‍ය යුගයේ ශාසනික වැදගත්කම
* අශෝක රජු පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
* ලාභ ප්‍රයෝජන, අපේක්ෂාවෙන් කටයුතු කිරීම ශාසනයේ කිලිටිවීමට බලපෑ බව පිළිගනී.
* නව රට සසුන් පිහිටුවීම පිළිබඳ චාට් සටහන් සකස් කරයි.
* ගැටලු විසදාගැනීමට නිවැරදි උපදෙස් හා ක්‍රියාමාර්ග අනුගමනය කරයි.
* බුදුදහම දිවිහිමියෙන් සුරකී.

13. දළදා හාමුදුරුවෝ
* දළදා පුරාවෘතය පංතිය ඉදිරියේ කියයි.
* දළදා හාමුදුරුවන්ගේ පූජනීයත්වය ගෞරවයෙන් පිළිගනී.
* දළදා වන්දනා ගාථා සජ්ඣායනය කරයි.
* දළදා වන්දනාව සඳහා වන්දනා ගමනක් සංවිධානය කරයි.
* දළදා සංස්කෘතිය අනාගත පරපුරට දායාද කරයි.

14. අපේ ගෙදර දානමය පිංකම.
* දානමය පිංකමක් සංවිධානය කිරීමේ පිළිවෙළ පැහැදිලි කරයි.
* ශාසනික වචන භාවිතය බෞද්ධයාගේ සිරිතක් බව පිළිගනී.
* දානමය පින්කමක දී භාවිත කරන ශාසනික වචන ලියා දක්වයි.
* පිළිවෙතින් සපිරි සඟසතු දානයක් සංවිධානය කරයි.

Not For Sale - CMSP

* ස්වාමීන් වහන්සේලා හා සම්බන්ධතා පැවැත්වීමේදී ශාසනික වචන භාවිතයට නැඹුරු වෙයි.

15. ප්‍රථම රහත් තෙරණිය.

* මහා ප්‍රජාපතී ගෝතමී මෙහෙණින් වහන්සේ ගැන කරුණු දක්වයි.
* කාන්තා විමුක්තිය උදෙසා කැපවූ චරිතයක් ලෙස මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතය අගය කරයි.
* මහා ප්‍රජාපතී ගෝතමී චරිතය ඇසුරින් ගතහැකි ආදර්ශ ලේඛනගත කරයි.
* යහපත් වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා කැපවෙයි.
* තමා වෙත ලැබෙන පදවි හමුවේ අනතිමානී වෙයි.

16. අපේ සාරධර්ම හැදිනගනිමු.

* ශිෂ්‍ය ජීවිතයේ පුහුණු කළ යුතු සාරධර්ම ඉදිරිපත් කරයි.
* ජීවිතය සාර්ථක කරගැනීම සඳහා සාරධර්ම අත්‍යවශ්‍ය සාදකයක් බව පිළිගනී.
* සාරධර්ම පිළිබඳව ඇති ධම්මපදයේ ගාථා දෙක ලියා ප්‍රදර්ශනය කරයි.
* සාරධර්ම පිළිපැදීම කෙරෙහි වැඩිහිටි අත්දැකීම් ලබාගනියි.
* සාධර්ම සුරකින සමාජයක කොටස්කරුවෙක් වෙයි.

17. ධම්මපදයෙන් බිඳක් උගනිමු.

* ධම්මපදයේ සැකසීම පිළිබඳව කරුණු ප්‍රකාශ කරයි.



Not For Sale - CMSP

* ධම්මපදය බෞද්ධයාගේ අත්පොත බව පිළිගනී.
* අදින්න පුබ්බක හා මට්ඨකුණ්ඩලී අතර දෙබස රඟපෑමෙන් ඉදිරිපත් කරයි.
* සැමදෙනා දඬුවමට හා මරණයට බය බව දැන දඬුවමින් හා ඝාතනයෙන් වැළකෙයි.
* තමා උපමාකොටගෙන, වරදින් මිදී අන්‍යයන් සමග සුහදව ජීවත්වෙයි.

18. ලෙන් විහාර රැසක් කළ නිරිඳු වළගම්බා
* වළගම්බා රජු සිදුකළ ශාසනික සේවා විස්තර කරයි.
* ත්‍රිපිටකය පුස්කොළ පොත්වල ලියවීම වළගම්බා රජුගේ වැදගත් මෙහෙවරක් බව පිළිගනී.
* වළගම්බා රජතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ ලියන ලද පුවරුවක් සකස් කරයි.
* වැඩිහිටි උපදෙස් අනුව කටයුතු කරයි.
* ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරයි.

19. නුවණ යොදවා දිවිය සුරකිමු.
* මනුෂ්‍යයා නම් කවරෙක් දැයි පැහැදිලි කරයි.
* ශාරීරික අඟ පසඟ පමණක් නොව චරිතය ද ආරක්ෂා කරගත යුතුබව බුදුසමය උගන්වන බව පිළිගනී.
* චරිතවත් ළමයෙකු සතු ගුණාංග 10 ක් ලියා ප්‍රදර්ශනය කරයි.
* පසිඳුරන් පිනවීමට ගිජු නොවී කටයුතු කරයි.



Not For Sale - CMSP

* සුචරිතයේ හැසිරී පරලොව දිවිය වැඩදායක කරගැනීමට කටයුතු කරයි.

20. හැදෙන ලොවකට අවැසි විලිබිය.
* ලෝක පාලක ධර්ම මොනවාදැයි නම් කරයි.
* ලැජ්ජාව හා පාපයට ඇති බිය ලෝකයේ ශිලාචාරකම සුරැකීමට ඉවහල්වන බව පිළිගනී.
* පවට බියවීම සම්බන්ධයෙන් හඳුන්වාදී ඇති කරුණු හතර පුවරුවක එහි සිංහල තේරුම ද සමග ලියා ප්‍රදර්ශනය කරයි.
* වරද හැදින ඉන් දුරුවේ.
* සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීමට දායක වේ.

21. ලක් සසුන එකලු කළ පඬිරුවන්
* විද්‍යොදය, විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භකළ පැවිදි උතුමන් නම් කරයි.
* ශාස්ත්‍රීය සේවා සිදුකිරීමට හික්කඩුවේ සුමංගල, රත්මලානේ ධර්මාරාම, වස්කඩුවේ ශ්‍රී සුභූති යන හිමිවරුන් දායක වූ බව දැන ගනී
* හික්කඩුවේ සුමංගල, රත්මලානේ ධර්මාරාම, වස්කඩුවේ සුභූති යන හිමිවරුන් ගෙන් වූ සේවා වෙන් වෙන්ව ලියා බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරයි.
* ශාස්ත්‍රීය කටයුතුවල නියැලීම සඳහා උපදෙස් පතමින් උගතුන් ඇසුරට පත්වෙයි.



Not For Sale - CMSP

22. සුපසන් බොදු නිවසක්

* ආගන්තුක පිළිගැනීමේ දී අනුගමනය කරන පිළිවෙල පහදයි.
* අල්ප ශබ්දතාව හා සංවරශීලි බව බෞද්ධ නිවසක පැවතිය යුතු ගුණාංගයක් බව පිළිගනී.
* කෑම මේසයක දී අනුගමනය කළයුතු වතාවත ලේඛනගත කරයි.
* ආගන්තුක හමුවකදී විනීතව කටයුතු කරයි.
* නිවසේ පරිසරය ප්‍රසන්නව පවත්වා ගනියි.

23. කිසිම සතකු නොමරමු අපි නොමරවමු.

* ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය නම් කුමක්දැයි පැහැදිලි කරයි.
* තමන් උපමාවට ගෙන, අන්‍යයන්ට හිංසා කිරීමෙන් වැලකීමට එකඟ වේ.
* පරිසරයේ හානිදායක ජීවීන් ඇති නොවන පරිදි කටයුතු කිරීමට යෝජනා පත්‍රයක් සකස් කරයි.
* වැරදි ක්‍රියාවන්ගෙන් ඈත්වෙයි.
* පරිසරය සොදුරු එකක් ලෙස පවත්වා ගනියි.

24. කඨින පූජෝත්සවය.

* කඨින පිංකම පිළිබඳ විස්තර කරයි.
* බෞද්ධයාගේ පිං වැඩෙන පිංකම් ඉටුකළ හැකිකාලය ලෙස වස්කාලය පිළිගෙන පිංකම් හි යෙදීමට කැමැත්ත පලකරයි.
* කඨින පිංකමක් සිදුකර පිළිවෙල දක්වෙන ලිපියක් ලියයි.
* පින්කම් හි දායක වෙයි.

Not For Sale - CMSP

* කඨින පිංකමේ සිරිත් - විරිත් හැඳින එය රැකගැනීමට කටයුතු කරයි.

25. වන්දනා ගාථා නිවැරදිව භාවිතා කරමු.
* නිවැරදිව ගාථා සජ්ඣායනයේ වැදගත්කම පැහැදිලි කරයි.
* වැරදි අයුරින් උච්චාරණය කිරීම නිසා අර්ථ වෙනස්විය හැකිබව පිළිගනී.
* නිවැරදිව, මිහිරිව, තේරුම අවබෝධයෙන් ගාථා සජ්ඣායනය කරයි.
* වන්දනා කිරීමේදී නිවැරදිව ගාථා සජ්ඣායනය කරයි.
* නිවැරදි වන්දනාවක යෙදෙයි.

26. පාලි විෂය කොටස් සඳහා
* පාලි භාෂාවේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
* ත්‍රිපිටක ධර්මය විස්තරාත්මකව ඉගෙනීමට පාලි භාෂාවේ ඇති දායකත්වය දක්වයි.
* පාලි භාෂාවේ ස්වර අක්ෂර 8 ක් ද ව්‍යඤ්ජන අක්ෂර 33 ක් ද ඇති බව කියයි.
* ව්‍යඤ්ජන අක්ෂර තනා ගැනීමේ අභ්‍යාසයේ නිරත වෙයි.
* අර්ථාන්විතව තෙරුවන් සරණ යයි.
* අර්ථාන්විතව පන්සිල් සමාදන් වෙයි.
* චෛත්‍ය වන්දනාවේදී නිවැරදිව ගාථා උච්චාරණය කරයි.
* පහන් මල්, පූජා කිරීම වෙනුවෙන් වූ ගාථා අර්ථාන්විතව නිවැරදිව සජ්ඣායනා කරයි.

Not For Sale - CMSP

27. අභිධර්ම පාඩම් සඳහා

* අභිධර්මය යන්න නිර්වචනය කර දක්වයි.
* ත්‍රිපිටකයේ එක් කොටසක් අභිධර්ම පිටකය ලෙස පිළිගනී.
* සිතේ ස්වරූපය අනුව බෙදෙන කොටස් ලියා දක්වයි.
* අකුසල් සිත් කාණ්ඩ විභාගකර දක්වයි.
* කාමසෝභන සිත් කාණ්ඩ වශයෙන් විභාගකර දක්වයි.
* රූපාවචර සිත් මොනවාදැයි පැහැදිලි කරයි.
* අරූපාවචර සිත් හඳුන්වයි.
* ලෝකය බෙදන ආකාරය දක්වයි.
* ලෝකෝත්තර සිත් වර්ග කර හඳුන්වයි.
* සිතෙහි ස්වභාවය හැඳින සිත දමනය කරගැනීමට පෙළඹෙයි.

Not For Sale - CMSP

# 8 ශ්‍රේණියට යෝජිත ඉගෙනුම්ඵල
# (අපේක්ෂිත උප නිපුණතා)

1. බුදු සිරිතේ පළමු විසිවස

* බුද්ධත්වයේ පටන් වර්ෂ 20 ක් ගතවන තාක්වූ කාලයේ වැදගත් සිදුවීම් විස්තර කරයි.
* ධර්ම ප්‍රචාරක කටයුතු විධිමත්ව සිදුවීම නිසා ශාසනය ඉක්මණින් ව්‍යාප්ත වූ බව පිළිගනී.
* බුදුදහම පැතිරී ගිය ඉන්දීය මධ්‍ය ප්‍රදේශයේ ප්‍රධාන නගර ලියා දක්වයි.
* නායකත්ව ලක්‍ෂණ ප්‍රගුණ කරයි.
* ප්‍රජා සේවාවේ නියැලෙයි.

2. බුදුගුණ හැඳින බුත්සරණෙ යායුතු

* බුදුගුණ 9 නම්කරයි.
* වගකීම් ඉසිලීමට සුදුසු උපදෙස් බුදුදහම ඇසුරින් ලබාගැනීමට කැමැත්ත පළකරයි.
* සත්ථා, බුද්ධ භගවා බුදුගුණයන් හි විශේෂ ලක්‍ෂණ වගුගතකර ඉදිරිපත් කරයි.
* අධිෂ්ඨානයෙන් හා කම්පා නොවීමෙන් කටයුතු කරයි.
* තමාගේ වාසනාව තමා විසින්ම මතුකර ගත යුතු බව පිළිගෙන ඒ සඳහා ක්‍රියාකරයි.

Not For Sale - CMSP

3. නොවරදින මග

* අපණ්ණක ජාතක කථාවේ සරල අර්ථය කියයි.
* බුද්ධිමත් නායකයත්වය සැමට සෙතක්ම වේ. යන්න පිළිගනී.
* අධ්‍යාපන චාරිකාවක් සංවිධානය සඳහා සැලසුමක් සකස් කරයි.
* ඇසුරු කළ යුතු අය කවුරුන් දැයි විමසිලිමත්ව කටයුතු කරයි.
* විචක්ෂණ බුද්ධියෙන් යුතුව ක්‍රියා කරයි.

4. සුබැසි බස් තෙපලමු - දෙලොව යහපත සලසන.

* බොරු බස් නොකිමේ වැදගත්කම පැහැදිලි කරයි.
* බොරුවෙන් වැලකී සත්‍ය වචන කථා කිරීමට කැමැත්ත පළ කරයි.
* 'මුසාවාදයෙන් වැලකීම දෙලොව යහපතට හේතුවේ. ' මැයෙන් රචනාවක් ලියයි.
* ඇත්ත කථා කරයි.
* ඇත්ත කථා කරමින් බොරු කියන්නවුන් වළක්වයි.

5. ධම්මපද ගාථා

* නිර්දිෂ්ට ධම්මපද ගාථා සජ්ඣායනා කරයි.
* පංචස්කන්ධයට අයත්වන සියල්ල හේතුන් නිසා හටගන්නා බව පිළිගනී.
* ත්‍රිලක්ෂණ භාවනාවේ ප්‍රතිඵල ලේඛන ගත කරයි.
* රූපය පිළිබඳව ඇතිවන ආශාව තාවකාලික බව කියයි.
* සරල ජීවිතයක් ගත කරයි.



Not For Sale - CMSP

6. දුක්ඛ සමුදය ආර්ය සත්‍ය

* දුක්ඛ සමුදය ආර්ය සත්‍ය ධම්මචක්කපවත්තන සූත්‍රයට අනුව විස්තර කරයි.
* ත්‍රිවිධ තෘෂ්ණාව නිසා දුක හටගන්නා බව පිළිගනී.
* සිරුරෙහි පිහිටන ඉන්ද්‍රිය පහ හා ඒවාට ලබාගත හැකි අරමුණු පහ ලියා දක්වයි.
* පංච ඉන්ද්‍රිය පිනවීමට ලොල් නොවී කටයුතු කරයි.
* ජීවිතයේ සාර්ථකත්වය ඇතිකර ගැනීමට කටයුතු කරයි.

7. යහපත් පෞරුෂ ලක්ෂණ හතරක්

* මෙත්ත සූත්‍රයෙන් ඉගෙනගත් ගුණධර්ම ඉදිරිපත් කරයි.
* යහපත් පෞරුෂයෙන් යුත් ජීවිතයක් ගොඩනගා ගැනීමට කැමැත්ත පළ කරයි.
* 'අඩු අවශ්‍යතා සහිතවීම යහපත් දිවියකට අඩිතාලමයි' මාතෘකාවට රචනාවක් ලියයි.
* ඉඳුරන් සංවර කරගත් ශිෂ්‍යයකු වෙයි.
* සමාජ ජීවිතයේදී චරිත සංවර්ධනයෙන් යුතුව ක්‍රියාකරයි.

8. දැහැමි බව රැකි නිරිඳු බිම්සර

* බිම්බිසාර රජු ගැන සැකවින් විස්තර කරයි.
* සැදැහැතිව කටයුතු කරන්නට බිම්බිසාර රජුගේ චරිතයෙන් ආදර්ශ සපයා ගත හැකි බව පිළිගනී.
* බිම්බිසාර රජතුමාගේ ශාසනික සේවාව ලේඛනගත කර දක්වයි.
* වගකීම් ඉටුකිරීමට පෙළඹෙයි.

* බිම්බිසාර රජුගේ ගුණ චරිතායනයෙන් යහපත් පුරවැසියෙක් වෙයි.

9. පාසල් පරිසරය බොදු සිරිතෙන් ඔපවත් කරමු.
* යහපත් ශිෂ්‍යයකුගේ ගතිලක්ෂණ ඉදිරිපත් කරයි.
* පාසලේ ක්‍රියාත්මක ආගමික හා පරිසර වැඩසටහන්වලට සාමූහිකව දායකත්වය ලබාදිය යුතු බව පිළිගනී.
* ක්‍රමවත් පාසල් පරිසරයක් ගොඩ නැගීම සඳහා සැලසුමක් සකස් කරයි.
* සාමූහික වගකීමෙන් කටයුතු කරයි.
* ආගමික කටයුතුවලට මුල්තැන දෙමින් පොදු කටයුතුවල යෙදෙයි.

10. වඳිමු දළදා, වඳිමු සිරිපා
* දළදා වන්දනා ගාථාව හා ශ්‍රී පාද වන්දනා ගාථා සජ්ඣායනා කරයි.
* දළදා වන්දනාව හා ශ්‍රී පාද වන්දනාව බෞද්ධයාගේ උතුම්ම පූජාවක් වන බව පිළිගනී.
* වන්දනා චාරිකාවක් සඳහා සැලසුම් ඉදිරිපත් කරයි.
* සැදූහැ සිතින් වන්දනාවේ යෙදෙයි.
* ගෞරවාන්විතව, දළදා, සිරිපා වන්දනාවේ අගය දන ක්‍රියාකරයි.

11. පාලි I (නමස්කාර පාඨය)
* නමස්කාර පාඨය නිවැරදිව ශබ්ද නගා කියයි.



Not For Sale - CMSP

* බෞද්ධයකු වශයෙන් පාලි භාෂාව දැනගත යුතුබව පිළිගනී.
* සරල පාලිපාඨ සිංහලටත්, සිංහල පාඨ පාලි භාෂාවටත් පරිවර්තනය කරයි.
* නමස්කාර පාඨයේ අර්ථය නිවැරදිව දැන සජ්ඣායනා කරයි.
* සරල පාලි පාඨ ගොඩ නගයි.

12. පාලි II(ඉතිපි සෝ පාඨය)
  * ඉතිපි සෝ පාඨය නිවැරදිව ශබ්ද නගා කියයි.
  * බුදුගුණ නවය ඇසුරින් පාලි භාෂාව ඉගෙන ගැනීමට පෙළඹේ.
  * ඉතිපිසෝ පාඨයේ පදවල සිංහල අර්ථය ලියයි.
  * සරල සිංහල වාක්‍ය පාලි භාෂාවෙන් ලියයි.
  * බුදුගුණ පාඨය ඇසුරු කොට වාක්‍ය රටා ගොඩනගයි.

13. අභිධර්මය I - (චෛතසික)
  * චෛතසිකයන්ගේ සම්ප්‍රයෝග ලක්ෂණ හතර නම් කරයි.
  * සිත සමග චෛතසිකයන්ගේ අන්‍යෝන්‍ය බැඳීම පිළිගනී.
  * චෛතසිකවල ස්වභාවය අනුව බෙදන ලද කොටස් තුන පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරයි.
  * පසිඳුරන්ට දැනෙන අරමුණුවල ප්‍රිය හෝ අප්‍රිය බව දැන ක්‍රියාකරයි.
  * අරමුණු හා සිත ක්‍රියාත්මක වන අයුරු විමසයි.

Not For Sale - CMSP

14. ආදර්ශයෙන් සපිරි බුදුසිරිත

* බුදුරජාණන් වහන්සේගේ ඉවසීමේ ගුණය පිළිබඳව විස්තර කරයි.
* ජීවිතය හැඩගස්වා ගැනීමට බුදුසිරිතෙන් ගතහැකි ආදර්ශ වාර්තාගත කිරීමට පෙළඹේ.
* වේරඤ්ජාවේ වස් විසීම හා ආලවක දමනය අවස්ථාවන් හි විශේෂ සිදුවීම් ලියා දක්වයි.
* බුද්ධ චරිතය විචාරශීලීව හදාරයි.
* ඉවසීමෙන් කටයුතු කරයි.
* හොඳ බෞද්ධයකු හැඳින ගනිමු.
* බෞද්ධයකු තුළ පැවතිය යුතු යහපත් ලක්ෂණ විස්තර කරයි.
* ශ්‍රද්ධාව බෞද්ධයකු තුළ පැවතිය යුතු වටිනා ගුණාංගයක් බව දැන ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමට පෙළඹේ.
* හොඳ බෞද්ධයකු කෙරෙහි දැකිය හැකි ගති ලක්ෂණ ලියා දක්වයි.
* හොඳ බෞද්ධයකු සතු ලක්ෂණ දැන ඒ අනුව කටයුතු කරයි.
* සිල්වත් වෙයි.

15. බුදු සසුන ඔපවත් කළ වාදිසිංහයාණෝ

* මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි හඳුන්වමින් කතා කරයි.
* මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිගේ නිර්භීත භාවය දැන එය අගය කරන්ට කැමැත්ත පළ කරයි.
* ගුණානන්ද හිමිගේ චරිතයෙන් ප්‍රකට කෙරන නායකත්ව ලක්ෂණ ලේඛණ ගතකරයි.

Not For Sale - CMSP

* අධිෂ්ඨානශීලීව කටයුතු කරයි.
* ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා සමයානුකූල දැනුමෙන් යුක්ත වෙයි.

16. දෙගුරුන් ගුණ දැන අදරින් සලකමු.
   * දෙගුරුන්ගේ වැදගත්කම පැහැදිලි කරයි.
   * මවුපිය ගුණ දැන ඔවුන්ට ආදර කරුණාව දැක්වීමට පෙළඹේ.
   * 'මවු පිය ගුණ වරුණ' යන මැයෙන් පද්‍ය පන්තියක් ලියයි.
   * මව්පියන්ට උපකාර කරයි.
   * දෙමාපියන් පෝෂණය කරයි.

17. මෙත්ත සූත්‍රය
   * මෙත්ත සූත්‍රය අන්තර්ගතය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරයි.
   * මෛත්‍රී කිරීමේ අනුසස් දැන මෛත්‍රී භාවනාවට යොමු වේ.
   * මෙත්ත සූත්‍රයේ දැක්වෙන ගුණ ධර්ම දහහතර ලියා දක්වයි.
   * මෛත්‍රී භාවනාවේ යෙදෙයි.
   * සමාජ ජීවිතයට මෙත්ත සූත්‍රගත ඉගැන්වීම් අදාළ කරගනියි.

18. වපුරන අයුරුම අස්වැන්න ලැබේ.
   * චක්ඛුපාල රහතන් වහන්සේගේ කථාව කියයි.
   * සියල්ල කර්මයෙන් සිදුනොවන බව පිළිගනී.
   * හිතාමතා නොකරන ක්‍රියා කර්ම ගණයට නොවැටෙන බව හා සිතා මතා කරන දේ කර්ම ගණයට ඇතුළත්වන බව පහදන ලිපියක් ලියයි.

Not For Sale - CMSP

* කර්මඵල විපාක පිළිගනිමින් කටයුතු කරයි.
* මෙලොවදීම කර්ම පලදීම සම්බන්ධ කථා පුවත් එකතු කරයි.

19. ලක් බුදු සසුනේ ආදීම තොරතුරු
    * තිස්ස රජු හා මිහිඳු හිමි ඇති වූ සංවාදය ඉදිරිපත් කරයි.
    * මහින්දාගමනයෙන් ලත් ප්‍රතිඵල තවදුරටත් පවත්වා ගන්නට පෙළඹෙයි.
    * 'දෙවන පෑතිස් යුගයේ වැදගත් සිදුවීම්' මාතෘකා කොට රචනයක් ලියයි.
    * බුදු දහම පෝෂණය හා සුරැකීමට දායක වෙයි.
    * ශාසනික සිරිත් අනුගමනය කරයි.

20. දස කුසල් හා දස අකුසල්
    * දස අකුසල් නම් කොට විස්තර කරයි.
    * අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදෙන්නට පෙළඹේ.
    * දස කුසල් හා දස අකුසල් තුන් දොර අනුව වගු ගතකර ප්‍රදර්ශනය කරයි.
    * වාචසික සුචරිතය පවත්වා ගනියි.
    * කායික සුචරිතයේ යෙදෙයි.

21. උතුම් අභිඥාලාභී තෙරණිය
    * යසෝධරා තෙරණින් වහන්සේගේ කථාව කියයි.
    * කම්පා නොවී ඉවසීමෙන් කටයුතු කිරීම වැදගත් බව පිළිගනී.



Not For Sale - CMSP

* යසෝදරා දේවියගේ පතිභක්තිය දැක්වෙන කවි සොයා ගායනා කරයි.
* සංසාරිකව කුසල ශක්තිය බලපාන බව දැන කටයුතු කරයි.
* ස්වාමි - භායර්‍යා ආදර්ශ අගය කරයි.

22. අපේ අවමඟුල් සිරිත් විරිත්
   * අවමඟුල් චාරිත්‍ර වාරිත්‍ර මතු පරපුර සඳහා ද පවත්වා ගනියි.
   * තම ප්‍රදේශයේ අවමඟුල් චාරිත්‍ර විස්තර කරයි.
   * අවමඟුල් සිරිත් විරිත් පිළිවෙළින් ලියා දක්වයි.
   * අවමඟුල් සිරිත් විරිත් දැන කටයුතු කරයි.
   * මරණය - දුක, සංවේගය, ශෝකය හා බැඳුන බැවින් ඒ අනුව කටයුතු සංවිධානයට පෙළඹේ.

23. පාලි III (පැන් හා ආහාර පූජා කිරීමේ ගාථා)
   * අර්ථාවබෝධයෙන් යුතුව පැන් හා ආහාර පූජා කිරීමේ ගාථා සජ්ඣායනය කරයි.
   * ගාථා කට පාඩම් කරගැනීමට පෙළඹේ.
   * ගාථාවන්හි සිංහල අර්ථ ලියා දක්වයි.

24. පාලි IV (දැහැත් හා සුවඳ දුම් පූජා කිරීමේ ගාථා)
   * අර්ථාවබෝධයෙන් හා නිවැරදි උච්ඡාරණයෙන් දැහැත් හා සුවඳ දුම් පූජා කිරීමේ ගාථා කියයි.
   * ගාථා කටපාඩම් කරගැනීමට පෙළඹේ.



Not For Sale - CMSP

* ගාථාවන් හි සිංහල අර්ථය ලියා දක්වයි.

25. අභිධර්මය II (අන්‍ය සමාන රාශිය)

* අන්‍ය සමාන රාශියට අයත් චෛතසික නම් කරයි.
* අන්‍ය සමාන චෛතසික කුසල හා අකුසල රාශි දෙකේම යෙදෙන බව දනගනී.
* අන්‍ය සමාන චෛතසික චාට් සටහනකින් දක්වයි.
* අන්‍ය සමාන රාශියේ චෛතසික කාණ්ඩ නම් කරයි.

26. සලකමු කළගුණ

* කණ්හ ජාතක කථාව කියයි.
* සමාජ ජීවිතයේදී හුදකලාව කටයුතු කළ නොහැකි බව පිළිගෙන සාමූහික ජීවිතයකට හුරුවේ.
* "සමගිය සමාදානය නිසා යහපත් සමාජයක් ගොඩනැගේ."රචනාවක් ලියයි.
* බුදු සිරිතේ හා ශ්‍රාවක සිරිත්හි එන කළගුණ දක්වූ අවස්ථා රැස්කරයි.
* කෘතවේදීව ජීවත් වෙයි.

27. දස පින් කිරියවත්

* දස පින් කිරියවත් නම් කරයි.
* දස පින් කිරියවත්හි යෙදීමට පෙළඹෙයි.
* සිදු කරන ලද පින් කිරියවත් ලේඛණයක් සකස් කරයි.
* දස පින් කිරියවත් හි ආනිසංස දන කටයුතු කරයි.
* සිල්වත් වෙයි.

Not For Sale - CMSP

28. ඇසූ පිරූතැන් ඇති ඛුජ්ජුත්තරා උවැසිය

* ඛුජ්ජුත්තරා උපාසිකාවගේ කථාව කියයි.
* අවංකව කටයුතු කිරීමේ ඇති වැදගත්කම පිළිගනී.
* සාමාවතී දේවියගේ චරිතයෙහි ඇති විශේෂතා ලේඛන ගත කරයි.
* නොදත්, අලුත් දේ දැන ගැනීමට කැමති වෙයි.
* අනතිමානීව කටයුතු කරයි.

29. ත්‍රි ශික්‍ෂාව හැඳින ගනිමු.

* ත්‍රිශික්‍ෂාව යනු කුමක්දැයි පැහැදිලි කරයි.
* සීල, සමාධි, ප්‍රඥා වඩා චතුරාර්‍ය සත්‍ය අවබෝධ කරගත හැකි බව පිළිගනී.
* නිවැරදි ධර්ම පඤ්චකය - තේරුම් සහිතව ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරයි.
* ධර්ම සාකච්ඡාවලට සහභාගි වෙයි.
* තමා දත් දේ අනුන්ට කියා දෙයි.

30. සීලානුස්සති භාවනාවේ යෙදෙමු.

* සීලානුස්සතිය, සමථ භාවනාවේ දස අනුස්සති යටතේ විස්තර වන බව ප්‍රකාශ කරයි.
* භාවනාවේදී කර්මස්ථානවල වැදගත්කම දැන භාවනාවට පෙළඹේ.
* භාවනා වඩමින් සීලානුස්සතියෙහි යෙදෙයි.
* පවින් බැහැර වේ.
* අනුස්සති සීලයෙන් යුතු වේ.

Not For Sale - CMSP

31. අනුරපුරයේ අපේ උරුමය

* මිහිඳු හිමිගේ ලක්දිව වැඩි පුරා වෘතය කියයි.
* ඉපැරණි කලා ශිල්ප නිර්මාණ සුරැකිය යුතු බව පිළිගනී.
* මිහිඳු හිමි පැමිණීමේ සිට ෂෂ අග්බෝ රජු දක්වා රාජ පරම්පරාව ලියා ප්‍රදර්ශනය කරයි.
* කැටයම් කලාව ඉගෙනීමට පෙළඹේ.
* අනුරපුර වන්දනාවේ යෙදෙයි.

32. සුවදායී නින්දක් ගුණදායී ආහාර රටාවක්

* ශාරීරික වර්ධනයට ආහාරයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
* නිවැරදි ආහාර රටාවක අවශ්‍යතාව පිළිගනී.
* දෛනික ආහාර වේල් සඳහා සැලසුම් සකස්කර දක්වයි.
* නින්ද අවශ්‍ය වූවක් බව දැන කටයුතු කරයි.
* විශ්‍රාමය ශාරීරික අවශ්‍යතාවයක් බව දැන විවේකයේ යෙදේ.

33. සිංහල බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමියා

* අනගාරික ධර්මපාල තුමාගේ කථාව සැකවින් කියයි.
* ජාතිකත්වය පිලිබඳව ගැඹුරින් කරුණු විමසීමට පෙළඹේ.
* අනගාරික ධර්මපාලතුමාගේ සේවා ගොනුවක් පිළියෙල කරයි.
* ධර්මපාලතුමාගේ චාරිතාදර්ශ චරිතායනය කරයි.
* නායකයෙකු ලෙස ක්‍රියාකරන්නට පෙළඹේ.

Not For Sale - CMSP

34. පිරිහීමේ දොරටු වසාලමු.

* පරාභව සූත්‍රය දේශනා කිරීම පිළිබඳ පුවත විස්තර කරයි.
* පිරිහෙන ලක්ෂණ හඳුනාගෙන ඉන් වැළකීමට පෙළඹේ.
* පිරිහීමේ කරුණු ලේඛණ ගත කරයි.
* දියුණුව සොයායන්නෙකු වෙයි.
* යහපතෙහි හැසිරෙන්නෙකු වෙයි.

35. සමුපකාරය හා ආගන්තුක සත්කාර

* සාමුහිකව කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි.
* ආගන්තුක සත්කාර වටිනා එකක් බව දැන එහි යෙදෙන්නට කැමති වෙයි.
* 'සාමූහිකව කටයුතු කිරීමේ ප්‍රයෝජන ' මැයෙන් රචනාවක් ලියයි.
* පොදු කටයුතුවල යෙදෙයි.
* අන්‍යයන්ට උදව් උපකාර කරයි.

36. පාලි V - (ප්‍රාර්ථනා ගාථා)

* අර්ථාවබෝධයෙන් හා නිවැරදි උච්චාරණයෙන් යුතුව ප්‍රාර්ථනා ගාථා කියයි.
* ගාථා කටපාඩම් කරගැනීමට යොමු වේ.
* ගාථාවන්හි සිංහල අර්ථය ලියා දක්වයි.



Not For Sale - CMSP

37. පාලි VI - (ආරක්ෂක ගාථා)

* අර්ථාවබෝධයෙන් හා නිවැරදි උච්චාරණයෙන් යුතුව ආරක්ෂක ගාථා කියයි.
* ගාථා කටපාඩම් කරගැනීමට යොමු වේ.
* ගාථාවන්හි සිංහල අර්ථය ලියා දක්වයි.

38. අභිධර්මය - (අකුසල රාශිය)

* අකුසල රාශියට අයත් චෛතසික වෙන්කර පැහැදිලි කරයි.
* එක් එක් අකුසල සිතකට සුදුසු පරිදි මෙම චෛතසික යෙදෙන බව පිළිගනී.
* දොපස් විඤ්ඤාණ සිත් වගුවකින් දක්වා ප්‍රදර්ශනය කරයි.
* අකුසල රාශිය පිළිබඳව අන්‍යයන්ට වැටහීමක් ලබාදීමට යොමු වෙයි.

39. අභිධර්මය - (ශෝභන රාශිය)

* ශෝභන රාශිය නම් කුමක්දැයි පැහැදිලි කරයි.
* විරති චෛතසික හැදින විරතියෙහි යෙදීමට කැමැත්ත පළකරයි.
* සෝභන රාශිය වගුගත කර දක්වයි.
* අභිධර්ම ඉගැන්වීමේ ඇති සුවිශේෂතා අධ්‍යනය කරයි.

Not For Sale - CMSP

# 9 ශ්‍රේණියට යෝජිත ඉගෙනුම්ඵල
# (අපේක්ෂිත උප නිපුණතා)

විෂය කොටස් බෙදා ඇති මාතෘකාවන් පොදුව ගෙන ඒවාට යෝජිත ඉගෙනුම්ඵල දක්වා ඇත.

**බුද්ධ චරිතය**

* පෙර ශ්‍රේණිවලදී උගත් බුදුසිරිතේ විශේෂිත සිද්ධි ඉදිරිපත් කරයි.
* පෙර ශ්‍රේණිවලදී උගත් බුදුසිරිතේ ලබාගත හැකි ආදර්ශ ලේඛනගත කරයි.
* අජාසත් රජුගේ අදූරදර්ශී ක්‍රියා හැඳින එවැනි ක්‍රියාකාරකම්වලින් ඉවත්ව සුචරිතව කටයුතු කරයි.
* දෙව්දත් තෙරුන්ගේ අකාරුණික ක්‍රියා කෙරෙහි මුහුණදුන් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨත්වය පිළිගෙන කටයුතු කරයි.
* ජාති, ගෝත්‍ර, කුල නොසලකා අන්‍යයන්ට පිහිටවීමට යොමු වෙයි.
* දෙමව්පියන්ට සලකයි.
* අසරණ අයට ඒ ඒ අවස්ථාවල සුදුසු අයුරින් පිහිට වෙයි.
* නිරෝගී ජීවිතයක් පවත්වා ගැනීමට උත්සුක වෙයි.
* රෝගී උපස්ථානයේ යෙදෙයි.
* කොසොල් රජු ප්‍රකාශිත බුදුරදුන් කෙරෙහි ප්‍රසාදයට හේතුවන කරුණු සැලකිල්ලට ගනිමින් ධර්ම සාකච්ඡාවක් පවත්වයි.

Not For Sale - CMSP

* ලිච්ඡවී රජදරුවන්ගේ අපරිහානීය ධර්ම පොදු සමාජ කටයුතුවලදී යොදා ගැනීමට ක්‍රියා කරයි.
* බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකි. අදහස තහවුරු කෙරෙමින් පුවත්පතකට ලිපියක් ලියයි.

ශ්‍රාවක ශ්‍රාවිකා චරිත

* සැරියුත් මහරහතන් වහන්සේගේ නිහතමානී ගුණය ආදර්ශය කරමින් අනතිමානීව ක්‍රියා කරයි.
* හොඳින් උගත් දේ හොඳින් පැහැදිලි කරයි.
* කේලම්කීම බරපතල හානිදායක එකක් බව කියයි.
* ඇත්ත ඇති සැටියෙන් දන විචක්ෂණව කටයුතු කරයි.
* ධර්මදූතයකු හා දක්ෂගුරුවරයකුගේ ලක්ෂණ මිහිඳු මාහිමි චරිතයෙන් ඉගෙන ඒවා චරිතායනය කරයි.
* ශ්‍රී ලංකාවේ සංස්කෘතික පෝෂණයට සංඝමිත්තා තෙරණියගෙන් සිදුවූ සේවාව දන සංස්කෘතික පෝෂණයට දායක වෙයි.

**ශ්‍රී ලාංකික බෞද්ධ චරිත**

* වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන්ගේ ජීවිත කතාව කියයි.
* නොපසුබස්නා උත්සහයෙන් කටයුතු කිරීම මගින් අරමුණු ජයගත හැකි බව කියයි.
* ශාසනික දියුණුවට, පැවැත්මට නිරන්තර සහය දක්වයි.
* බ්‍රහ්මචාරී වලිසිංහ හරිස්චන්ද්‍රතුමා දයේ වීරයෙක් බවට කරුණු දක්වයි.
* රටට, ජාතියට, ආගමට සේවා සැපයීමට කැපවෙයි.



Not For Sale - CMSP

* ස්ත්‍රීත්වය දක්ෂතාවන් දැක්වීමේදී බලනොපාන බව අනුලාදේවිගේ හා විහාර මහාදේවිගේ චරිත ඇසුරු කොට පවසයි.
* රට, දැය, සමය වෙනුවෙන් උදාර මෙහෙවරක නිරත වෙයි.

**ජාතක කථා**

* අත්ථස්සද්වාර ජාතක කථාව කියයි.
* දියුණුවේ දොරටු (මාර්ග) හැඳින ඒවායේ යෙදෙමින් තම ශිෂ්‍ය ජීවිතය යහපත් කරගනියි.
* චුල්ලසෙට්ටි ජාතක කථාව පැහැදිලි කරයි.
* දුරදක්නා නුවණ හා ස්ථිර අධිෂ්ඨානය නිසා ජීවිතය ජයගත හැකි බව පවසයි.
* නොමඟ හැර දමා සුමගට යොමු වෙයි.
* දැහැමි පුරවැසියෙකු වෙයි

**ධර්මය**

* ජීවිතය අනිත්‍ය වන්නේ ඇයි දැයි කරුණු දක්වයි.
* ජීවත්වීමේදී ත්‍රිලක්ෂණය ගැන දැන සාර්ථක දිවියක් ගොඩනගා ගනී.
* චතුරාර්‍ය සත්‍ය බුදු දහමේ එක් මූලික ඉගැන්වීමක් බව පැහැදිලි කරයි.
* පුද්ගල ජීවිතය සාර්ථකව පවත්වා ගැනීමට හා තේරුම් ගැනීමට චතුරාර්‍ය සත්‍ය ඉගැන්වීම පාදක කරගනී.

Not For Sale - CMSP

* දුක කාටත් පොදු ධර්මතාවක් බව පිළිගෙන කටයුතු කරයි.
* දුක පිළිබඳව කම්පා නොවී දුක ජයගැනීමට ක්‍රියා කරයි.
* තණ්හාව දුකට මුල බව දැන එය බැහැරකිරීමට පෙළඹේ.
* අනවශ්‍ය බැඳීම් වලින් ඉවත්ව සරල ජීවිතයක් ගතකරයි.
* බෞද්ධ නිර්මාණය යනු කුමක්දැයි පැහැදිලි කරයි.
* තෘෂ්ණාව මෙලොවදීම ප්‍රහාණය කළ යුතු බව පිළිගනී.
* ප්‍රඥාවෙන් හා වීර්යයෙන් යුතුව ක්‍රියා කරයි.
* ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ඉගැන්වීම් විස්තර කරයි.
* අරි අටෙහි මග ඉගැන්වීම් අනුව කටයුතු කර යහපත් අයෙකු වෙයි.
* සියල්ල කර්මයෙන් සිදු නොවන බව කියයි.
* නියාම ධර්මයන්ට අනුව කර්මය දැන පරිසරයට උචිත අයෙකු වෙයි.
* උත්සාහවත්ව කටයුතු කරයි.
* චේතනාව පාදක කොට කුසල අකුසල සිත් හටගන්නා බව කියයි.
* අකුසල මුල් හැඳින කුසල මුල වර්ධනය කරගනී.
* යහපත - අයහපත දැන සුචරිතවත් වෙයි.

ගාථා හා දහම් කවි

* බෞද්ධ සාහිත්‍ය සදුපදේශයන්ගෙන් පෝෂිත බව දක්වයි.
* සත් පුරුෂයකු සතුව පැවතිය යුතු ලක්ෂණ කියයි.
* නියමිත ගාථාවන් හී ඇති උපදේශ වෙන්වෙන්ව ප්‍රදර්ශනය කරයි.
* උපදේශාත්මක ගාථා එකතුවක් සකස් කරයි.



Not For Sale - CMSP

* සදුපදේශ අනුගමනයෙන් නිවැරදි මඟට යොමුව කටයුතු කරයි.
* සුදන යනු කවුරුන්දැයි විස්තර කරයි.
* සුභාෂිතයේ ඉගැන්වීම් ගැන හදාරයි.
* සුදන ගුණ හැඳින තමාද සුදන වීමට ක්‍රියා කරයි.
* ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරයි.
* ලෝකෝපකාරය ග්‍රන්ථයේ ධන පරිභෝජනය පිළිබඳව ඇතළත් බව දක්වයි.
* මනා ධන පරිභෝජනයකට යොමුව කටයුතු කරයි.

**සූත්‍ර ධර්ම**

* පිරිහීම හා දියුණුවීම යන අවස්ථා පැහැදිලි කරයි.
* දියුණුවට හේතුවන කරුණු ලේඛනගතකරයි.
* පරිහානියට හේතුවන කරුණු දැන එයින් වෙන්වේ.
* ශිෂ්‍ය ජීවිතයේදී අධ්‍යාපනික දියුණුවට හේතුවන කරුණු අධ්‍යයනය කරමින් ඒ අනුව කටයුතු කරයි.
* දුසිරිතෙන් වැළකේ.
* 'පුද්ගල දුසිරිත්වලින් තොර සමාජයක් ' මාතෘකා කොට කථාවක් පවත්වයි.

**ආචාර ධර්ම**

* ගිහි - පැවිදි යුතුකම් මොනවාදැයි සිගාලෝවාද සූත්‍රයට අනුව විස්තර කරයි.
* ගිහි යුතුකම් පැවිදි සමාජය පෝෂණය කරයි.
* පැවිදි ආශිර්වාදය ලබමින් ජීවිතය සැපවත්කරගනී.



Not For Sale - CMSP

* පවුල් ඒකකයක පැවතිය යුතු ස්වාමි - භාර්යා යුතුකම් ගැන පැහැදිලි කරයි.
* අඹු සැමි සහයෝගීතාව වාසනාවත් පවුල් දිවියක අත්තිවාරම බවට කරුණු දක්වයි.
* ඔවුනොවුන්ට ගෞරව කරයි, අගය කරයි.
* සේව්‍ය සේවක සම්බන්ධතාව යහපත් ආර්ථිකයකට හේතුවන බව කියයි.
* ඔවුනොවුන්ගේ යුතුකම් ඉටුකර අන්‍යෝන්‍ය බැඳීමෙන් කටයුතු කරයි.
* එකිනෙකා අගය කරයි.
* බෞද්ධයකුගේ ජීවිත කාලය පුරාවට එළඹෙන මංගල අවස්ථා නම්කරයි.
* සිංහල බෞද්ධ මංගල උත්සවයන් සංවිධානයේදී බැහැර කළයුතු දේ දක්වයි.
* සිංහල බෞද්ධ සරණ මංගල චාරිත්‍ර පිළිවෙලින් ලේඛන ගතකරයි.
* සිංහල බෞද්ධ චරාරිත්‍ර හැඳින ඒ අනුව මංගල උත්සව සංවිධානය කරයි.
* සිංහල බෞද්ධ කුල සිරිත් මතු පරපුරට දායක කරයි.
* අවමංගල්‍යයක දී සිදුකෙරෙන සිංහල බෞද්ධ චාරිත්‍ර පැහැදිලි කරයි.
* ගෞරවාන්විතව අවමංගල්‍ය කටයුතු පැවැත්වීමට යොමු වේ.
* අර්ථවත් අවමංගල්‍ය චාරිත්‍රවල යෙදේ.

Not For Sale - CMSP

**බෞද්ධ කලා ශිල්ප**

* බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ ආරම්භය පිළිබඳ කරුණු කියයි.
* ජනතා චිත්ත ප්‍රසාදය සඳහා ප්‍රතිමාකරණය හේතු වී ඇතිබව පහදයි.
* ආසන හා මුද්‍ර අනුව ප්‍රතිමාකලාවේ නිර්මාණ රැස්කොට පොත් පිංචක් සකස්කරයි.
* බුද්ධ ප්‍රතිමා නිර්මාණය අගයකරමින් ඒ සඳහා වන ව්‍යාපෘතීන්වලට තමාද දායක වේ.
* මහින්දාගමනයේ ආභාෂය මත බුදු පිළිම නිර්මාණය කළ ඇති බවට සාක්ෂි සපයයි.
* සමාධි පිළිම වහන්සේ, අවුකන පිළිම වහන්සේ, මාලිගාවිල පිළිම වහන්සේ, තොළුවිල පිළිම වහන්සේ, පොලොන්නරුව ගල්විහාර පිළිම වහන්සේ නිර්මාණය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.
* වන්දනා ගමනක යෙදී ප්‍රතිමා නිර්මාණය පිළිබඳ කරුණු හදාරයි.
* නිර්මාණ කුසලතාව මතු පරපුරට දායාද කරයි.

**පාලි**

* පාලි භාෂාවේ වැදගත්කම පැහැදිලි කරයි.
* සරල පාලි පාඨ සිංහල භාෂාවෙන් ලියයි.
* පස්වන හා හයවන විභක්ති ඒක වචන හා බහු වචන පද යොදමින් වාක්‍ය නිර්මාණය කරයි.
* පාලි භාෂාවේ මිශ්‍ර ක්‍රියාව සම්බන්ධයෙන් හදාරයි.
* පාලි භාෂාවේ නිපාත පද වාක්‍ය වල යොදයි.



Not For Sale- CMSP

* පාලි භාෂාවේ සර්වනාම භාවිතය පිළිබඳ කරුණු දක්වයි.
* නාම වර නැඟීම හා ඒවායේ අර්ථ තේරුම් ගැනීමට කටයුතු කරයි.
* පාලි භාෂා ප්‍රවීනත්වයට පත්වීමට විෂය (භාෂාව) හැදෑරීමට යොමුවෙයි.

**අභිධර්මය**

* අභිධර්මයේ ඉගැන්වෙන ලෝභ මූලික සිත් අට කියයි.
* මෝහ මූලික සිත් දෙක පැහැදිලි කරයි.
* සැකයෙන් හා උද්ධච්ඡයෙන් වෙන්ව කටයුතු කිරීමට උත්සහ දරයි.
* කාමාවචර සිත් 29 වගුගතකර දක්වයි.
* කුසලය හා අකුසලය තේරුම්ගෙන කටයුතු කරයි.
* රූපාවචර හා අරූපාවචර සිත් පිළිබඳව කරුණු දක්වයි.
* රූපාවචර හා අරූපාවචර ධ්‍යාන වගු සටහනකින් දක්වයි.
* අහේතුක සිත් පිළිබඳව කරුණු දක්වයි.
* දෙපස් විඤ්ඤාණ නම් කරයි.
* අහේතුක ක්‍රියා සිත්හි හසිතුප්පාද සිත හටගැනීමට පිළිබඳව කරුණු කියයි.
* භූත රූප නම් කොට පැහැදිලි කරයි.
* ප්‍රසාද රූප කරණ කොට විෂය රූප උපදනා බවට කරුණු ඉදිරිපත් කරයි.
* ප්‍රසාද රූප හා විෂයරූප වැඩසටහනකින් දක්වයි.

Not For Sale - CMSP

* සතර මහා භූත රූප ඇසුරුකොට ස්ත්‍රී පුරුෂ භාව රූප හටගන්නා බව කියයි.
* අභිධර්මය හැදෑරීමට යොමු වෙයි.

**භාවනා**

* මිනිස් කයෙහි ඇති නිස්සාරභාවය ගැන කරුණු දක්වයි.
* සිරුරෙහි ඇති කොටස් භාවනාවක් වශයෙන් යොදාගත හැකි ආකාරය පැහැදිලි කරයි.
* භාවනා ඉරියව්ව පුරුදු කරයි.
* මමත්වය එය බැහැරකරදීම සඳහා පිළිකුල් භාවනාව හේතුවන බව කියයි.
* මරණය පිළිබඳව සිහිකරමින් මරණානුස්සති භාවනාව වැඩිය හැකි බව පැහැදිලි කරයි.
* භාවනාවෙහි යෙදෙයි.
* යහපතෙහි හැසිරෙයි.

Not For Sale - CMSP

# 10 ශ්‍රේණියට යෝජිත ඉගෙනුම්ඵල
# (අපේක්ෂිත උප නිපුණතා)

විෂය කොටස් බෙදා ඇති මාතෘකාවන් පොදුව ගෙන ඒවාට යෝජිත ඉගෙනුම්ඵල දක්වා ඇත.

**බුද්ධ චරිතය**

* සිදුහත් කුමරුගේ උපත පටන් ගිහිගෙය හැරයෑම තෙක් කරුණු දක්වයි.
* සිදුහත් බෝසත්තුමා පැවිද්දේ පටන් බුද්ධත්වය දක්වා වූ කාලය විස්තර කරයි.
* බුදුසිරිතේ මුල් විසිවස තුළ වැදගත් සිදුවීම් ලේඛනගත කරයි.
* බුද්ධ චරිතයේ අවසාන විසිපස් වසර තුළ සිදුවූ වැදගත් සිදුවීම් පෙළ ගස්වයි.
* සියලු ජීවින් කෙරෙහි දයාබරිතව කටයුතු කරන්නට පෙලඹේ.
* බුදුහිමිගේ පද්මාකාර දිවිපෙවත ආදර්ශයට ගනිමින් සියදිවිය සාර්ථක කරගනී.
* බුදු සිරිතේ උදාර මානුෂික ගුණාංග අධ්‍යනය කර එහි වටිනාකම දැන ඒවා ජීවිතයට චරිතායනය කරගනියි.
* බුදුසිරිතෙන් ආදර්ශ ලබා යහපත් දිවියක් ගොඩනඟා ගනියි.
* බුදුසිරිතේ නායකත්ව ලක්ෂණ ප්‍රජා නායකත්වය සඳහා උපයෝග කරගනියි.
* අගය කළ යුතු පුද්ගලයන් අගය කිරීමට යොමු වේ.
* බුදු ගුණ හැඳින සැදැහැති වෙයි.

Not For Sale - CMSP

**බෞද්ධ චරිත කථා**

* සීවලී මහරහතන්වහන්සේගේ කතාවට අනුව කර්මයේ බලපෑම විස්තර කරයි.
* සුනාපරන්ත පුණ්ණ හිමිගේ කථාව දන - ඉවසීමෙන් කටයුතු කරයි.
* ධම්මදින්නා රහත් තෙරණියගේ චරිතයෙන් ආදර්ශ ගෙන ධර්ම කථිකත්වය ඇති කරගනී.
* බුද්ධකාලීන විවිධ උපාසක චරිතයන් හි පැවති ගුණ දන යහපත් උපාසක චරිතයක් ගොඩනඟා ගනියි.
* බුද්ධ කාලීන උපාසිකා චරිතයන් හි ආදර්ශ වර්තමාන කාන්තා සමාජය කෙරෙහිද ආරෝපණය කළ හැකි බවට කරුණු දක්වයි.
* වැලිවිට අසරණ සරණ සංඝරාජ හිමියන් කළ ශාසනික, අධ්‍යාපන, සේවා හැදින ඒවා වඩා වර්ධනයට දායක වෙයි.
* අමරපුර හා රාමඤ්ඤ මහා නිකායික ආරම්භක මහ නාහිමිවරු පිළිබඳ කරුණු හදාරා බාධක ජය ගැනීමේ කටයුතු කිරීමට පෙළඹෙයි.
* ශික්ෂාකාමී ජීවිතයක් ගතකරයි.
* දුටුගැමුණු, පරාක්‍රමබාහු, රජවරුන් පිළිබඳ කරුණු හදාරා ගුණපාල - ඒ අනුසාරයෙන් සමාජ මෙහෙවරෙහි යෙදෙයි.
* ගුණපාල මලලසේකර හා කේ.එන්. ජයතිලක යන පඬිවරුන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරයි.
* මෙම චරිතවලින් ආදර්ශ ගෙන ඒවා චරිතායනය කරගනියි.

Not For Sale - CMSP

* මාරි මියුසියස් හිගින්ස් මැතිනියගේ සිදුවූ සේවාව පිළිබඳව ලේඛනයක් සකස් කරයි.

බෞද්ධ චින්තනය

* ගැටළු විසදා ගැනීමේදි පටිච්චසමුප්පාද ඉගැන්වීම ගුරුකොටගත හැකි බවට කරුණු දක්වයි.
* සියල්ල කර්මයට භාරනොකොට බෞද්ධ කර්ම සංකල්පය හදාරා එයට අනුගතව ක්‍රියාකරයි.
* බෞද්ධ කර්ම සංකල්පය සදාචාර සංවර්ධනයට හේතුවන බව පැහැදිලි කරමින් ලිපියක් ලියයි.
* පුනර්භවය පිළිගනිමින් යහපත්ව ජීවත් වෙයි.
* ස්කන්ධ පංචකය පිළිබඳව දැන සත්ව පුද්ගල වටිනාකම තේරුම් ගනී.
* සමාජ සුබ සාධනය සඳහා සිව්බඹ විහරණ අනුගමනය කරයි.
* සමාජ නිදහස හා එකිනෙකා අතර වගකීම හැඳින කටයුතු කරයි.
* පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගැනීම සදහා සහජීවනයේ ඇති ලක්ෂණ අනුගමනය කරයි.
* දැහැමි දිවියක් සඳහා බෞද්ධ ආර්ථික ඉගැන්වීම් අනුගමනය කරයි.
* යුතුකම් ඉටුකිරීම තුළින් සමාජයේ අන්‍යෝන්‍ය බැඳීම තහවුරුවන බව දැන ඒ අනුව කටයුතු කරයි.
* බුදු දහමේ ඉගැන්වීම් යථාවබෝධයෙන් අනුගමනය කරයි.

Not For Sale - CMSP

## බෞද්ධ පරිසරය හා සිරිත් විරිත්

* ධර්ම සංගායනා ආරම්භකොට කාලීන සමාජ ගැටලු විසදාගත හැකි ආකාරය යෝජනා කරයි.
* සැදැහැවතකු දැක සංවේග ඉපදවිය යුතු ස්ථාන හතරේ ආගමික වටිනාකම පැහැදිලි කරයි.
* සොළොස්මස්ථාන වන්දනා චාරිකාවක යෙදෙයි.
* බෞද්ධ උත්සව පිළිබඳව හදාරා ආගමික මුහුණුවර රැකගෙන තවදුරටත් පවත්වා ගැනීමට කටයුතු කරයි.
* ගමයි - පන්සලයි බෞද්ධ බැදීම දැන එම සංස්කෘතිය තවදුරටත් පවත්වා ගනී.
* පන්සල හා ගම මැනවින් සබඳතාපවත්වා ගැනීමට මාර්ගෝපදේශ සපයයි.

## බෞද්ධ වත්පිළිවෙත්

* නිවසක සිදුකළ හැකි පින්කම් විස්තර කරයි.
* දානමය පිංකමක්/පරිත්‍රාණ පිංකමක් සංවිධානය පැහැදිලි කරයි.
* නිවස තුළ පරිසරය බෞද්ධ ආකල්පයන්ට අනුකූලව සංවිධානය කරගනී.
* අධ්‍යාත්මික ගුණ වගාවට වන්දනා ගමන් හේතුවන බව දැන වන්දනා ගමන්හි යෙදෙයි.
* සීල සමාදානයේ ඵල දැන පොහොය දින අෂ්ඨාංගික සීලය සමාදන්ව හැසිරෙයි.

Not For Sale - CMSP

### බෞද්ධ කලා ශිල්ප

* බුදු දහම කලාත්මක රස වින්දනය අගය කරන බව කියයි.
* ධාර්මික විනෝදය සඳහා කලාකරුවා සිය නිර්මාණ සකස්කර ඇතිබව කියයි.
* විහාරස්ථාකයක ඇති ගොඩනැගිලිවල වටිනාකම හැඳින ඒවා ආරක්ෂා කොට සංවර්ධනය කිරීමට කටයුතු යොදයි.
* ධර්ම සන්නිවේදනය සඳහා බෞද්ධ චිත්‍රකලාව උපයෝග වූ බව පිළිගෙන ඒවා සංරක්ෂණයට යොමු වේ.
* කැටයම් කලාවේ සුවිශේෂතා හඳුනාගෙන කලා රසඥතාව වර්ධනය කරගනී.

### බුදු දහම ප්‍රචලිත වී ඇති විදේශීය රටවල්

* ථෙරවාදී බෞද්ධ රටවල් ගැන හදාරා ථෙරවාදී බුදු දහම පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
* ථෙරවාදී බුද්ධ ධර්මය ප්‍රචාරණයට දායක වෙයි.
* යුරෝපා රටවල බුද්ධ ධර්මය ප්‍රචාරය පිළිබඳ කරුණු සොයා ඒවා ලේඛනගත කරයි.

### ගාථා හා සූත්‍ර

* ධම්මපද ගාථා මිහිරිව, නිවැරදිව ගායනා කරයි.
* ධම්මපද ගාථාවන් හි ඇතුළත් උපදේශ අනුගමනය කරයි.
* සමාජයේ පැවැත්මට ගුණදහම් පුහුණුවට දායක වෙයි.
* වසල කරණ ධර්ම බැහැරලා යහධර්ම අනුගමනය කරයි.
* වැරදි ක්‍රියාවන්ගෙන් අතමිදී කටයුතු කරයි.

Not For Sale - CMSP

**පාලි**

* වාක්‍ය රටා තේරුම් ගනියි.
* පාලි භාෂාවේ ව්‍යාකරණ විධි ඉගෙන අනුගමනය කරයි.
* පාලි ගාථා ගීතවත්ව ගායනා කරයි.
* සිංහල ප්‍රකාශ පාලියටත්, පාලි ප්‍රකාශ සිංහලටත් පරිවර්තනය කර ලියයි.
* ත්‍රිපිටකයේ අන්තර්ගතය හඳාරයි.

**අභිධර්මය**

* අන්‍ය සමාන චෛතසික වර්ග කර දක්වයි.
* අකුසල චෛතසිකයන්ගේ සමානතාව විස්තර කරයි.
* සෝභන චෛතසික 25 ප්‍රස්ථාරගතකර ප්‍රදර්ශනය කරයි.
* චිත්ත වීථි අධ්‍යනය කර කර්මය හා සම්බන්ධවන ආකාරය විමසයි.
* කුසලයෙන් සැපතත්, අකුසලයෙන් දුගතියත් හිමිවන බව දැන සුචරිතයේ හැසිරෙයි.
* සැනසීම සඳහා නිවන හේතුවන බව දැන කටයුතු කරයි.
* නිර්වාණය සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම හදාරා, ජීවිතයේ යථාර්ථය තහවුරු කරගැනීමට ක්‍රියා කරයි.

**ආනාපානසති භාවනාව**

* ආශ්වාසය හා ප්‍රාශ්වාසය මෙනෙහිකරමින් ආනාපානසති භාවනාව වඩන බව කියයි.

Not For Sale - CMSP

* සිදුහත් කුමරු වප්මගුල් දා දඹගස් සෙවනේ වඩන ලද්දේ මෙම භාවනාව බවට කරුණු දක්වයි.
* භාවනාවට සුදුසු ආසන ගැන කරුණු දක්වයි.
* භාවනාවේ යෙදෙයි.
* භාවනාවේ යෙදී සිතේ සසල බව දුරුකර ගැනීමට වෙහෙසෙයි.

Not For Sale - CMSP

# දහම් පාසල් ගුරු චර්යාව
# (සිරි වජිරඤාණ දහම් පාසල)

## ගුරු භවතුන් සතු යුතුකම්

**"ආචරියෝ භික්ඛවේ අන්තේවාසිකම්හි පුත්ත චිත්තං උපට්ඨපෙස්සති, අන්තේවාසිකෝ ආචාරියම්හි පිතු චිත්තං උපට්ඨපෙස්සති"**

**'මහණෙනි, ගුරුවරයා තම ශිෂ්‍යයා කෙරෙහි පුත්‍ර චිත්තය හෙවත් පුත්‍රයකු කෙරෙහි තැබිය යුතු ප්‍රේම චිත්තය පිරිනමන්නේ ය, පිහිටුවා ගන්නේ ය. ශිෂ්‍යයා ද ගුරුවරයා කෙරෙහි පියා කෙරෙහි තැබිය යුතු ගෞරව සිත පිහිටුවා ගන්නේ ය.**

'මෙය භික්ෂූන්හට නියම කළ දෙයක් වුව ද ගිහි ගුරු ශිෂ්‍යයන් අතර ද ඇති කර ගැනීම ඉතා සුදුසු ය. ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි දරු ප්‍රේමයත් ශිෂ්‍යයා ගුරුවරයා කෙරෙහි පිය ගෞරවයත් ඇති කර ගත් විට ඉගැන්වීමත් ඉගෙනීමත් මැනවින් සිදු වෙයි. වාද භේද ඇති වන්නේ ද නැත. මෙකල සියලු ගුරු ශිෂ්‍යයනට ම මේ පිය පුත් සැබැඳියාව ඇති කර ගැනීම අපහසු විය හැකි ය. තරුණ ගුරුවර ගුරුවරියන් බහුල හෙයිනි. පිළිවන් අය එකී සම්බන්ධයත් අනෙක් අය ප්‍රිය සහෝදර සම්බන්ධයත් ඇති කර ගත යුතු ය.

"ගුරුවරුන් තුළ කරුණාව - මෛත්‍රිය - දයාව තිබිය යුතු ය. මේ ශිෂ්‍යයන් රටට - ජාතියට - ආගමට හා භාෂාවට

Not For Sale - CMSP

වැඩ සලසන උදාර පුරුෂයන් කරන්නට ඕනෑය යන උසස් අදහස් තිබිය යුතු ය. පරීක්ෂාකාරී විය යුතු ය. ශිෂ්‍යයන්ගේ වරදෙහි හෝ අලසකම්හි හෝ නොසැලකිල්ලෙහි හෝ නො කළකිරිය යුතු ය. දිනෙන් දින තමන් ගුණ නුවණින් දියුණු වෙමින් එයින් ශිෂ්‍යයනට ආදර්ශ දිය යුතු ය. පුහුදුන් බැවින් තමන් තුළ අඩු පාඩු ඇතත් ඒවා ශිෂ්‍යයනට දැන ගන්නට ඉඩ නො තැබිය යුතු ය.

ගුරුවරුන් විසින් ශිෂ්‍යයන් කෙරෙහි පැවැතිය යුතු ආකාරය ද බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළහ.

1. **සුවිනීතං විනෙන්ති :**

මනා කොට හික්මවත්. හැමට පළමුව මෙලෙසින් ප්‍රකාශ කළේ උගත්කමට වඩා මිනිස්කම උසස් කොට සැළකූ හෙයිනි. කවර සමාජයකට වුව ද අවශ්‍ය වන්නෝ උගතුන් හට වඩා මනුෂ්‍යයෝ ය. මෙහි මනුෂ්‍යයා කීවේ නමින් මිනිස් වුවන් ගැන නොව, '**මනස්ස උස්සන්නතාය මනුස්සා**' තිරිසනුනට නොමැති ශිල්පශාස්ත්‍ර ඥාන හා කරුණා මෛත්‍රී ආදියෙන් ද උත්සන්න වූ සිතක් ඇති බැවින් මනුෂ්‍යයෝ නම් වෙතියි කී නියම මිනිසා ගැන ය.

ගුරුවරුන් ශිෂ්‍යයනට ශිල්ප ශාස්ත්‍රයෙන් උගන්වන අතර ම ආදර්ශයෙන් හා උපදේශයෙන් ද ඔවුන්ගේ චරිතය හැඩගැස්වීම ද කළ යුතු ය. ජන සාමාජයට කරදර නොවන, එසේ ම යහපත් සැලසෙන පිරිසක් කිරීමට නිතර ම උත්සාහ දැරිය යුතු ය. තමන් නිසා එක ශිෂ්‍යයෙකු වත් නොමඟ ගියොත් එය ඒ ශිෂ්‍යයාටත් ජන සමාජයටත් කරන මහා අපරාධයක් බව සලකා ශිෂ්‍යයන් සුමඟ නො යැවිය හැකි නම් නොමඟ

Not For Sale - CMSP

නොයන්නට වත් ක්‍රියා කිරීම  තමන් ගේ පරම යුතුකම බව සෑම ගුරුවරු ම සිතත් වා !

2. **සුග්ගහීතං ගාහාපෙන්ති :**

මනා කොට උගන්වත්. තමන්හට ආචර්ය - ගුරු - ගුරුදේව - ගුරු මෑණියන් - ගුරු පියාණන් ආදී උසස් නම් ලැබෙන්නේ ශිෂ්‍යයන් නිසා ය. එහෙයින් තමන් බැඳී සිටින යුතුකම් කොටස වන ඉගැන්වීම හැකි පමණ හොඳින් සම්පූර්ණ කිරීමට ගුරුවරු සිතට ගත යුතු ය. ඉගැන්වීමට නියමිත කාලයෙහි ඒ කටයුතු සකසා සපුරා නො කරන්නාහු ගුරුකමට නොගැලැපෙන්නෝ වෙති.

3. **සබ්බසිප්පසුත සමක්ඛායිනො භවන්ති :**

හැම දෙනා හට ම සියලු ශිල්ප ශාස්ත්‍ර දානය කරත්. ශිෂ්‍යයන් අතර දුප්පත් - පෝසත් -සුරූපී - විරූපී ඉගෙනීමෙහි දක්ෂ අදක්ෂ ආදි නන් වැදෑරුම් අය සිටින්නට පිළිවන. ඒවා කිසිවක් නො සලකා ඉගැන්විය යුතු ය.

4. **මිත්තාමච්චෙසු පටියාදෙන්ති :**

මිත්‍රාමාත්‍යාදීනට හඳුන්වා දෙත්. කාගේ හෝ ගුණමකු නො වීම ඉතා උසස් ගුණයෙකි. බුදුරජාණන් වහන්සේ මහ පිරිස් මැද ශිෂ්‍යයන්ගේ ගුණ වැණූ වාර බොහෝ ය. ඒ නිසා ගුරුවරු ද හොඳ කීකරු ගුණවත් නැණවත් ශිෂ්‍යයන්ගේ ගුණ කිය යුතු තැන නොමසුරුව කිව යුතු ය. එසේම " මේ මගේ හොඳ ශිෂ්‍යයෙකි, අනාගතයෙහි දී රටට - ජාතියට -ආගමයට හා භාෂාවට වැඩ සැළැසිය හැකි නැණවතෙකි. ගුණවතෙකි' යි



Not For Sale - CMSP

තම හිතමිත්‍රාදින්ටත් රාජමහාමාත්‍යාදීන්ටත් හඳුන්වා දීම ද හොඳ ගුරුවරයකුගේ යුතුකමෙකි.

මෙසේ හැම ගුරුවරු ම ආදර්ශයෙන් හා උපදේශයෙන් තමන්ගේ ශිෂ්‍යයන්, උගතුන්, ගුණවතුන් හා නැණවතුන් කොට රටට -ජාතියට - ආගමයට හා භාෂාවට මහඟු සේවයක් කරන්නට තරයේ ම ඉටා ගනිත් වා !

Not For Sale - CMSP

## අග්ගමහාපණ්ඩිත අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අනුදැන වදාළ මහැඟි පිළිවෙත් පහ

★ නිති පන්සිල් හා පොහොය අටසිල් රැකීමට උත්සාහාවත් කිරීම.

★ කුලදෙවි - මාපිය - ගුරුවර - වැඩහිටියන් පිදීමට යොමු කිරීම.

★ චාම් ජීවිතයට සහ සුහද වාසයකට හුරු කිරීම.

★ සංවර බව හා විනය ගරුක බව හා ධර්මඥානය දියුණු කිරීම.

★ ආගමාලයෙන් පිබිදුණු, ස්වදේශ වාත්සල්‍යයෙන් ඔද වැඩුණු ජාතිකාභිමානයෙන් මෙහෙයැවුණු, ස්වභාෂානුරාගයෙන් පණවත් වුණු දරු පරපුරක් බිහි කිරීම.

යන මාහැඟි පිළිවෙත් පහක් ඔස්සේ දරු දූරියන් ආදර්ශයෙන් හා උපදේශයෙන් නිසිමග යැවීම ඔබගේ පරම යුතුකමකි.

Not For Sale - CMSP

# දහම් පාසල් ගුරුවරයාගේ කාර්යභාරය

සතියේ දිනවල ඉතා අවිවේකී කාර්ය බහුල ජීවිතයක් ගත කොට සති අන්තයේ ලැබුණ ඉතා කෙටි විවේකය පවා අමතක කර දමා දහම් පාසලට පැණ ඔබ ස්වෙච්ඡාවෙන් හා නිස්සරණාධ්‍යාශයෙන් සිදු කරන සේවය ඉතා විශිෂ්ට වූවකි. මේ තුළින් ඔබට මහත් සැනසිල්ලක් මෙන්ම ධර්මදානමය පිනක් ලැබෙන අතර සිසු දරුවනට නිවැරදි මඟ පෙන්වීම තුළින් ඔවුන්ගේ ජීවිත වාසනාවන්ත කැර ගැනීමට මහත් උපකාරයක් ද වනු ඇත. හැම පුද්ගලයකුම අභ්‍යන්තර සහ බාහිර යන දෙයාකාරයෙන් සංවර්ධනයක් ඇති කැර ගත යුතු ය. පුද්ගලයාගේ සිතුම් පැතුම්, රුචි අරුචිකම්, අවැතුම් පැවැතුම්, ආකල්ප, ආවේග සමාජයට හිතකර ලෙස සංවර්ධනය කැර ගැනීම අභ්‍යන්තර සංවර්ධනය ලෙසත්, භෞතික සහ සමාජ පරිසරය අවබෝධ කැර ගෙන එය සංවර්ධනය කිරීම බාහිර සංවර්ධනය ලෙසත් හැඳින්විය හැකි ය.

දහම් පාසලට පැමිණ තමාට නියමිත පන්තියට ගොස් පාඩමක් කියාදීම පමණක් ගුරුවරයකු ගුරුවරියක වශයෙන් අපි ඔබෙන් බලාපොරොත්තු නොවෙමු. දෙමාපියන් ඉරිදා දිනයන්හි තම දූදරුවන් දහම් පාසලට එවන්නේ දිනපතා පාසලෙන් ලැබෙන අධ්‍යාපනය හා සමාන අධ්‍යාපනයක් දහම් පාසලෙන් ද ලබා දීම ප්‍රධාන අරමුණ කැර ගෙන නොවේ. ඔවුන් සතුව විශාල බලාපොරොත්තුවක් ඇත. ඊට අනුගත වැඩපිළිවෙළක් අප සතුව තිබිය යුතු ය.

පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ඉලක්කය යම්කිසි විෂයයක් පිළිබඳ විධිමත් දැනීමක් ලබාදීම වේ. දහම් පාසල් අධ්‍යාපනයේ

Not For Sale - CMSP

මූලික බලාපොරොත්තුව විය යුත්තේ සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි **'සුවිනීතං විනෙන්ති'**යන ආකාරයට විනීත ගති පැවැතුම් ඇති හික්මුණු චරිතවත්, හැදියාවක් ඇති ශිෂ්‍යයින් තැනීම ය. බෞද්ධ සාහිත්‍යයෙහි එන අංගුලිමාල සහ අශෝක අධිරාජයාගේ චරිත දෙක ගත් විට පුද්ගලයකු සමාජ විනාශකාරී සහ සමාජ හිතකර වීමේ දී ගුරුවරයාගේ මඟ පෙන්වීම කෙතෙක් දුරට ඉවහල් වන්නේ ද යන්න මැනවින් පැහැදිලි වේ.

දහම් පාසලට පැමිණෙන ළමයා ඔබට හමු වන්නේ සතියේ එක් දිනක සීමිත කාලයක් තුළ පමණි. මෙම අවස්ථාව ඉතාමත් වැදගත් වූවකි. එම කාලය ඔබ උගන්වන පාඩම් තුළින් යමක් ළමයාගේ ජීවිතයට සම්බන්ධ කැර රටට ජාතියට ආගමට වැඩදායී ක්‍රියාකාරී යහපත් පුද්ගලයකු බිහි කිරීමට අවශ්‍ය පදනම සකස් කිරීම ඉතා වැදගත් වූවකි.

බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය තුළ දක්නට ලැබෙන විශිෂ්ටතම ලක්ෂණය නම් ගුරු සිසු සබඳතාවයි. සාර්ථක අධ්‍යාපනයකට මනා ගුරු සිසු සබඳතාවක අවශ්‍යතාව නූතන අධ්‍යපනඥයෝ පවා පිළිගනිති. ගුරු සිසු සබඳතාව ඉගෙනුම සඳහා ශිෂ්‍යයනට ලැබෙන මනා පෙළඹවීමකි. ආදරය, කරුණාව, පිළිගැනීම, අන්‍යොන්‍ය විශ්වාසය වැනි මානසික අවශ්‍යතා ගුරුවරයාගෙන් ශිෂ්‍යයනට ලැබිය යුතු අනිවාර්ය අංග වශයෙන් පිළිගත හැකි ය. බුදුරජාණන් වහන්සේ ගුරු සිසු දෙපක්ෂයට එකිනෙකා කෙරෙහි ආදරය ගෞරවය භක්තිය උපදවා ගැනීම සඳහා ඉදිරිපත් කළ සංවේදී ආකල්පය නම් පිය පුතු සංකල්පය යි.

'ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි මේ තෙමේ මාගේ පුතු ය' යන සිත උපදවන්නේ ය. ගුරුවරයා කෙරෙහි 'මේ තෙමේ මගේ

Not For Sale - CMSP

පියා' යන සිත උපදවන්නේ ය. යනු බුදුරජාණන් වහන්සේගේ උදාර අදහසකි.

මෙම ප්‍රකාශයෙහි ඇති ගැඹුරු අදහස මනාව වටහා ගත් පසු දෙපාර්ශවය ම ක්‍රියා කළ යුතු ආකාරය ඉතා පැහැදිලි ය. එනම් පිය පුතු සබැඳියාව තහවුරු විය යුතු බව ය.

මෙයින් පැහැදිලිව පෙනෙන ගුරු කාර්යභාරයේ විශිෂ්ටත්වය නම් ශිෂ්‍යයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීමටත් වඩා වැදගත් කොට සලකන ලද්දේ ශිෂ්‍යයාගේ සදාචාර වර්ධනය සඳහා අවශ්‍යයෙන් ම පියවර ගත යුතු බව ය. කළමණාකාරීත්ව මණ්ඩලය ඒ සඳහා විවිධ සැළසුම් ඉදිරිපත් කැර ඇත. ආචාර්ය මණ්ඩලයේ නොමඳ සහයෝගය ඊට ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

Not For Sale - CMSP



# පසුවදන

දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා, දහම් ගුරු ප්‍රජාව දැනුවත් කොට ඔවුන්ගේ සේවා සඵලත්වය වැඩිදියුණු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

එකී අරමුණ ඉටුකරනු සඳහා වූ, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගේ සංකල්පය මල්පල ගන්වනු පිණිස සම්පාදිත 'දහම් ගුරු මග' නම් වූ දහම් පාසල් ගුරු ධාරිතා සංවර්ධන අත්පොත සාර්ථක මගපෙන්වීමකි.

දහම් පාසල් ගුරුභවතුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් කාර්ය උදෙසා මග පෙන්වමින් පිටුබලයක් සපයන්නට 'දහම් ගුරු මග' සමත් ය. ගුණාත්මක සේවා වර්ධනයට දහම් පාසල් ගුරුවරයා ඔසවාතබන්නට මෙමගින් උත්සාහ දරා ඇත.

බුදු දහමට අනුකූලව, සමාජ සාරධර්ම සංවර්ධනයට සංස්කෘතිය මතු පරපුරට දායාද කරන්නට, දහම් පාසල් ගුරුභවතාගෙන් සිදුවන අමිල මෙහෙය අර්ථ ගැන්වීමට මෙහි මාර්ගෝපදේශ අනුගමනය කිරීම වැදගත් වේ.

දහම් ගුරු සුපෞරුෂයට 'දහම් ගුරු මග' ආලෝකයක් ම වේවායි පතමි.

**-රාජකීය පණ්ඩිත, ආචාර්ය පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි**


**දකුණු පළාත් සංවර්ධන අධිකාරිය**
බාලද්‍රක්ෂ මාවත, කොටුව, ගාල්ල.
091-2234332
091-2247786
ෆැක්ස් 091-2247786
091-2242709
Email spda.galle@gmail.com
Web https://www.spda.lk



ISBN - 978-955-7360-00-3


දහම් ගුරු මග


ප්‍රකාශනය : දකුණු පළාත් සංවර්ධන අධිකාරිය